321 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 321 - இல - 2
Volume 321 - No - 2

2025 සැප්තැම්බර් 10 වන බදාදා
2025 செப்ரெம்பர் 10, புதன்கிழமை
Wednesday, 10th September, 2025

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයකු නම් කිරීම [තීරුව 189]

පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 189]

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 190]

ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව පිළිබඳ තීරණය [තීරුව 190]

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අයවැය ඇස්තමේන්තුව - 2026 [තීරුව 201]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තීරුව 205]

ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න [තීරු 206-217]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 217-231]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

1990දී එල්ටීටීඊය විසින් මුස්ලිම් වන්දනාකරුවන් ඝාතනය කිරීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීම [තීරුව 231]

වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම [තීරුව 234]

වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ අත්පත් කරගත් පෞද්ගලික ඉඩම් නිදහස් කිරීම:

පරිසර අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 238]

ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි [තීරු 249-324]

කල්තැබීමේ යෝජනාව:

වී සඳහා සාධාරණ සහතික මිලක් [තීරු 325-366]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர் நியமனம் [ப: 189]

பின்வரிசைக் குழு: உறுப்பினர் நியமனம் [ப: 189]

பொது மனுக்கள் பற்றிய குழு: உறுப்பினர் நியமனம் [ப: 190]

பாதுகாப்புப் பிரதி அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான தீர்மானம் [ப: 190]

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் வரவு செலவுத்திட்ட மதிப்பீடு - 2026 [ப: 201]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 205]

மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள் [ப:206-217]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 217-231]

தனி அறிவித்தல் மூல வினா:

1990ஆம் ஆண்டு விடுதலைப் புலிகளால் படுகொலை செய்யப்பட்ட முஸ்லிம் யாத்திரிகள் தொடர்பான விசாரணை [ப: 231]

வலிகாமம் வடக்கு பிரதேச செயலாளர் பிரிவு மக்களின் மீள்குடியேற்றம் [ப: 234]

வன்னித் தேர்தல் மாவட்டத்தில் கையகப்படுத்தப்பட்டிருக்கும் தனியார் காணிகளை விடுவித்தல்:

சுற்றாடல் அமைச்சரினது கூற்று [ப: 238]

சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 249-324]

ஒத்திவைப்புப் பிரேரணை:

நெல்லுக்கான நியாயமான நிர்ணய விலை [ப: 325-366]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Ministerial Consultative Committees: Nomination of Member [Col. 189]

Backbencher Committee: Nomination of Member [Col. 189]

Committee on Public Petitions: Nomination of Member [Col. 190]

Ruling on Vote of No-confidence against Deputy Minister of Defence [Col. 190]

BUDGET ESTIMATE OF COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION - 2026 [Col. 201]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 205]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 206-217]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 217-231]

QUESTION BY PRIVATE NOTICE:

Conduct of Inquiry into the Killing of Muslim Pilgrims by LTTE in 1990 [Col. 231]

Resettlement of Displaced People in Valikamam North DS Division [Col. 234]

RELEASE OF PRIVATE LANDS ACQUIRED IN VANNI ELECTORAL DISTRICT:

Statement by Minister of Environment [Col. 238]

PRESIDENTS' ENTITLEMENTS (REPEAL) BILL:

Read a Second, and the Third time and passed [Cols. 249- 324]

ADJOURNMENT MOTION:

A Fair Guaranteed Price for Paddy [Cols.325-366]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 සැප්තැම්බර් 10වන බදාදා
2025 செப்ரெம்பர் 10, புதன்கிழமை
Wednesday 10th September, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයකු නම් කිරීම
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர் நியமனம்
MINISTERIAL CONSULTATIVE COMMITTEES: NOMINATION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධාන සහ 2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.එස්. අබ්දුල් වාහිද් මහතා මතු සඳහන් එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
- නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
- සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

II

පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
பின்வரிசைக் குழு: உறுப்பினர் நியமனம்
BACKBENCHER COMMITTEE: NOMINATION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 129හි විධිවිධාන ප්‍රකාරව, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ සේවය කිරීම සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.එස්. අබ්දුල් වාහිද් මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

III

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
பொது மனுக்கள் பற்றிய குழு: உறுப்பினர் நியமனம்
COMMITTEE ON PUBLIC PETITIONS: NOMINATION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125හි විධිවිධාන ප්‍රකාරව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

IV

ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව පිළිබඳ තීරණය
பாதுகாப்புப் பிரதி அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான தீர்மானம்
RULING ON VOTE OF NO-CONFIDENCE AGAINST DEPUTY MINISTER OF DEFENCE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to make this Announcement in furtherance of the Announcement made by me on 19th August, 2025 regarding the Motion titled the 'No-Confidence Motion', submitted by a group of 32 Members of Parliament of the Opposition, including the Hon. Leader of the Opposition in Parliament on 12th August, 2025 against the Hon. Major General (Rtd.) Aruna Jayasekera, MP and Deputy Minister of Defence.

I have carefully considered this Motion in light of the provisions of the Constitution, the Standing Orders of the Parliament and established Parliamentary practices and precedents.

I also studied the traditions and procedures followed in other Commonwealth and democratic legislatures such as the UK House of Commons, India's Lok Sabha and Australia's House of Representatives in this regard.

Under Articles 42, 43 and 44 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, collective and individual ministerial responsibility lies with the Cabinet of Ministers. A Deputy Minister, though a Member of Parliament, is not a Member of the Cabinet and does not bear direct Constitutional responsibility to this House in the present context.

[ගරු කථානායකතුමා]

The Constitution clearly recognizes that No-Confidence Motions may be brought against the Government as a whole, while the precedents recognize No-Confidence Motions against the Prime Minister or an individual Cabinet Minister and the Leader of the Opposition in Parliament. But, there is no provision for such a Motion against a Deputy Minister.

Therefore, if such a Motion is to be accepted today, it would establish an undesirable precedent contrary to the Constitutional and Parliamentary precedents.

Accordingly, having taken into consideration of all these facts, I wish to inform this House that the Motion of No-confidence against the Deputy Minister of Defence is not in order and cannot be accepted in its present form.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I rise to a point of Order.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධව පැහැදිලි කර ගන්න අවශ්‍යයි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මටත් කාරණයක් කියන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අගෝස්තු මාසයේ 12වැනි දා තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් ඔබතුමා මුණ ගැසී මේ විශ්වාස භංග යෝජනාව ඔබතුමාට භාර දුන්නේ. අගෝස්තු මාසයේ 19වැනි දා ඔබතුමා මේ සභාවට දැනුම් දීමක් කළා, මේ යෝජනාව ලැබුණු බවටත්, මේ පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කරලා තීන්දුවක් දෙන බවටත්. ඊට පසුව පක්ෂ නායක රැස්වීමේදී - පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී - අපි ඔබතුමාගෙන් මේ ගැන විමසුවාම ඔබතුමා කිව්වා, මෙක ගැනීමට ඇති හැකියාව පිළිබඳව ලේකම් මණ්ඩලයෙන් වාර්තාවක් කැඳවා තිබෙන බව. ඒ වාගේම ඔබතුමා කිව්වා, අධිකරණ ක්‍රියාවලියට මේ විශ්වාස භංග යෝජනාව බාධාවක් වෙනවාද කියන එක දැනගන්න නීතිපතිවරයාගෙන් උපදෙස් ලබා ගත් බව. අපි දන්නා තරමින් ඔබතුමාට මේ වාර්තා දෙක ලැබී තිබෙනවා.

අපට දැනගන්න අවශ්‍ය මේකයි. මොකද, portfolio එකක් තිබෙන ඕනෑම කෙනෙකුට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න පුළුවන්. මේ වාර්තාවල අඩංගු කාරණා අපි දන්නේ නැහැ. අපි විශ්වාස කරන විධියට, නීතිපතිවරයා ඔබතුමාට උපදෙස් දීලා තිබෙන්නේ විශ්වාස භංගය ගෙනෙන්න නීතිමය බාධාවක් නැති බව සහ එයින් අධිකරණයට බලපෑමක් නැති බවටයි. ඒ වාගේම ලේකම් මණ්ඩලයෙන් දීලා තිබෙන වාර්තාව මොකක්ද කියන එකත් අපි දැනගත යුතුව තිබෙනවා.

ලංකාවෙන්, ඉන්දියාවෙන් උදාහරණ පෙන්වලා වාර්තාවක් දුන්නා කියලා තමයි අපි හිතන්නේ. ඒ නිසා කරුණාකරලා ඒ වාර්තා දෙක විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ අපේ දැනගැනීම සඳහා සභාගත කරන හැටියට අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මම ඉදිරිපත් කළ නිවේදනයේ වචනයක්, වචනයක් පාසා පරිශීලනය කරන්න. ඊට අමතරව Commonwealth parliamentsවල, House of Commonsහි, Lok Sabhaහි Parliamentary procedures අපට අධ්‍යයනය කරන්න පුළුවන්. ඒ අධ්‍යයනය කිරීමේ වාර්තා ලබා දීමට පුළුවන්. එකඟතාවක් තිබෙනවා නම් ඊට අනුව කටයුතු කිරීමේ හැකියාව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඒ වාර්තා සභාගත කරන්න කියලා අපි ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් මම සලකා බලන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Hon. Speaker, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු ප්‍රකාශයට සමගාමීව මේ අවස්ථාවේදී අපේ මතය ඉදිරිපත් කරන්නත් අවස්ථාවක් දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන් ඔබතුමාගේ තීන්දුව ගැන.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, මේ සම්බන්ධයෙන්,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විපක්ෂ නායකවරයා හැටියට මට ඒ අවස්ථාව ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

දැන් ඔබතුමා සඳහන් කළා, විවිධ සම්ප්‍රදායන් ඔක්කොම පිළිබඳව සොයා බලා ඔබතුමා තීන්දු තීරණ ගත්තා කියලා. මම ඔබතුමාට කියන්න කැමතියි, විශේෂයෙන්ම Erskine May, Kaul and Shakdher, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, Erskine May, Kaul and Shakdher-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අපට මේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සියලුදෙනාම ඒ සම්බන්ධයෙන් කියලා තිබෙන කරුණු අධ්‍යයනය කිරීමෙන් පසුව තමයි මේ වාර්තාව මම ඉදිරිපත් කරනු ලැබුවේ, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සම්ප්‍රදායක් විධියට විපක්ෂ නායකතුමාට ඔබතුමා ගත්ත තීන්දුව පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක debate එකක් නොවෙයි, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ, debate එකක් නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Debate එකක් නම් ඒ අනුව කටයුතු කරන්න පුළුවන්. ඒකට අවශ්‍ය ප්‍රතිපාදන තිබෙනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඊළඟ එක ගේන්නේ ඔබතුමාට. කියන්න තිබෙනවා, ගොඩක් දේවල්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම Erskine May, Kaul and Shakdher විසින් පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් පිළිබඳව සඳහන් කර තිබෙන දේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. ඒ වාගේම කීර්තිමත් පාර්ලිමේන්තු මහ ලේකම්වරියක් හැටියට කටයුතු කරපු ප්‍රියානි විජේසේකර මැතිනිය ලියපු කෘතියේත් මේ ගැන සඳහන් වෙනවා. මේ සම්ප්‍රදායයන් දිහා බැලුවාම පැහැදිලිව පෙනෙනවා, නියෝජ්‍ය ඇමතිවරයෙක් කියන්නේ විධායකයේ කොටසක් කියන එක. නියෝජ්‍ය ඇමතිවරයෙක් විධායකයේ කොටසක් බවට පත් වෙනකොට Standing Ordersවල ඒ ගැන සඳහන් වුණේ නැහැයි කියලා විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම බැහැර කරන්න බැහැ. ඒක අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට මම නැවතත් යෝජනා කරනවා, මා නිකුත් කරන ලද නිවේදනය කියවන්න කියලා. එහි පැහැදිලිව සඳහන් වෙනවා that a Deputy Minister "is not a member of the Cabinet and does not bear direct constitutional responsibility to this House in the present context" කියලා. So, please read about the responsibilities of the Cabinet Ministers and the Deputy Ministers in the present context. එතකොට හරි, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Speaker, it is my right to - *[Interruption.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, කථානායකවරයා විසින් ලිපිලේඛනාදිය පිළිගැන්වීම.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මටත් පොඩ්ඩක් ඉඩ දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒ කාරණාව කියවන්න කියලා නේ කිව්වේ. *[බාධා කිරීම්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මේ පාස්කු ප්‍රහාරයේ වූදිතයෝ ආරක්ෂා කරන්න එපා. අනීතික නීති පියවර. *[බාධා කිරීම්]*

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමන්ලාට භය වෙන්න දෙයක් නැහැ නේ. භය නැත්නම් මේක ගේන්න දෙන්නකෝ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපට 159දෙනෙක් නැහැ නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මේ පාස්කු ප්‍රහාරය වසන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා මම ඉදිරිපත් කළ නිවේදනය හොඳට කියවන්න. ඒකේ තිබෙනවා, ඔබතුමන්ලාට කරන්න පුළුවන් දේවල්. [බාධා කිරීම්] ඔබතුමන්ලාට කරන්න පුළුවන් දේවල් තිබෙනවා. ඒ කාරණා හොඳට කියවන්න. කරුණාකර කියවන්න. [බාධා කිරීම්]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දෙන්නකෝ mike එක. අපට කියන්න තිබෙනවා, පොඩි කාරණයක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I have a right to speak about it as the Leader of the Opposition. - *[Interruption.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Leader of the Opposition?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, කරුණාකරලා අපිටත් පොඩ්ඩක් සවන් දෙන්න. *[බාධා කිරීම්]* ඔබතුමා, ඔබතුමාගේ ප්‍රකාශය පදනමක් ඇතුව කළා සේම අපටත් සවන් දෙන්න. මේ ඉල්ලීම කරන්නේ බොහොම ගෞරවයෙන්.

ගරු කථානායකතුමනි, මේ කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. විශේෂයෙන්ම ස්ථාවර නියෝග තුළ නියෝජ්‍ය අමාත්‍යවරුන්ට එරෙහි විශ්වාස භංග යෝජනා පිළිබඳව නිශ්චිත සඳහනක් නොතිබුණත්, ඒ නිශ්ශබ්දතාවෙන් හැඟෙන්නේ No-Confidence Motion එකක් හෝ censure motion එකක් ගෙනෙන්න බැහැයි කියන කාරණාව නොවෙයි.

ඒ වාගේම මම මේ කාරණය කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. පැහැදිලිවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (1) ව්‍යවස්ථාවට අනුව නියෝජ්‍ය අමාත්‍යවරයෙකුත් විධායක බලතල ක්‍රියාත්මක කරනවා. විධායක බලතල ක්‍රියාත්මක කරන නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට එලෙස විශ්වාස භංග යෝජනා හෝ censure motion එකක් ගෙන එන සම්ප්‍රදාය වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදායක්. "Erskine May: Parliamentary Practice"හි ඒ ගැන සඳහන් වෙනවා; Kaul and Shakdherගේ "Practice and Procedure of Parliament"හි ඒ ගැන සඳහන් වෙනවා. ගරු කථානායකතුමනි, මේ තිබෙන්නේ "Erskine May: Parliamentary Practice" සහ Kaul and Shakdherගේ "Practice and Procedure of Parliament". මේවා refer කරලා තමයි මම මේ කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔය සියලු දේවල් පරිශීලනය කළා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 (3)වන ව්‍යවස්ථාවට. ඒ යටතේ, පුළුල් ව්‍යවස්ථාමය රාමුව තුළින් විශ්වාස භංගයක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාම සඳහන් කළා Erskine May ගැන. ඒ වාගේම ඔබතුමාම සඳහන් කළා, Parliamentary practices ගැන වාගේම precedents ගැන. මේ පූර්වාදර්ශ, පාර්ලිමේන්තු ක්‍රමවේදය කියන සියල්ලක්ම ඔබතුමා පරිශීලනය කළා නම් මම ඔබතුමාට ගෞරවයෙන් කියන්න කැමැතියි, පැහැදිලිවම නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්නට පුළුවන් බව. ඒ විතරක් නොවෙයි. නීතිපතිවරයා ලබා දුන් උපදෙසත්, ලේකම් මණ්ඩලය ලබා දුන් වාර්තාවත් අපට බලන්න ඕනෑ. කරුණාකරලා ඒවා සභාගත කරන්න. ඒවා අපට අවශ්‍යයි.

ඒ වාගේම, ඒවා පරිශීලනය කළාට පස්සේ අපේ මතය මේ සභාවේ ඉදිරිපත් කිරීමේ අයිතිය අපට තිබෙනවා. ඒ නිසා මම ගෞරවයෙන් ඔබතුමාට කියන්න කැමැතියි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ විධායක බලතල හොබවන නියෝජ්‍ය අමාත්‍යවරයකුට විරුද්ධව No-confidence Motion එකකුත් ගේන්න පුළුවන් බව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා 46 (1) ව්‍යවස්ථාව විතරක් නොවෙයි, 46 (2) ව්‍යවස්ථාවත් කියවන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම, censure motion එකකුත් ගේන්න පුළුවන්. ඒකට කිසිම බාධාවක් නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම precedent එකක් නැහැ, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු විපක්ෂ නායකතුමනි, පළමුවැනි කාරණය තමයි, අපි හිතන විධියට කථානායකවරයා නියෝගයක් දුන්නාට පස්සේ ඒ පිළිබඳව විවාදයක් කරන්න ස්ථාවර නියෝග අනුව ඉඩ නැහැ. නමුත් ගරු කථානායකතුමනි, ඔබතුමා අවස්ථාවක් ලබා දුන්නා මේක වැදගත් ප්‍රශ්නයක් නිසා. ආණ්ඩුවක් වශයෙන් අපි ප්‍රකාශ කරලා තිබෙනවා මේ යෝජනාව පිළිබඳව ඕනෑම වෙලාවක

විවාදයකට අපි ලැහැස්තියි, අපට ප්‍රශ්නයක් නැහැ කියලා. නමුත් ඒක පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද, නැද්ද කියලා බලන එක ඔබතුමාගේ වගකීම, ගරු කථානායකතුමනි. ඔබතුමා යෝජනා කරනවා නම් මේක No-confidence Motion එකක් ලෙස ගේන්න පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවත් බැහැ කියලා, ඒක පාර්ලිමේන්තු සම්ප්‍රදාය පිළිබඳ ප්‍රශ්නයක්, නීති රීති පිළිබඳ ප්‍රශ්නයක්. එහෙම නැතිව මේ Motion එක එතුමන්ලා වෙනත් Motion එකක් ලෙස ගේනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ.

දෙවැනි එක තමයි, පාර්ලිමේන්තුවට දෙයක් ඉදිරිපත් කරන්න පුළුවන් ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුගමනය කරන්නේ නැතිව වෙන ඕනෑම දෙයක් තමන්ට ඕනෑ විධියට ඇතුළු කර ගන්න දරන උත්සාහයන් තිබෙනවා නම් අපි ඒවා පිළිගන්නේ නැහැ. ඒ නිසා, play by the rules. Constitution එකට අනුව, Standing Ordersවලට අනුව සහ කථානායකතුමාගේ නියෝගය අනුව කටයුතු කරනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩු පක්ෂය වශයෙන් අපි ඕනෑම වෙලාවක ඒක විවාද කරන්න ලැහැස්තියි.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය මේකයි. දැන් ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඔබතුමාට තර්ජනය කළා, ඔබතුමා මේකට අවසර දුන්නේ නැත්නම් ඔබතුමාට විරුද්ධව විශ්වාසභංගයක් ගෙනෙනවා කියලා. අපි අහන්නේ මෙයයි. ගරු කථානායකතුමනි, ඔබතුමා පත් වෙලා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ නිසි ඡන්දයකින්. දැන් එතකොට මේකද ප්‍රජාතන්ත්‍රවාදය? කථානායකවරයාව -ඔබතුමාව- පරාජයට පත් කරන්න මේගොල්ලන්ට මේ ලෝකේ බැහැ; මේගොල්ලන්ට බැහැ. *[බාධා කිරීම්]* නමුත්, ගරු කථානායකතුමනි, මම අහන්නේ මේකයි. ඒකද, විපක්ෂ නායකවරයාගේ ස්ථාවරය? *[බාධා කිරීමක්]* මේ ගරු සභාවේ මූලාසනය විධියට එතුමා අධ්‍යයනය කරලා නියෝගයක් දුන්නාට පස්සේ ඒකද ස්ථාවරය? ඒ තර්ජනය ද? අපිට ප්‍රශ්නයක් නැහැ, ඔබතුමන්ලා අරුණ ජයසේකර මැතිතුමාට අදාළව පාර්ලිමේන්තුවේ නීති රීතිවලට අනුව ඕනෑම Motion එකක් ගෙනෙන්න. ඒ අනුව අපි කැමැතියි වාද විවාද කරන්න.

අවසාන වශයෙන් මම ඔබතුමාට කියන්න කැමැතියි ඔබතුමාගේ Ruling එක පිළිබඳව. දිගටම විවාද කරන සම්ප්‍රදායක් මේ ගරු සභාවේ හදන්න එපා. එහෙම බලයක් පාර්ලිමේන්තුවට නැහැ; එහෙම බලයක් නැහැ.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Speaker, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිසාම් කාරියප්පර් මහතා. *[බාධා කිරීමක්]*

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I am on a point of Order. I was the first to raise a point of Order.

ගරු කථානායකතුමනි, මගේ පළමු රීති ප්‍රශ්නය - my point of Order - මෙයයි. විපක්ෂයේ මන්ත්‍රීවරු 30 ගණනක් අත්සන් කරලා ලබා දීපු විශ්වාසභංග යෝජනාව පිළිබඳ වූ ඔබතුමාගේ නිවේදනය කිසිම පූර්ව දැනුම් දීමකින් තොරව, හඟවලා common නිවේදන යටතේ ලබා දීම වැරදියි, ගරු කථානායකතුමනි. මොකද, ඒ පිළිබඳව පෙර දැනුම් දීමක් ඔබතුමා නොකළේ, because you did not have the courage of your conviction. ඒක වැරදියි. ඒ නිසා පූර්ව දැනුම් දීමකින් තොරව එම නිවේදනය නිකුත් කිරීම වැරදියි.

මගේ දෙවැනි රීති ප්‍රශ්නය මෙයයි; I will now move on to my second point of Order. In accordance with the tradition, the Hon. Speaker shall not reject a properly filed No-confidence Motion on political grounds as that would undermine Parliamentary accountability.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධයෙන් මම ප්‍රකාශ කරලා තිබෙනවා. ඔබතුමාගේ ප්‍රකාශය වැරදියි. *[බාධා කිරීම්]*

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, සභානායකතුමා කිව්වා, තමුන්නාන්සේට විරුද්ධව අපි විශ්වාස භංගයක් ගෙනෙනවා කිව්වාය කියලා. තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ අපේ විපක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් රකින්නේ නැත්නම්, අපට ඒක කරන්න සිද්ධ වෙනවා. මම දන්නා විධියට, පාර්ලිමේන්තුවට කවුරු හරි ගෙනා විශ්වාස භංග යෝජනාවක් පළමුවැනි වතාවට තමයි මේ ප්‍රතික්ෂේප කරලා තිබෙන්නේ, තමුන්නාන්සේ. ඒක ඓතිහාසිකයි.

ඒ විතරක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයෙකුට විරුද්ධවත් විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. 1978දී හිටපු විපක්ෂ නායකවරයාට විරුද්ධව එදා විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. තමුන්නාන්සේ ලෝක් සභාව ගැන කිව්වා. ලෝක් සභාවේ, ඉන්දියාවේ හිටපු උප ජනාධිපතිට විරුද්ධවත් විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. මේ නියෝජ්‍ය ඇමතිවරයා සුවිශේෂයි. මොකද, මේ ආණ්ඩුවේ ආරක්ෂක කටයුතු සම්බන්ධව ඇමතිවරයෙක් නැහැ; ජනාධිපතිවරයා තමයි ඇමතිවරයා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා. එතුමා තමයි උත්තර දෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේ- *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔය කාරණාව දැන් මෙතැනින්- *[බාධා කිරීම්]* ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට මේ කාරණය කියා අවසන් කරන්න ඉඩ දෙන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එතුමාට අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි. එතුමා අවසන් කළේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒ නිසා මම ඉල්ලා සිටිනවා, නැවත වරක් මේ ගැන සලකා බලන්න කියලා.

ඒ විතරක් නොවෙයි, මේ රටේ වෙච්ච ලොකු ප්‍රශ්නයක් තමයි පාස්කු ඉරිදා බෝම්බ සිද්ධිය. තමුන්නාන්සේලාත් ඒක යොදා ගත්තා, බලයට එන්න. ඒ පරීක්ෂණ කටයුතු නියමාකාරයෙන් කරන්නයි අපි මේවා ඉල්ලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා, මගේ Announcement එකේ අන්තිම ඡේදය ඔබතුමන්ලා හොඳට කියවන්න. ඒක කියවන්නේ නැතුව මේ කාරණාව විසඳන්න විධියක් නැහැ. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීතුමන්ලා, මේ සියලු දේවල් පරිශීලනය කරලායි මගේ නිවේදනය මේ ලබා දෙන්නේ කියන කාරණාව මම මතක් කරන්න කැමැතියි.

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, 92 (ඇ) යටතේ නැවත මම පහදා දෙන්න ඕනෑ, ස්ථාවර නියෝග 77 වාගේම. සභානායක ගරු බිමල් රත්නායක මැතිතුමා මේ සභාවට අසත්‍ය කියනවා. ගරු කථානායකතුමනි, හැම එකටම "ඔබතුමාගේ අභිමතය" කියන කාරණය නැහැ. බලන්න, ස්ථාවර නියෝග 78, 79, 80. ඒවාට අනුව, මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් ඔබතුමාට ක්‍රියා කරන්න පුළුවන් ආකාරය සඳහන්ව තිබෙනවා. හැබැයි, ස්ථාවර නියෝග 78, 79, 80 අනුව, පාර්ලිමේන්තුවේදී ඔබතුමා දෙන නියෝගය අනුව මන්ත්‍රීවරයෙකු ක්‍රියා කරන්නේ නැත්නම් ඔබතුමාට කරන්න තිබෙන්නේ මොකක්ද? Motion එකක් ගේන්න ඕනෑ. එතකොට ඒ motion එක මඟින්, ඔබතුමා ගන්නා තීන්දුව වැරැදියි කියලා මෙහි බහුතරය තීන්දු කළොත්, ඔබතුමා පරාදයි. එම නිසා ඔබතුමාගේ තීන්දුව, ඔබතුමාගේ අභිමතය පරිදි මෙහි හැම දෙයක්ම කරයි කියන කාරණය සභානායකතුමා කියන්න හදනවා නම්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පරිකල්පන සඳහා යන්න ඔබතුමාට අවස්ථාවක් නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. මම ඉක්මනින් අවසන් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට පරිකල්පන ඉදිරිපත් කරන්න බැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පරිකල්පන නොවෙයි. ඔබතුමා මේ ස්ථාවර නියෝග කියවන්න. [බාධා කිරීමක්] මට මේ කාරණය අවසාන කරන්න ඉඩ දෙන්න.[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමාට ඒ කාරණය කියලා අවසන් කරන්න දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දැන් මේ කරන්නේ වෙන මොකවත් නොවෙයි, ගරු කථානායකතුමනි. සිරිල් ගාමිණී පියතුමා කිව්වා එතුමාව අයින් කරන්න කියලා. ආණ්ඩුවේ NPP එකේ උගත්තු කියනවා ඇතුළේ, මෙහෙම වෙන්න ඕනෑ කියලා. අප ගෙනෙන මේ සාධාරණ යෝජනාව ඒ බෙදීම නතර කරගන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

NPP එකේ කට්ටිය අද මේකට විරුද්ධයි. තමුන්නාන්සේ ඒක වළක්වනවා, මෙය පාවිච්චි කරලා. *[බාධා කිරීමක්]*

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඔය අසුනට තිබෙන මහත් ගෞරවයෙන් මම මේ කාරණය කියා සිටින්නේ. ඔබතුමාගේ නිවේදනය මම මුල ඉඳලා අවසාන වනකල් අහගෙන සිටියා. ඔබතුමාගේ නිවේදනයෙන් ඔබතුමා කියනවා, "මේ පොත බැලුවා, මේ පොත බැලුවා, මේ පොත බැලුවා" කියලා. හැබැයි, කිසිම තර්කයක් නැහැ. කථානායකවරයෙකු මීට කලින් මෙවැනි වැදගත් කාරණාවලදී නියෝගයක් දෙනකොට සලකා බලන දේවල් තිබුණා. නීතිපතිවරයාගේ මතය ඔබතුමාට ලැබුණා.

නීතිපතිවරයාගේ මතය වන්නේ, නීති විරෝධී කිසිවක් මේ යෝජනාවේ නැහැ, බාධාවක් නැහැ යන්නයි. ඔබතුමාට ලැබුණා,

ලේකම් මණ්ඩලයේ මතය. ලේකම් මණ්ඩලයේ මතය අපි දන්නේ නැහැ. ඒ වාගේම ඔබතුමා කථා කළා, Commonwealth පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන. ඔබතුමාගේ නියෝගය ඇතුළේ ඒ එක එක තර්ක මතු කරලා, අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේ මතු කරපු තර්ක, ඒ වාගේම ලැබුණු වාර්තාවල තිබෙන කරුණු විධිමත්ව ගෙනහැර දක්වලා, වෙනත් කථානායකවරුන්, ඒ වාගේම වෙනත් රටවල, වෙනත් සංකල්ප මඟින් ඉදිරිපත් කරලා තිබෙන තර්ක, විතර්ක කිසිවක් නැහැ. ඔබතුමා කියනවා, "මම මේක බැලුවා, මේක බැලුවා, මේක බැලුවා. මේක බලපු නිසා මම ඒක ප්‍රතික්ෂේප කරනවා" කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සංක්ෂිප්ත වාර්තාවේ ඒවා තිබුණේ නැත්තේ, මම ඒවා අධ්‍යයනය කරලා එකඟ නොවන හින්දා, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඒක සංක්ෂිප්ත වෙන්න බැහැ. ඒ තරම් බරපතළ කාරණයක් -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථානායකවරයා විසින් පිළිගන්වනු ලබන ලිපිලේඛන.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අයවැය ඇස්තමේන්තුව - 2026
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் வரவு செலவுத்திட்ட மதிப்பீடு - 2026
BUDGET ESTIMATE OF COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION - 2026

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 31(1)(ආ) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සකස් කරන ලදුව, මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2026 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මම සභාගත කරමි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "එකී අයවැය ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Speaker, I present the -

(i) Annual Report of the Postgraduate Institute of Archaeology of the University of Kelaniya for the year 2023; and

(ii) Annual Report of the University Grants Commission for the year 2023.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present Performance Report of the Department of Registration of Persons for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Science, Technology and Digital Transformation.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the Performance Report of the Administrative Appeals Tribunal for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

[ගරු බිමල් රත්නායක මහතා]

මෙම වාර්තා සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත වෙත යොමු කරන ලද ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එම කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු කථානායකතුමනි, කෑගල්ල, උඩුගොඩ, නෙවිස්මියර් ඉහළ, ජී 265 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. පොඩිරාළහාමි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) තලවතුගොඩ, ජෝතිකාරාම පාර, 295/9සී දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජී. දයාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) දෙහිවල, ගල්විහාර පාර, 254/1බී දරන ස්ථානයෙහි පදිංචි එෆ්.ආර්. සුල්ෆිකාර් මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) ලීමගහකොටුව, දොඩන්දෙණිය, අංක 212 දරන ස්ථානයෙහි පදිංචි කේ.පී. ජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) බත්තරමුල්ල, පැලවත්ත, රත්නායක මාවත, අංක 15-ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී.ඒ. පෙරේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මීගොඩ, මාවලස් ගාර්ඩ්න්, අංක 555/69 දරන ස්ථානයෙහි පදිංචි බී. මහින්ද සේනාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

ගරු කථානායකතුමනි, අළුබෝමුල්ල, පමුණුගම, දිගනතුඩුව, අංක 372/ඒ දරන ස්ථානයෙහි පදිංචි අයි.සී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
QUESTIONS POSED TO HON. PRIME MINISTER

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය ගරු අගමැතිතුමියට ඉදිරිපත් කරනවා, ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන්.

1. 2024දී ගිණුම් අනුව විදුලිබල මණ්ඩලයේ - CEBහි - මුළු වියදම රුපියල් බිලියන 470ක් වන අතර, ආදායම රුපියල් බිලියන 615ක් විය. මේ ඉතිරි මුදල ණය අඩු කිරීම හා කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා භාවිත කරන බවට රජය ගන්නා පියවර මොනවාද? සංක්‍රමණය, බෙදාහැරීම සහ සංස්ථාගත වියදම, මුළු වියදම් සියයට 8.5ක් දක්වා වැඩිවීම පිළිබඳව, මෙම අධික පරිභෝජන වියදම් අඩු කරමින් පාරිභෝගිකයාට අඩු ගාස්තු වශයෙන් ප්‍රයෝජනය ලබා දීමට රජය ගන්නා පියවර මොනවාද?

2. 2024දී නැවත උත්පාදනය (renewable energy) මුළු විදුලි ජනනයෙන් සියයට 51ක් සඳහා රුපියල් බිලියන 72.41ක් වැය වූ අතර, තාප විදුලි ජනනයෙන් (thermal) සියයට 49ක් සඳහා රුපියල් බිලියන 272ක් වැය විය. විදේශ විනිමය පිටවීමක් නොමැතිව නැවත උත්පාදනය වැඩි කිරීමට රජය නැවතත් වග බලා ගනිමින් වාණිජවලට යෝග්‍ය ගාස්තු යළි පිහිටුවාගෙන renewable energy ඇති කරනවා ද?

3. බැටරි ගබඩා කිරීම (battery storage) නීතිගතව අධිකාරි කටයුතු මඟින් අහිමි කර ඇත. අයදුම් රහිත ආනයන ඉවත් කර ඇති අතර, මිලදී ගැනීම වසර 20ක ජීවිත කාලය වෙනුවට වසර 10කට සීමා කර ඇත. එසේ වීමට හේතුව කුමක් ද?

4. CEBහි මුදල් අතිරික්තයක් තිබියදීත් විදුලි ගාස්තු නැවත වැඩි කරනවා ද?

ස්තුතියි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න බලශක්ති අමාත්‍යාංශයෙන් සති දෙකක කාලයක් ඉල්ලා තිබෙනවා. එම නිසා මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟ ප්‍රශ්නය, ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මා අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2021.05.20 දින හෝ ඊට ආසන්න කාලය තුළ ශ්‍රී ලංකා මුහුදු තීරයේදී ගිනිගෙන විනාශ වූ "MV X-Press Pearl" නෞකාව නිසා සිදු වූ පාරිසරික හානිය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක: SC/FR 168/2021, SC/FR 176/2021, SC/FR 184/2021 සහ SC/FR 277/2021 දරන නඩුවලට අදාළව 2025.07.24 වන දින තීන්දුවක් ලබාදී ඇති බව ඔබතුමිය දන්නේ ද?

02. එකී නඩු තීන්දුව මඟින් ලබා දී ඇති නියෝග සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර මොනවාද?

03. ඉහත කී පරිසර දූෂණයට අදාළව ශ්‍රී ලංකා රජය විසින් Singapore International Commercial Courtහි - SICCහි - පවරා ඇති අලාභ නඩුවේ වර්තමාන තත්ත්වය කුමක්ද?

04. ලන්ඩන්හි අද්මිරල්ටි මහාධිකරණයෙහි - Admiralty Courtහි - පවරා ඇති වගකීම සීමා කිරීමේ කාර්ය පටිපාටිය - Limitation of Liability Proceedings - නඩුවේ දැනට පවතින තත්ත්වය කුමක්ද?

05. මෙවැනි බරපතළ සමුද්‍ර පරිසර දූෂණයක් නැවත ඇති වීම වැළැක්වීම සඳහා දැනට ගෙන ඇති පියවර මොනවාද?

ගරු කථානායකතුමනි, මෙහි කොටස් දෙකක් තිබෙනවා. එක කොටසක් තමයි ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නඩු තීන්දුව පිළිබඳ කාරණය. අනෙක, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සිංගප්පූරුවේ පවරපු නඩුවත්, ලන්ඩන්හි පවත්වාගෙන යන නඩුවත් කියන නඩු දෙක පිළිබඳ කාරණය. මේ, කාරණා දෙකක්. මේ පිළිබඳව රජයේ වගකීම අනුවයි මම මේ ප්‍රශ්නය අසන්නේ. මේක රටේ සිදු වුණු බරපතළම පරිසර දූෂණවලින් එකක්. පැවතුණු රජය වැරැදි තීරණ අරගෙන තිබුණා. එහි ප්‍රතිඵලයක් හැටියට නෛතික කටයුතුවලට යන්නට සිද්ධ වුණා. මේ විශිෂ්ට වූ නඩු තීන්දුවෙන් පසුව වර්තමාන රජය ඒ පිළිබඳව ගන්නා තීරණ මොනවාද? ඒ වාගේම ලන්ඩනයේ සහ සිංගප්පූරුවේ සිදුවන කාරණා නිසා රට අන්ධකාරයේ ඉන්නේ. මේ අන්ධකාරය නැති කරන්න මේ රජයට කරන්න පුළුවන් කාරණා මොනවාද කියලායි ගරු අගමැතිතුමියගෙන් මම අහන්නේ.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුරු සඳහා මම තොරතුරු ලබා ගත යුත්තේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයෙන්. සවිස්තර පිළිතුරක් ලබා දීම සඳහා එම අමාත්‍යාංශයෙන් යම් කාලයක් ඉල්ලා තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, සතියකට වැඩියි මේ ප්‍රශ්නය යොමු කරලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ කාරණාවට දැන් පිළිතුර ලබා දුන්නා නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මට තත්පර 30ක් ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, කියන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ බරපතළකම නිසා මම මීට දින 10කට පමණ කලිනුයි ගරු අගමැතිතුමියට මේ ප්‍රශ්නය යොමු කළේ, දවසක්, දෙකක් දීලා නොවෙයි. ගරු අගමැතිතුමියනි, එතරම් කාලයක් ලබා දීලා ඔබතුමියගෙන් මේ ප්‍රශ්නය අහන්න විපක්ෂයට තිබෙන වටිනා අවස්ථාව මම ලබා ගත්තාට පස්සේ මේ විධියේ උත්තරයක් දෙන එක ඉතාම කනගාටුදායකයි කියලා මම ඔබතුමියට කියනවා. ඔබතුමිය විතරක් පෞද්ගලිකව නොවෙයි, මේ විෂය භාරව කටයුතු කරන ඇමතිවරුත් මේ තත්ත්වය පිළිබඳව වගකියන්න ඕනෑ. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම ඒ ගැන යමක් කියන්න ඕනෑ. පාර්ලිමේන්තුවේදී අග්‍රාමාත්‍යතුමියගෙන් ප්‍රශ්න අහන්න මන්ත්‍රීවරයෙකුට තිබෙන අවස්ථාව වැදගත් අවස්ථාවක්. එතකොට ඒ ප්‍රශ්න යොමු කිරීමේදී අගමැතිතුමියට පිළිතුරු දෙන්න සිද්ධ වෙන්නේ වෙනත් අමාත්‍යාංශවලින් තොරතුරු අරගෙන. ඒ අනුව අපි හැම විටම උත්තර දීලා තිබෙනවා. උත්තර ලබා දෙමිනුත් තිබෙනවා. අපි ප්‍රශ්නවලට කොතරම් කාර්යක්ෂමව පිළිතුරු දීලා තිබෙනවාද කියන එක මම මීට කලින් අවස්ථාවකත් සඳහන් කළා. විශේෂයෙන්ම මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. අපි ස්ථාවර නියෝග 27 (2) යටතේ අහන ප්‍රශ්න සම්බන්ධව ඔබතුමන්ලාට කියා තිබෙනවා. හදිසි, ජාතික වැදගත්කමකින් යුක්ත ප්‍රශ්න වෙනුවට ඉතාම දීර්ඝ, සවිස්තරාත්මක පිළිතුරු ඉල්ලන ප්‍රශ්නවලට තමයි අපිට පිළිතුරු දෙන්න බැරි වෙලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය එහෙම එකක්ද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුවට එහෙම චෝදනාවක් කරන එක වැරදියි. ඒ වාගේම, ස්ථාවර නියෝග 27 (2) යටතේ අහන ප්‍රශ්නවලට අපි මේ වන විට පිළිතුරු ලබා දීලා තිබෙනවා. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා කියපු කාරණා සම්බන්ධයෙනුත් සම්පූර්ණ වාර්තාවක් මම සකස් කරලා තිබෙනවා. ආණ්ඩුවක් වශයෙන් අපි ඒ වගකීම හරියට ඉටු කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ඊළඟ දිනයවත් කියන්න. අඩු ගණනේ උත්තර දෙන දිනයක් කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සති දෙකක් කියලා ගරු අග්‍රාමාත්‍යතුමිය කිව්වා නේද?

ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කරන මීළඟ ප්‍රශ්නය, ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු කථානායකතුමනි, ඩිජිටල් ආර්ථික කටයුතු සම්බන්ධයෙන් තමයි ගරු අගමැතිතුමියට මේ ප්‍රශ්නය යොමු කරන්නේ.

ජනතාව ඩිජිටල් ආර්ථික කටයුතු සඳහා යොමු කිරීමට ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම ඉතාම වැදගත් වෙනවා. ඩිජිටල් ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා පියවර ගැනීම වර්තමාන රජයේ මූලික අරමුණු අතර ඉදිරියෙන්ම පවතින බව අවස්ථා ගණනාවකදීම ගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ඒ සඳහා වෙනම අමාත්‍යාංශයක් ද පිහිටුවීමට ගරු ජනාධිපතිතුමා විසින් කටයුතු කරන ලදී. එසේම සැප්තැම්බර් මාසය ඩිජිටල් ආර්ථික මාසයක් ලෙස ප්‍රථම වතාවට ප්‍රකාශයට පත් කර තිබේ.

1. ඩිජිටල් ආර්ථික මාසයක් ප්‍රකාශ කිරීමේ මූලික අරමුණු මොනවාද?
2. ඒ සඳහා මූලිකව සම්බන්ධ වන පාර්ශ්ව මොනවාද?
3. ඩිජිටල් ආර්ථික මාසය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩසටහන් සහ අපේක්ෂිත ප්‍රතිඵල මොනවාද?
4. මේ සඳහා ජනතා සහභාගිත්වය ලබා ගැනීමට කටයුතු කරන්නේ කෙසේද? ඒ හරහා ජනතාවට ලැබෙන ප්‍රතිලාභ මොනවාද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. ශ්‍රී ලංකාව ඩිජිටල් ලෙස බලගැන්වූ ජාතියක් බවට පත්වීමේ ගමන වේගවත් කිරීමේ ජාතික මූලපිරීමක කොටසක් ලෙස සැප්තැම්බර් මාසය "ඩිජිටල් ආර්ථික මාසය" ලෙස නම් කර ඇත. මෙම මාසය විශේෂයෙන් නම් කිරීමේදී ඩිජිටල්කරණය පිළිබඳ ප්‍රබෝධයක් ඇති කරවීම සහ අනාගතයට සූදානම් ආර්ථිකයක් - future-ready economy එකක් - ගොඩනැඟීම සඳහා රජයේ දැඩි කැපවීම පෙන්නුම් කිරීම අරමුණු කරගෙන ඇත. මේ යටතේ වූ ක්‍රියාකාරකම් සැප්තැම්බර් මාසය ආරම්භයේ සිට දින 100ක් පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

   ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

   (i) ඩිජිටල් මෙවලම් සහ සේවාවන් භාවිතයට යොමු වීමේ වැදගත්කම පිළිබඳව පුරවැසියන්, ව්‍යාපාර සහ ආයතන දැනුවත් කිරීම සහ; e-රාජ්‍ය වේදිකා, ඩිජිටල් මූල්‍ය විසඳුම් සහ කෘත්‍රිම බුද්ධිය - AI - පාදක කරගත් නවෝත්පාදන සඳහා සමාජයේ සියලුම කොටස් අනුවර්තනය කිරීම වේගවත් කිරීම.

   (ii) ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සහ එහි හවුල්කාර ආයතන යටතේ ක්‍රියාත්මක කරන ඩිජිටල් ව්‍යාපෘති වේගවත් කිරීම. එමඟින් ප්‍රතිලාභ පුරවැසියන්ට සහ ව්‍යාපාරවලට වේගයෙන් ළඟා වනු ඇත.

   (iii) 2030 වර්ෂය වන විට ඩිජිටල් ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 15ක් එනම්, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 12ක් දක්වා පුළුල් කිරීම සඳහා වන රජයේ අභියෝගාත්මක ඉලක්කය සපුරා ගැනීම. මේ අතරම, ඩිජිටල් ක්ෂේත්‍රයේ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් දක්වා සහ ඩිජිටල් ශ්‍රම බලකාය ලක්ෂ 2ක් දක්වා පුළුල් කිරීමට ද අපේක්ෂිතය. මෙම අභිලාෂය පැහැදිලිව සන්නිවේදනය කිරීමට සහ එය සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයම පෙළගැස්වීමට මෙම ඩිජිටල් ආර්ථික මාසය වේදිකාවක් සපයයි.

   (iv) දකුණු ආසියානු කලාපයේ තාක්ෂණ නවෝත්පාදනය, ඩිජිටල් මූල්‍යකරණය සහ AI ප්‍රමුඛ සංවර්ධනය සඳහා විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම.

   සාරාංශයක් ලෙස, ඩිජිටල් ආර්ථික මාසය යනු, සංකේතාත්මක මූලපිරීමක් පමණක් නොව, දැනුවත්භාවය ඉහළ නැංවීම, ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ඩිජිටල් අභිලාෂය ලොවට ප්‍රදර්ශනය කිරීම සඳහා වන ප්‍රායෝගික යන්ත්‍රණයකි. ඒ තුළින් නවෝත්පාදනය, කාර්යක්ෂමතාව සහ අවස්ථාවන් හරහා අනාගතයේදී පුරවැසියන්ට සෘජුවම ප්‍රතිලාභ ලබා දීම සඳහා ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළකි.

2. සමස්ත මග පෙන්වීම, සම්බන්ධීකරණය සහ උපාය මාර්ගික අධීක්ෂණය සපයමින් මෙම මූලපිරීම මෙහෙයවනු ලබන්නේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසිනි. මෙම අමාත්‍යාංශයට සමගාමීව, එහි විෂය පථය යටතේ ඇති විවිධ ආයතන ක්‍රියාකාරීව නියැළී සිටින අතර, ඔවුන්ගේ නිශ්චිත කාර්යභාරය සහ විශේෂඥතා ක්ෂේත්‍ර සමඟ සමපාත වන ක්‍රියාකාරකම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, ඩිජිටල් සංවර්ධනය සඳහා පුළුල් ප්‍රවේශයක් සහතික කරයි.

   මෙම මූලපිරීමේ සාර්ථකත්වයට, පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් වන තාක්ෂණ සමාගම්, බැංකු, මූල්‍ය තාක්ෂණ - fintech - සමාගම් සහ ආරම්භක සමාගම් විසින් නව්‍ය විසඳුම් හඳුන්වා දීම, ප්‍රශස්ත භාවිතයන් පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීම සහ පුරවැසියන් සහ ව්‍යාපාර අතර ඩිජිටල් අනුවර්තනය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වේ.

   රජය, කර්මාන්ත අංශය සහ සමාජයේ සියලු කණ්ඩායම් මෙම ශක්තිමත් පද්ධති නිර්මාණය කිරීම සඳහා දායක වේ.

3. ඩිජිටල් ආර්ථික මාසය සඳහා වන වැඩසටහන, නවෝත්පාදන ප්‍රදර්ශනය කිරීම, ඩිජිටල් සාක්ෂරතාව පුළුල් කිරීම සහ සමාජය පුරා අනුවර්තනය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති ඉහළ බලපෑමක් සහිත ක්‍රියාකාරකම් මාලාවකින් සමන්විත වේ. මේවාට ඇතුළත් වන්නේ;

   (i) ප්‍රධානතම කාර්යයන්

   - Disrupt Asia උත්සවය හා ප්‍රදර්ශනය

     ප්‍රාරම්භක ව්‍යාපාර - startups, ව්‍යවසායකයින් සහ නවෝත්පාදන පරිසරය පද්ධති ප්‍රදර්ශනය කිරීම. මෙය සැප්තැම්බර් 17, 18, 19 හා 20 කියන දින තුළ පවත්වනවා.

   - ශ්‍රී ලංකා මූල්‍ය තාක්ෂණ සමුළුව - FinTech Summit.

     ඩිජිටල් මූල්‍ය භාවිතය, අනුවර්තන සහ නව විසඳුම් ප්‍රවර්ධනය කිරීම. මෙය සැප්තැම්බර් 24 සහ 25 දිනවල පවත්වන්න නියමිතයි.

   - කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ජාතික ප්‍රදර්ශනය - National AI Expo.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කර්මාන්ත හරහා කෘත්‍රිම බුද්ධියේ යෙදවුම් ප්‍රදර්ශනය කිරීම. මෙය සැප්තැම්බර් 29 සහ 30 දිනවල පැවැත්වීමට සැලසුම් කර තිබෙනවා.

(ii) ජාතික මට්ටමේ දැනුවත් කිරීමේ සහ සම්බන්ධීකරණ වැඩසටහන්

- ඩිජිටල් රාජ්‍ය සේවා සහ කඩදාසි භාවිතයෙන් තොර - paperless - විසඳුම් පුරවැසියන්ට හඳුන්වා දෙන මහජන ප්‍රදර්ශන සහ නිරූපණ.
- ඩිජිටල් මෙවලම්වල ප්‍රතිලාභ පිළිබඳ පුළුල් දැනුවත්භාවයක් ඇති කිරීම සඳහා මාධ්‍ය ප්‍රචාරණය.

(iii) ධාරිතා වර්ධනය සහ අධ්‍යාපනය

- ඩිජිටල් නිපුණතා, ව්‍යවසායකත්ව සහ තාක්ෂණ අනුවර්තනය පිළිබඳව තරුණයින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ වෘත්තිකයන් සඳහා පුහුණු පාඨමාලා, වැඩමුළු.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ - ICT - සහ ඩිජිටල් සේවාවන්හි අනාගත වෘත්තීන් දිරිමත් කිරීම සඳහා විශ්වවිද්‍යාල සහ පාසල් සම්බන්ධීකරණ වැඩසටහන්.
- e-රාජ්‍ය විසඳුම් පිළිබඳ පළාත් මට්ටමේ නිලධාරින්ගේ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා වැඩමුළු.

(iv) කර්මාන්ත සහ පාර්ශ්වකරුවන්ගේ සංසද

- ඩිජිටල් ආර්ථිකයේ අභියෝග සහ අවස්ථා පිළිබඳව කර්මාන්ත ක්ෂේත්‍රයේ පුරෝගාමීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ සංවාද සහ විද්වත් සාකච්ඡා - panel discussions.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් අතර අනුවර්තනය ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ මණ්ඩල සහ වෘත්තිකයින්ගේ සංගම් සමඟ සහයෝගීතාව.

(v) සෙසු ක්‍රියාකාරකම්:

- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය - SLCERT - විසින් ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයේ - NCSOC - මෙහෙයුම් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය - SLCERT - විසින් ජාතික සහතික බලාධිකාරියේ - NCA - මෙහෙයුම් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය - SLCERT - විසින් 2025 ජාතික සයිබර් ආරක්ෂණ උපාය මාර්ගය දියත් කිරීම.
- රට පුරා රථ වාහන දඩ මුදල් එම ස්ථානයේදීම ගෙවීමට හැකි වන පරිදි රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව වන GovPay පුළුල් කිරීම.
- මගීන්ට බැංකු කාඩ්පත් සහ QR කේත භාවිතයෙන් බස් ගාස්තු ගෙවීමට ඉඩ සැලැස්වීම සඳහා ජාතික ප්‍රවාහන ගෙවීම් වේදිකාවක් - NTPP - ස්ථාපිත කිරීම.
- රජයේ ඩිජිටල් පැවැත්ම ප්‍රමිතිකරණය කිරීම.
- කෘත්‍රිම බුද්ධිය - AI - පිළිබඳ ශ්‍රී ලංකාවේ නිල වේදිකාව වන ai.gov.lk නිල වේදිකාව දියත් කිරීම.
- ඩිජිටල් ආර්ථික අත්දැකීම් මධ්‍යස්ථානය - Experience Centre - සංවර්ධනය කිරීම.
- සිම්පත් ලියාපදිංචි කිරීමේ ස්වයංක්‍රියකරණය දියත් කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 5G සංඛ්‍යාත ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම.

ගරු කථානායකතුමනි, මෙම මුලපිරීම් හරහා පහත සඳහන් ප්‍රතිඵල ජනනය කිරීමට අපේක්ෂා කරයි;

- තාක්ෂණය මත පදනම් වූ ප්‍රාරම්භක - tech startup - පරිසර පද්ධතිය ශක්තිමත් කිරීම සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම.
- මූල්‍ය තාක්ෂණ - fintech - භාවිතය වේගවත් කිරීම, මූල්‍ය ඇතුළත් කිරීම - financial inclusion - සහ ඩිජිටල් ගෙවීම් කෙරෙහි විශ්වාසය වැඩි කිරීම.
- GovPay විසින් පුරවැසියන්ට ඩිජිටල් ක්‍රමවේද මඟින් රජයට දඩ මුදල් ගෙවීමට, පෝලිම් සහ භෞතිකව ලේඛන සැකසීම අඩු කිරීම සහ සමස්ත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට පහසු, වේගවත් සහ ආරක්ෂිත ක්‍රමයක් සැපයීම.
- ජාතික ප්‍රවාහන ගෙවීම් වේදිකාව - NTPP - යටතේ නෝට්ටු/කාසි රහිත ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම, මගීන් සඳහා පහසුව වැඩිදියුණු කිරීම. අපි බලාපොරොත්තු වන ප්‍රතිඵල අතර මේ දේවල් තිබෙනවා. පොදු ප්‍රවාහන ගෙවීම් පද්ධති නවීකරණය කිරීම සහ සම්පූර්ණයෙන්ම අන්තර් ක්‍රියාකාරී සහ ඩිජිටල් ලෙස සක්‍රිය ප්‍රවාහන ජාලයක් සඳහා අඩිතාලම සකස් කිරීම.
- අනන්‍ය ඩිජිටල් හැඳුනුමේ - SLUDI - ලෝක ව්‍යාප්ත සැබෑ යෙදුම් පෙන්නුම් කිරීම, පුරවැසියන් දැනුවත් කිරීම සහ ඩිජිටල් අක්තපත්‍ර - Digital Credentials - පද්ධති කෙරෙහි විශ්වාසය ගොඩනැඟීම.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශ හරහා කෘත්‍රිම බුද්ධිය - AI - සඳහා වූ සූදානම වැඩිදියුණු කිරීම.
- ඩිජිටල් සේවාවල පුරවැසි සහභාගිත්වය, කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම.
- අනාගතයට සූදානම් කුසලතා ඇති තරුණයින්, රාජ්‍ය සේවකයින් සහ වෘත්තිකයන් සවිබල ගැන්වීම.
- සයිබර් ආරක්ෂාව සහ ඩිජිටල් සේවා කෙරෙහි විශ්වාසය වැඩිදියුණු කිරීම.
- පුරවැසියන්ගේ සිට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දක්වා ඩිජිටල් ආර්ථිකය තුළ සියලුදෙනා ඇතුළත් සහභාගිත්වය- all-Inclusive participation - දිරිමත් කිරීම.

4. ඩිජිටල්කරණය සඳහා මහජනතාව පෙලඹවීම ඩිජිටල් මාසයේ මූලික අරමුණයි. සියල්ලන්ගේ සහභාගිත්වය - inclusivity - ප්‍රවර්ධනය කිරීම සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක ආයතන පොදු වේදිකාවක් හරහා සමුළු, සංසද, විවෘත ප්‍රදර්ශන, දැනුවත්

කිරීමේ වැඩසටහන්, මූලික නිර්මාණ අවස්ථා - sandbox - සහ සජීවී නිරූපණ සංවිධානය කරනු ලබයි.

පාසල්, විශ්වවිද්‍යාල, තරුණ සංවිධාන සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සමඟ සහයෝගීතාවෙන් මෙම මූලපිරීම අග නගරයට පමණක් සීමා නොවී දිවයින පුරා විවිධ ප්‍රජාවන්ට ළඟා වන බව සහ ප්‍රතිඵල ලබා දෙන බව සහතික කරනු ඇත.

සාමාන්‍ය ජනතාවට පහත පරිදි වඩාත් ප්‍රායෝගික සහ දිගුකාලීනව වැදගත් ප්‍රතිඵල ලැබේ.

- කාර්යක්ෂම හා කඩදාසි භාවිතයෙන් තොර රජයේ සේවාවන් සඳහා පහසු ප්‍රවේශ හඳුන්වා දීම.
- ඩිජිටල් අංශයේ නව ඉගෙනුම් සහ වෘත්තීය අවස්ථා ඇති කිරීම.
- ආරක්ෂිත මූල්‍ය විසඳුම් පුළුල් ලෙස භාවිත කිරීම.
- ආරක්ෂාව සහ විනිවිදභාවය තුළින් එදිනෙදා ඩිජිටල් අන්තර් ක්‍රියාවලදී වැඩි පහසුව ඇති කිරීම.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனூர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු කථානායකතුමනි, ජනතාව වෙනුවෙන් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ගරු අගමැතිතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු අගමැතිතුමියනි, මට කෙටි කාරණයක් පැහැදිලි කර ගැනීමට තිබෙනවා. ඩිජිටල් ආර්ථිකය දියුණු කිරීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම් අත්‍යවශ්‍ය ක්ෂේත්‍රයක් වෙනවා. මෙතෙක් කල් අපේ රටේ අනෙකුත් සංවර්ධන කටයුතු සිදු වුණා වාගේ ඩිජිටල් යටිතල පහසුකම් ද විෂමතා සහිතව තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා රජයේ වත්මන් වැඩ පිළිවෙළ තුළ ජාල සන්නිවේදනය, දුරකථන සන්නිවේදනය ඇතුළු සන්නිවේදන පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව කෙටියෙන් දැනගැනීමට මම කැමතියි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය මේ වනකොටත් ඒ යටිතල පහසුකම්වල අවශ්‍යතාව පිළිබඳව අධ්‍යයනයක් සහ පරීක්ෂණයක් කරමින් ඒ වෙනුවෙන් මැදිහත් වෙනවා. උදාහරණයක් හැටියට මම අධ්‍යාපන අමාත්‍යාංශය ගත්තොත්, මේ වනකොට සෑම පළාතකම, සෑම පාසලකම, සෑම අධ්‍යාපන කලාපයකම ඩිජිටල්කරණයට අවශ්‍ය වන යටිතල පහසුකම් පිළිබඳව අධ්‍යයනයක් කරලා, අධ්‍යාපන අමාත්‍යාංශයත්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් එකතු වෙලා ඒ පහසුකම් සලස්වන්න වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. සෙසු අමාත්‍යාංශවලත් ඒ විධියටම ක්‍රියාත්මක වෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු සුනිල් රාජපක්ෂ මහතා.

ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා පාදක කරගනු ලබන විභාගය වන අපොස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා වන කඩඉම් ලකුණු මේ වනවිට ප්‍රකාශයට පත් කර තිබෙනවා.

01. 2025 වසරේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අපොස (උසස් පෙළ) විභාගය සඳහා එක් එක් විෂය ධාරා යටතේ කොපමණ සිසුන් ප්‍රමාණයක් විභාගය සඳහා මුහුණ දී තිබේද?

02. එම ප්‍රමාණයෙන් කොපමණ සිසුන් ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබේද?

03. විශ්වවිද්‍යාල සඳහා 2025 වසරේ ඇතුළත් කර ගැනීමට බලාපොරොත්තු වන සිසුන් ප්‍රමාණය කොපමණද? එය විභාගයට මුහුණ දුන් ප්‍රමාණයෙන් සහ සුදුසුකම් ලැබූ පිරිසෙන් කොපමණ ප්‍රතිශතයක්ද?

04. 2025 වසරේ විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රමාණය ඉහළ ගොස් තිබේද? ඒ කොපමණ ප්‍රමාණයකින්ද? කුමන පාඨමාලාවන්වලද?

05. විශ්වවිද්‍යාල ප්‍රවේශය තවදුරටත් පුළුල් කිරීමට රජය ගෙන ඇති වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරගරු කථානායකතුමනි, ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. ගරු කථානායකතුමනි, 2025 වසරේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපොස (උසස් පෙළ) විභාගයේ එක් එක් විෂය මාලා යටතේ සිසුන් 274,361ක් මුහුණ දී තිබෙනවා. විවිධ විෂයයන් අනුව එම විභාගයට මුහුණ දුන් සිසුන් සංඛ්‍යාව දැක්වෙන වගුව මම **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද වගුව:
சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை :
Table tabled:

විෂය ධාරාව	විභාගයට මුහුණ දුන් සිසුන් සංඛ්‍යාව
කලා	94,040
ජීව විද්‍යා	52,867
ජෛව පද්ධති තාක්ෂණවේදය	8,447
වාණිජ්‍යය	56,691
ඉංජිනේරු තාක්ෂණවේදය	19,367
භෞතික විද්‍යාව	35,722
වෙනත්	7,227
මුළු එකතුව	**274,361**

02. එම ප්‍රමාණයෙන් 177,920ක ශිෂ්‍යයන් ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගෙන තිබෙනවා, විවිධ ක්ෂේත්‍රවලින්. එම තොරතුරු ඇතුළත් වගුවත් මම **සභාගත*** කරනවා.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

සභාමේසය මත තබන ලද වගුව:
சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை :
Table tabled:

අංක	විෂය ධාරාව	විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මූලික සුදුසුකම් සපුරාලූ සිසුන් සංඛ්‍යාව
1	ජෛවීය විද්‍යා	31,152
2	භෞතීය විද්‍යා	22,565
3	වාණිජ්‍ය	39,530
4	කලා	61,313
5	ඉංජිනේරු තාක්ෂණවේදය	13,278
6	ජෛව පද්ධති තාක්ෂණවේදය	6,292
7	වෙනත් (ඉහත කිසිදු විෂය ධාරාවකට අයත් නොවන සිසුන්)	3,790
මුළු එකතුව		177,920

03. 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව 43,237ක්. ඒ කියන්නේ 177,920ක් සුදුසුකම් ලබා තිබියදී 43,237ක් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කර ගන්න අපි යෝජනා කරලා තිබෙනවා. ඒ කියන්නේ, විභාගයට මුහුණ දුන් ප්‍රමාණයන්හි ප්‍රතිශතයක් හැටියට ගත්තොත්, 15.76කට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබී තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ ප්‍රමාණයන්හි ප්‍රතිශතයක් ලෙස 24.3ක ප්‍රමාණයක් ඇතුළත් කර ගෙන තිබෙනවා.

04. 2024/2025 අධ්‍යයන වර්ෂයේ අලුත් පාඨමාලාවලට ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයට 50කුත්, වෙනත් විශ්වවිද්‍යාලවලට 225කුත් අරගෙන තිබෙනවා. දැනට පවතින අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍යයින් 66දෙනෙකුට ප්‍රවේශය ලබා දීලා තිබෙනවා. එම විශ්වවිද්‍යාල පිළිබඳ තොරතුරුද මම **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද වගු:
சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணைகள்:
Tables tabled:

- දැනට පවතින පාඨමාලාවන් වෙනත් විශ්වවිද්‍යාලවල හඳුන්වාදීම මත පදනම්ව යෝජිත ප්‍රමාණය

අංක	අධ්‍යයන පාඨමාලාව	විශ්වවිද්‍යාලය	යෝජිත සිසුන් සංඛ්‍යාව
1	ජෛව පද්ධති තාක්ෂණවේදය (BST)	කැලණිය විශ්වවිද්‍යාලය	75
2	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	50
3	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	නැඟෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	100
එකතුව			225

- දැනට පවතින අධ්‍යයන පාඨමාලාවන් සඳහා වැඩි වූ සිසුන් ප්‍රමාණය

අංක	අධ්‍යයන පාඨමාලාව	විශ්වවිද්‍යාලය	යෝජිත සිසුන් සංඛ්‍යාව
1	පරිවර්තන අධ්‍යයනය	යාපනය විශ්වවිද්‍යාලය	10
2	පරිවර්තන අධ්‍යයනය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	7
3	ව්‍යාපාර විද්‍යාව	මොරටුව විශ්වවිද්‍යාලය	1
4	වෛද්‍ය විද්‍යාව	නැඟෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	6
5	වෛද්‍ය විද්‍යාව	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	1
6	ජෛවීය විද්‍යාව	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	3
7	භෞතීය විද්‍යාව	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	2
8	ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා)	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	15
9	ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා)	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	10
10	කෘෂිකර්මය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	1
11	ජෛව පද්ධති තාක්ෂණවේදය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	4
12	ඉංජිනේරු තාක්ෂණවේදය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	1
13	ආහාර විද්‍යාව හා තාක්ෂණය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	2
14	ශාරීරික අධ්‍යාපනය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	3
එකතුව			66

05. දැනට ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ පාසල් පද්ධතියට පළමු වසරට ඇතුළත් වන සිසුන්ගෙන් අවම වශයෙන් සියයට 50කටවත් ශාස්ත්‍රීය, වෘත්තීය හෝ තාක්ෂණික උසස් අධ්‍යාපනය තුළින් උපාධියක් හෝ උසස් අධ්‍යාපනයට ප්‍රවේශයක් ලබා ගැනීමට අවස්ථාව උදා කෙරෙනු ඇතැයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒක අපේ ඉලක්කයක්. එසේම ඒ, ඒ වෘත්තීය ක්ෂේත්‍රයන්ට ඇතුළත් වන සියලු සේවා සඳහා උපාධියක් පිරිනැමීමට අවශ්‍ය වන ව්‍යුහාත්මක මෙන්ම නෛතික ක්‍රියාමාර්ග ද මේ වනවිට සිදු කරමින් පවතිනවා. ඒ කියන්නේ, සම්ප්‍රදායික ක්ෂේත්‍රවලට අමතරව උසස් අධ්‍යාපනය ලබාගෙන උපාධියක් ලබා ගන්න කැමැති නම් ඒ සඳහා අවශ්‍ය මාර්ගයත් අපි සැලසුම් කරගෙන යනවා.

දැනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන හා අදාළ පනතක් මඟින් අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල් අධ්‍යාපනයෙන් ප්‍රවේශ වන සිසුන් වැඩිදෙනෙකුට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වන පරිදි රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය සහ අනෙක් උසස් අධ්‍යාපන ආයතන පද්ධතියේ මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීමටද අපි සැලසුම් කර තිබෙනවා.

ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු කථානායකතුමනි, විශ්වවිද්‍යාල පද්ධතිය කියන්නේ අපේ රටේ අනාගතය, ආර්ථිකයේ අනාගතය ගොඩනැඟෙන තැන. ඒ පිළිබඳව මා විසින් අසන ලද ප්‍රශ්නවලට ඉතා පැහැදිලිව හා සවිස්තරාත්මකව පිළිතුරු ලබා දීම පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමියට මම ස්තුතිවන්ත වෙනවා.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කුඩා තේ වතු හිමියන්: විස්තර
சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்கள்: விபரம்
TEA SMALLHOLDERS: DETAILS

15/2024

1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන් ලබා දුන් දායකත්වය ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට මුළු කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iii) කුඩා තේ වතු හිමියන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) කුඩා තේ වතු හිමියන්ගේ ජීවන මට්ටම උසස් කිරීම වෙනුවෙන් ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් සිදු කරනු ලබන කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்கள் 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கையின் மொத்த தேயிலை உற்பத்திக்கு வழங்கியுள்ள பங்களிப்பு, சதவீத அடிப்படையில் ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) தற்போதுள்ள சிறு தேயிலைத் தோட்ட உரிமை யாளர்களின் மொத்த எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்கள் தொடர்பில் செயற்படுகின்ற அரசாங்க நிறுவனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(v) சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களின் வாழ்க்கைத் தரத்தை மேம்படுத்துவதற்காக மேற்குறிப்பிட்டுள்ள நிறுவனம் ஒவ்வொன்றும் மேற்கொள்ளும் பணிப்பொறுப்புகள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House the -

(i) contribution made by the tea smallholders to the total tea production in Sri Lanka as a percentage from 2015 to the present, separately in respect of each year;

(ii) total number of tea smallholders, as at present;

(iii) number of government institutions dealing with tea smallholders;

(iv) names of those institutions; and

(v) functions performed by each of the aforesaid institutions to uplift the living standards of tea smallholders, separately?

(b) If not, why?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

වර්ෂය	සමස්ත නිෂ්පාදනය (නිමි තේ කිලෝග්‍රෑම් මිලියන)	කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය (නිමි තේ කිලෝග්‍රෑම් මිලියන)	කුඩා තේ වතු අංශයේ දායකත්වය (සමස්ත තේ නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස)
2015	328.96	239.86	72.91
2016	292.57	218.07	74.54
2017	307.72	232.417	75.53
2018	303.944	228.049	75.03
2019	300.133	225.728	75.21
2020	278.489	205.666	73.85
2021	299.338	223.197	74.56
2022	251.499	189.734	75.44
2023	256.088	190.66	74.45
2024	262.15	197.15	75.21

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

(ii) අපේ ගණනයට අනුව 2024.12.31 දිනට කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව 418,989කි.

(iii) 05කි.

(iv) 01. වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

02. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

03. ශ්‍රී ලංකා තේ මණ්ඩලය

04. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

05. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයේ (v) වන කොටසට ටිකක් දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. ඒ නිසා එම පිළිතුර සභාගත කරන්නද?

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු ඇමතිතුමනි, ඔබතුමා එම පිළිතුර සභාගත කරන්න. පුළුවන් නම් ඔබතුමන්ලා මෑත කාලයේදී කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ කියන කාරණා ටික highlight කරන්න.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, අපි කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් නැවත තේ වගාව සඳහා හෙක්ටෙයාරයකට රුපියල් 630,000ක් ලබා දෙනවා. එක් අයෙකුට උපරිම වශයෙන් හෙක්ටෙයාර 4ක් සඳහා අපි ආධාර ලබා දෙනවා. ඒ වාගේම අලුත් වගාව සඳහා හෙක්ටෙයාරයකට අපි රුපියල් 500,000ක් ලබා දෙනවා. හැබැයි, අපි ඒ මුදල ලබා දෙන්නේ අක්කරයක් සඳහා පමණයි. භෝග පුනරුත්ථාපනය සඳහා එක පැළයක් වෙනුවෙන් අපි රුපියල් 100ක් ලබා දෙනවා. සාමාන්‍යයෙන් අක්කරයකට පැළ 1,000ක් හිටවන්න ඕනෑ. ඒ අනුව අපි රුපියල් 100 බැගින් එක් අයෙකුට ලබා දෙන්නේ උපරිම වශයෙන් හෙක්ටෙයාරයකටයි.

ඒ වාගේම තේ පොහොර සහනාධාරයත් අපි ලබා දෙනවා. වෙළෙඳ පොළේ තේ පොහොර කිලෝග්‍රෑම් 50ක මිටියක් රුපියල් 9,000ක් වාගේ වෙනවා. අපි ඒ වෙනුවෙන් රුපියල් 4,000ක සහනාධාරයක් ලබා දෙනවා. 2025 අවුරුද්දේ අපි ඒ සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 2,800යි.

ඒ වාගේම අපි ආයතනයේ පෞද්ගලික වාණිජ පැළ තවාන් පවත්වාගෙන යනවා. ඒවා නියාමනය කරනවා. ප්‍රමිතියෙන් යුක්ත පැළ ලබා දීම් ආදිය කරනවා.

ගරු කථානායකතුමනි, පිළිතුරේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:*
**Rest of the Answer tabled:*

(v) කුඩා තේ වතු අංශයේ, කුඩා තේ වතු හිමියන් (අක්කර 10ට අඩු) සහ මධ්‍යම ප්‍රමාණයේ තේ වතු හිමියන් (අක්කර 10ට වැඩි) ලෙස ප්‍රධාන කණ්ඩායම් 2ක් ඇත. ඒ අනුව,

01. වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

- වැවිලි ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහාත් කුඩා තේ වතු හිමියන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහාත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධීකරණය කිරීම.
- ආයතනවල පනත් රෙගුලාසි අවශ්‍යතාව මත සකස් කිරීමට, සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සඳහා පියවර ගැනීම.
- ග්‍රාමීය තේ වගාව ප්‍රවර්ධනය හා කුඩා තේ වතු හිමියන් දිරි ගැන්වීම.
- කුඩා තේ වතු හිමියන් වෙත අවශ්‍ය පොහොර, තේ පැළ ආදිය ලබා දීමේදී ඊට අදාළ කටයුතු අධීක්ෂණය හා නියාමනය කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් සිදු කරන සංවර්ධන කටයුතු අධීක්ෂණය හා නියාමනය කිරීම.
- කුඩා තේ වතු හිමියන් සඳහා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

කුඩා හා මධ්‍ය පරිමාණ තේ වතු හිමියන්ගේ කෙටිකාලීන හා දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහ ජංගම යෙදවුම් (Mobile Applications) 2ක් සකස්කිරීම.

02. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

පෞද්ගලික (කුඩා තේ වතු) අංශයේ කළමනාකාරීත්වය යටතේ පවත්නා ඉඩම් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් ආධාර ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම.

- තේ නැවත වගාව හෙක්ටෙයාර 01ක් සඳහා රුපියල් 630,000ක්. (එක් අයෙක් සඳහා උපරිම බිම් ප්‍රමාණය හෙක්ටෙයාර 04)
- අලුත් වගාව හෙක්ටෙයාර 01ක් සඳහා රුපියල් 500,000 (එක් අයෙක් සඳහා උපරිම බිම් ප්‍රමාණය අක්කර 01ක්)
- භෝග පුනරුත්ථාපනය පැළ 01ක් සඳහා රුපියල් 100.00 බැගින් උපරිම අක්කරයකට පැළ 1,000ක් (එක් අයෙකුට හෙක්ටෙයාර 01)
- තේ පොහොර සහනාධාර යටතේ බෙදා හැරීම. (එක් කිලෝග්‍රෑම් 50 මිටියක් සඳහා රුපියල් 4,000.00ක සහනාධාරයක් ලබා දෙනු ඇත.)
- ආයතනික හා පුද්ගලික වාණිජ තවාන් පවත්වාගෙන යාම අධීක්ෂණය හා නියාමනය සිදු කිරීම.
- මව් වගාවන් පවත්වා ගෙන යාම.
- කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- තේ ශක්ති සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිලාභ ගෙවීම.
- ව්‍යාප්ති කටයුතු හා උපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම.
    - ගොවි පුහුණු වැඩසටහන්.
    - ඒක පුද්ගල ව්‍යාප්ති සේවාව.
    - pH පරීක්ෂාව.
    - වගා ආදර්ශන පවත්වා ගෙන යාම.
    - පිවිතුරු තේ දළු ක්‍රියාන්විතය සමිති මට්ටමින් හා කම්හල් පාදකව ක්‍රියාත්මක කිරීම.
    - පුද්ගලික අංශ සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන වැඩසටහන්.
    - තාක්ෂණික දැනුම බෙදා හැරීමට අදාළව අත්පත්‍රිකා හා අත් පොත් ලබා දීම.
    - සමාජ මාධ්‍ය මඟින් තේ වගාව පිළිබඳ දැනුම බෙදා හැරීම.

03. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

- තේ පර්යේෂණ ආයතනය ජනනය කළ නව තාක්ෂණය සහ දැනුම ලබා දීම සඳහා ව්‍යාප්ති සේවාවන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂකවරුන් පුහුණු කිරීම තුළින් සිදු කිරීම.
- අක්කර 10ට වැඩි කුඩා තේ වතු හිමියන්ට තේ පර්යේෂණ ආයතනය ජනනය කළ නව තාක්ෂණය සහ දැනුම පිළිබඳ උපදෙස් සහ ව්‍යාප්ති සේවාවන් සෘජුවම තේ පර්යේෂණ ආයතනය මඟින් ලබා දීම.
- කුඩා වතු හිමියන් තේ වගාව පිළිබඳව දැනුවත් කිරීම සහ තේ කර්මාන්තය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා කණ්ඩායම් සහ සන්නිවේදන ක්‍රියාකාරකම් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගීතාවයෙන් පැවැත්වීම.
- විශ්ලේෂණ සේවාවන් සහ අනෙකුත් සේවාවන් කුඩා තේ වතු අංශයේ දියුණුව සඳහා ලබා දෙන අතර, ඒවා පාංශු හා ශාක පෝෂක, පොහොර, කාබනික ද්‍රව්‍ය, පසෙහි pH අගය, නෙමටෝඩා රෝග විනිශ්චය සේවාව නැවත වගාවේදී පස පුනරුත්ථාපනය කරන කාලය මඟ හරවා සෘජු පැළ සිටුවීම සඳහා තීරණය කිරීමට පාංශු තත්ත්ව පරීක්ෂාව වේ.
- ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති විශේෂිත ගැටලු හඳුනා ගෙන විසඳුම් ලබා දීම සහ කුඩා තේ වතු අංශයේ ඉල්ලීම මත ක්ෂේත්‍රයේ අධ්‍යයන/ ක්ෂේත්‍ර සිදු කිරීම.
- රෝපණ ද්‍රව්‍යවල ඉල්ලුම සපුරාලීම සහ වැඩිදියුණු කළ තේ ප්‍රභේද ජනප්‍රිය කිරීම සඳහා, මව් ශාක ව්‍යාපෘතිය යටතේ කුඩා වතු හිමියන්ට වැඩි දියුණු කළ තේ ප්‍රභේදවල රිකිලි නිකුත් කිරීම.
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා එක්ව ගුණාත්මක තේ පැළ කුඩා තේ වතු හිමියන් ඇතුළු වගාකරුවන්ට ලබා දීම සඳහා අවසන් අදියරේ වූ වාණිජ තවාන් පරීක්ෂාව සිදු කිරීම.

  තේ පර්යේෂණ ආයතනය නිර්දේශ කරන කෘෂි පිළිවෙත් සහ නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දීම සඳහා චක්‍රලේඛ හා මාර්ගෝපදේශ සහ ප්‍රකාශන කුඩා තේ වතු හිමියන්ට ලබා දීම.

04. ශ්‍රී ලංකා තේ මණ්ඩලය

- තේ වගා සහනාධාර ව්‍යාපෘති යටතේ තේ වගාව ව්‍යාප්ත කිරීම සඳහා සහ දැනට පවතින තේ ඉඩම්වල ඵලදායීතාව ඉහළ ගැංවීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම.
- පැළ තවාන් ව්‍යාපාති ස්ථාපිත කිරීම සඳහා මුදල් ලබා දීම තුළින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ප්‍රමිතිගත තේ පැළ කුඩා තේ වතු හිමියන් වෙත ලබා දීම.
- ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දලු ප්‍රවාහනය සඳහා කර්මාන්තශාලා හා අමු තේ දලු වෙළඳුන් සඳහා ප්ලාස්ටික් කූඩ හා නයිලෝන් බෑග් මිලදී ගැනීම සඳහා සහනාධාර ලබා දීම.
- සුහුරු දලු නෙළන කණ්ඩායම් සහ කුලියට උපකරණ ලබා දීමේ මධ්‍යස්ථාන පිහිටුවීම.
- අමු තේ දලු වෙළෙඳුන් සඳහා දිස්ත්‍රික් මායිම් පැනවීම.
- කුඩා තේ වතු හිමියන් සඳහා කර්මාන්තශාලා මඟින් පොහොර බෙදා හැරීම.
- යාන්ත්‍රීකරණය අරමුණු කර ගනිමින් තේ නැවත වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ක්ෂුද්‍ර ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- උස් සෙවණ ස්ථාපිත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- අමු තේ දලු වෙළෙඳුන්ගේ තේ වෙළෙඳ බලපත්‍ර හිමිකාරිත්වය නියාමනය.

05. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

- කුඩා වතු හිමියන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම උදෙසා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් අමතර ආදායම් ඉපයීමට මඟ සැලසීම.

  තේ අස්වැන්න ඉහළ නැංවීමේ අරමුණින් තේ වගාව සම්බන්ධව තාක්ෂණික දැනුම ලබාදීම.

(ආ) අදාළ නොවේ.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමා ඔය කියපු කාරණා ටික මෙතෙක් කාලයක් හැම රජයක් තුළින්ම තේ කර්මාන්තය වෙනුවෙන් ලබා දීපු දායකත්වය. 2013-2014 වර්ෂවල තේ කර්මාන්තයේ නිෂ්පාදනය කිලෝ මිලියන 340ක් තිබුණා. මේ වෙනකොට ඔබතුමා කියපු විධියට එය 260ට අඩු වෙලා තිබෙනවා. ඒ අඩුවීමට ප්‍රධාන හේතුව පොහොර පිළිබඳව ගත්ත වැරදි තීන්දුවයි කියා මා හිතනවා. ඒ තීන්දුව නිසා තේ කර්මාන්තයේ අස්වැන්නේ අඩුවීමක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, රුපියල් 4,000ක සහනාධාරයක් දීම ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියන එක ඔබතුමාත් පිළිගන්න ඕනෑ. ඒක තමයි ඇත්ත කථාව. ඒ වාගේම ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් දන්නවා, රුපියල් 5,000ක් ලබා දීමත් ප්‍රමාණවත් නැති බව.

තේ කර්මාන්තය කියන්නේ අතීතයේ සිට අපේ රටට විශාල අපනයන ආදායමක් ලැබෙන කර්මාන්තයක්. නමුත්, අද වෙනකොට කොපමණ ප්‍රමාණයක් මේ කර්මාන්තය අතහැර යනවාද කියන එක ඔබතුමාගේ විග්‍රහය තුළ පැහැදිලි වෙනවා. මෑත කාලයේ තේ කර්මාන්තශාලා 200කට වඩා වැහිලා ගිහිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, ව්‍යාපාරය අතහැර දාලා තිබෙනවා. මම අහන්න කැමැතියි ඔය කියපු සිල්ලර ගණයේ කවුරුත් කරන දායකත්වයට වඩා, මහා පරිමාණයෙන් මේ තේ කර්මාන්තයේ නියැළී ඉන්න අහිංසක මිනිස්සු,- මොකද, මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කය කියන්නෙත් කුඩා තේ වතු හිමියන් විශාල ප්‍රමාණයක් ඉන්න ප්‍රදේශයක්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

වැඩියෙන්ම ඉන්න ප්‍රදේශයක්.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ඔව්, ලංකාවේ වැඩියෙන්ම කුඩා තේ වතු හිමියන් ඉන්න ප්‍රදේශයක්. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මෙම ව්‍යාපාරයේ ඉන්න නිසා එතුමා දන්නවා. එතුමා මට පැහැදිලි කරනවා. ගරු ඇමතිතුමනි, කුඩා තේ වතු හිමියන් මේ ව්‍යාපාරය අතහැර යන එක නතර කර ගන්න සාධනීය මැදිහත්වීමක් වෙන්න යම් අදහසක් අමාත්‍යාංශය පැත්තෙන් තිබෙනවාද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු නලින් හේවගේ මහතා
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයේ සැලකිය යුතු සත්‍ය කරුණු ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන්ම ඉතිහාසයේ තේ කර්මාන්තය හොඳ තැනක තිබුණා. ඔබතුමා කිව්වා වාගේ, 2013 වසරේදී නිමි තේ කිලෝ මිලියන 340ක ප්‍රමාණයක් තිබුණා. නමුත්, ගිය අවුරුද්දේ එය 262 දක්වා පහළට බැස්සා. එසේ පහළ

[ගරු නලින් හේවගේ මහතා]

බැස්සේ ඒ කාලයේ ගත්ත ප්‍රතිපත්තිමය කාරණා සහ ඔබතුමන්ලා හදපු වැඩ පිළිවෙළවල්වල, ඒ ආණ්ඩු හදපු වැඩ පිළිවෙළවල ප්‍රතිඵලයක් හැටියටයි කියන එක තමයි අපි කියන්නේ. සිල්ලර නොවෙයි, තොග ගණනින් හදපු වැඩ පිළිවෙළවල්. මොකද, පසුගිය කාලයේ ඔබතුමා කිව්වා වාගේම පොහොර තහනමක් ඒමත් එක්ක තේ කර්මාන්තය ඇතුළු අපේ රටේ කෘෂිකර්මාන්තයම දැවැන්ත අර්බුදයකට ගියා. එහෙම තිබියදී තමයි අපි මේ පොහොර සහනාධාරය නැවත ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. තේ කර්මාන්තයට විතරක් නොවෙයි, පොල් කර්මාන්තයටත් පසුගිය කාලයේ අර්බුදයක් ආවා. අවුරුදු 5ක් අපේ රජයේ වතුවලට පවා - සමහර වතුවලට - පොහොර දාලා තිබුණේ නැහැ. ඒ වතුවලටත් පොහොර සහනාධාරය ලබා දෙනවා.

ඒ වාගේම දැන් අපි ජාතික වැවිලි ප්‍රතිපත්තියක් සකස් කරමින් ඉන්නවා. තේ කර්මාන්තයටත් අපි පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් හදලා තිබෙනවා. නිමි තේ කිලෝ ප්‍රමාණය ගත්තොත්, මිලියන 262ක් තිබුණේ ගිය අවුරුද්දේ. මේ අවුරුද්දේ අපි බලාපොරොත්තු වෙනවා, නිමි තේ කිලෝ මිලියන 275 දක්වා ගෙන යන්න. මම පෞද්ගලිකව විශ්වාස කරනවා, 275ත් ඉක්මවන්න පුළුවන් කියලා. අපි හදපු පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මට අනුව 2030දී නිමි තේ කිලෝ මිලියන 400 දක්වා ගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

ඔබතුමා කියන ආකාරයට කුඩා තේ වතු හිමියන් සඳහා, කුඩා තේ වතු සංවර්ධනය සඳහා මීට වඩා හොඳ වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා අපි පිළිගන්නවා. අපේ වැඩ පිළිවෙළේ ඒ සඳහා අවශ්‍ය දේවල් තිබෙනවා. නැවත වගා කරවීම, පොහොර සහනාධාරය ලබා දීම, ඒ වාගේම නිසි ක්‍රමවේදයට දලු නෙළන්න අදාළ තාක්ෂණය ලබා දීම, නවීන යන්ත්‍රෝපකරණ ලබා දීම ආදී වැඩ පිළිවෙළවල් මේ සම්බන්ධයෙන් තිබෙන බව සඳහන් කරන්න කැමැතියි.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, මේ කාරණයත්. ඔය ලබා දෙන පොහොරවල ප්‍රමිතිය පිළිබඳව ගොවීන්ගේ මැසිවිල්ලක් තිබෙනවා. ඒ ගැන පොඩ්ඩක් අවධානය යොමු කරන්න. මොකද, මේ ක්ෂේත්‍රය මේ වෙනකොට ඩොලර් බිලියන 1.4ක අපනයන ආදායමක් ලබා ගන්නා විශාල ක්ෂේත්‍රයක්. මෙය පුළුල් කරන්න මහා ලොකු යෝජනා ගෙනෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. මෙය පුළුල් කරන්න වුවමනාව විතරයි අවශ්‍ය වෙන්නේ. මොකද, තේ වගාව කියන්නේ මේ රටේ දීර්ඝ කාලීන වගාවක්. මිනිස්සු ඒ වගාවෙන් බැහැර වෙන්නේ බැරිම තැන.

ඊළඟට මම මෙන්න මේ කාරණය දැන ගන්න කැමැතියි. ඉතිහාසයේ විවිධ රජයන් විසින් වතු ලබා දීලා තිබෙනවා, කර්මාන්තය දියුණු කරලා පවත්වාගෙන යන්න. උදාහරණයක් හැටියට කිව්වොත්, මා නියෝජනය කරන කොලොන්න මැතිවරණ කොට්ඨාසයේ එග්බර්ත් කියන වතුයාය, Maturata Plantations Limited වාගේ වතු සමාගම් ඒ ඉඩම් ගත්තාට දැන් තේ වවන්නේ නැහැ. ඒවායේ එක එක හෝටල් ව්‍යාපාර පවත්වාගෙන යන එක, එක එක ආයතනවලට බදු දෙන එක, පතල් කපන එක තමයි කරන්නේ. පතල් කපන එක නම් හොඳ වැඩක් කියමුකෝ. මොකද, කොහෙන් හරි ජාතික ආර්ථිකයට අපනයන ආදායමක් එකතු වෙනවා නේ. ඒ නිසා මේවා monitor කරන්න. ඒ යන වැඩසටහන් ගැන හොයා බලන්න. මොකද, රජයෙන් වතු දීපු සමාගම තවත් සමාගම් 10කට විතර lease කරලා ආපහු දීලා තිබෙනවා. ඒ නිසා ඒ වෙනුවෙන් නිසි වැඩ පිළිවෙළක් සකස් කිරීම සම්බන්ධයෙන් අනිවාර්යයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතුයි. එහෙම නැත්නම් වෙන්නේ, මේ රටේ වගා කළ යුතු බිම් ප්‍රමාණයක් වතු සමාගම් මිලදී ගෙන ඉතා සොච්චම් මුදලක් රජයට ගෙවලා පාඩුවේ පැත්තකට වෙලා ඉන්න එක. ඒ නිසා අපි දැන ගන්න කැමැතියි, ඒ සම්බන්ධව ඔබතුමන්ලාගේ අවධානය යොමු වෙලා තිබෙනවාද කියලා. මොකද, ඔබතුමන්ලාගේ රජය බලයට පත් වෙලා දැන් වසරක පමණ කාලයක් ගෙවී ගිහිල්ලා තිබෙනවා. වතු සමාගම්වල ඒ යන ක්‍රියාමාර්ගය නිසා රටේ ආර්ථිකයට ලොකු හානියක් වෙනවාය කියලා මම විශ්වාස කරනවා. මේ පිළිබඳව ඔබතුමාගේ අදහස දැන ගන්න කැමැතියි.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ඔබතුමා ඒ ප්‍රශ්නයෙන් අහපු කාරණා කිහිපයක් තිබෙනවා, පැහැදිලි කරන්න. පොහොර සහනාධාරය ගැන කිව්වොත්, ගොවීන්ගේ පැත්තෙන් ඒ පොහොර ප්‍රමිතියෙන් යුක්ත නැහැ කියන මැසිවිල්ලයි, නිසි වෙලාවට පොහොර ලැබෙන්නේ නැහැ කියන මැසිවිල්ලයි තිබෙනවා. ඒ සම්බන්ධව අපි නව රජය හැටියට සාකච්ඡා කරලා, මේ වෙනකොට තීන්දුවක් අරගෙන තිබෙනවා.

මෙච්චර කාලයක් පොහොර සහනාධාරය යටතේ ලබා දුන්නේ, සංස්ථාවේ පොහොර පමණයි. ගොවීන් කියනවා, ඒ පොහොරවලට වැඩිය අහවල් පොහොර හොඳයි, අහවල් පොහොර හොඳයි කියලා. ඒ හින්දා සමාගම් ගණනාවකින් පොහොර ලබා ගැනීමට හැකි වන පරිදි සහනාධාරය ලබා දෙන්න අපි මෙවර තීන්දු කරලා තිබෙනවා. එම සහනාධාරය පමාවකින් තොරව ලබා දීම සඳහා අපි QR code එකක් නිර්මාණය කරලා ඒක ජනතාවට ලබා දෙන්න සූදානම්. පසුගිය කාලයේ තෙල් ගැහුවේත් QR code එකක් මඟින් නේ. එතකොට, හැම කෙනෙක්ම තෙල් ගහගත්තා නේ. ඒ හින්දා තමන් කැමති සමාගමකින් පොහොර ටික ගන්න අදාළ QR code එක නිකුත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ලබන මාසය වෙනකොට අපි ඒ කාර්යය ආරම්භ කරනවා.

ඒ වාගේම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. අපේ රටේ ඉතිහාසයේ නම් තේ මඟින් විශාල ආදායමක් ලැබුණා තමයි. නමුත්, පසුගිය කාලයේ ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළවල්වල තිබුණු අසාර්ථකත්වයත් එක්ක තේවලින් ලැබෙන ආදායම පහළට වැටුණා. ගිය අවුරුද්ද ගත්තොත්, ඩොලර් බිලියන 1.42ක් තමයි තේ අපනයන ආදායම විධියට ලැබුණේ. හැබැයි, අපි ඔබට සතුටින් කියන්න කැමැතියි, මේ අවුරුද්දේ මුල් මාස 5යි, ගිය අවුරුද්දේ මුල් මාස 5යි සසඳනකොට, ගිය අවුරුද්දේ මුල් මාස පහේ තේ අපනයන ආදායම විධියට තිබුණේ ඩොලර් මිලියන 331ක්. හැබැයි මේ අවුරුද්දේ මුල් මාස පහේදී එය ඩොලර් මිලියන 434 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ හින්දා මේ අවුරුද්දේ එය වර්ධනය කර ගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා වාගේම විශ්වාස කරනවා.

ඒ වාගේම ඔබතුමා මේ ප්‍රශ්නයෙන් තව කාරණයක් ඇහුවා. ඒ තමයි, මහා පරිමාණ වතුවල ඌන උපයෝජිත ඉඩම් තිබෙනවා සහ වෙනත් වගාවලට සහ වෙනත් කාර්යයන්වලට එම ඉඩම් පාවිච්චි කරනවා, ඒකට මොකක්ද ගතහැකි ක්‍රියාමාර්ගය කියන එක. එම වතු වැවිලි සමාගම්වලට දෙනකොට ගිවිසුම් ගැහුවේ ඔබේ රජයන් තමයි. එක්සත් ජාතික පක්ෂ රජයන් තමයි ඒ ගිවිසුම් ගැහුවේ. ඒ ගිවිසුම් බරපතළයි. රජයට විශාල අවාසිදායක

තත්ත්වයන් ඇති වන පරිදි ගිවිසුම් ගහලා තිබෙනවා. ඊයේ කම්කරු ඇමතිතුමාත්, මමත් සහභාගි වෙලා, වැවිලි සමාගම්වල හාම්පුත්තුත් ගෙන්වලා අපි දීර්ඝ සාකච්ඡාවක් කළා, වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම ගැන සහ ඌන උපයෝජිත ඉඩම් වගා කටයුතු සඳහා වෙන් කරන්න. ඔබතුමා කෙසේ කීවත් මේ රටේ ආදායම වැඩි කරන්න නම්, එම ඉඩම් සඳහා අගය එකතු කිරීම් කරන්න ඕනෑ. ඒ හින්දා තේ වගාව සංචාරක ව්‍යාපාරයත් එක්ක බද්ධ කරන්න පුළුවන් නම්, තවත් දේවල් එක්ක බද්ධ කරන්න පුළුවන් නම්, වැවිලි කර්මාන්තයට අවාසිසහගත නොවන විධියට අපි ඒක කරන්න සූදානම්.

අපි ඊයේ වතු සමාගම් එක්ක සාකච්ඡා කළා. ඒ අනුව ඌන උපයෝජිත ඉඩම් තිබෙන්න පුළුවන්කමක් නැහැ. මේ අවුරුද්දට අදාළ අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළා, ඌන උපයෝජිත ඉඩම් සියල්ලම වගාවට ගත යුතුයි කියලා. ඒවා රජයේ වෙන්න පුළුවන්, පෞද්ගලික අංශයේ වෙන්න පුළුවන්, කෙනෙක් සතුව තිබෙන්න පුළුවන්, ඒවා රාජ්‍ය සම්පත්, ඒවා නිකරුණේ තියන්න පුළුවන්කමක් නැහැ, එම නිසා ඒ ඉඩම් වගා කරන්න ඕනෑ කියලා කිව්වා. ඒ අනුව අපේ අමාත්‍යාංශයේ ජනවසමට සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට අයිති ඌන උපයෝජිත ඉඩම් මැනුම් කටයුතු කරලා අවසන් කරලා, පළමු අදියර විධියට අපි ගිය සතියේ විනිවිදභාවයෙන් යුක්ත ක්‍රමයකට පත්තරේ ප්‍රසිද්ධ දැන්වීම් දැම්මා, හෙක්ටෙයාර ගණනක් කැමති ආයෝජකයෝ ඉන්නවා නම් බදු අරගෙන වගා කරන්න කියලා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයට සුදුසු, අතහැර දමා තිබෙන බංගලා තිබෙනවා, ඒවා ගන්නවා නම් ගන්න කියලා. මේ රටට ආදායම එන්න ඒවා පාවිච්චි කරනවා.

ඒ වාගේම ඊයේ වතු හාම්පුතුන්ට අපි පැහැදිලි කළා, ඔබේ සමාගම් සතුව තිබෙන වගා නොකළ සියලු ඉඩම් අනිවාර්යයෙන් ඔබ වගා කරන්න ඕනෑ, එක්කෝ අතුරු බදු දෙන්න ඕනෑ කියලා. එහෙම නොදුන්නොත්, රජය හැටියට ක්‍රියාමාර්ගයක් අරගෙන අනිවාර්යයෙන් අපි ඒවා වගා කරන තැනට කටයුතු කරනවාය කියන එක අපි එතුමන්ලාට පැහැදිලි කළා සහ අපි ඒක කරනවාය කියන එක ඔබතුමාටත් පැහැදිලි කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -117/2024 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -1253/2025- (1), ගරු මංජුල සුරවීර ආරච්චි මහතා.

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1254/2025- (1), ගරු ඊ.එම්. බස්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති: ගම්පහ ප්‍රා.ලේ. කොට්ඨාසය
நகர அபிவிருத்தி அதிகாரசபையால் அமுல்படுத்தப்பட்ட கருத்திட்டங்கள்: கம்பஹா பிரதேச செயலாளர் பிரிவு
PROJECTS IMPLEMENTED BY URBAN DEVELOPMENT AUTHORITY: GAMPAHA DS DIVISION

1255/2025

5. **ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතරින් මේ වන විට වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියේ නම, ක්‍රියාත්මක කරන ලද ග්‍රාම නිලධාරි වසම, ආරම්භ කරන ලද වර්ෂය, අවසන් කරන ලද වර්ෂය, වියදම් කරන ලද මුදල සහ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතරින් මේ වන විට වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ව්‍යාපෘතියේ නම, වියදම් කරන ලද මුදල සහ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ලසිත් භාෂණ ගමගේ මහතා]

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நகர அபிவிருத்தி அதிகாரசபையால் கம்பஹா பிரதேச செயலாளர் பிரிவில் அமுல்படுத்தப்பட்ட கருத்திட்டங்களில் இதுவரை வேலைகள் பூர்த்தி செய்யப்பட்டுள்ள கருத்திட்டங்களின் எண்ணிக் கை யாது;

(ii) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்தினதும் பெயர், அமுல்படுத்தப்பட்ட கிராம அலுவலர் பிரிவு, ஆரம்பிக்கப்பட்ட ஆண்டு, நிறைவு செய்யப்பட்ட ஆண்டு, செலவிடப்பட்ட தொகை மற்றும் தற்போதைய நிலைமை வெவ்வேறாக யாது;

(iii) நகர அபிவிருத்தி அதிகாரசபையால் கம்பஹா பிரதேச செயலாளர் பிரிவில் அமுல்படுத்தப்பட்ட கருத்திட்டங்களில் இதுவரை வேலைகள் பூர்த்தி செய்யப்படாதுள்ள கருத்திட்டங்களின் எண்ணிக்கை யாது;

(iv) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்தினதும் பெயர், செலவிடப்பட்ட தொகை மற்றும் தற்போதைய நிலைமை வெவ்வேறாக யாது;

(v) நகர அபிவிருத்தி அதிகாரசபையால் மேற்படி பிரதேச செயலாளர் பிரிவில் எதிர்காலத்தில் அமுல்படுத்த உத்தேசிக்கப்பட்டுள்ள கருத்திட்டங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House the -

(i) number of projects that have been completed so far, out of those implemented by the Urban Development Authority (UDA) in the Gampaha Divisional Secretary's Division;

(ii) name of each such project, the Grama Niladhari Division in which each project was implemented, the year of commencement, the year of completion, the amount spent, and the current status, separately;

(iii) number of projects that have not been completed, out of the projects implemented by the UDA in the Gampaha Divisional Secretary's Division;

(iv) name, the amount spent and the current status, separately in respect of each such project; and

(v) projects proposed for implementation in the above-mentioned Divisional Secretary's Division by the UDA in future?

(b) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ප්‍රශ්නය තුළ මෙම ගැටලුවට අදාළ කාලවකවානු පැහැදිලිව සඳහන් නොවුණත් ආසන්න වශයෙන් පසුගිය අවුරුදු 8ක කාලය තුළ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තරයක් ඇමුණුම 01හි දක්වා තිබෙනවා. ප්‍රධාන ව්‍යාපෘති 6ක් පිළිබඳ විස්තර එහි සඳහන්ව තිබෙනවා. උදාහරණයක් හැටියට ගන්න පුළුවන්, හෙනරත්ගොඩ උද්භිද උද්‍යාන ඇවිදින මංතීරු ව්‍යාපෘතිය. ඒ ආදි වශයෙන් එකී ප්‍රධාන ව්‍යාපෘති 6 පිළිබඳ තොරතුරු ඇතුළත් ඇමුණුම 01 පහත දක්වා තිබෙනවා.

*ඇමුණුම 01**

අංක	ව්‍යාපෘතියේ නම	ග්‍රාම නිලධාරී වසම	ආරම්භ කළ වසර	අවසාන කළ වසර	වියදම් වූ මුළු මුදල	වෙනත් විශේෂ කරුණු
01	හෙනරත්ගොඩ උද්භිද උද්‍යාන ඇවිදින මංතීරු ව්‍යාපෘතිය.	මැදගම අංක (2) ග්‍රා. නි. වසම	2021	2022	20.6M	වැඩ අවසන් කර ගම්පහ නගර සභාව වෙත භාර දී ඇත.
02	යක්කල වික්‍රම් උයන ඇවිදින මංතීරු ව්‍යාපෘතිය	වීදියවත්ත	2021	2022	71.35M	වැඩ නිම කර ගම්පහ යක්කල වික්‍රමආරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලය වෙත භාරදී ඇත.
03	ගම්පහ බෞද්ධාලෝක මාවත ආදර්ශ මාර්ගය අලංකරණ ව්‍යාපෘතිය	මැදගම (1) මැදගම (2) ග්‍රා.නි. වසම්	2021	2022	34.01M	වැඩකටයුතු නිම කර ගම්පහ නගර සභාවෙත භාර දී ඇත.
04	ඔරුතොට ඇවිදින මංතීරු ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	මැදගම (2), බැන්ඩියමුල්ල (බටහිර) ග්‍රා.නි. වසම්	2021	2023	33.47M	ගේබියන් පැති බැම් ප්‍රතිස්ථාපනය කිරීම හා පිළිසකර කටයුතු නිම කර ඇත.
05	ගම්පහ ගෘහස්ත වොලිබෝල් ක්‍රීඩාංගනය ව්‍යාපෘතිය (සියත අදියර - I)	මැදගම (2) ග්‍රා.නි. වසම	2021	2023	44.35M	රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමේ චක්‍රලේඛනය අනුව ව්‍යාපෘතියේ අයිතමයන් සීමා කළ අතර ක්‍රීඩා කටයුතු සිදු කළ හැකි මට්ටමට වැඩ කටයුතු නිමකර ගම්පහ නගර සභාව වෙත බාර දී ඇත. කෙසේ වෙතත් මෙහි වහලය ඉදිකිරීම ඇතුළත්ව ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් නොකළහොත් දැනට නිම කර ඇති කණු හා පාදම දිරාපත් වන අතර නගරයේ අලංකාරයට හා ක්‍රමවත් භාවයට සෘජුව බලපෑමක් සිදුවේ.
06	ගම්පහ සියත උයන පාරිසරික හා භූ දර්ශන ව්‍යාපෘතිය අදියර - I	ඉහලගම බටහිර මැදගම (2) ග්‍රා.නි. වසම්	2018	2018	4.77M	අදියර I යටතේ සමස්ථ ව්‍යාපෘතිය සඳහා ජල කළමනාකරණ සැලස්මක් සකස් කරන ලදී.
	අදියර - II	ඉහලගම බටහිර මැදගම (2) ග්‍රා.නි. වසම්	2018	2019	62.42M	අදාළ ජල කළමනාකරණ සැලස්මට අනුව දිය පොකුණු, එය වටා ඇවිදින මංතීරුව සකසා ව්‍යාපෘතියට අවශ්‍යවන පරිදි භූමිය සකස් කරන ලදී. නමුත් මධ්‍යම අධිවේගී මාර්ගයේ ගමපහ යක්කල මාර්ග පිවිසුම මෙම ව්‍යාපෘති භූමිය හරහා ඉදිකිරීමට යෝජිත බැවින් ද ඊට සමගාමීව යක්කල මාර්ගය පුළුල් කිරීමටද යෝජිත බැවින්ද එම කටයුතු නිම වන තුරු ව්‍යාපෘතියේ වැඩ කටයුතු නතර කර ඇත.

(ii) ඇමුණුම 01හි දක්වා ඇත.

මා ඉදිරිපත් කරපු එම ඇමුණුමෙහි ඒ එක් එක් ව්‍යාපෘතියෙහි නම, ග්‍රාම නිලධාරී වසම, ආරම්භ කළ වසර, අවසාන කළ වසර, වියදම් වූ මුළු මුදල සහ වෙනත් විශේෂ කරුණු සම්බන්ධයෙන් තිබෙන තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ගම්පහ සියත උයන පාරිසරික හා භූ දර්ශන ව්‍යාපෘතිය. එය

[*මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
*[*இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[*This annex is also placed in the Library.]*

අදියර I සහ II වශයෙන් ඉහළගම බටහිර මැදගම (2) ග්‍රාම නිලධාරි වසම තුළයි ක්‍රියාත්මක වන්නේ. 2018දී ආරම්භ කරලා, 2018දී සහ 2019දී පිළිවෙළින් අවසන් කරලා තිබෙනවා, එම ව්‍යාපෘතියේ අදියර I සහ II. අදියර I සඳහා මිලියන 4.77ක් ද, අදියර II සඳහා මිලියන 62.42ක් ද වියදම් කරලා තිබෙනවා. ඒ ආදි වශයෙන් ඒ සියලු ව්‍යාපෘති සම්බන්ධ විස්තර ඇමුණුම 01හි දක්වා තිබෙනවා.

(iii) ව්‍යාපෘති 2ක් තිබෙනවා. ඒ ව්‍යාපෘති 2 පිළිබඳ තොරතුරු මම ඉදිරිපත් කරනවා. එකක් තමයි, ගම්පහ පොදු වෙළෙඳ සංකීර්ණය ව්‍යාපෘතිය. එය ආරම්භ කර තිබෙන්නේ 2021 වර්ෂයේ. අවසන් කිරීමට නියමිත වෙලා තිබෙන්නේ 2026 අගෝස්තු මාසයේ. සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදල මිලියන 634ක් වෙනවා. අනෙක් එක, මාකෙවිට නෙළුම්විල ඇවිදින මංතීරු ව්‍යාපෘතිය. එය 2021 වර්ෂයේ ආරම්භ කරලා 2027 වර්ෂයේදී අවසන් වීමටයි නියමිතව තිබෙන්නේ. මිලියන 26.14ක් තමයි ඇස්තමේන්තු වියදම.

(iv) එයට පිළිතුර ඇමුණුම 02හි දක්වා තිබෙනවා. ඒ පිළිබඳ තොරතුරු මම දැනටමත් සඳහන් කර තිබෙනවා.

*ඇමුණුම 02**

අංක	ව්‍යාපෘතියේ නම	ග්‍රාම නිලධාරී වසම	ආරම්භ කළ වසර	අවසන් කිරීමට නියමිත වසර	ඇස්තමේන්තුගත මුදල	වෙනත් විශේෂ කරුණු
01	ගම්පහ පොදු වෙළඳ සංකීර්ණය	මැදගම (1) ග්‍රා. නි. වසම	2021-09-29	2026/08/15	634.00M	ව්‍යාපෘතියේ අදියර I ලෙස පොදු වෙළඳපොළෙහි වෙළෙන්දන් තාවකාලිව ප්‍රතිස්ථාපනය කරන ලදී. මේ වන විට ව්‍යාපෘතියේ II අදියර ක්‍රියාත්මක වන අතර පොදු වෙළඳ පොළ ව්‍යාපෘතියේ III වන අදියර සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නියමිතය. එමගින් පොදු වෙළඳපොළ ගොඩනැගිල්ල භාවිතයට විවෘත කළ හැකි ලෙස වහලය සහිතව වැඩ නිම කිරීමට නියමිත වේ.
02	මාකෙවිට නෙළුම්විල ඇවිදින මංතීරු ව්‍යාපෘතිය	මාකෙවිට (උතුර)	2021	2027	26.14M	අදියර I අවසන් කර ඇත. ව්‍යාපෘති ප්‍රදේශයට ප්‍රවිශ්ඨ වන ඉඩම් සම්බන්ධ ගැටළුවක් ඇති අතර අත්පත්කර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත.

(v) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ව්‍යාපෘති ගණනාවක් සැලසුම් කර තිබෙනවා. ගමනාගමනය මුල් කරගත් සංවර්ධනය සඳහා වන බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය, වාහන නැවතුම් ස්ථාන, පදික මංතීරු හා පාපැදි මංතීරු ව්‍යාපෘති උදාහරණ වශයෙන් දක්වන්න පුළුවන්. ඒ සැලසුම් කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් වන තොරතුරු ඇමුණුම 03 හැටියට පහත දක්වා තිබෙනවා.

*ඇමුණුම 03**

වර්ගීකරණය	ව්‍යාපෘතියේ නම	ග්‍රාම නිලධාරි කොට්ඨාශය
	උපායමාර්ගය 1. ගමනාගමනය මුල් කරගත් සංවර්ධනය	
ගමනාගමනය වැඩිදියුණු කිරීම	1. බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය	මැදගම I , මැදගම II, මැදගම III, මැදගම IV (ගම්පහ නගර මධ්‍යය)
	2. වාහන නැවතුම් ස්ථාන (Park & Ride)	
	3. පදික මංතීරු හා පා පැදි මංතීරු ව්‍යාපෘතිය	
මිශ්‍ර සංවර්ධන	1. වාණිජ පර්ෂද සංවර්ධනය	
	I. නගර වෙළෙඳපොළ පුනර්ජීවන ව්‍යාපෘතිය හා සාප්පු සංකීර්ණ සංවර්ධන ව්‍යාපෘතිය	මැදගම 01 (ගම්පහ නගර මධ්‍යය)
	II. වාණිජ සංකීර්ණ සංවර්ධන ව්‍යාපෘතිය	
සංක්‍රමණික නේවාසික සංවර්ධනය (Transit Neighborhood Development)	2. සංක්‍රමණ කේන්ද්‍රය (Transit core) තුළ දැරිය හැකි නිවාස සංවර්ධන ව්‍යාපෘතිය	
	I. සියත මධ්‍යම ආදායම් ලාභී නිවාස සංවර්ධන ව්‍යාපෘතිය.	මැදගම 04
	II. වැරැල්ලවත්ත මධ්‍යම ආදායම් ලාභී නිවාස සංවර්ධන ව්‍යාපෘතිය.	යක්කල බටහිර
අනු නගර සංවර්ධනය	උපායමාර්ගය 2. තරඟකාරී චන්ද්‍රිකා නගර පර්ෂද ඇති කිරීම	
	3. ගනේමුල්ල නේවාසික චන්ද්‍රිකා නගර සංවර්ධනය	
	I. ගනේමුල්ල බස්රථ අංගන සංවර්ධන ව්‍යාපෘතිය.	ගනේමුල්ල උතුර
	II. ගනේමුල්ල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	ගලහිටියාව නැගෙනහිර
	III. ගනේමුල්ල රථවාහන නැවතුම්පළ සහ දුම්රියපළ සංවර්ධන ව්‍යාපෘතිය.	ගලහිටියාව නැගෙනහිර
	4. යක්කල වාණිජ චන්ද්‍රිකා නගර සංවර්ධනය	
	I. යක්කල ආර්කේඩ් සුපිරි වෙළඳසැල් සංවර්ධන ව්‍යාපෘතිය (Shopping Arcade Development)	යක්කල බටහිර
	II. යක්කල නගර මුහුණත සංවර්ධන ව්‍යාපෘතිය (Façade Improvement project)	යක්කල නගර මධ්‍යය
	5. වැලිවේරිය සේවා නගර සංවර්ධනය	
	I. වැලිවේරිය නගර මධ්‍යය සංවර්ධන ව්‍යාපෘතිය.	වැලිවේරිය නගර මධ්‍යය
	II. වැලිවේරිය නගර මුහුණත සංවර්ධන ව්‍යාපෘතිය. (Façade Improvement project)	
ආයෝජන ආකර්ෂණය සහ ආර්ථික සංවර්ධනය	උපායමාර්ගය 3. අගය එකතු කරන ලද ආයුර්වේද හා කෘෂි කලාප සංවර්ධනය	
	6. අගය එකතු කරන ලද අන්නාසි තිර සංවර්ධන ව්‍යාපෘතිය	බැලුම්මහර
	7. විකුම් උයන ඔසු උයන සංවර්ධන ව්‍යාපෘතිය	විදියවත්ත
	8. හෙනරත්ගොඩ උද්භිද උද්‍යාන ඇවිදීමේ මංතීරු "මල් වීදිය" ව්‍යාපෘතිය	මැදගම
ආයෝජන ආකර්ෂණය සහ ආර්ථික සංවර්ධනය	9. පුද්ගලික අධ්‍යාපන හා වෘත්තිය පුහුණු ආයතන පර්ෂද සංවර්ධන ව්‍යාපෘතිය.	මැදගම
	10. ගෘහස්ථ ක්‍රීඩාංගන සංවර්ධන ව්‍යාපෘතිය	මැදගම
	11. සිසු හිතකාමී කොරිඩෝ, එළිමහන් විවෘත අවකාශ, , විවෘත පුස්තකාල ඇති කිරීම.	නගරාශ්‍රිතව
	12. සිසු නේවාසිකාගාර සංවර්ධන ව්‍යාපෘති.	මැදගම
අගනගර අලංකරණය	13. ගම්පහ නගරයේ අගනගර ලාක්ෂනිකයන් මැනවින් පිළිබිඹු වන පරිදි සිදුකරන භූ දර්ශන ව්‍යාපෘති.	ගම්පහ නගරය ආශ්‍රිතව
	14. ගම්පහ - කොළඹ බස් නැවතුම්පොළ සහ දුම්රිය ස්ථාන ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් වීදි වැඩිදියුණු කිරීම් සහ භූමි අලංකරණය	
	15. අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් ලෙස සැලකෙන ගම්පහ නගරයේ විශේෂත්වය වැඩි දියුණු කිරීම සඳහා ගම්පහ - ජා ඇල වටරවුම සංකේතාත්මකව භූ දර්ශනය කිරීම.	
	16. ගම්පහ - ඔරුතොට පාර සහ ගම්පහ - මිනුවන්ගොඩ නව මාර්ගය ඔස්සේ නගරයට ප්‍රධාන පිවිසුම ඔස්සේ නගරයේ දර්ශනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා භූ දර්ශනය කිරීම සහ නගරයට විවර වන දුම්රිය රක්ෂිත භූ දර්ශනය කිරීම.	
	17. සියත උයන පරිසර උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය	ඉහළගම බටහිර , මැදගම

[*මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
*[*இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[*This annex is also placed in the Library.]*

(ආ) අදාළ නොවේ.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

ගරු අමාත්‍යතුමනි, මම මෙහිදී නාගරික සංවර්ධන අධිකාරිය කරගෙන ගිය ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 2ක් උදාහරණ විධියට ගන්නම්. ඒවා තමයි, මාකෙවිට නෙළුම්විල ඇවිදින මංතීරු ව්‍යාපෘතිය සහ ගම්පහ සියත උයන ඇවිදින මංතීරු ව්‍යාපෘතිය. ඒ ව්‍යාපෘති 2 ම අතරමඟ ඇන හිට තිබෙනවා. ඒවාට විශාල මුදලක් වැය කර තිබෙනවා. උදාහරණයක් හැටියට, සියත උයන ඇවිදින මංතීරු ව්‍යාපෘතිය අත් හරින්න හේතුව හැටියට දක්වා තිබෙන්නේ, Expressway entrance එක ඉදි කිරීමට යෝජිත වීමයි. එතකොට මුලදී ඒ ගැන සොයා බැලීමක් කර නොවෙයි ද, ඒ ව්‍යාපෘති ආරම්භ කළේ? එවැනි ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. එය එසේ තිබියදී මගේ ප්‍රශ්නය යොමු වන්නේ ගම්පහ නගර මධ්‍යයේ ඉදි වන පොදු වෙළෙඳ සංකීර්ණය සම්බන්ධයෙනුයි. එය ඉදි කරන්න පටන් ගත්තේ 2021දීයි.

හැබැයි, අප ඒ සම්බන්ධයෙන් ගම්පහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී විමසූ අවස්ථාවේදී මුලදී වාචිකව පිළිතුරක් ලබා දුන්නා, මේ වසර තුළ එය ලබා දීමට හැකියි කියලා. පසුව ඒ ගැන කියැවුණා, එය complete කරන්න - සම්පූර්ණයෙන් අවසන් කරන්න - ලබන වසරේ අගෝස්තු මාසය වනකල් කාලය දීර්ඝ වෙනවා කියලා. ගරු ඇමතිතුමනි, මෙච්චර කාලයක් එම ව්‍යාපෘතිය ඇදී යෑමට හේතුව මොන වාගේ කාරණයක්ද කියන එක මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, එම ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙන්නේ 2021 වසරේයි. අවසන් කිරීමට නියමිත වසර හැටියට තමයි 2026 අගෝස්තු 15 වෙනි දා කියා සඳහන් කර තිබෙන්නේ. ඒ වාගේම එය අදියර තුනකින් තමයි ක්‍රියාත්මක වන්නේ. 1 අදියර මේ වනකොට සම්පූර්ණ කරලා තිබෙනවා, වෙළෙන්දන් තාවකාලිකව ස්ථාපනය කරලා. අපි අදියර කිහිපයකින් එය නිම කරන්න බලාපොරොත්තු වනවා. ඇත්තටම එම ව්‍යාපෘතිය 2021දී ආරම්භ කළත්, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලංකාව පුරා ආරම්භ කරපු ව්‍යාපෘති බොහොමයක් නතර කරලා තිබුණා. නතර කරලා තිබෙන ඒ ව්‍යාපෘතිවලින් ගණනාවක් නැවත ආරම්භ කරන්න මේ අවුරුද්දේ අය වැයෙන් මුදල් වෙන් කළා. ඒ අනුව ගම්පහ පොදු වෙළඳ සංකීර්ණය සඳහා මිලියන 107ක් වෙන් කර තිබෙනවා. දැන් ඒ සඳහා ටෙන්ඩර් කැඳවා තිබෙනවා. මේ මාසයේ 18 වෙනි දා වෙනකොට ඒ tenders open කරලා, ඒ ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කරන්න අපට පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවන අතුරු ප්‍රශ්නයත් අහන්න.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
ගරු කථානායකතුමනි, එපමණයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 4 -1254/2025- (1), ගරු ඊ.එම්. බස්නායක මහතා.

ගරු ඊ.එම්. බස්නායක මහතා
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

1990දී එල්ටීටීඊය විසින් මුස්ලිම් වන්දනාකරුවන් පිරිසක් ඝාතනය කිරීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීම
1990ஆம் ஆண்டு விடுதலைப் புலிகளால் படுகொலை செய்யப்பட்ட முஸ்லிம் யாத்திரிகள் தொடர்பான விசாரணை
CONDUCT OF INQUIRY INTO THE KILLING OF MUSLIM PILGRIMS BY LTTE IN 1990

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා මෙම ප්‍රශ්නය ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා.

1990 වර්ෂයේ කලවංචිකුඩි පොලිස් බල ප්‍රදේශයේ කුරුක්කල්මඩම් ගම්මානයේ මුස්ලිම් ජාතිකයින් පිරිසක් මක්කම වන්දනා කර ආපසු කොළඹ-මඩකලපුව ප්‍රධාන පාරේ තම නිවෙස් කරා වාහනයෙන් පැමිණෙමින් සිටියදී එහි සිටි බාල, මහලු, තරුණ සියලු මුස්ලිම් භක්තිකයින් 1990 ජූලි මාසයේ 12 වෙනි දින කොටි සංවිධානය විසින් පැහැරගෙන ගොස් මරා දමා වළලා ඇත.

එම අවස්ථාවේදී මෙම සිද්ධිය එම අයගේ ඥාතියෙකු වන හිටපු කාත්තන්කුඩි නගර සභා මන්ත්‍රී සහ අපේ පක්ෂයේ සංවිධායක වන අල්හාජ් අබ්දුල් මජීඩ් මොහමඩ් රවුෆ් මහතා විසින් කලවංචිකුඩි පොලිස් ස්ථානයට පැමිණිලි කර සිටින ලද අතර, එම පැමිණිල්ලට අනුව කලවංචිකුඩි මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක බී/172/14 දරන අංකය යටතේ නඩුවක් ගොනු කරන ලදී. මෙම නඩුව විභාග කිරීමෙන් අනතුරුව වහාම වළ දමා ඇති සියලු මිනී ගොඩගෙන ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුකූලව අවශ්‍ය සියලු කටයුතු සිදු කරන ලෙසටත්, එම ප්‍රදේශය සම්පූර්ණයෙන් ආරක්ෂා සහිතව තබන ලෙසටත්, ඒ සඳහා සියලු කටයුතු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - Office on Missing Persons - හරහා සිදු කරන ලෙසටත් ගරු මහෙස්ත්‍රාත්තුමා විසින් නියෝගයක් ලබා දී ඇත.

මේ සිද්ධියේදී මුස්ලිම් ජනතාව 170ක් පමණ මරා දමා ඇති බව විශ්වාස කර සිටිනවා.

ගිය සතියේ ගරු ඇමතිතුමා මඩකලපුව දිස්ත්‍රික්කයේ මේ ප්‍රදේශයට පෞද්ගලිකව ගිහින් සංචාරය කර නිරීක්ෂණය කළාට මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු අමාත්‍යතුමනි,

(i) මෙම නියෝගය පරිදි කඩිනම් පරීක්ෂණයක් පැවැත්වීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට - OMP - අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන්කර දීමට ඔබතුමා කටයුතු කරනවාද?

(ii) එම කටයුතු නවීන තාක්ෂණය (drones, scanners වැනි නවීන උපකරණ මඟින්) භාවිත කර කඩිනම් කරදීමට ඔබතුමා කටයුතු කරනවාද?

(iii) ඒ වාගේම ඇටර්නි ජනරාල් දෙපාර්තමේන්තුව හා අනිකුත් රජයේ ආයතන තුළින් අවශ්‍ය සහයෝගය ලබා ගැනීම සඳහා ඔබතුමා කටයුතු කරනවාද? මියගිය අයගේ මෘත ශරීර ගොඩගැනීමෙන් පසුව ඉස්ලාම් ආගමට අනුව භූමදාන කටයුතු සිදු කිරීමට අවශ්‍ය දේ කරනවාද?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්න තුනටම උත්තරය "ඔව්" කියන එකයි.

But, now, I will explain the steps I have taken without just saying “Yes.” And, thank you very much for raising this very important and timely Question.

(i) Basically, the reason why I visited that area is this. In 2014 when the case was started off, the Office on Missing Persons - OMP - had not been established; the OMP was established only around 2018. Then, they intervened. At that point, during Gotabaya Rajapaksa’s regime, for some reason, the matters did not proceed. I will leave it at that. We all know the reasons for it. So, we will leave it at that.

Therefore, I am very grateful to the people who have petitioned again to revive the matter. Then, the OMP went there. On the 26th of August, 2025, an expert team including Judicial Medical Officers, forensic anthropologists and archaeologists submitted a request to the Court to go to the mass grave site, as per the Order made. Even now, as we speak, that team is visiting that place; I was told that they were going there and the OMP is handling everything. Based on their findings, they will submit an interim report and then, the Magistrate will give the order for excavation and exhumations.

Then, the budget. Those experts are the ones who give us the budget on everything that is necessary. When that is submitted to the Ministry through proper channels, I will approve the funds. We have enough funds, and this matter will never be sidelined. So, there is enough funds. Even the inquiry into the Chemmani mass graves is proceeding with great speed because of continuous funding. So, funds would be there.

(ii) Hon. Member, the means and methods of inquiry, as you know, would be decided based on the opinions of the experts including JMOs, forensic anthropologists, archaeologists, the police, crime scene investigators and in accordance with international protocols. My Ministry will fully facilitate the process, using modern and advanced technologies to ensure accuracy, efficiency and the preservation of evidence. These technologies would enable more targeted and minimally invasive excavations, minimizing the risk of damaging potential evidence and ensuring that the process adheres to international best practices and Standard Operating Procedures in forensic archaeology and human rights investigations. The ultimate objective is to ensure a scientifically rigorous and transparent excavation process which upholds judicial inquiry and delivers justice to the families of the victims. So, I assure you that it will be done, that we will use technology, and if we do not have the necessary technology here, we will ask our international friends to provide that to us. Anyway, we will do so.

(iii) The Court will determine the collaboration of relevant government institutions, including the Attorney-General, but it would not be limited to him. The Attorney-General would only be one and a main person involved, but subject matter experts would ensure that the excavation process is carried out in full compliance with legal and procedural standards. That multi-disciplinary and inter-agency approach will be adopted to strengthen the credibility, transparency and legal integrity of the entire process, from investigations to potential judicial proceedings. In fact, the Office for Reparations and the Office on Missing Persons have already formulated some proposals to be submitted to our international partners including the UN agencies, seeking their expertise and help. We are not going to leave any stone unturned. If we do not have the expertise, we have to get it from where it is available, and we are fully open for that. So, whatever technology needed, drones or otherwise, would be provided.

Then, the last rites of the victims. The entire process would ensure that utmost respect and compassion for the victims and their families are considered an important principle of it. Once ante-mortem data - as you know, we have to collect ante-mortem data and make sure that we have saved all the evidence - is collected and once the Court determination is made based on the scientific process, then, most definitely, in consultation with the religious leaders of the area, the civil society organizations and their families, we will grant the victims the most respectful last rites they deserve according to their religion. And, my Ministry is fully aware of the profound emotional impact that this situation has. Therefore, all activities related to their identification and the final rites of the remains would be conducted with the highest degree of confidentiality and sensitivity.

The main goal is to reveal the truth, provide answers to their families and communities, honour the memory of the deceased and to uphold human dignity throughout the process.

So, the short Answer to your whole Question is "Yes" and hoping that the Weather God does not come in the way, by October, this process should be able to be started.

Thank you.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

Thank you so much for your efforts and everything, in this regard. Hon. Minister.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

II

වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම
வலிகாமம் வடக்கு பிரதேச செயலாளர் பிரிவில் இடம்பெயர்ந்த மக்களின் மீள்குடியேற்றம்
RESETTLEMENT OF DISPLACED PEOPLE IN VALIKAMAM NORTH DS DIVISION

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் சனாதிபதியும் பாதுகாப்பு அமைச்சருமான மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

யாழ்ப்பாண மாவட்டம், வலிகாமம் வடக்குப் பிரதேச செயலாளர் பிரிவின்கீழ் வரும் 13 கிராம அலுவலர் பிரிவுகளில் பரம்பரை பரம்பரையாக வாழ்ந்த மக்கள், பலாலி இராணுவ முகாம், இராணுவத்தினரின் வருகை மற்றும் எறிகணைத் தாக்குதல்கள் காரணமாக, 1990.06.15ஆம் திகதி வெள்ளிக்கிழமை தமது சொந்த மண்ணிலிருந்து இடம்பெயர்ந்தார்கள். இந்த இடப்பெயர்வு நிகழ்ந்து 35 வருடங்கள் கடந்தும், நாட்டில் போர் முடிவடைந்து 15 வருடங்கள் நிறைவடைந்த பின்னரும், இன்றுவரை மீள்குடியேற்றப்படாத நிலையிலுள்ள அந்த மக்கள், இந்த நாட்டுக்குள்ளேயே இடைத்தங்கல் முகாம்களிலும், உறவினர், நண்பர்களின் வீடுகளிலும் சொல்லொணாத் துன்பங்களுக்கு மத்தியில் ஏதிலிகளாக வாழ்ந்து வருகிறார்கள்.

2,700 ஏக்கருக்கும் அதிக விஸ்தீரணமுடைய காணிகளைக் கொண்ட மயிலிட்டி, பலாலி, வசாவிளான், கட்டுவன், குரும்பசிட்டி, குப்பிளான், தையிட்டி, ஊறணி, தோலகட்டி உள்ளிட்ட பல பேரூர்களைச் சேர்ந்த மக்கள், தமது சொந்தக் காணிகளில் குடியேறும் உரிமை பறிக்கப்பட்டவர்களாகவே இன்றும் வாழ்கிறார்கள். ஆட்சி மாற்றங்கள், அரசு மாற்றங் களின் பின்னரும் அவர்களது மீள்குடியேற்றம் சாத்தியப் படாமை பாதிக்கப்பட்ட ஒவ்வொரு குடும்பத்தினரதும், அவர்களது பிள்ளைகளினதும், அடுத்த தலைமுறையினதும் எதிர்காலத்தையே கேள்விக்கு உட்படுத்தி இருக்கிறது.

அண்மையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் யாழ்ப்பாணத்துக்கு வருகை தந்தபொழுதுகூட, மயிலிட்டிப் பகுதி மக்கள் தங்களுடைய சொந்த இடங்களுக்குப் போவதற் கான ஒரு போராட்டத்தை முன்னெடுத்து இருந்தார்கள். எனினும், சனாதிபதி அவர்கள் அந்த இடத்தைத் திரும்பிக்கூட பார்க்கவில்லை. இந்த அரசாங்கம் பதவியேற்று ஓராண்டு ஆகின்றது. இன்னும் அந்த மக்களை மீள்குடியேற்றுவதற்கான எந்த சாத்தியக்கூறுகளும் தென்படவில்லை. அந்த வகையில், பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்.

01. யாழ்ப்பாண மாவட்டம், வலிகாமம் வடக்குப் பிரதேச செயலாளர் பிரிவின் கீழுள்ள 13 கிராம அலுவலர் பிரிவுகளிலிருந்தும் கடந்த 35 வருடங்களுக்கு முன்னர் இடம்பெயர்ந்து, இன்றுவரை சொந்த மண்ணில் மீள்குடியேற முடியாது இந்த நாட்டுக்குள்ளேயே ஏதிலிகளாக வாழ்ந்துவரும் குடும்பங்கள் எத்தனை என்பதை கௌரவ அமைச்சர் அறிவாரா?

02. உயர் பாதுகாப்பு வலயம் என்ற போர்வையில், இந்த மக்களுக்குச் சொந்தமான எத்தனை ஏக்கர் காணிகள் இன்றளவும் இராணுவத்தினரால் கையகப்படுத்தப் பட்டுள்ளன என்பதையும், குறித்த காணிகள் ஏன் இதுவரை விடுவிக்கப்படவில்லை என்பதையும் அமைச்சர் அவர்கள் இச்சபைக்கு அறிவிப்பாரா?

03. இந்த நாட்டில் போர் முடிவுற்று 15 ஆண்டுகளின் பின்னரும், வலிகாமம் வடக்குப் பிரதேச மக்களின் மீள்குடியேற்றம் வலிந்து தவிர்க்கப்பட்டு வருவது ஏன் என்பதையும், இதனால் சொந்த மண்ணில் குடியேறி வாழ முடியாதவர்களாக அந்த மக்கள் படும் அவலங்கள் எத்தகையவை என்பதையும் அமைச்சர் அவர்களால் இச்சபைக்கு அறிவிக்க முடியுமா?

04. புதிய அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒரு வருட காலத்தை அண்மித்துள்ள நிலையில், வலிகாமம் வடக்கு மக்களின் மீள்குடியேற்றம் சார்ந்து இதுவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் குறித்து அமைச்சர் அவர்கள் இச்சபைக்கு அறிவிப்பாரா?

05. இதுவிடயமாக, தங்கள் அமைச்சினால் ஏதேனும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு இருப்பின், வலிகாமம் வடக்கு மக்களின் மீள்குடியேற்றம் எப்போது சாத்தியமாகும் என்பதை இச்சபையில் பகிரங்கமாகத் தெரிவிக்க முடியுமா?

06. அத்தகைய நடவடிக்கைகள் எவையேனும் இதுவரை மேற்கொள்ளப்படவில்லை எனின், மேற்குறித்த மீள்குடியேற்ற விடயம் காலதாமதமாவதற்கான காரணம் என்ன என்பதை அமைச்சர் அவர்கள் அறிவிப்பாரா?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

Hon. Speaker, the Answers is as follows:

1. In 2010, within the Divisional Secretary's Division of Valikamam North in the Jaffna District, a total of 42,699 individuals belonging to 12,376 families were registered as displaced persons who had not been resettled. Out of them, 38,693 individuals from 10,981 families were subsequently resettled in the same Division. However, 4,006 individuals from 1,395 families still remain to be resettled in the Valikamam North Divisional Secretary's Division.

2. In the post-conflict period starting from 2009, 23,850.72 acres of land were under the control of the tri-forces. Those lands have been gradually released, but 2,583.05 acres still remain to be released. Of that, 2,025.80 acres are yet to be released in Valikamam North alone.

3. It is the policy of the Government to resettle all displaced persons on their original lands. Since assuming office, the Government has released 57.39 acres of land to the rightful owners. The remaining lands will be released following consultations with the relevant Government authorities, including the Ministry of Defence.

4. The Palaly Road has been opened for the public, facilitating easier transportation for the people and restoring their trust in the process.

   Additionally, steps have been taken to redevelop the Myliddy Fishing Harbour, which had, historically, contributed to the national economy. This redevelopment is expected to create significant employment opportunities for people in the Northern region.

   Furthermore, to support the resettled people in the Jaffna District, an allocation of Rs. 1,259.568 million had been made this year from the very first Budget of the NPP Government through the Ministry of Urban Development, Construction and Housing. Development projects are currently being implemented under this funding, which also includes housing schemes and infrastructure facilities including drinking water, domestic

electricity connections and internal roads for those who were displaced by the war and have since been resettled.

5 & 6. The resettlement programme is directly linked to the release of land by the relevant authorities. Accordingly, lands are being released in a phased manner based on security clearance, administrative requirements and the availability of essential infrastructure facilities.

This programme is processing in line with the release of land by the respective agencies. However, as the programme is fully dependent on the timing of land releases, it is not possible at this stage to specify an exact date for the completion of the resettlement process.

We started this process in April. By August, within five months, we have released 57 acres in the Jaffna District alone.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, விடை அளித்தமைக்கு நன்றி!

மிக முக்கியமாக, உள்நாட்டுக்குள் இடம்பெயர்ந்து 35 வருடங்களுக்கும் மேலாக உறவினர் வீடுகளிலும் நண்பர் வீடுகளிலும் முகாம்களிலுமே இந்த மக்கள் வாழ்கின்றார்கள். அதைவிட, யுத்தம் முடிந்து 16 ஆண்டுகள் கடந்திருக்கின்றது; இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து ஓர் ஆண்டு ஆகின்றது. இன்னும் அந்த மக்கள் சொந்த இடங்களுக்குப் போக முடியவில்லை. சற்று யோசித்துப் பாருங்கள்! மயிலிட்டி, பலாலி பகுதி மக்களுடைய தரமான நிலங்கள் - பயிர்ச்செய்கை நிலங்கள் மற்றும் குடியிருப்பு நிலங்கள் - இருக்கையில், அவர்கள் தொடர்ந்தும் சொந்த நாட்டுக்குள்ளேயே அகதிகளாக இருக்கிறார்கள். அவர்களுடைய மீள்குடியேற்ற நடவடிக்கை தொடர்பிலுள்ள காலதாமதத்தை நீங்கள் உடனடியாக நீக்குங்கள்! தயவுசெய்து, அந்த மக்களை விரைவாக மீள்குடியேற்ற வேண்டும். நீங்கள் பாதை திறந்து இருப்பதாகச் சொல்கிறீர்கள். அந்தப் பாதையில் எந்தவோர் இடத்திலும் யாரும் இறங்க முடியாது; கைத்தொலைபேசி மூலம் புகைப்படம் எடுக்க முடியாது. அதுமாத்திரமன்றி, அந்தப் பாதை பயன்படுத்த முடியாதவாறு அல்லது எந்நேரமும் பயணிக்க முடியாதவாறு இருக்கின்றது. அது பரவாயில்லை! ஆனால், அந்த மக்கள் தங்களது சொந்த நிலங்களில் மீள்குடியேறுவதற்கு முடியாமல் இருக்கின்ற நிலையில், பல இடங்களில் இராணுவத்தினர் தோட்டம் செய்கிறார்கள்.

இன்று அங்கு பல இடங்கள் வெறுமையாக இருக்கின்றன. மாதா ஆலயம், அம்மன் ஆலயம், வைரவர் ஆலயம் உட்பட அங்கிருக்கின்ற பல ஆலயங்கள்கூட இதுவரை விடுவிக்கப் படாமல் இருக்கின்றன. அந்த இடங்கள் பயன்படுத்தப்படாமல் இருக்கின்றன. இராணுவத்தினரும் அந்த இடங்களில் இல்லை. தயவுசெய்து, அந்த இடங்களையாவது விடுவியுங்கள்! அந்த மக்களுக்கு நல்லெண்ணத்தை வெளிப்படுத்துங்கள்! யாழ்ப்பாண மாவட்டத்தில் உங்களுக்கு மூன்று பாராளுமன்ற உறுப்பினர்களைத் தந்திருப்பதாக, அந்த மக்கள் உங்களோடு இருப்பதாக நீங்கள் சொல்லிக்கொள்கிறீர்கள். நீங்கள் ஆட்சிக்கு வந்து ஓர் ஆண்டு ஆகியும் ஏன் வலிகாமம் வடக்கு மக்களை அவர்களுடைய இடங்களில் மீள்குடியேறுவதற்கு இன்னும் அனுமதிக்காமல், அதனைத் தடுத்து வருகின்றீர்கள்? அதற்கான காரணம் என்ன என்பதை தயவுசெய்து சொல்லுங்கள்!

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

Hon. Speaker, as I said in my Answer, we are not keeping silent on this issue. We have already started the resettlement programme and also a sizable amount of money has been allocated for that through our very first Budget. As you know, only 4,000 individuals out of a total of 38,693 now remain to be resettled. We know that it is a very severe problem. But, gradually, we will resettle all those people in their original lands.

Also, out of 23,850.72 acres, only 2,025.80 acres yet remain to be released. As I said, from April this year, within five months, we have released a certain extent of land. But, we know that that extent of land is not enough. But, our task is to release all the lands to the original owners. So, we are in the process of releasing them. There is no barrier or any other issues in that regard. The only thing is, it will take a little time as we have to take security concerns into consideration and also some administrative process is going on. Anyway, we are in the process of releasing them.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, පරිසර අමාත්‍ය ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා.

වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ අත්පත් කරගත් පෞද්ගලික ඉඩම් නිදහස් කිරීම: පරිසර අමාත්‍යතුමාගේ ප්‍රකාශය

வன்னித் தேர்தல் மாவட்டத்தில் கையகப்படுத்தப்பட்டிருக்கும் தனியார் காணிகளை விடுவித்தல்: சுற்றாடல் அமைச்சரினது கூற்று

RELEASE OF PRIVATE LANDS ACQUIRED IN VANNI ELECTORAL DISTRICT: STATEMENT BY MINISTER OF ENVIRONMENT

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් 2025.07.24වන දින අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ආරක්ෂක අමාත්‍යාංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය කියන ආයතනවලින් තොරතුරු ලබා ගැනීමට සිදු වුණා. ඒ ආයතන පහ විසින් සැපයූ තොරතුරු සියල්ල කැටි කරගෙන තමයි මා මෙම පිළිතුර ඉදිරිපත් කරන්නේ.

(1) ඔව්.

- **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

  මූලික වශයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මුලතිව් දිස්ත්‍රික්කය පදනම් කරගෙන චුන්ඩිකුලම් ජාතික උද්‍යානය, නයාරු ස්වභාව රක්ෂිතය,

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

නන්දිකඩාල් ස්වභාව රක්ෂිතය යන රක්ෂිත තුන වෙනුවෙන් හෙක්ටෙයාර 28,171.32ක ප්‍රමාණයකුත්, මන්නාරම දිස්ත්‍රික්කය පදනම් කරගෙන වෙඩිතලතිවු ස්වභාව රක්ෂිතය, වන්කලෛ අභය භූමිය, ආදම්ගේ පාලම ජාතික උද්‍යානය, මඩු පාර ජාතික උද්‍යානය සඳහා හෙක්ටෙයාර 216,075.95ක ප්‍රමාණයකුත් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. වවුනියාව දිස්ත්‍රික්කයේ වනජීවී රක්ෂිත ප්‍රකාශයට පත් කරලා නැහැ.

ගරු කථානායකතුමනි, එම සවිස්තර තොරතුරු ඇතුළත් වගුව මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද වගුව:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை :*
** Table tabled:*

	දිස්ත්‍රික්කය	රක්ෂිතයේ නම	ගැසට් අංකය	ප්‍රමාණය (හෙක්ටෙයාර)
1.	මුලතිව්	වුන්ඩිකුලම් ජාතික උද්‍යානය	1920/3	19,565.3
		නයාරු ස්වභාව රක්ෂිතය	8356/80	4,464.35
		නන්දිකඩාල් ස්වභාව රක්ෂිතය	2003/10	4,141.67
2.	මන්නාරම	වෙඩිතලතිවු ස්වභාව රක්ෂිතය	1956/3	29,180
		වන්කලෛ අභය භූමිය	1566/3	4,838.95
		ආදම්ගේ පාලම ජාතික උද්‍යානය	1920/3	18,990
		මඩු පාර ජාතික උද්‍යානය	1920/3	163,067
3.	වවුනියාව	වනජීවී රක්ෂිත ප්‍රකාශ කර නොමැත		

ඉල්ලුම්කරුවන් විසින් නීත්‍යානුකූල හිමිකම් තහවුරු කර නොමැති බැවින් සම්පූර්ණ පෞද්ගලික ඉඩම් ප්‍රමාණය නිශ්චිත වශයෙන් ප්‍රකාශ කරන්න බැහැ.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පසුගිය යුද්ධ සමය අවසානයේ මහජනතාව නැවත පදිංචි කිරීම යටතේ 2009 වසරේ සිට වවුනියාව, මන්නාරම හා මුලතිව් යන දිස්ත්‍රික්කවල කිසිදු අවසරයකින් තොරව විශාල ලෙස වනාන්තර එළිපෙහෙළි කර නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඒ හේතුවෙන් එවකට 2011, 2012 වසරේ සිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් එම ප්‍රදේශවල රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත කිරීමත් සමඟ මෙම වනාන්තර එළිපෙහෙළි කිරීම සම්බන්ධව විශාල ගැටලුවලට එම නිලධාරින්ට මුහුණ පෑමට සිදු වුණා. ඒ අනුව භූමියේ ඇති වනාන්තර ආවරණය වන පරිදි GPS ඛණ්ඩාංක මඟින් එවැනි තර්ජනයට ලක් වූ වනාන්තර 2021 වර්ෂය දක්වා විවිධ අවස්ථාවලදී රක්ෂිතභාවයට පත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව මම දළ අදහසක් ඉදිරිපත් කරන්නම්. වවුනියාව දිස්ත්‍රික්කයේ රක්ෂිත ලෙස ගැසට් කරලා තිබෙනවා, හෙක්ටෙයාර 41,049.45ක්. මන්නාරම දිස්ත්‍රික්කයේ රක්ෂිත ලෙස ගැසට් කරලා තිබෙනවා, හෙක්ටෙයාර 73,199.74ක්. මන්නාරම දිස්ත්‍රික්කයේ රක්ෂිත ලෙස ගැසට් කරලා තිබෙනවා, හෙක්ටෙයාර 40,030.53ක්. මුලතිව් දිස්ත්‍රික්කයේ ගැසට් කරලා තිබෙනවා, හෙක්ටෙයාර 171,817.83ක්. ගරු කථානායකතුමනි, එම සවිස්තර තොරතුරු ඇතුළත් වගු මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද වගු:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணைகள் :*
** Tables tabled:*

<u>වවුනියාව දිස්ත්‍රික්කයේ රක්ෂිත ලෙස ගැසට් කරන ලද වනාන්තර</u>

අනු අංකය	වනාන්තරයේ නම	වපසරිය (හෙක්)	ගැසට් අංකය	දිනය
1.	කුරුක්කල්පුදුකුලම්	1943	1770/13	2012.08.08
2.	පුලියන්කුලම	9361	1770/13	2012.08.08
3.	ඉරණඉලුප්පුකුලම	2884	1779/15	2012.10.10
4.	පෙරියකුරියුට්ටිකුලම්	1184	1179/15	2012.10.10
5.	එලමරදන්කුලම	429.17	2257/61	2021.12.10
6.	නාම්බන්කුලම	193.78	2257/60	2021.12.10
7.	නීලයාමොටේ 01	1199.1	2257/61	2021.12.10
8.	කන්දසාමිනගර්	281.29	2257/66	2021.12.10
9.	නීලයාමොටේ 02	829.01	2257/66	2021.12.10
10.	පෙරියකට්ටු	567.61	2257/59	2021.12.10
11.	කන්ගන්කුලම	957.17	2257/59	2021.12.10
12.	මදුරානගර්	73.53	2257/60	2021.12.10
13.	සින්නකුලම	56.86	2257/67	2021.12.10
14.	පුදියසින්නකුලම	17.99	2257/67	2021.12.10
15.	මහිලන්කුලම	65.4	2257/62	2021.12.10
16.	මොහොත්තාන්කුලම	644.55	2257/62	2021.12.10
17.	කොන්දකාරකුලම	13.99	2257/68	2021.12.10
18.	පෙරියමඩු රක්ෂිතය	4216	1770/13	2012.08.08
19.	පෙරියමඩු රක්ෂිතය	9620	1784/10	2012.11.12
20.	පුලියන්කුලම රක්ෂිතය	5624	1770/13	2012.08.08
21.	පුතුකුලම් රක්ෂිතය	888	1770/13	2012.08.08
		41049.45		

මන්නාරම දිස්ත්‍රික්කයේ රක්ෂිත ලෙස ගැසට් කරන ලද වනාන්තර

අනු අංකය	දිස්ත්‍රික්කය	වනාන්තරයේ නම	ප්‍රමාණය (.හෙක්)	ගැසට් අංකය	දිනය
1	මන්නාරම	වෙඩිතලතිව්	525.00	1834/13	28.10.2013
2	මන්නාරම	පලකමුණයි	312.00	1834/13	28.10.2013
3	මන්නාරම	මුල්ලිකුලම්	5,284.00	1759/02	21.05.2012
4	මන්නාරම	මරිච්චුකඩ්ඩි	1,952.59	2208/57	2021.01.01
5	මන්නාරම	තිරුකේෂ්වරම්	328.01	2145/36	16.10.2019
6	මන්නාරම	මුන්ඩම්පිඩ්ඩි කඩොලාන	517.41	2145/36	16.10.2019
7	මන්නාරම	ඉරුක්කුලම්පිඩ්ඩි කඩොලාන	166.28	2145/36	16.10.2019
8	මන්නාරම	අච්චන්කුලම් කඩොලාන	1,405.79	2145/36	16.10.2019
9	මන්නාරම	මඩුපාර	44,829.00	1779/15	10.10.2012
10	මන්නාරම	පාම්පේඩියි	3,542.00	1779/15	10.10.2012
11	මන්නාරම	මරිච්චුක්කඩෙයි /කාරක්ඩිකුලි	6,042.00	1779/15	10.10.2012
12	මන්නාරම	නෛන්තිවේලි	8,295.66	7182	10.06.1921
			73,199.74		

මන්නාරම දිස්ත්‍රික්කයයේ සංරක්ෂිත ලෙස ගැසට් කරන ලද වනාන්තර

අනු අංකය	දිස්ත්‍රික්කය	වනාන්තරයේ නම	ප්‍රමාණය (.හෙක්)	ගැසට් අංකය	දිනය
1	මන්නාරම	මාවිල්ලු	40,030.53	2011/34	24/03/2017
			40,030.53		

මුලතිව් දිස්ත්‍රික්කයේ රක්ෂිත ලෙස ගැසට් කරන ලද වනාන්තර

අනු අංකය	දිස්ත්‍රික්කය	වනාන්තරයේ නම	ප්‍රමාණය (.හෙක්)	ගැසට් අංකය	දිනය
1	මුලතිව්	වලෙයි කඩොලාන	4,559.25	2145/38	16.10.2019
2	මුලතිව්	මුල්ලියාවේලි	1,280.00	1784/10	12.11.2012
3	මුලතිව්	තන්නිමුරිප්පු	1,357.00	1779/15	10.10.2012
4	මුලතිව්	වෙප්පන්කුලම්	1,287.00	1779/15	10.10.2012
5	මුලතිව්	ආන්දන්කුලම්	15,113.49	7182	10.06.1921
6	මුලතිව්	මුණ්ඩුමුරිප්පු	26,268.00	1761/11	07.06.2012
7	මුලතිව්	නාගන්චෝලෙ	6,824.75	7923	01.07.1932
8	මුලතිව්	කෝකිලායි කඩොලාන	2,432.38	2145/38	16.10.2019
9	මුලතිව්	වඩකච්චි	4,068.18	5855	30.05.1902
10	මුලතිව්	තුනුක්කායි	25,400.00	1759/1	21.05.2012
11	මුලතිව්	අලවේඩුවාන්	4,067.00	1759/1	21.05.2012
12	මුලතිව්	පුදුකුඩිඉරිප්පු	2,205.00	1759/1	21.05.2012
13	මුලතිව්	මාන්කුලම්	5,942.00	1759/1	21.05.2012
14	මුලතිව්	ඉරණමඩු	3,937.32	7777	16.05.1930
15	මුලතිව්	පන්නිකන්කුලම්	6,828.31	5683	13.03.1900
16	මුලතිව්	වමලන්කුලම්	2,490.48	7182	10.06.1921
17	මුලතිව්	කුලාමුරිප්පු "B"	1,714.18	7182	10.06.1921
18	මුලතිව්	කුලාමුරිප්පු "A"	3,155.29	7182	10.06.1921
19	මුලතිව්	තන්ඩුවන්	1,146.30	7182	10.06.1921
20	මුලතිව්	තේරාවිල් ඔඩ්ඩුසුඩාන්	38,042.56	7182	10.06.1921
21	මුලතිව්	වන්නිවිලන්කුලම්	2,030.99	7182	10.06.1921
22	මුලතිව්	අමදිපුරම්	984.39	2257/56	10.12.2021
23	මුලතිව්	කල්විලන්	2,026.75	2257/54	10.12.2021
24	මුලතිව්	නට්ටන්කන්ඩාල්	274.56	2257/55	10.12.2021
25	මුලතිව්	සිරට්ටිකුලම්	6,351.63	2257/56	10.12.2021
26	මුලතිව්	වන්නිවිලන්කුලම්	2,030.99	7182	10.06.1921
			171,817.83		

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

මන්නාරම දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා රක්ෂිත භූමි නොමැති අතර, වවුනියාව හා මුලතිව් යන දිස්ත්‍රික්කවල ප්‍රකාශයට පත් කරන ලද පුරාවිද්‍යා රක්ෂිත භූමි ලෙස නම් කරන ලද ස්ථාන පිළිබඳ තොරතුරු මෙසේය.

උතුරු පළාතේ, වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අග්බෝපුර ග්‍රාමයේ ඇති "මාමඩුව" පුරාවිද්‍යා ප්‍රදේශයක් ලෙස නම් කර ඇත, 2022.07.28 දිනැති 2290/33 අංක දරන ගැසට් නිවේදනය අනුව, 2019.10.22 දින අනුමත කරන ලද්දා වූ 2019.10.16 දිනැති අතිරේක අංක 11 හා පත්‍ර අංක 13හි සඳහන් කැබලි අංක 336 දරන අක්කර 26යි, රූඩ් 02යි, පර්චස් 27.0ක් - හෙක්ටෙයාර 10.7922ක් - වූ ඉඩම - අග්බෝපුර ග්‍රාමය - පූර්ව ඓතිහාසික - මුල් ඓතිහාසික සුසාන භූමි සංකීර්ණයක් සහිත ස්ථානයකි. මෙම ඉඩම රජය සතුවේ.

උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එම්යූ/83, සෙම්මලෛ නැඟෙනහිර ග්‍රාමයේ ඇති නයාරු පුරාවිද්‍යා භූමිය, පිඹුරු අංක 70 දරන සර්වේයර් ජනරාල්ගේ අවසාන භූමිතික පිඹුරට කරන ලද්දා වූ ද, සර්වේයර් ජනරාල් වෙනුවෙන් මුලතිව් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි කේ.වී.එස්.පී. කැකුලාවල විසින් 2019.11.18 දින අනුමත කරන ලද්දා වූ ද, 2019.10.07 දිනැති අතිරේක අංක 20 හා පත්‍ර අංක 71හි සඳහන් පිළිවෙළින් කැබලි අංක 2071 හා 2073 කැබලි අංක 2071 දරන අක්කර 29යි, රූඩ් 01යි, පර්චස් 8.3ක් - හෙක්ටෙයාර 11.8578ක් - වූ ඉඩම, කැබලි අංකය 2073 දරන අක්කර 36යි, රූඩ් 03යි, පර්චස් 39.4ක් - හෙක්ටෙයාර 14.9715ක් - වූ ඉඩම ස්මාරක සහිත නටබුන් භූමියකි. මෙම ඉඩම රජය සතුවේ.

ගරු කථානායකතුමනි, දළ වශයෙන් කිව්වොත්, වවුනියාව දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 10.79ක ප්‍රදේශයක්, මුලතිව් දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 11.85ක ප්‍රදේශයක් සහ මුලතිව් දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 14.97ක ප්‍රදේශ දෙකක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පුරාවිද්‍යා ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

- ආරක්ෂක අමාත්‍යාංශය

වවුනියාව, මන්නාරම හා මුලතිව් යන දිස්ත්‍රික්කවල ත්‍රිවිධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් වන සංරක්ෂණ හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් බවත්, එම ඉඩම් වාර්ෂිකව ලබා දෙනු ලබන විවිධ අවසර පත්‍ර යටතේ පරිහරණය කරනු ලබන බවත් දන්වා තිබෙනවා.

- මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

මන්නාරම දිස්ත්‍රික්කය තුළ ඇති ආරක්ෂිත ස්ථාන වශයෙන් දක්වා ඇති ස්ථාන 14 පිළිබඳ තොරතුරුත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ පිළිතුරෙහි අඩංගු වෙනවා.

(2) - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරන ලද රක්ෂිත නිසා 2009-2015 කාලය තුළ වනජීවී ඉඩම් ප්‍රකාශයට පත් කිරීමේදී එම ඉඩම් සඳහා හිමිකම් කීමට ඉදිරිපත් වී නොමැත. වර්තමානයේ සියලු ඉල්ලීම් දිස්ත්‍රික් ලේකම් හරහා ලැබෙන අතර, එහි නිශ්චිත පවුල් ගණන දක්වා නැත.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනාන්තර රක්ෂිත ලෙස ගැසට් කරන අවස්ථාවේ එම ඉඩම්වල මහජනතාව පදිංචි වී සිට නැත.

(3) - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඇති සියලු ඉඩම් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

චක්‍රලේඛ අංක 5/2001 අනුව වනාන්තර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනයේ තිබූ වනාන්තර වන අතර, එවැනි වනාන්තර රක්ෂිතභාවයට පත් කිරීම මඟින් එම භූමි ප්‍රමාණයට මායිම් කණු ස්ථාපිත කර ඇත. ඒ අනුව ගම්වැසියන්ගේ බලපත්‍ර ඉඩම් හෝ අසාධාරණයට ලක් වූ පුද්ගලයන්ට අයත් ඉඩම් හෝ මධ්‍යම පාන්තික ඉඩම් 2022 වර්ෂයේදී පමණ ආරම්භ කරන ලද තිරසර වනාන්තර කළමනාකරණ වැඩසටහන තුළින් හඳුනා ගැනීමට කටයුතු කර මුලතිව්, මන්නාරම, කිලිනොච්චි දිස්ත්‍රික්ක හැර වවුනියාව දිස්ත්‍රික්කයේ පමණක් පුද්ගලයන්හට නිදහස් කිරීමට සුදුසු, රක්ෂිතභාවයෙන් මුදා ගැනීමට යෝජිත ඉඩම් හෙක්ටෙයාර 9,123.78ක්, එනම් අක්කර 22,804.45ක් හඳුනාගෙන ඇත.

(4) - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඒ සඳහා මත විමසුමක් කරලා තිබෙනවා.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත තිරසර වනාන්තර කළමනාකරණ වැඩසටහනට මෙය අන්තර්ගත වේ.

(5) - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

2009 වසරේ මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු ආයතන රැසක සහභාගිත්වයෙන් සිදු කරන ලද "Strategic Environmental Assessment" නම් අධ්‍යයනය මඟින් පාරිසරිකව වටිනා ඉඩම් හඳුනාගෙන ඇත. මෙම වාර්තාව 2009 වසරේදී පිළියෙළ කර ඇති වාර්තාවක් වන අතර එහි නිර්දේශ අනුව රක්ෂිත ප්‍රකාශයට පත් කර ඇත.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව එහෙම ගැටලුවක් මතුවන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

(6) - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

මෙම ප්‍රමාණය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මුළු

ප්‍රමාණය වේ. වනජීවී ඉඩම් වෙන් වෙන් වශයෙන් ගත් විට මීට වඩා අඩු අගයක් ගනී.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ඉහත ගැටලුසහගත තත්ත්වය මත එවැනි අසාධාරණයකට ලක්වූ වැසියන්ගේ ඉල්ලීම්, එම දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම්වරු මඟින් ලබාගෙන 2022 වර්ෂයේ සිට අවස්ථා ගණනාවකදී වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වවුනියාව, මන්නාරම, මුලතිව්, කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය සමඟ සාකච්ඡා වට ගණනාවක් පවත්වා එම ඉල්ලීම්වලට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාගෙන අන්තර් අමාත්‍ය කමිටුවට ඉදිරිපත් කර, මෙම ඉල්ලීම්වලට අදාළ ඉඩම් ක්ෂේත්‍රයේ ග්‍රාම නිලධාරින්, ඉඩම් නිලධාරින් සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගේ සහභාගිත්වය ඇතුව භෞතික ලෙස GPS උපකරණ භාවිත කර මැනුම් කටයුතු ආරම්භ කරන ලදී. එම අවස්ථාවේදී යම් යම් පිරිස්, මහජන නියෝජිතයන් හා දිස්ත්‍රික්කයේ වගකිව යුතු නිලධාරින්ගේ විරෝධතා හේතුවෙන් මුලතිව්, මන්නාරම, කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල මෙම ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවන ලද අතර, මුලතිව් දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 17,449.0ක් - අක්කර 43,099.03ක් - හා මන්නාරම දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 2,896.0ක - අක්කර 7,153.12ක - බිම් ප්‍රමාණයක් රක්ෂිතභාවයෙන් මුදා හැරීමට මේ වනවිටත් හඳුනාගෙන ඇත. වවුනියාව දිස්ත්‍රික්කයේ එම කටයුත්ත සාර්ථකව නිම කරන ලදී. ඒ අනුව හෙක්ටෙයාර 9,123.78ක් - අක්කර 22,804.45ක් - රක්ෂිතභාවයෙන් මුදා හැර මහජනතාව වෙත ලබා දීම සඳහා මේ වනවිට ජනාධිපති ලේකම් කාර්යාලය අනුමත කර ඇති අතර, ඒ අනුව හඳුනා ගත් රක්ෂිත මායිම් පමණක් ඇතුළත් වන අන්දමින් මායිම් කණු සිටුවීම ආරම්භ කර ඇත. තවද, 2021 වර්ෂයට පෙර ඉහතින් දක්වා ඇති පරිදි GPS ඛණ්ඩාංක මඟින් රක්ෂිතභාවයට පත් කිරීමෙන් පසු පැරණි මායිම් කණු සිටුවීමේදී වර්තමාන මැනීම් හඳුනාගෙන, මැනීමෙන් බැහැර වන මහජනතාවට අයත් ඉඩම්වලට අදාළව පැරණි මායිම් කණු යොදා ඇති කණු ගලවා ඉවත් කර නව රක්ෂිත මායිම් ආවරණය වන පරිදි මායිම් කණු ස්ථාපිත කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.

(7) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව ගත්තොත්, වනජීවී ඉඩම් නිදහස් කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා පාරිසරික සංවේදිතා ඇගයුම් - Environmental Sensitivity Assessments - සිදු කළ යුතු අතර, ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ මේ වනවිට අදාළ දිස්ත්‍රික් ලේකම්වරු වෙත නිකුත් කර ඇත. එම වාර්තා ලබා දුන් පසු ඉදිරි කටයුතු සිදු කිරීමේ හැකියාව ඇත. මෙහි නිර්දේශ අනුමත කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වේ.

ගරු කථානායකතුමනි, මීට අමතරව අගෝස්තු 25වැනි දා පැවැති කැබිනට් මණ්ඩල රැස්වීමේදී තීරණයක් ලබා ගත්තා, මේ වනවිට රක්ෂිතභාවයෙන් බැහැර කිරීමට සුදුසු ඉඩම් පිළිබඳව සමාලෝචනය කර තහවුරු කර ගැනීම සඳහා පහත සඳහන් සංයුතියෙන් යුතු අමාත්‍යාංශ අනුකමිටුවක් පත් කිරීමට. ඒ අනුව ඉඩම් අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරුන්, පළාත් ඉඩම් කොමසාරිස්වරුන්, අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත් කරලා, එම කමිටුව යටතේ තවත් මොනවා හෝ දුක් ගැනවිලි තිබෙනවා නම් ඒවාත් සලකා බලා, ඒවා සමාලෝචනය කරලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කමිටුවක් පත් කරගෙන තිබෙනවා.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

எனது வினாவுக்கு விடையளித்தமைக்கு கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

எமது பிரதேசத்திலுள்ள மக்களுக்கு வனவளத் திணைக்களம், வனசீவராசிகள் திணைக்களம் என்பவற்றால் பாரிய பிரச்சினைகள் ஏற்பட்டு இருக்கின்றன. வன்னித் தேர்தல் மாவட்டத்தில் மாத்திரம் கிட்டத்தட்ட 60,000 ஏக்கர் விவசாயக் காணிகளில் செய்கை பண்ணவிடாமல் தடுத்துக் கொண்டு இருக்கிறார்கள். இந்த நிலைமை கடந்த காலங்களில் இருந்து தொடர்ச்சியாக இருந்து வருகின்றது. நான் இந்த அரசாங்கத்தைக் குற்றஞ்சாட்ட விரும்பவில்லை. அந்தக் காணிகளை விரைவாக விடுவிப்பதற்கென கடந்த காலத்தில் நியமிக்கப்பட்ட மாவட்டக் குழுவால், அமைச்சுமட்ட குழுவுக்கு சிபாரிசுகள் முன்வைக்கப்பட்டும் அதனைச் சரிபார்ப்பதில் காலதாமதம் நிலவியது. இந்தப் பணிகளை முடிவுறுத்தும் நேரத்தில்தான் தேர்தல் வந்தது. கடந்த அரசாங்கம் மேற்கொண்ட நல்ல வேலைத்திட்டங்களை நீங்கள் தொடர்ந்து முன்னெடுக்கிறீர்கள்! அந்த அடிப்படையில், இவ்விடயம் தொடர்பிலும் நீங்கள் விரைவாக நடவடிக்கை எடுக்க வேண்டும். மறுபடியும் உப குழு ஒன்றை நியமித்தாலும் பரவாயில்லை! விரைவாக இதற்குரிய ஏற்பாடுகளைச் செய்தால் நல்லது. எமது பகுதியிலுள்ள ஒவ்வொரு மாவட்டத்திலும் நூற்றுக்கணக்கான குளங்கள் abandonஆக இருக்கின்றன. அங்கு குளங்கள் இருந்ததற்கான அடையாளங்கள் இருக்கின்றன.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, කරුණු පැහැදිලි කර ගැනීම කෙටියෙන් කරන්න.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

හොඳයි.

இதற்குரிய ஏற்பாடுகளை விரைவாகச் செய்தால் உணவு உற்பத்தியில் பாரிய அதிகரிப்பை ஏற்படுத்தலாம். உணவு உற்பத்தியை அதிகரித்தால் பணவீக்கம் குறையும். எனவே, பொருத்தமான காணிகளை விரைவாக விடுவிக்குமாறுதான் நாங்கள் கேட்கின்றோம். இப்போது season தொடங்க இருக்கின்றது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, කෙටියෙන් අහන්න.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
කෙටියෙන් අහන්නේ.

கௌரவ அமைச்சர் அவர்களே, Forest Departmentஆல் மணல் அகழ்வுக்கான அனுமதி வழங்கும் விடயம் மிக முக்கியமானது. Landowner என்ற முறையில் கண்டபடி அனுமதிகளைக் கொடுக்கின்றது. இதனால் இன்று ஆற்றுப் பக்கம் போக முடியாமல் இருக்கின்றது. கடந்த அரசாங்க காலத்தில் எவ்வாறு வளங்கள் அழிக்கப்பட்டதோ, அதே நிலை இப்போதும் தொடர்கின்றது. எனவே, உடனடியாக ஒரு குழுவை - committeeஐ - நியமித்து, இது தொடர்பில் ஆராய்ந்து, உரிய நடவடிக்கை எடுக்க வேண்டும். அதற்குரிய royaltyஐ எடுத்து இருக்கிறீர்கள். அந்த அழிவுகளைத் தடுக்க வேண்டும். அங்கு மரங்கள் விழுந்து கிடக்கின்றன. ஆற்றிலிருந்து 5 மீற்றர் தூரத்தில் மேற்கொள்ளப்பட்ட மணல் அகழ்வு இன்று 20 மீற்றர் வரை சென்றிருக்கின்றது. இவ்விடயம் தொடர்பில் ஆராய்வதற்கென விரைவாக ஒரு குழுவை நியமித்து, அங்கு இடம்பெறுகின்ற கனிய வள அழிவை தடுத்து நிறுத்துமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාත් ඉතාම කෙටියෙන් පිළිතුරු දෙන්න.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු මන්ත්‍රීතුමනි, අපි එම කමිටුව පත් කරලා, තීන්දු තීරණ ලබා දීම සඳහා මාස හයක වාගේ කාලයක් ලබා දීලා තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ අපි බලාපොරොත්තු වනවා, එම ප්‍රශ්නයට මැදිහත් වෙලා ඉතා කෙටි කාලයක් තුළ විසඳුම් ලබා දෙන්න.

ඔබතුමා කිව්ව දෙවැනි කාරණය වන වැලි ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරන්නම්. ඒක මේ category එකට නොවෙයි, අයිති. නමුත්, ඒ ප්‍රශ්නය සම්බන්ධවත් අපි ඉක්මනින් මැදිහත්වීමක් කරන්නම්.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා. ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න වෙනුවෙන් වෙන් කළ කාලයෙන් විනාඩි පහක් ඉතුරුව තිබෙන නිසා ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න කලින් විනාඩියක කාලයක් ලබා ගැනීමට මා අවසර ඉල්ලා සිටිනවා. මට විනාඩි පහක් අවශ්‍ය නැහැ.

ගරු කථානායකතුමනි, පක්ෂ නායකවරුන්ට ලැබී තිබෙන අයිතියක් තමයි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ඇසීම. ඒ සඳහා අප විසින් දැනට ලබා දී තිබෙන පිළිතුරු පිළිබඳව ඉතා කෙටි සාරාංශයක් ඉදිරිපත් කරන්නයි ඔබතුමාගෙන් මම විනාඩියක කාලයක් ඉල්ලා සිටින්නේ.

ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා ප්‍රශ්න 8ක් අහලා තිබෙනවා; අපි එයින් ප්‍රශ්න 7කට පිළිතුරු ලබා දීලා තිබෙනවා; එතුමාගේ තව එක ප්‍රශ්නයකට තමයි ගරු කථානායකතුමනි, පිළිතුරු ලබා දීමට තිබෙන්නේ.

ඊළඟට, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා ප්‍රශ්න 4ක් අහලා තිබෙනවා; අපි එයින් ප්‍රශ්න 2කට පිළිතුරු ලබා දීලා තිබෙනවා. ඊළඟට, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා ප්‍රශ්න 5ක් අහලා තිබෙනවා; අද ලබා දුන් පිළිතුරත් එක්ක එතුමාගේ ප්‍රශ්න 2කට පිළිතුරු ලබා දීලා තිබෙනවා. ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා ප්‍රශ්න 6ක් අහලා තිබෙනවා; අපි එයින් ප්‍රශ්න 5කට පිළිතුරු ලබා දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රශ්න 18ක් අහලා තිබෙනවා; අපි එයින් ප්‍රශ්න 15කට පිළිතුරු ලබා දීලා තිබෙනවා; පිළිතුරු ලබා දීලා නැත්තේ ආසන්න වශයෙන් එතුමා අගෝස්තු 21 හා 22 කියන දිනවල අහපු ප්‍රශ්නවලට තමයි.

ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ප්‍රශ්න 14ක් අහලා තිබෙනවා; අපි එයින් ප්‍රශ්න 10කට පිළිතුරු ලබා දීලා තිබෙනවා. එතුමා අද - සැප්තැම්බර් 10වන දා - අහපු ප්‍රශ්නයටත් අප පිළිතුරු ලබා දුන්නා. එතුමා ජූලි 23 සහ අගෝස්තු 06 කියන දින දෙකේ අහපු ප්‍රශ්නවලට තමයි පිළිතුරු ලබා දෙන්න තිබෙන්නේ. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ප්‍රශ්න 25ක් අහලා තිබෙනවා; අපි එයින් ප්‍රශ්න 22කට පිළිතුරු ලබා දීලා තිබෙනවා,

ගරු කථානායකතුමනි. ඒ අනුව සමස්තයක් වශයෙන් ගත්තොත්, මේ පක්ෂ නායකයින් විසින් අසන ලද ප්‍රශ්නවලට ඒ ආකාරයෙන් පිළිතුරු ලබා දීලා තිබෙනවා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත - දෙවන වර කියවීම.

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம்
PRESIDENTS' ENTITLEMENTS (REPEAL) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 11.25]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද අපි දෙවනවර කියවීමට ඉදිරිපත් කර තිබෙන්නේ, 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත - Presidents' Entitlements Act, No. 4 of 1986 - අහෝසි කිරීම, abolition සඳහා ගෙන එන පනත් කෙටුම්පතයි. ඒ සම්බන්ධයෙන් වන විවාදයට තමයි අද අපි මේ එකතු වෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙම විවාදය ආරම්භයේදී මා සඳහන් කරන්න කැමැතියි, අපට හිටපු ශ්‍රේෂ්ඨ නඩුකාරතුමෙක් ගැන. එතුමා තමයි Justice Weeramantry. එතුමා එක නඩු තීන්දුවකදී මිහිඳු මහ රහතන් වහන්සේගේ දේශනාවක් quote කර තිබෙනවා, "Those who hold power must act as trustees for the people, exercising their authority for the common good" යනුවෙන්. ගරු කථානායකතුමනි, සිංහල භාෂාවෙන් කියනවා නම්, "රජෙක් වේවා, ජනාධිපතිවරයෙක් වේවා ඒ අධිකාරි බලය ඔහු පවත්වා ගෙන යා යුත්තේ ජනතාවගේ භාරකාරයා ලෙස මිසක්, අයිතිකාරයා වශයෙන් නොවෙයි. ඒ වාගේම ඒ බලය හැම විටම පොදු යහපත සඳහා යොදවන්න"ය කියන කාරණාව තමයි එයින් කියැවෙන්නේ.

ගරු කථානායකතුමනි, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අරගෙන බැලුවත්, අපේ ජනාධිපතිවරයාගේ සිට පහළට සිටින හැම කෙනෙකුම කියා තිබෙන ප්‍රධාන වචනය මොකක්ද? ජනතාවට නැති දේවල්වලින් ශත පහක දෙයක්, තඹ දොයිතුවක දෙයක් අපට එපා කියන කාරණයත්, හැම දෙනාම නීතිය ඉදිරියේ සමාන විය යුතුයි කියන කාරණයත් තමයි අපි කියා තිබෙන්නේ. මේවා අපි හුදෙක් කට පාඩමට කියන වචන නොවෙයි. ඒවා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත් ලියා තිබෙනවා. අපේ ජීවිතත් ඒ විධියට හැඩ ගැසී තිබෙනවා. අපි භාරකරුවෝ පමණයි. අන්න ඒ නිසා තමයි ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාවට පෙනෙන්න අරගෙන තිබෙන්නේ ඉස්සර හිටපු පාලකයෝ සහ දැන් ඉන්නා පාලකයන්ගේ වෙනස මොකක්ද කියන එක.

1986 අංක 4 දරන පනත ගෙනැවිත් තිබෙන්නේ ව්‍යවස්ථාවේ කොටසක් හැටියට නොවෙයි. අපි දන්නවා, 1977දී ජේ.ආර්. ජයවර්ධන අගමැති ලෙස බලයට ඇවිල්ලා, පසුව ඒ බලය හරහා විධායක ජනාධිපති ක්‍රමය නිර්මාණය කළ බව. ඔහු ඒක නිර්මාණය කළේ හැම දාම ඉන්න තමයි. නමුත් 1986 වෙනකොට පෙනෙන්න ගත්තේ මොකක්ද? අර කළගෙඩි-ලාම්පු සෙල්ලමෙන් පාර්ලිමේන්තු මැතිවරණයත් කල් දැමූ ඔහුට පෙනී ගියා, "මට ඉන්න බැරි වුණොත්, මගේ නහින දෙහින කාලයේ කොහොමද බදු මුදල්වලින් මම ජීවත් වෙන්නේ" කියලා. ඒ නිසා ඔන්න 1986දී ගෙනාවා, අර පනත. නමුත් ඒක ව්‍යවස්ථාවේ කොටසක් නොවෙයි.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36වැනි ව්‍යවස්ථාවේ තමයි ජනාධිපතිවරයාගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් තීරණය තිබෙන්නේ. මේ පනත තුළ ඒවා කිසිවක් නැහැ. ඉදිරියේදී ව්‍යවස්ථාව සංශෝධනය කරන අවස්ථාවකදී අපට සලකා බලන්නට පුළුවන්, ජනාධිපති විශ්‍රාම වැටුපට මොකක්ද වෙන්නේ කියලා. නමුත් අදට කටයුතු කෙරෙන්නේ මේ පනතේ තිබෙන මූලිකම දේවල් සම්බන්ධවයි. එකක් තමයි ජනාධිපති කෙනකුට දෙන නිල නිවස. ඒ ගැන මේ පනතේ කියා තිබෙන්නේ මොකක්ද? ඒකේ "නිල නිවසක්" වශයෙන් සඳහන් කර නැහැ. විශ්‍රාමික කෙනාට සුදුසු නිවසක් කියලායි සඳහන් කර තිබෙන්නේ. එහෙම සුදුසු නිවසක්, නැත්නම් සුදුසු තැනක් හොයා ගන්න විශ්‍රාම වැටුපෙන් තුනෙන් එකක මුදලක් දෙනවා. ඒක තමයි 1986 අංක 4 දරන පනතේ - අද අහෝසි කරන පනතේ - සඳහන් කර තිබෙන්නේ. ඒ වාගේම හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවට ගෙවන මාසික විශ්‍රාම වැටුප, මාසික ලේකම් දීමනා යනාදී කාරණාත් එහි සඳහන් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ දේවල් කිරීම යුක්ති සහගතද, නැද්ද කියන එක මම ඉදිරියේදී පැහැදිලි කරනවා.

ඇයි මේ පනත හොඳ නැත්තේ? මම කියනවා, හොඳ නැහැ කියලා. හේතුව මොකක්ද? මේ පනතේම නොවෙයි, වැරැද්ද තිබෙන්නේ. අශිෂ්ට විධියට ජනතාවගේ බදු මුදල් හොරා කමින්, ඒකෙන් පවතින්න පුළුවන් කියා හිතන පාලකයන්ගේ අතේ තිබියදී මේ නීතිය හොඳ නැහැ. මොකද, මෙය අවභාවිත කරනවා. මොකද, මිහිඳු මහ රහතන් වහන්සේ කිව්ව විධියට නොවෙයි ඒගොල්ලන් හිතන්නේ. ඒගොල්ලන් භාරකාරයෝ නොවෙයි, මේක කඩා වඩාගෙන ඉන්න ඕනෑය කියන කට්ටිය, බදු මුදලින්ම යැපෙන්න ඕනෑය කියන කට්ටිය විධියටයි ඒගොල්ලන් හිතන්නේ. ඒක නිසා තමයි මහජනතාව අපට පුන පුනා කිව්වේ, "මෙන්න මේ වාගේ නාස්තිකාර වියදම් කපන්න, මේගොල්ලන්ට මේවා දෙන්න ඕනෑ නැහැ" කියලා. ඒ හින්දා තමයි අපි ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ මේක ලිව්වේ. අපි කියපු දේවල් කරන ආණ්ඩුවක්. මේ එන්නේ අපි කරනවා කියපු තව එකක්.

මම නඩු දෙකක් ගැන කියන්නම්. හිටපු කිසිම ජනාධිපතිවරයෙකුට අපහාස කරන්න, හිරිහැර කරන්න වුවමනාවට නොවෙයි මම මේ ගැන කියන්නේ. නමුත් මේ නඩු දෙක ගැන කියන්න වෙනවා. එකක් තමයි, Senarath and others vs Chandrika Bandaranaike Kumaratunga and others. අනෙක් එක තමයි මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ නඩුව. පැජට් පාරේ නඩුව කිව්වාම කට්ටියට තේරුම් ගන්න පුළුවන්. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් 2005 අගෝස්තු 31වැනි දින කැබිනට් තීන්දුවකින් මාදිවෙල ප්‍රදේශයේ ඉඩම් කැබැල්ලක් වෙන්කර ගන්නවා, එතුමියගේ මුදලින් ගෙයක් හදන්න. මොකක්ද ඒ අවස්ථාවේ උසාවිය කිව්වේ? එතුමියට හිමිකමක් තිබෙනවා කියලා ඒ අවස්ථාවේ පාවිච්චි කළෙත් 1986 මේ පනතම තමයි. අන්න ඒ වෙලාවේ ජනතාව විසින් පෙත්සම් ඉදිරිපත් කළාම සුප්‍රීම් අධිකරණය කිව්වා, "Her entitlements are arbitrary, unreasonable and *ultra vires*. It violates the rule of law" කියලා. අපි හැම දාම කියපු දෙයක් තමයි නීතිය ඉදිරියේ පුද්ගලයන් සමාන වෙන්න ඕනෑ කියන එක. මේ පනතෙන් කරලා තිබෙන්නේ හිටපු ජනාධිපතිවරුන්ව නීතියෙන් වැඩි සැලකිල්ලක් දෙන පුරවැසියෝ බවට පත් කිරීමයි. එතකොට මේකෙන් 12(1) වගන්තියත් උල්ලංඝනය වෙනවා; මානව සදාචාරයත්

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]]

උල්ලංඝනය වෙනවා; මිහිඳු මහ රහතන් වහන්සේ කියපු මූලික හරයටත් පටහැනි වෙනවා. මේ පනත තමයි ඒකට භාවිත කළේ. මේ පනත තිබුණොත් අවභාවිතාව වළක්වන්න බැහැ. මොකද, මේ ගොල්ලන්ගේ දේශපාලනය සංස්කෘතික නැහැ.

පැජට් පාරේ ගෙදර සම්බන්ධ මෛත්‍රීපාල සිරිසේනගේ නඩුවේ ඔහු Cabinet Paper දාලා මොනවාද ඉල්ලුවේ? Special Task Force එක ඔහුගේ ආරක්ෂාවට යෙදවීම, ඔහු ජනාධිපතිවරයෙක් වශයෙන් වාසය කළ මහගමසේකර මාවත, කොළඹ 7හි නිවස ඔහු විශ්‍රාම ගියාම ඔහුට දෙන්න, නිල සහ අනෙක් වාහන, පෙට්‍රල් දීමනාව විශ්‍රාමික විනිසුරුවරයෙකුට දෙන තරමට දෙන්න, වතුර බිල්, ලයිට් බිල්, telephone bill සහ නිල නිවාසයේ තිබෙන සියලුම වියදම් දරන්න, කොටින්ම කියනවා නම් කා.කා.ස දෙදෙනෙකුටත් අනුමැතිය ඉල්ලා තිබෙනවා. ඒකට පාවිච්චි කළෙත් මේ 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත. ඒකට අධිකරණය ඉඩ දුන්නේ නැහැ. මොකද, ඒ අවස්ථා දෙකේම ඒ පනතේ නැති දේවල් තමයි ඒගොල්ලන් ගන්න උත්සාහ කළේ.

දැන් සමහර අය කියන්න පුළුවන්, යුද්ධය දිනපු කෙනාට ආරක්ෂාව නැහැ කියලා. ආරක්ෂාව ගැන මොකුත් මේ පනතේ සඳහන් වෙලා නැහැ. ආරක්ෂාව ගැන තිබෙන්නේ Cabinet Papersවල. ආරක්ෂාව මදි නම් අවශ්‍ය ඕනෑම අවස්ථාවක වැඩි කරලා ඉල්ලන්නත් පුළුවන්. ඕනෑ කෙනෙකුට තර්ජනයක් තිබෙනවා නම් security ඉල්ලන්න පුළුවන්. මේක පටලවා ගන්න හොඳ නැහැ. මොකද, ලබා දෙන යාන වාහන, security, නිල නිවාසයේ security bulbs සවි කිරීම වැනි දේවල් මේකේ තිබෙන ඒවා නොවෙයි. කෙසේ හෝ වේවා ගරු කථානායකතුමනි, මම පෙන්වන්න උත්සාහ කළේ මේ පනත අවභාවිත වෙන එක වළක්වා ගන්නට අවශ්‍ය වෙනවා කියන එකයි. එහෙම නම් අපි මේ පනත තියන්න ඕනෑ නැහැ. මොකද, අපේ රටේ තිබෙන දේශපාලන සංස්කෘතිය අනුව මේක තිබුණොත් මිනිස්සු මරාගෙන කන එකයි, තමන්ගේ හැන්දෙන් තමන්ට බෙදා ගන්න එකයි තමයි සිද්ධ වෙන්නේ.

නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරනකොට රටක ආර්ථිකය පවා වර්ධනය වෙනවා. අද අපේ රට ආර්ථික ප්‍රපාතයෙන් ගොඩ ඇවිත් ඉතා සාර්ථක ලෙස ඉදිරියට යනවා. ඇයි? We are respecting the rule of law. අද පාලකයාත් නීතියට යට වෙලා අනෙක් පුද්ගලයින් වාගේ ජීවත් වෙනවා. ඇමතිවරු, මන්ත්‍රීවරු, අපි ඔක්කොම වරප්‍රසාද අතහැරලා කටයුතු කරන්නේ. අද සිරස මාධ්‍යයේ විකාශය වුණු ප්‍රවෘත්තියක් මම දැක්කා. එහි සඳහන් වුණු ආකාරයට ලෝක බැංකුවෙන් - World Bank එකෙන් - මොකක්ද කියන්නේ? ඒ ගොල්ලන් කියනවා, සියලු ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය නිසි පරිදි යෙදවීමට ශ්‍රී ලංකාව වඩාත් උචිත ලෙස ස්ථාන ගත වී ඇත කියා, that we are focused and positioned. ආර්ථික ස්ථායීකරණය සම්බන්ධයෙන් කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත කියලා. ඉතා වැදගත්ම දේ මේකයි. 1980 සිට මේ දක්වා රටවල් 123ක, අවස්ථා 330කදී මේ ආකාරයෙන් ඇති වූ ආර්ථික අර්බුද සමඟ ලංකාවේ තත්ත්වය සසඳා බැලීමේදී ආණ්ඩුවේ මෙම උත්සාහය වේගවත් සහ අරමුණු සහගතයි - sharp and faster. 2029 වන විට සියයට 2කින් ආණ්ඩුවේ ආදායම වැඩිකර ගැනීමට ඉඩ කඩ ලැබෙනවා, ආර්ථික වර්ධනයට සහ සාධාරණත්වයට බලපෑමක් නැතිව කියලාත් සඳහන් කරනවා. මේ ආකාරයේ achievement එකක් කරගන්න ලැබෙන්නේම ගරු කථානායකතුමනි, නීතියේ විධානයේ ආධිපත්‍යය නිසායි. ඒ නිසා අපට ඕනෑ නැහැ, නීතියට උඩින් ඉන්න කිසිවෙක්. ජනාධිපතිගේ සිට පහළට නීතියට යටත් වෙන්න ඕනෑ කියන ස්ථාවරය ඉතාම ගෞරවයෙන් අපි කියා සිටිනවා.

ඒ වාගේම, සමහරු තව තර්කයක් ගොඩ නඟනවා, විශ්‍රාමික ජනාධිපතිවරුන්ට විශ්‍රාම වැටුප් ආදි සහන දෙන්න ඕනෑ කියලා. විශ්‍රාමික ජනාධිපතිවරුන්ට, විශ්‍රාමික අගමැතිවරුන්ට යම් යම් පහසුකම් ලබා දෙන ඉන්දියාව ඇතුළු රටවල් කිහිපයක් තිබෙනවා. සිංගප්පූරුව, එංගලන්තය, ඉන්දියාව සහ එක්සත් ජනපදය වැනි රටවල් කිහිපයක් ඒ රටවල විශ්‍රාමික ජනාධිපතිවරුන්ට, අගමැතිවරුන්ට යම් වරප්‍රසාද ප්‍රමාණයක් දෙනවා. ඇයි ඒ දෙන්නේ? ඔවුන් විශ්‍රාම ගියාට පසුවත් රටට යම් පොදු යහපතක්, සේවයක් කරන නිසා. උදාහරණයක් වශයෙන් ටෝනි බ්ලෙයාර් අග්‍රාමාත්‍යවරයා විශ්‍රාම ගියාට පසු සේවා කිහිපයක් කළා. ඔහු Sports Foundation සහ Faith Foundation කියලා foundations 2ක්ම establish කළා. Then, he worked as an envoy for the Middle East Quartet. ඒ කියන්නේ මොකක්ද? ඔවුන් විශ්‍රාම ගියත් රටේ ප්‍රගතිය, රටේ brand එක, රට වෙනුවෙන් යම් යම් දේවල් කරන උදවිය. හිටපු අග්‍රාමාත්‍යවරියක වන මාග්‍රට් තැචර් ගත්තත් එහෙමයි. ඇයගේ අදහස් සම්බන්ධයෙන්, ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අප එකඟ නොවුණාට ඇයගේ ක්‍රියාවලින් පෙන්නුම් කරන්නේ මොකක්ද? හිටපු අගමැති හැරල්ඩ් මැක්මිලන් පවා peerage එකක් භාරගෙන නැවත ව්‍යවස්ථා සම්පාදනයට ආවා. ඒගොල්ලන් වෙනුවෙන් පොඩි ප්‍රතිපාදනයක් කරන්න ඕනෑ. ඇයි ඒ? ඒගොල්ලන් මොනවා හරි දායකත්වයක් රටට දෙන නිසා. නමුත්, අපේ කට්ටිය දැන් මොකද කරන්නේ? පුතාලාට මාළිගාවල් හදන්න try කරනවා. බලය නැති වෙච්ච දවසේ ඉඳලා ඒක ආපහු ගන්නේ කොහොමද කියලා කුරුමානම් අල්ලමින් ඉන්නවා. ඒගොල්ලන් රටට මොකක්ද කරන්නේ? මොකක්ද රටට දෙන දායකත්වය? ගරු කථානායකතුමනි, එහෙම නම්, බදු ගෙවන මිනිසුන්ගේ මුදල්වලින් ඒගොල්ලන්ට සහන දීම සාධාරණද? සාධාරණ නැහැ, කිසිසේත් සාධාරණ නැහැ. අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කරලාම කිව්වා, අපි මේ වාගේ වියදම් කරන්න ඕනෑ නැහැ කියලා. අපි මහ ජනතාවට ඒ බව දැනුම් දුන්නා. මහ ජනතාව අපට ඡන්දය දුන්නා. මෙම තත්ත්ව යටතේ අපි ඒ තීන්දුව ගත්තා. හැබැයි, කාට හරි ලොකු ආර්ථික අපහසුතාවක් තිබෙනවා නම් අපේ ජනාධිපතිතුමාට ලිපියක් ලියලා ඉල්ලන්න පුළුවන්, "මට ජීවත් වෙන්න හරිම අමාරුයි" කියලා. එහෙම අමාරුකම් තිබෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. මා හිතන විධියට, එහෙම ඉල්ලීමක් කළොත්, සාධාරණයක් කරාවි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have only two more minutes.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Okay.

උදාහරණයක් වශයෙන්, පුතාලාට රොකට් අරින්න සල්ලි තිබෙනවා නම්, ලක්ෂ පහමාරේ සපත්තු දමන්න පුළුවන් නම්, CSN ආදි නාළිකා තිබෙනවා නම් දෙමව්පියන්ට සලකන්න බැහැ කියන්න ඒගොල්ලන්ට හැකියාවක් නැහැ. [බාධා කිරීමක්] මම හිටපු කිසිදු ජනාධිපතිවරයෙකුගේ ප්‍රතිරූපයට හානි කරන්න සූදානම් නැහැ. හැබැයි ඔය කෑ ගහන කට්ටියට කියන්න ඕනෑ, කිරි මුට්ටි ටික දැන් ලැහැස්ති කරගන්න කියලා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්. We are trustees of public funds; we are not the owners of public funds. මිහිඳු මහරහතන් වහන්සේ දේශනා

කරපු දෙය තමයි "රජ, ඔබ භාරකාරයා මිස අයිතිකාරයා නොවෙයි" කියන එක. අපි ඒක ඇඟට අරගෙනයි තිබෙන්නේ. ඒ හේතුව නිසා ජනතාවට දුන් පොරොන්දුවක් පරිදිම අපි තීන්දු කළා ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත අහෝසි කරලා ජනතාවගේ බදු මුදල් නාස්ති වීම වැළැක්වීමට.

මම අවසාන වශයෙන් ගරු විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලීමක් කර සිටිනවා. ගරු විපක්ෂ නායකතුමාට මම කියනවා, ඔබ වෙනස් විධියට හිතන්න කියලා. අප වැරැදි කරන කොට හොඳ විපක්ෂයක් වශයෙන් ඔබ ඒවා විවේචනය කරන්න. නමුත් අපි හොඳ දෙයක් ගේනවා නම් අත ඔසවලා ඒකට උදවු දෙන්න. මම විශ්වාස කරනවා, ගරු විපක්ෂ නායකතුමා තමන්ගේ කණ්ඩායම - ඔය එක්කෙනෙකු දෙන්නෙකු හැර අනෙක් කට්ටිය- ඒ වෙනුවෙන් මෙහෙයවයි කියලා. විපක්ෂයේ ඔබතුමන්ලාගේ සහයෝගයද මේ හොඳ ක්‍රියාව සඳහා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Dayasiri Jayasekara, you have 12 minutes.
Order please! Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.39]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයට ගැනෙන මේ පනත් කෙටුම්පත සම්බන්ධව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන කාරණයක් තමයි මේ ඉෂ්ට කරන්නේ. ඒකට යම් ජනමතයක් ලැබී තිබෙනවා. ඒ අනුව ඒකට විරුද්ධ වෙන්න අපට බැහැ. ඒ වාගේම මම කියන්න කැමැතියි අපි මේකට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්න බලාපොරොත්තුවකුත් නැති බව. නමුත් මම කාරණා කිහිපයක් මෙතැනදී මතු කරන්න කැමැතියි, අපේ ගරු ඇමතිතුමා කියපු කාරණා ද සැලකිල්ලට ගනිමින්. "පුරවැසියාට නොමැති කිසිම දෙයක් පාලකයාට දිය යුතු නැත" යනුවෙන් මේ ආණ්ඩුවේ සුනිල් හඳුන්නෙත්ති ශූරින් කළ ප්‍රකාශයෙන් තමයි ඔබතුමන්ලා මෙය පටන් ගත්තේ.

එවැනි ප්‍රකාශවලින් ඔබතුමන්ලා මේ රටේ ජනකාන්තවාදය පටන් ගත්තා. එහෙම කළේ මේ රටේ මිනිසුන්ගේ ආකර්ෂණය දිනා ගැනීම සඳහායි. "පුරවැසියාට නොමැති කිසිම දෙයක් පාලකයාට දිය යුතු නැත" කියලායි ඔබතුමන්ලා කිව්වේ. හැබැයි, අද වෙනකොට ඒක කඩ වෙලා තිබෙන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දැන් දීලා තිබෙන ටික මම පස්සේ කියන්නම්. දේශපාලන නිදහස සම්බන්ධයෙන් 1971දී John Rawls සිය මතය ඉදිරිපත් කළා, “A Theory of Justice" කියන පොතෙන්, සමාන අවස්ථා තිබිය යුතුයි කියලා. එයට අනුව, political liberty refers to the right to vote and hold public office, freedom of speech, assembly, freedom of thought and integrity of the person. මේ කරුණුත් සමඟ එතුමා කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. John Rawls ගේ මතය තමයි අප මේ කාරණයේදී සැලකිල්ලට ගන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුරවැසියා හා පුරවැසියන්ගේ නියෝජිතයා කියන කාරණය ගත්තාම, එහි යම් වෙනසක් තිබෙනවා. ඒ වෙනස ගැන තමුන්නාන්සේලා මේ රටේ මිනිසුන්ට කිව්වේ නැහැ. හැබැයි, දැන් තමුන්නාන්සේලාටම ක්‍රමානුකූලව තේරිලා තිබෙනවා, එහෙම වෙනසක් තිබෙනවා කියලා. තමුන්නාන්සේලා කිව්වා ආණ්ඩුවේ වාහන භාවිතයට ගන්නේ නැහැ කියලා. නමුත්, මන්ත්‍රීවරු ගණනාවක් ආණ්ඩුවේ වාහන පාවිච්චි කරනවා. මා ළඟ ඒ ලැයිස්තුව තිබෙනවා. ඕනෑ නම් මම ඒක ඉදිරිපත් කරන්නම්. නිල නිවාස ගන්නේ නැහැ කියලාත් ඔබතුමන්ලා කිව්වා. නමුත්, මන්ත්‍රීවරු සියලුදෙනාම වාගේ නිල නිවාස පාවිච්චි කරනවා. ඒ විතරක් නොවෙයි, අද වනකොට ඒවායේ ටයිල් කරන්නත් අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒක තමයි ඉතින්. අපි කිව්වේ නැහැ නේ ඒවා. *[බාධා කිරීමක්]* ඔබතුමා කලබල කරන්නේ නැතිව ඉන්න. තමුන්නාන්සේලා නේ ඒවා කිව්වේ. අපි ඒවා කිව්වේ නැහැ. කයිය ගහන්නේ නැතිව පොඩ්ඩක් මේක අහගෙන ඉන්න. සමහර ඇමතිවරු පඩියයි, ඉන්ධනයි දෙකම ගන්නවා. ඒ කියන්නේ ඇමතිවරයෙකුට ලැබෙන එකත් ගන්නවා, මන්ත්‍රීවරයෙකුට ලැබෙන එකත් ගන්නවා; දෙකම ගන්නවා. එම නිසා මම කියන්න කැමැතියි, "පුරවැසියා" සහ "පුරවැසියාගේ නියෝජිතයා" අතර වෙනසක් තිබෙන බව. ඒ නිසා තමයි අගමැතිතුමිය ඕනෑම function එකකට ගියාම, තමුන්නාන්සේලා එතැන හිටියොත් නැඟිටලා එතුමියට ඉඩ දෙන්නේ. එහෙම කරන්නේ එතුමියට වෙනම විධියකට සලකන නිසා. එහෙම කරන්න ඕනෑ නැත්නම්, එතුමිය ආවාම තමුන්නාන්සේලා එතුමියට ඉඩ දෙන්නේ නැතිව පිටිපස්සට ගිහිල්ලා වාඩි වෙන්න කියන්න. කථානායකතුමා ආවාම කථානායකතුමාට අපි ඉඩ දෙනවා. නියෝජ්‍ය කථානායකතුමා එනකොට අපි ඉන්නවා නම් නැඟිටලා එතුමාට පුටුව දෙනවා. ජනාධිපතිතුමා එනවා නම් එතුමාට වෙනම පුටුවක් ලැහැස්ති කරලා තිබෙනවා. අපි ගිහිල්ලා ඒකේ ඉඳ ගන්නේ නැහැ. එහෙම තමයි මේක හැදිලා තිබෙන්නේ. එහෙම වෙන්නේ නැහැ කියලා නේ තමුන්නාන්සේලා කිව්වේ. හැබැයි, අද තමුන්නාන්සේලාටම ඒක අවබෝධ වෙමින් තිබෙනවා. ඒකයි මම මේ කියන්නේ.

මේ ක්‍රියාදාමය පිළිබඳව කථා කරලා ජනාධිපතිතුමා ඉස්සෙල්ලාම කළේ මොකක්ද? මේ පිළිබඳ හැදෙව්වා වාර්තාවක්. ඒ තමයි, චිත්‍රසිරි කමිටු වාර්තාව. මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, ඒ චිත්‍රසිරි වාර්තාවේ තිබෙන්නේ මොනවාද කියලා. දැන් මේ ගරු සභාවේ ඉන්නවා, ගරු සභානායකතුමාත්, ගරු අගමැතිතුමියත්. කරුණාකර, ඒ චිත්‍රසිරි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, ඔබතුමන්ලා ඒ චිත්‍රසිරි වාර්තාව මත තමයි පනත් කෙටුම්පත් ගෙන එන ඒවා ගැන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් කපන ඒවා ගැන තීන්දු තීරණ ගත්තේ. ඒ වාර්තාව සකස් කරන්න එතුමාට යම්කිසි මුදලක් ගෙවලා තිබෙනවා ඇති. ඒවා, මේ රටේ මිනිසුන්ගේ මුදල්; මහජන මුදල්. මට හිතෙන විධියට, ඒක නොමිලේ සකස් කරන්නේ නැතිව ඇති. ඒ චිත්‍රසිරි වාර්තාව කරුණාකර මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. අද බැරි නම්

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

හෙට උදේ හරි කමක් නැහැ ඒක ඉදිරිපත් කරන්න. මොකද, අපි කැමැතියි ඒකේ තිබෙන ඒවා ගැන දැනගන්න. මේ සියලු කරුණු එක්ක තමයි අපි මේ ගැන කල්පනා කරන්නේ.

වෙනත් රටවල හිටපු රාජ්‍ය නායකයන්ට ලබා දෙන පහසුකම් ගැන ගරු අධිකරණ ඇමතිතුමාත් කියපු නිසා මම ඒ ගැන දිගින් දිගටම කියන්න යන්නේ නැහැ. බංග්ලාදේශයේ හිටපු අග්‍රාමාත්‍යවරියට ඩොලර් 800ක් ගෙවනවා. ඒ, අවසාන වරට ගත්තු පඩියෙන් සියයට 75ක්. ස්විට්සර්ලන්තයේත්, ජීවත් වෙනතුරුම පඩිය, නිවාස, ගමනාගමනයට, කාර්ය මණ්ඩලයට ගෙවීම් කරනවා. ඒ වාගේම ෆින්ලන්තයේ, පෝලන්තයේ, ප්‍රංශයේ සහ ඉන්දියාවේත් එහෙම ගෙවනවා. ඉන්දියාවේ ජනාධිපතිට විතරක් නොවෙයි උප ජනාධිපතිටත් -1997දී පනතක් ගෙනැල්ලා- ඉන්දියානු රුපියල් ලක්ෂ දෙක ගණනේ මාසයකට ගෙවනවා. නිවසක්ද ලබා දෙනවා. ලේකම්වරයාටත් ගෙවනවා. ඒ වාගේම ජර්මනිය, එංගලන්තය, ඇමෙරිකාව ආදි රටවලත් මෙවැනි ගෙවීම් කරනවා. අපේ අධිකරණ ඇමතිතුමා දැන් කිව්වා, එංගලන්තයේ හිටපු අගමැති ටෝනි බ්ලෙයාර් විශ්‍රාම ගියාට පසුවත් ඒ රට වෙනුවෙන් සේවය කරනවා කියලා. එතුමා ඇහුවා, අපේ කට්ටිය මොනවාද කරන්නේ කියලා. එංගලන්තයේ ව්‍යවස්ථාව අරගෙන කියවා බලන්න. ඒකට අනුව, හිටපු අගමැතිවරු committee එකක ඉන්නවා. ඒගොල්ලන් ඒ කමිටුවේ වැඩ කරනවාට යම් ගෙවීමක් කරනවා. ඒක තමයි එහේ හදලා තිබෙන විධිය. ලංකාවේ එහෙම එකක් හදලා නැහැ. ඒ නිසා ලංකාවේ හිටපු ජනාධිපතිවරු නිකම් ඉන්නවා කියලා තමුන්නාන්සේලා කිව්වාට හරියන්නේ නැහැ. ඒ හැම කෙනෙකුම මේ රටට යම්කිසි වැඩ කොටසක් කරලා තිබෙන මිනිස්සු. වැරදි අඩු පාඩු සිද්ධ වෙන්න පුළුවන්. තමුන්නාන්සේලාගෙනුත් වැරදි අඩු පාඩු සිද්ධ වෙනවානේ, දවස ගානේ.

ඒ නිසා මෙතැන වෙන කාරණයක් තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනාධිපතිවරයෙක් තීන්දු තීරණ ගන්නේ රට වෙනුවෙන්. සමහර වෙලාවට යුද්ධ කරන්න තීන්දු ගන්නවා. සමහර වෙලාවට රටවල් එක්ක කැමැති නැති තීන්දු ගන්න සිද්ධ වෙනවා. ඒ තීන්දු ගන්න එතුමාට මුක්තියක් ලැබිලා තිබෙනවා. ඒ මුක්තිය පාවිච්චි කරන්නේ තමන්ට අනාගතයේ කරදරයක් නැතිව ඉන්න පුළුවන් වෙයි කියලා කල්පනා කරලා. ඒකට තමයි එතුමා රකින්නේ. වෙන කාරණයකට නොවෙයි. වෛරයක් තියාගෙන ඉන්නවා ජනාධිපතිවරු ලොකු කාර්වල යනවා, අරහෙම තමයි ඉන්නේ කියලා. ලැබුණු වරප්‍රසාද ටික misuse කළ එකේ ප්‍රශ්නය තමයි මේ තිබෙන්නේ. මේ පනතේ මොකක්ද තිබෙන්නේ? කැබිනට් ඇමතිවරයකුට දිය යුතු වරප්‍රසාද ටික දෙන්න කියලා. ඒ හැර ලබා ගත්ත ඒවා තමයි තමුන්නාන්සේලා පාවිච්චි කළේ මේ රටේ මිනිස්සු තුළ වෛරයක් ඇති කරන්න. ඒ වෛරය ඇති කරලා තමයි මේ විනාශය කළේ. නමුත් මතක තියා ගන්න, ඒ හැම කෙනෙකුටම ඒ අයිතිය තිබෙන්නේ ඔවුන් මේ රට වෙනුවෙන් වැඩ කරලා තිබෙන නිසා.

ඉතිහාසයේ ලංකාවේ හිටියේ රජ්ජුරුවෝ. එයා මැරෙනකම්ම හිටියා. ඊට පස්සේ අපට ආවා අග්‍රාණ්ඩුකාරයෙක්, ඊළඟට ආණ්ඩුකාරයෙක්, ඊළඟට නාමික ජනාධිපති කෙනෙක්, ඊළඟට විධායක ජනාධිපති කෙනෙක්. මේ විධියට තමයි ඒ ධුරය ආවේ. ඩී.එස්. සේනානායක මැතිතුමා, ඩඩ්ලි සේනානායක මැතිතුමා, ජෝන් කොතලාවල මැතිතුමා, බණ්ඩාරනායක මැතිතුමා යම් පදනමක් සහිතව, ආර්ථික හැකියාවක් ඇතිව හිටපු මිනිස්සු. චන්ද්‍රිකා මැතිනියත් එහෙමයි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එතුමාගේ "බ්‍රේමාර්" නිවස කෞතුකාගාරයකට දුන්නා. ප්‍රේමදාස මැතිතුමා මිය ගියේ මේ රටේ යුද්ධය යන අතරතුරේ එල්ටීටීඊකාරයකුගේ බෝම්බයක් වැදිලා. ඒ නිසා හේමා ප්‍රේමදාස මැතිනිය බලා ගන්නේ නිකම් නොවෙයි. නෝනා බලාගෙන ඉද්දී මහත්තයා ජනාධිපති විධියට මැරිලා යනවා. ඒ නිසා තමයි එතුමිය රකින්නේ. තමුන්නාන්සේලාගේ නායකයාගේ නෝනා මහත්තයා රකිනවා වැලිසර හමුදා කඳවුරෙන්. විප්ලවවාදියෙක් කියලා නේ තමුන්නාන්සේලා කියන්නේ. අපි කියන්නේ ත්‍රස්තවාදියෙක් කියලා එහෙම වුණා නම්. විජේවීර සහෝදරයාගේ නෝනා Commander of the Navy, නැත්නම් නාවික හමුදාපතිගේ සංග්‍රහ වියදම්වලින් 1989 ඉඳලා අද වෙනකම් බලාගන්නේ, දරුවෝ 5ක් එක්ක අදටත් බලාගන්නවා. වැලිසර කඳවුරේ අදත් ඉන්නවා. දැන් ඇයට ත්‍රීවිලර් එකක් දීලා තිබෙනවා. තමුන්නාන්සේලා කල්පනා කරලා ත්‍රීවිලර් එක වෙනුවට වාහනයක්වත් දෙන්න. නමුත් තමුන්නාන්සේලා කථා කළේ එහෙම නොවෙයි නේ. ඇයට ගෙදරක් හදලා දෙන්න කියලා තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් සල්ලි එකතු කළා. ඒවාට වෙච්ච දෙයක් නැහැ. එතුමිය තමයි මේවා කියන්නේ අපි නොවෙයි. ඕනෑ නම් දාලා පෙන්වන්න පුළුවන් එතුමිය කියන කථාව. ටිල්වින් සිල්වලා ඇවිල්ලා කථා කරපුවා ඇති. ඇයට ගෙයක් හදන්න සල්ලි එකතු කළා. අද එතුමිය යන්නේ ත්‍රීවිලර් එකේ. මම කියන්නේ නැහැ එතුමියගේ සැමියා රට විනාශ කළ නිසා එතුමියට ගහලා මරන්න කියලා. නමුත් එතුමියත් රැක ගත්තා. මොකද, මේ රටේ මිනිස්සු මිනිහෙක් වැටුණාට පස්සේ ඒ මිනිහා බලා ගන්න එකත් යම්කිසි විධියකින් කරනවා. එහෙම නම් ඒ එකතු කර ගත්ත සල්ලි ටික ගැනත් බලන්න ඕනෑ. 1989 ඉඳලා මේ රට ගිනි තියපු නායකයෙකුගේ නෝනාමහත්තයායි, දරුවෝ ටිකයි බලා ගත්ත ඒ සල්ලි ටික අපි ආපහු එකතු කර ගන්න ඕනෑ. එහෙම කරන්න කියලා අපි කියන්නේ නැහැ. ඒ වාගේ කුහක, කාලකණ්ණි අදහස් අපේ හදවතේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

හේමා ප්‍රේමදාස මැතිනියට ඒ තත්ත්වය ඇති වුණා. මතක තියා ගන්න ඕනෑ අනෙක් කාරණය තමයි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ රටේ යුද්ධය නතර කරන්න විශාල වෙහෙසක් ගත්තාය කියන එක. එතුමිය සාමය ගෙන යන්න බැලුවා, ඊළඟට යුද්ධය ගෙනිච්චා; උතුර බේරා ගත්තා. එතුමියගේ ඇහැක් අහිමි වුණා, යුද්ධය නිසා. ඒ නිකම් ටීක් බෝල ගහලා නොවෙයි. එතුමියලා ඒ ක්‍රියාදාමයට සම්බන්ධ වුණා.

දැන් මොකක්ද තමුන්නාන්සේලා කරන්න හැදුවේ? තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම මහින්ද රාජපක්ෂ මහත්තයාට අපහාස කරලා ගෙදරින් යන්න කිව්වා. යන්න බැරි නම් අපි එළවනවා කිව්වා. ඕවා නොවෙයි කරන්න තිබුණේ. මොකක් හරි විධියකට ඒක කථා කරන්න තිබුණා. නමුත් මම කියන්න කැමැතියි ඒක කරලා බැරි තැන තමයි -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Dayasiri Jayasekara, you have only two more minutes.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මම හිතන විධියට තව වේලාව තිබෙනවා, විනාඩි 10යි ගිහින් තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ජනාධිපතිට අනාගතයේ ඉන්න ගෙදරක් නැති වුණාම මොකක්ද වෙන්නේ? එතුමා බලා ගන්න විධියක් නැති වුණාම මොකද වෙන්නේ? එතුමා හිටපු status එකක් තිබෙනවා. එතකොට මොකක්ද වෙන්නේ? එතුමා ජනාධිපති විධියට ඉන්න ගමන් බලනවා අනාගතයේදී තමන්ගේ වැඩ කටයුතු ටික හදා ගන්න, බිස්නස්කාරයෙකුට, යාළුවෙකුට කථා කරලා.

ඒ ගෞරවය තියන්න තමයි රජයෙන් ඒ වගකීම භාර දෙන්නේ. ඔබ මොන තරම් වැඩ කළත් කමක් නැහැ, අපි ඔබ

මැරෙනකන් බලා ගන්නවා කියනවා. කොච්චරද මේකට යන වියදම? මේ වියදම මුළු දළ ජාතික නිෂ්පාදිතයෙන් 0.0011196යි. මම මේ කිව්වේ මේ අයට ගෙවන වියදම. මේ, දළ ජාතික නිෂ්පාදිතයේ වියදම. එතකොට total revenue එකෙන් වියදම කීයද? 0.008874යි. මේ ගැන තමයි මේ කථා කරන්නේ. ඇයි මේ? මේ තුළින් තමුන්නාන්සේලා මිනිස්සු තුළ වෛරයක් ඇති කළා මේ ක්‍රියාවලිය ඉස්සරහට ගෙනියන්න. මම මේ පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දෙන්නේ නැහැ. හැබැයි, මේ මතවාදය පිළිබඳවයි මම මේ කථා කරන්නේ.

අපි දන්නවා. තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? තමුන්නාන්සේලා සියලු මන්ත්‍රීවරුන්ගේ පඩිය අරගෙන account එකකට දානවා. Account එකකට දාලා ඒකෙන් කීයක් හරි ගෙවනවා. තමුන්නාන්සේලාට ජනාධිපතිවත් ඒ විධියට බලා ගන්න පුළුවන් වෙයි. හැබැයි, අපේ පක්ෂයේ එහෙම accounts හදලා මන්ත්‍රීවරුන්ගේ accountsවලින් ජීවත් වෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. අද තමුන්නාන්සේලා ගමේ කාර්යාල හදනවා. රුපියල් ලක්ෂයක් දෙනවා. කාර්යාල කොච්චර තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. ඒක නඩත්තු කරන්නේ පක්ෂයෙන් වෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවාත් දීලා තිබෙන්නේ ඒ ක්‍රියාදාමය ගෙන යන්නයි. මම කියන්නේ මේ මුදල් misuse කරන්නේ නැතිව වැඩ කටයුතු ටික කරන්න තිබුණා කියන එකයි. සමහර නායකයන් තමන්ගේ ගෙවල් දොරවල් හදා ගන්න විශාල වියදමක් ආණ්ඩුවෙන් දරාගෙන ඒ ක්‍රියාදාමය ක්‍රියාත්මක කළා.

අපි දැක්කා නේපාලයේ හිටපු අග්‍රාමාත්‍යතුමාගේ නෝනාමහත්තයා පුච්චලා මැරුවා. එහේ ඉස්සෙල්ලාම පෙන්වන්නේ මොකක්ද? ලංකාවේ ජනාධිපති මන්දිරය අල්ලා ගත්ත එක තමයි ඉස්සෙල්ලාම පෙන්වන්නේ. ඒකේ නටපු නාඩගම් ටික තමයි පෙන්වන්නේ. Swimming pool එකේ නටපුවා, ජනාධිපතිගේ ඇඳේ බුදියා ගත්ත ඒවා, පිනුම් ගහපු ඒවා. එවැනි රංචුවකට පුළුවන් මේ රට විනාශ කරන්න. එහෙම මේ පාර්ලිමේන්තුවත් විනාශ කරන්න හැදුවා. මේ පාර්ලිමේන්තුවට එන්න කිව්වා. කට්ටියට එකතු වෙන්න කිව්වා මේ පාර්ලිමේන්තුව අල්ලන්න යන්න. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ මේ වෙලාවේ නැති වුණත්, මම කියන්න ඕනෑ ලාල් කාන්ත මැතිතුමා එදා පොල්දූව හන්දියේ ඉඳන් කථා කරලා කිව්වා. එදා මේ පාර්ලිමේන්තුව ඇතුළට පැන්නා නම් තමුන්නාන්සේලා හිතනවා ද control එකක් තියෙයි කියලා? නැහැ. ඒගොල්ලන් මේක ඇතුළේ නටලා, කරන්න තිබෙන සෙල්ලම් ඔක්කෝම කරලා, කථානායකතුමාගේ පුටුව අනෙක් පැත්ත හරවලා ඒක උඩ ඉඳගෙන සෙල්ලම් කරලා නටලා ඔක්කෝම කරලා යයි. සමහර විට ගිනි තියන්නත් පුළුවන්. අපි දන්නේ නැහැ. ඒ වෙලාවේ ඒ තරම් වෛරයක් මිනිස්සුන්ට තිබුණා. හැබැයි, මොකක්ද කළේ? රනිල් වික්‍රමසිංහ මහත්තයා හදිසි නීතිය දාලා, හමුදාව දාලා ඒ තත්ත්වය පාලනය කළේ නැත්නම් අද මේ පාර්ලිමේන්තුවේ මෙහෙම ඉඳගෙන අපට කථා කරන්න ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි සිද්ධ වුණේ. ඒක තමයි අද නේපාලයේ ඇති වෙලා තිබෙන්නේ. මේක බංග්ලාදේශයෙන් පටන් ගත්තා. මතක තියා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, your time is up now.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේලා අද මේ රටට කරපු දෙයක් නැහැ. තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? එක්කෙනෙක් හිරේ දානවා. අරයා හිරේ දානවා කියනවා. හෙට අරයා යනවා කියලා හතර දෙනෙක් හිරේ දානවා. ඒ මිනිස්සු ආපහු සති දෙකකින් එළියට එනවා. තවත් හතර දෙනෙක් දානවා. තමුන්නාන්සේලා එක එක මිනිස්සු හිරේ දාලා සන්තෝෂ වෙලා Facebook එකේ දානවා, අරූ හිරේ, මූ හිරේ, අරූ හොරා මූ හොරා කියලා. හැබැයි, මොකක්ද රටට වෙලා තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මම වයඹ පළාතේ එක බැංකුවකට කථා කළා. මම ඒ නම කියන්නේ නැහැ. බැංකු ගිණුම් 8,000කට වැඩිය Non-performing Loans - NPLs - තිබෙනවා. ගෙවලා නැහැ. ගෙවන්න තිබෙන මුදල් බිලියනයකට වැඩියි. මිනිස්සු ආපුවාම අලුත් ව්‍යාපාරිකයන් ආවාම මොකක්ද කියන්නේ? ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක කොයි තරම් වැඩ කෙරුවත් ආණ්ඩුවේ ගේම පියවා ගෙන ඇති, ණය අඩු කරගෙන ඇති. හැබැයි, අපට හම්බ වුණු දෙයක් නැහැ මහත්තයෝ කියලා තමයි ඒගොල්ලන් කියන්නේ. තමුන්නාන්සේලා රටට කරපු දෙයක් නැහැ, මේ ටිකේ. මොකක්ද කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලා මේ වාගේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා දවස ගණනේ මිනිස්සු එක්ක කථා කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේකත් අහන්න කැමතියි. මම දිගටම මේ කන්ටේනර් ගැන ඇහුවා. අපි කිව්වා කරුණාකරලා අපට දෙන්න කියලා මේකේ CUSDEC document එක. මේ CUSDEC document එකෙන් තමයි අපට හොයා ගන්න තිබෙන්නේ කවුද මේවා ගෙනිව්වේ කියලා. ඒ නිසා මේ කන්ටේනර් 323 ඇතුළේ මේ කියන ඒවා ගෙනිච්චා කියලා අපි තවමත් කියනවා. එහෙම නැත්නම් තමුන්නාන්සේලා අපට කියන්න, නුවරඑළියේ ගෙදර අයිති කාටද, ඒකේ ඊට කලින් හිටියේ කවුද, ඒ අයිතිකාරයා කවුද, මේ බඩු ටික කොහේද තිබෙන්නේ? අද කවුරුත් මේ ගැන කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම කියන්න කැමතියි මේ සියල්ලම හොඳින් අවබෝධ කරගෙන වැඩ කරන්න කියලා. තමුන්නාන්සේලා මේ කරන වැඩවලින් තමුන්නාන්සේලාට දීලා තිබෙන mandate එක ක්‍රියාත්මක කිරීම ගැන මගේ ප්‍රශ්නයක් නැහැ. ඒක ක්‍රියාත්මක කරන්න. හැබැයි, මතක තියා ගන්න, දවසක් එනවා මේ රටේ මිනිස්සු ඔය වාගේම ආපහු හැරිලා තමුන්නාන්සේලාට ගහන දවසක්. ඒ දවස වෙනකොට ඉස්සෙල්ලාම බේරා ගන්න තිබෙන්නේ තමුන්නාන්සේලාගේ ජනාධිපතියි, අගමැතිවරියයි, ඇමතිවරු ටිකයි.

අපට ප්‍රශ්නයක් නැහැ. අපි කොහොමත් ඒ වැඩේට සූදානම්. ඕනෑ දේකට මුහුණ දෙන්න සූදානම්. හැබැයි මතක තියා ගන්න, ඒ වෙලාවට ඉස්සර වෙලාම එන්නේ තමුන්නාන්සේලා බලාපොරොත්තු දීපු තරුණයෝ ටික; ඒ බලාපොරොත්තු විනාශ වෙච්ච තරුණයෝ ටික. අද තරුණයෝ දහස් ගණනක් රැකී රක්ෂා නැතිව ඉන්නවා. උපාධිධාරීන් 35,000ක් රක්ෂා නැතිව ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we have to move on to the next speaker. Would you please wind up now?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මිනිස්සු නැඟිටින දවස වැඩි ඈතක නොවෙයි. එදාට අර නේපාලයේ වුණා වාගේ තමුන්නාන්සේලාට බලාගෙන ඉන්න සිද්ධ වෙයි කියන එකත් මතක් කරමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Najith Indika. You have ten minutes.

[පූ.භා. 11.55]

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි ඉදිරිපත් කරලා තිබෙන මේ පනත් කෙටුම්පත, එහෙම නැත්නම් මේ කරන සංශෝධනය ලංකාවේ දේශපාලන ඉතිහාසයේ වෙනස් දේශපාලන සම්ප්‍රදායයක් ඇති කරන, නැත්නම් මෙතෙක් කල් තිබිච්ච ගමනේ හැරවුමක් සලකුණු කරන, සංකේතවත් කරන අවස්ථාවක් කියලා මම හිතනවා. මම එහෙම කියන්නේ ඇයි? මම හිතන විධියට මගේ කථාවට කලින් කළ කථාවෙනුත් මගේ කථාවට අවශ්‍ය කාරණා ඔක්කෝම සැපයුණා. මේ පනත් කෙටුම්පත මොකක්ද? අපි අද මේ කරන්නේ මොකක්ද? මුලින්ම ඒක කථා කරලා ඉන්න එපා යැ. 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත අහෝසි කිරීම -ඉවත් කිරීම- තමයි අද අපි කරන්නේ. ඒක තමයි මෙකෙන් කරන්නේ. වෙනත් දෙයක් කරන්නේ නැහැ.

1978දී ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමය ඇති කළාට පස්සේ, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇති කළා. ජනාධිපතිවරුන්ට, අගමැතිවරුන්ට, නැත්නම් මැති ඇමතිවරුන්ට, මේ රටේ සාමාන්‍ය පුරවැසියන්ට හිමි අයිතිවාසිකම්, වරප්‍රසාද පිළිබඳව එම ව්‍යවස්ථාවේත් තිබෙනවා. එහෙම තිබියදී තමයි එවකට පැවැති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නැවත අවුරුදු අටකින්, 1986දී ජනාධිපතිවරුන්ට විශේෂ හිමිකම් සහිත පනතක් ගෙනාවේ. එහෙම එකක් ගෙනාවේ ඇයි? ව්‍යවස්ථාව හදන වෙලාවේ ඒක මතක් වුණේ නැත්තේ ඇයි? නිදහසින් පසුවත් ලංකාවේත් එක යුගයක් තිබුණා, දේශපාලනඥයා යම් ආකාරයකට සාමාන්‍යකරණය වෙලා හිටපු. ඔවුන්ට පෞද්ගලිකව දේවල් තිබුණු එක වෙනම දෙයක්. හැබැයි යම් ආකාරයකට දේශපාලනය කියන්නේ සේවයක් කියලා හිතන්න උත්සාහ කරපු කාලයක් තිබුණා. හැබැයි, 1977න් පස්සේ ඒක වේගයෙන් අනෙක් පැත්තට අරගෙන ගිය බව අපි දැක්කා. ලංකාවේ රාජාණ්ඩු 1815දී තමයි ඉවර වෙන්නේ. ඊට පස්සේ අපි පූර්ණ යටත් විජිතයක් බවට පත් වෙනවා. ඒක ඇත්ත. හැබැයි ලංකාවේ අන්තිමට රජවරු හිටියේ 1815දී. ඊට පස්සේ 1831දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක සර්ව ජන ඡන්ද බලය ලැබුණා. ඒකේ තේරුම හැමෝටම ඡන්ද බලය තිබෙනවාය කියන එක විතරක් නොවෙයි. ඒකේ තේරුම තමයි සියලු මිනිස්සු සමානයි කියන එක. රටේ නායකයා තෝරා ගනිද්දී, රටේ පාලකයන් තෝරා ගනිද්දී මේ රටේ හැම මනුස්සයාටම එක වාගේ අයිතියක් තිබෙනවා කියන පණිවුඩය තමයි ඒකෙන් ආවේ. එතකොට සියල්ලෝ සමානයි. හැබැයි සියල්ලෝ සමාන වුණාට පස්සේත්, කෙනෙක් යම් කාලයකට රටේ ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා, ඒ නායකත්ව මට්ටම්වලට පත් වෙලා, ජනාධිපති වෙලා, අගමැති වෙලා, ඇමති වෙලා, මන්ත්‍රී වෙලා - ඒ මොකක් හරි වෙලා- ඒ අදාළ ධුර කාලය ගත කළාට පස්සේත් ලැබෙන, මේ රටේ රස්සා කරන, මේ රට වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරන, මේ රට වෙනුවෙන් මුළු තරුණ කාලයම කැප කරලා අවුරුදු 55දී -60දී විශ්‍රාම යන සාමාන්‍ය මනුස්සයෙකුට නොලැබෙන අමුතු එක මොකක්ද? මොකක්ද ඒ වුවමනාව? ඒ මොකක්ද? ඒගොල්ලන් මලෙන් උපන්නාද? එහෙම එකක් නොවෙයි. මතක තියා ගන්න, අපි අදගෙනැල්ලා තිබෙන්නේ, ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත. ඒක අපට තමයි අදාළ. ඔබතුමන්ලාට නොවෙයි. මේ රටේ ආයෙත් ඔය පැත්තෙන් ජනාධිපතිවරු හැදෙන්නේ නැහැ. මේ රටේ ජනාධිපතිවරු හැදෙන්නේ මේ පැත්තෙන් විතරයි. ඒ නිසා ඒක ඔබතුමන්ලාට අදාළ වෙන්නේ නැහැ. එහෙම ගත්තොත්, මේක අපි සඳහා අපි ම දමා ගන්නා බාධකයක්. මේ නීතිය මේ රටේ අනාගතය සඳහා වාගේම, දැන් ඉන්න ජනාධිපතිටත් අදාළයි. මේක අතීතයට විතරක් අදාළ එකකුත් නොවෙයි. මේක දැන් ඉන්න ජනාධිපතිවරයාටත් අදාළයි; අපටත් අදාළයි. මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ, කළ යුතු වැඩක් නිසා. එහෙම නැතුව කාගෙන්වත් පළි ගන්න, කවුරුවත් ඉලක්ක කරගෙන කරන වැඩක් නොවෙයි. ඒ නිසා මේකේ වැදගත්කම තේරුම් ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම හිතන විධියට ගරු ඇමතිතුමාත් මේ ගැන කිව්වා. මේ පනත් කෙටුම්පත හරහා 1986 අංක 4 දරන පනත ඉවත් කිරීම කියන කාරණයේදී ඉවත් වෙන දේවල් කිහිපයක් තිබෙනවා. ඒ කියන්නේ 1986දී එකතු කරපු දේවල් ටික. ඒ අනුව ජනාධිපතිවරයෙකුට හෝ ජනාධිපතිවරයෙකුගේ වැන්දඹුවට සපයන ලද නිවසක් හෝ ගෙවන ලද දීමනාව, මාසික ලේකම් දීමනාව, නිල ප්‍රවාහන දීමනාව ඇතුළු කිහිපයක් ඉවත් වෙනවා. මේකට ඇතුළත් වෙන්නේ නැති වුණත් වරින් වර කැබිනට් මණ්ඩල තීරණ හරහාත් ආරක්ෂකයන්, වාහන සම්බන්ධයෙන් තීරණ අරගෙන තිබෙනවා. අවශ්‍යතාව පරිදි දැනුත් ඒවා ක්‍රියාත්මක වෙනවා.

හැබැයි, මේ තනතුර තමන්ට දෙවියන් වහන්සේගෙන් නිකම් ලැබුණු එකක් විධියට, වරප්‍රසාද සහිත දෙයක් විධියට පාවිච්චි කරපු එක යුගයක්, එක පියවරක් මේකෙන් ඉවර වෙනවා. මේ කියන මුදල පොඩි වෙන්න පුළුවන්. මුදල පොඩියි කියන්නේ, අපට සාපේක්ෂව නොවෙයි. අපි පසුගිය කාලයේ දැක්කා, එම නිල නිවාස ප්‍රතිසංස්කරණය සඳහා කීයක් වියදම් කළාද කියලා. ඒ සඳහා ලක්ෂ ගණන්, මිලියන ගණන්, කෝටි ගණන් වියදම් කළ හැටි අපි දැක්කා. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය ඒ මුදලේ ප්‍රමාණය නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රටේ දේශපාලනඥයා මේ රට මොන දිශාවටද ගෙනියන්නේ කියන එකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මම නැවත නැවතත් කියන්නේ මේකයි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එතුමාගේ අදහස කිව්වා. නමුත්, 2022 ජනතා අරගළය, ජනතාවගෙන් පුපුරා ගිය පීඩනය නිසා අවුරුදු දෙකකට පස්සේ මැතිවරණය හරහා වෙනස් ජනතා අභිලාෂයක් මත මේ ආණ්ඩුව බලයට පත් වුණා. එතකොට, 2022 ඇති වුණු තත්ත්වයත් නිකම් උදා වුණේ නැහැ. අපි ඒක හැමදාම කියනවා. මේ රට බංකොලොත් වුණා. අපේ කලාපයේ අනෙක් රටවල් බංකොලොත් වුණේ නැහැ. එහෙම බංකොලොත් වුණේ නිකම් නොවෙයි. ඊට කලින් අවුරුදු 10 අරගෙන බැලුවත්, ප්‍රධාන දේශපාලන ධාරා දෙක විධියට හිටපු දෙගොල්ලෝම මේ රට මාරුවෙන් මාරුවට පාලනය කළා. එහෙම ආපු ගමනක කෙළවරේ තමයි මේ රට බංකොලොත් වුණේ.

මේ රට බංකොලොත් වෙද්දී, මේ රට කඩාගෙන වැටෙද්දී, මේ රටේ දුප්පත් මිනිහා තවත් දුප්පත් වෙද්දී - දිළින්දා තවත් දිළිඳු වෙද්දී - 2023 සමීක්ෂණ වාර්තා අනුව මේ රටේ සියයට 68යි දශම ගණනකගේ ආහාර පරිභෝජනය කඩා වැටිලා තිබුණා. ළමා මන්දපෝෂණය අතින් මේ රට ආසියාවේ දෙවැනි තැනට ආවා. මේක එහෙම කඩා වැටුණු රටක්. අපි මේ කථා කරන්නේ ඕස්ට්‍රේලියාව ගැන නොවෙයි නේ. අපි මේ කථා කරන්නේ ජර්මනිය ගැනවත්, එංගලන්තය ගැනවත් නොවෙයි නේ. එතුමා රටවල් ලැයිස්තුවක් ඉදිරිපත් කරනවා, මම දැක්කා. අපි මේ කථා කරන්නේ ලංකාවේ ජනාධිපති ගැන. අපි මේ කථා කරන්නේ ලංකාවේ දැන් සිටින ජනාධිපති ගැන. අපි මේ කථා කරන්නේ දුප්පත්කම ඉහවහා ගිය ලංකාවේ ජනාධිපතිලා ගැන, විශ්‍රාමික ජනාධිපතිලා ගැන. ඒ නිසා මේ ගැන කථා කරනකොට ජර්මනිය ගැන කථා කරන්න එපා, ඕස්ට්‍රේලියාව ගැන කථා කරන්න එපා. පනතට අදාළව කථා කළොත්, ඔය කියන දේවල් ඒ රටවල ඇත්තේත් නැහැ. ඒ රටවලත් සමහර ජනාධිපතිවරුන් වෙනුවෙන් සීමා සහිතව තමයි විශ්‍රාම වැටුප් සහ වරප්‍රසාද පිරිනමන්නේ.

සමහර රටවල විශ්‍රාමික ජනාධිපතිවරු නිල රාජකාරිවලට ඇතුළු වෙනවා. ජනාධිපති කාලයෙන් පස්සේ ඔවුන්ට රජයේ යම් කිසි නිල රාජකාරි සහ වගකීම් පැවරෙනවා. ඒවාට අනුව තමයි සමහර දීමනා ලැබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා කියපු තොරතුරු ඇත්ත නොවෙයි. ඒවා ඇත්ත කියලා සැලකුවත්, අපි මේ කථා කරන්නේ ජර්මනියේවත්, එංගලන්තයේවත්, ඕස්ට්‍රේලියාවේවත්, ප්‍රංශයේවත් විශ්‍රාමික ජනාධිපතිවරු ගැන නොවෙයි. ඔවුන්ට සලකන්නේ කොහොමද, ඔවුන්ට කෝටි කීයක් දෙනවාද, ඔවුන්ට මොන වාගේ දේවල් දෙනවාද කියන එක ගැන නොවෙයි අද කථා කරන්නේ. බංකොලොත් භාවයෙන් උළුව උස්සන මේ රටේ, ආර්ථිකය කඩා වැටුණු මේ රටේ, තවමත් ළමයින්ට කන්න, බොන්න දෙන එක ප්‍රශ්නයක් වෙච්ච මේ රටේ විශ්‍රාමික දේශපාලනඥයන්ට සලකන්නේ කොහොමද කියන එක ගැන තමයි අපි මේ කථා කරන්නේ. ඒක අමතක කරන්න එපා. අපි මේ කථා කරන්නේ ඒක ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැනදී අපට වගකීමක් තිබෙනවා. වගකීමක් තිබෙනවා වාගේම ජන වරමකුත් තිබෙනවා. අපට ඒ දෙකම තිබෙනවා. අපි අලුතින් ඇවිල්ලා, පස්සේ හිතලා කරන දේවල් නොවෙයි, මේ. අපි මේවා ඡන්දයට කලින් කිව්වා, ඡන්දය වෙලාවේත් කිව්වා, ඡන්දයෙන් පස්සේ දැන් කරනවා. ඒක තමයි අපේ වැඩ පිළිවෙළ. ඒ සඳහා අපට පැහැදිලි ජන වරමක් ලැබුණා. මේක ඉලක්කම්වලින් පොඩි වෙන්න පුළුවන්. නමුත්, මේකෙන් දෙන සංකේතාත්මක වටිනාකම, මේකෙන් දෙන පණිවුඩය ලොකුයි. ඒක අමතක කරන්න එපා. මේකේ වැදගත්කම තිබෙන්නේ එතැන. මේ රට තුළ කොහොම දේශපාලන සම්ප්‍රදායක්ද මෙතැනින් එහාට හදන්නේ කියන එකයි වැදගත්. මෙතැනින් එහාට මේ රට තුළ කොහොම දේශපාලන සංස්කෘතියක්ද හදන්නේ කියන එක මේක ඇතුළේ තිබෙනවා. දේශපාලනයට ඇවිල්ලා, අවුරුදු කිහිපයක් වැඩ කරලා ගිහිල්ලා, පවුල් 50කට විතර පඩිංචි වෙන්න පුළුවන් ගෙදරක ඉන්න එක නොවෙයි වෙන්න ඕනෑ. ඔවුන්ටත් මේ රටේ සාමාන්‍ය මිනිස්සු විධියට විශ්‍රාම යන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ විශ්‍රාම වැටුප අහෝසි වෙන්නේ නැහැ.

ඔබතුමන්ලා විත්‍රසිරි වාර්තාව ගැන කිව්වා. විත්‍රසිරි කමිටු වාර්තාව මත පදනම් වෙච්ච දේවල් විතරයි මේකෙන් ඉදිරිපත් කරන්නේ. එම වාර්තාවට අනුව තව ඉස්සරහට යන්න තිබෙනවා. නිශ්චිත එක කාරණයක් තමයි, 1986 අංක 6 දරන පනත ඉවත් කිරීම. ඒක එක කාරණයක් පමණයි. මෙතැනදී අපි අවධාරණය කරන්න ඕනෑකම තිබෙන්නේ, මේ රට කොහොම තිබුණු රටක්ද, මේ රට දැන් තිබෙන්නේ කොතැනද, මේ රටේ ජනතාවගේ අපේක්ෂා මොනවාද කියන එකයි. විශේෂයෙන්ම ඒ අපේක්ෂා සම්බන්ධයෙන් මම නැවතත් කියනවා. මේ රටේ ජනතාව අපෙන් බලාපොරොත්තු වුණු දේවල් දෙකයි තිබෙන්නේ. මේ ආණ්ඩුව පත් කරද්දී, මේ ජනාධිපතිතුමා පත් කරද්දී ජනතාව බලාපොරොත්තු වුණු දේවල් දෙකයි තිබෙන්නේ. එකක් තමයි, තමුන්නාන්සේලා කඩා වට්ටපු ආර්ථිකය කොහොම හරි මේ රටේ මිනිසුන්ට ඔළුව උස්සන්න පුළුවන් තැනට පත් කරන එක. ඒ කියන්නේ ආර්ථිකය සංවර්ධනය කිරීම සහ ස්ථාවර කිරීම. දෙවැනි එක තමයි ආර්ථිකය කඩා වැටීමට හේතු වුණු මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා, මේ රටේ නීතියේ විධාන ස්ථාපිත කරලා, මේ රටේ දේශපාලනය කරන ක්‍රමය වෙනස් කරන එක. ඒ දෙකම අපෙන් බලාපොරොත්තු වුණා. ඒ දෙකට අදාළව තමයි අපි පොරොන්දු දුන්නේ, ඒ දෙකට අදාළව තමයි අපේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කළේ, ඒ දෙකට අදාළ දේවල් තමයි අපි මේ කරමින් ඉන්නේ. අපි කරලා තිබෙන්නේ මොනවාද කියලා ඔබතුමන්ලා දකින්නේ නැති වෙන්න පුළුවන්. දැන් තිබෙන ඉලක්කම් අරගෙන බලන්න, රටේ තිබෙන තත්ත්වය අරගෙන බලන්න. ඒ වාගේම මහ බැංකු වාර්තා බලන්න, ලෝක බැංකු වාර්තා බලන්න, ADB වාර්තා බලන්න. කොහොමත් ඔබතුමන්ලා හොඳක් දකින්නේ නැහැ නේ. ඒක වෙනම කථාවක්. හැබැයි, මේ රටේ අපි විශ්වාස කරන දෙයක් තිබෙනවා. අපි හැමදාම විශ්වාස කරපු දෙයක් තිබෙනවා. දැන් නොවෙයි, මේ රට කඩා වැටුණාට පසුව නොවෙයි, මේ රට බංකොලොත් වෙන්න කලින් ඉඳලා ව්‍යාපාරයක් විධියට අපි විශ්වාස කරපු දෙයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ පසුගිය අවුරුදු 20 තිස්සේ කියපු දෙයක් තිබෙනවා. ඒ තමයි මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් නොකර මේ රටට ගමනක් නැහැ, මේ රටේ දේශපාලනඥයා නැවත සාමාන්‍ය මනුස්සයෙක් බවට පත් නොකර මේ රටේ ගමනක් නැහැ කියන එක. මේ රටේ විශ්‍රාම ගිය මිනිස්සු ලක්ෂ ගණනක් ඉන්නවා. අපේ දෙමව්පියනුත් ඉන්නවා. ඒ අය අවුරුදු 30ක්, 40ක් රට වෙනුවෙන් වැඩ කරපු අය. දැන් කියනවා, මේ අය රට වෙනුවෙන් වැඩ කරපු අය කියලා. රට වෙනුවෙන් වැඩ කරලා තමයි අනෙක් මිනිස්සුත් විශ්‍රාම යන්නේ. එහෙම විශ්‍රාම ගිය මිනිසුන්ට මීට වඩා -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Najith Indika, your time is up now.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

-ආරක්ෂාව පැත්තෙන් ප්‍රශ්න තිබෙනවා නම්, ඒවා දැනුත් වෙනවා. ඒක හරි. උඩින් වැටුණු, නැත්නම් දෙවියන් වහන්සේ විසින් පත් කළ භූමියේ නියෝජිතයන් විධියට හිටපු රාජ්‍ය නායකයන් හිටියා. රජවරුන් රට පාලනය කරපු කාලය ඉවර වෙනවාත් එක්කම තමයි ඒ කාලයත් ඉවර වුණේ. එතැනින් පසුව සර්වජන ඡන්ද බලය ලැබී අවුරුදු 100කට ආසන්න කාලයකට පස්සේත් ඒ මානසිකත්වයෙන් එළියට එන්න බැරි නම්, ඒ ගැන කනගාටුයි. අපි එළියට ඇවිල්ලා ඉන්නේ. මේ රටේ අනාගතය නිර්මාණය කරන්නේ අපි. මේ රටේ බලය වෙනස් වෙලා තිබෙන්නේ. මේක අපට අදාළ පනත් කෙටුම්පතක්. මතක තියා ගන්න, මේක ඔබට නොවෙයි, අපට අදාළ පනත් කෙටුම්පතක්. මේක අතීතයට අදාළ එකක් නොවෙයි, අපට අදාළ එකක්. අපි ඒක දැනගෙන තිබෙන්නේ. මේ රටේ දේශපාලනය නැවත මහපොළොවේ තියන වැඩේ අපි කරනවා. ඒකට ගන්නා එක පියවරක් ලෙසට අද දවසත්, මේ පනතත් ඉතිහාසගත වෙනවා. මම ආඩම්බරයෙන් ඒ පනත් කෙටුම්පත සම්මත කරන්නට අත ඔසවන්න බලාගෙන ඉන්නවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Gnanamuththu Srineshan. You have 10 minutes.

[பி.ப. 12.06]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம் தொடர்பாக இன்றைய நாளில் நடைபெறுகின்ற விவாதத்திலே கலந்து கொள்வதை யிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இந்த சனாதிபதி ஆட்சி

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

முறைமையை 1978ஆம் ஆண்டில் ஜே.ஆர். ஜயவர்தன அவர்கள், முதுநிலையை அடைந்த தனது 71ஆவது வயதில் கொண்டுவந்திருந்தார். அவரைத் தொடர்ந்து இந்த ஆட்சி முறையில் ரணசிங்க பிரேமதாஸ அவர்கள், டி.பி. விஜயதுங்க அவர்கள், சந்திரிகா அம்மையார், மஹிந்த ராஜபக்ஷ, மைத்திரிபால சிறிசேன, கோட்டாபய ராஜபக்ஷ, ரணில் விக்கிரமசிங்ஹ ஆகிய எட்டு சனாதிபதிகள் இந்த நாட்டில் ஆட்சி செய்திருக்கின்றார்கள். இந்த ஆட்சிமுறை எவ்வாறு இருந்தது? அவர்கள் எவ்வாறு ஆட்சி செய்தார்கள்? என்ற விடயத்தைத் தமிழ்த் தேசிய சமூகம் என்ற அடிப்படையில் நாங்கள் ஆராய்கின்றபோது, ஒரு சனநாயக ஆட்சிமுறை என்பதற்குள் ஒரு சர்வாதிகாரத்தைப் புகுத்திய ஆட்சி முறையாகத்தான் அதனைப் பார்க்க முடிகிறது. அதாவது, 1947இல் கொண்டுவரப்பட்ட சோல்பரி அரசியலமைப்புச் சட்டத்தில், இங்கு வாழ்கின்ற சிறுபான்மை மக்களைப் பாதுகாப்பதற்கான ஏற்பாடுகள் நான்கு காணப்பட்டன. அந்த ஏற்பாடுகளை அகற்றி, 1972ஆம் ஆண்டு முதலாவது குடியரசு அரசியல் யாப்பு கொண்டுவரப்பட்டது. அடுத்த கட்டமாக ஜே.ஆர். ஜயவர்தன அவர்கள் அந்த அரசியல் யாப்பில் மாற்றங்களை ஏற்படுத்தி, சனாதிபதி ஆட்சிமுறையைக் கொண்டுவந்தார்.

இந்த சனாதிபதித்துவ ஆட்சிமுறை எங்களுக்கு என்ன செய்தது? நாட்டுக்கு என்ன செய்தது? என்பது பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். ஜே.ஆர். ஜயவர்தன அவர்கள் இந்த சனாதிபதித்துவ ஆட்சிமுறையைக் கொண்டுவந்ததைத் தொடர்ந்து, 1979இல் 'பயங்கரவாதத் தடைச் சட்டம்' என்ற மனித குலத்துக்கே எதிரான ஒரு சட்டத்தைக் கொண்டு வந்திருந்தார். இந்தச் சட்டம் அப்பாவிகளைக் குற்றவாளிகளாக மாற்றியது; குற்றவாளிகளைத் தப்பிக்க வைக்கவும் வழிசெய்தது. சனாதிபதிகளின் உரித்துரிமைகளை இல்லாமற் செய்வதைவிட இந்த சனாதிபதித்துவ ஆட்சிமுறையே இந்த நாட்டில் இருக்கக்கூடாது என்பது எனது கருத்தாகும். ஏனென்றால், இந்த சனாதிபதித்துவ ஆட்சிமுறையானது கடந்த காலத்தில் படுபயங்கரமான செயல்களைச் செய்ய இடமளித் திருக்கின்றது. அதாவது, இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தைக் கொண்டுவந்து ஒரு சமூகத்தை அழிக்கின்ற செயற்பாடுகளைக்கூட செய்திருக்கின்றது. ஏன், ஜே.வி.பீ. யினரும்கூட அதனால் பாதிக்கப்பட்டிருக்கிறார்கள்.

அடுத்ததாக, இன்று நாங்கள் மண்ணைத் தோண்டு கின்ற போது மனித எலும்புக்கூடுகளை அடையாளங் கண்டு கொண்டிருக்கின்றோம். செம்மணியில் 230க்கும் மேற்பட்ட எலும்புக்கூடுகள் கண்டெடுக்கப்பட்டிருக்கின்றன. சனாதிபதித்துவ ஆட்சிமுறையில் சந்திரிகா அம்மையார் அதிகாரத்தில் இருந்தபோது இந்நிலைமை ஏற்பட்டிருக் கின்றது. இந்த ஆட்சிமுறை வடக்கில் மாத்திரமல்ல, கிழக்கிலும் பல மனிதப் புதைகுழிகளை உருவாக்கியிருக்கின்றது. இப்போது மனிதப் புதைகுழிகள் மாத்திரமல்லாமல், போதைப் பொருட்களும் புதைகுழியினுள் இருந்து எடுக்கப்படுகின்றன. இவற்றுக்கெல்லாம் இந்த ஆட்சிமுறைதான் காரணமாக இருந்திருக்கின்றது. ஆகவே, இந்த சனாதிபதித்துவ ஆட்சி முறை அரசியல் யாப்பிலிருந்து முழுமையாக நீக்கப்பட வேண்டும் என்பதுதான் எங்களுடைய நிலைப்பாடு.

ஒவ்வோர் ஆட்சியாளரும் தமது பதவிக் காலத்தில் இந்த சனாதிபதித்துவ ஆட்சிமுறையிலுள்ள அதிகாரங்களைப் பயன்படுத்தியிருக்கின்றார்கள். அந்த நேரத்தில் எதிர்க் கட்சி யில் இருந்தவர்கள் இந்த சனாதிபதித்துவ ஆட்சிமுறை நீக்கப்பட வேண்டுமென்று சொல்லி வந்திருக்கிறார்கள். ஜே.ஆர். ஜயவர்தன அவர்கள் சனாதிபதியாக இருந்தபோது சிறிமாவோ அம்மையார் சொன்னார், "இந்த சனாதிபதித்துவ ஆட்சிமுறை உதவாது" என்று. அதன் பின்னர் சந்திரிகா அம்மையார் ஆட்சிக்கு வந்தபோது, "ஆறு மாத காலத்திற்குள் அல்லது ஒரு வருட காலத்திற்குள் சனாதிபதி ஆட்சிமுறையை நீக்குவேன்" என்று சொன்னார். ஒவ்வொருவரும் எதிர்க்கட்சி யிலிருந்து கஷ்டப்படுகின்றபோது, அடக்கப்படுகின்றபோது, ஒடுக்கப்படுகின்றபோது சனாதிபதித்துவ ஆட்சிமுறையை வெறுக்கின்றார்கள். ஆனால், அவர்கள் சனாதிபதி ஆகிய பின்னர் அந்த ஆட்சிமுறையை அலங்கரிக்கின்றார்கள். அந்த அடிப்படையில் பார்க்கின்றபோது, ஒரு சனாதிபதி இந்த நாட்டுக்குக் கடமை செய்திந்தால், அவருக்குக் கிடைக்க வேண்டிய நியாயமான கொடுப்பனவுகள், பாதுகாப்பு என்பவற்றை வழங்குவது பற்றி நாங்கள் குறைகூறவில்லை. ஆனால், சனாதிபதியாக இருந்தார் என்பதற்காக, அளவுகடந்த ஆடம்பர ரீதியான வாழ்க்கை வாழ்வதற்குப் பல ஏற்பாடுகள் செய்யப்பட்டிருக்கின்றது. குறிப்பாகச் சொல்லப்போனால், கிட்டத்தட்ட 200க்கும் மேற்பட்ட படையினர் அவர்களது பாதுகாப்புக்கு இருக்கின்றார்கள்; முன்னாள் சனாதிபதி களுக்குக் கூடுதலான ஓய்வூதியம் வழங்கப்படுகின்றது; மாளிகை வாசிகளாக அவர்கள் ஆடம்பரமாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். ஆனால், சாதாரண மக்களின் நிலைமை எங்களுடைய நாடு வங்குரோத்து நிலைக்குச் சென்றிருப்பதைக் காட்டுகின்றது.

எமது நாட்டில் உயர் மட்டத்தில் இருக்கின்றவர்களுக்குக் கொடுக்கப்படுகின்ற சிறப்புரிமைகள் சாதாரண மட்டத்தில் இருக்கின்ற மக்களுக்கும் வழங்கப்படுகின்றதா? என்று கேட்டால், இல்லை என்றுதான் சொல்ல வேண்டும். ஜனநாயக அல்லது மக்களாட்சி நாடுகளில் மக்கள்தாம் முக்கிய மானவர்கள்; மக்கள்தாம் தலைவர்கள் என்றெல்லாம் வரைவிலக்கணம் காணப்படுகின்றது. ஆனால், சனாதிபதித்துவ ஆட்சி முறையில் மிகக் கூடுதலான சிறப்புரிமைகள், உரித்துரிமைகள் குறிப்பிட்ட சிலரால் மட்டும் அனுபவிக்கப்படுகிறது. அந்த வகையில், சாதாரண மக்களி லிருந்து மேலதிகமாக, அளவுக்கு அதிகமாக, ஆடம்பரமாக மிகவும் உயர்ந்த நிலையிலிருந்து அனுபவிக்கின்ற அந்த உரித்துரிமைகள் அகற்றப்படுவதில் எந்தப் பிழையும் இருக்க முடியாது. ஏனென்றால், இது மக்களையும் ஆளுகின்றவர் களையும் பாரிய இடைவெளிக்கு உட்படுத்துகின்ற ஒரு செயற்பாடாகக் காணப்படுகின்றது. ஆகவே, இந்த அளவுகடந்த சுகபோகங்களை, சொர்க்க வாழ்க்கையை அனுபவிக்கின்ற நிலைமை உண்மையில் இருக்கக் கூடாது என்பதுதான் எனது நிலைப்பாடாகும்.

எமது நாட்டில் ஜனாதிபதியாக இருக்கின்றவர் அரசின் தலைவராக இருக்கின்றார், அரசாங்கத்தின் தலைவராக இருக்கின்றார், ஆட்சித் துறையின் தலைவராக இருக்கின்றார், ஆயுதப் படைகளின் தலைவராக இருக்கின்றார் என்பது உங்களுக்குத் தெரியும். ஒருவர் இவ்வளவு தலைமைத் துவத்தையும் வகித்துக்கொண்டிருந்தும் இந்த நாடு முன்னேற்றமடைந்திருக்கின்றதா? பொருளாதாரச் செழிப்பைக் கண்டிருக்கின்றதா? ஜே.ஆர். ஜயவர்தன அவர்கள் சொன்னார், "நான் ஸ்ரீலங்காவை சிங்கப்பூராக மாற்றப் போகிறேன்" என்று. ஆனால், இங்கே சித்திரவதைக் கூடங்கள்தான் ஆக்கப்பட்டிருக்கின்றவேயொழிய, நாடு சிங்கப்பூராக ஆக்கப்படவில்லை என்பதை நாங்கள் அனுபவத்தில் சொல்கின்றோம்.

நான் முன்னர் குறிப்பிட்டதுபோல, இப்போது நாட்டில் பல மனிதப் புதைகுழிகள் கண்டுபிடிக்கப்பட்டுக் கொண்டிருக்

கின்றன. அது சத்துருக்கொண்டான் படுகொலையாக இருக்கலாம், கொக்கட்டிச்சோலைப் படுகொலையாக இருக்கலாம், கிழக்குப் பல்கலைக்கழகப் படுகொலையாக இருக்கலாம், வீரமுனைப் படுகொலையாக இருக்கலாம், குமுதினிப் படகுப் படுகொலையாக இருக்கலாம்! இவ்வாறு பல மனிதப் புதைகுழிகளைக் கடந்த கால ஆட்சியாளர்கள் உருவாக்கியிருக்கிறார்கள். இப்போது போதைவஸ்துகள்கூட புதைகுழிகளிலிருந்து எடுக்கப்படுகின்றன. அந்தளவுக்கு நிலைமை மாறியுள்ளது. சம்பந்தப்பட்டவர்களை விசாரிக்கின்ற போது அவர்களுக்கு உயர்ந்த மட்டங்களோடுகூட நெருக்கமான தொடர்புகள் இருப்பது பற்றிய செய்திகளை ஊடகங்கள் தந்துகொண்டிருக்கின்றன. ஆகவே, கடந்த காலங்களில் ஜனாதிபதிகளாக இருந்தவர்கள் தங்களுடைய அதிகாரத்தைப் பயன்படுத்தித் தங்களை முதன்மையுள்ளவர் களாக மாற்றிவிட்டு, மக்களை அதல பாதாளத்திற்குத் தள்ளியிருக்கிறார்கள். இவர்கள் செய்த சேவைகளைவிட மக்கள் பட்ட அவஸ்தைகள்தான் கூடுதலாக இருக்கின்றன.

நான் உங்களுக்கு ஒரு விடயத்தைச் சொல்கின்றேன். சில ஆண்டுகளுக்கு முன்னர் சாவகச்சேரி நகரத்தை அண்மித்த மிருசுவில் என்ற இடத்தில் 8 அப்பாவிகள் கொல்லப் பட்டார்கள். அதில் ஓர் ஐந்து வயதுக் குழந்தையும் கழுத்து அறுத்துக் கொலை செய்யப்பட்டது. இந்தக் கொலைகளைச் செய்தவர் சுனில் ரத்நாயக்க என்ற ஒரு படை அதிகாரி. இந்த விடயம் சம்பந்தமான வழக்கு நீதிமன்றத்தில் நடைபெற்று அவருக்கு மரண தண்டனை வழங்கப்பட்டது. பின்னர் மேன்முறையீடு செய்யப்பட்டபோதும் மரண தண்டனை உறுதிப்படுத்தப்பட்டது. இவ்வாறு அப்பாவிகளைப் படுகொலை செய்து மரண தண்டனை விதிக்கப்பட்ட பயங்கரக் குற்றவாளியை கோட்டாபய ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதி யாக இருந்தபோது பொது மன்னிப்பின்கீழ் விடுதலை செய்திருக்கின்றார். ஆகவே, இந்த அதிகாரங்களின்கீழ் இனவாத ரீதியான செயற்பாடுகள்தான் அளவுக்கதிகமாக நடைபெற்றிருக்கின்றது. இப்படியெல்லாம் செய்தவர்களுக்கு உச்சமான, மகோன்னதமான சிறப்புரிமைகளை வழங்கி இடாம்பீகமான வாழ்க்கையை வாழ்வதற்கான வசதிகளை வழங்கினால் இந்த நாடு ஓர் அபிவிருத்தி அடைந்த நாடாக முடியாது. வங்குரோத்து நிலையில் காணப்படுகின்ற இந்த நாட்டில் குறிப்பிட்ட ஒரு பிரிவினர் சொர்க்கத்தில் வாழ்ந்து கொண்டிருக்கின்றபோது, எங்களுடைய மக்கள் நரகத்தில் வாழ்ந்து கொண்டிருப்பதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. ஏனென்றால், இதில் சமத்துவமும் இருக்காது; சம உரிமையும் இருக்க முடியாது.

ஜே.ஆர். ஜயவர்தனவின் காலத்தில் இடம்பெற்ற மிக மோசமான கறுப்பு யூலைச் சம்பவத்தின்போது 3,000க்கும் மேற்பட்ட தமிழர்கள் அழிக்கப்பட்டார்கள். அதுபோல், யாழ்ப்பாண நூலகம் எரிக்கப்பட்டதும் இந்த சனாதிபதித்துவ ஆட்சியின் கீழ்த்தான் நடைபெற்றது. அந்தக் காலத்தில் பாராளுமன்றத்தின் 168 ஆசனங்களில் 140 ஆசனங்கள் ஜே.ஆர். ஜயவர்தனவின் கட்சிக்கு இருந்தது. அவ்வாறு 5/6 பெரும்பான்மையை வைத்துக்கொண்டு அவர் அடாவடியாகச் செயற்பட்டாரே ஒழிய, மக்களின் பிரச்சினைகளைத் தீர்க்கக்கூடிய விதத்தில் செயற்படவில்லை. எனவே, இப்படியான செயற்பாடுகளையெல்லாம் செய்கின்றவர் களுக்குச் சலுகைகள் மட்டுப்படுத்தப்பட வேண்டும். நாட்டின் தலைவர்கள் நாட்டுக்குச் சேவை செய்திருந்தால் அளவாக அவர்களுக்குரிய சலுகைகளை வழங்கலாம். ஆனால், அளவு கடந்த சலுகைகளை வழங்குவதென்பது பொதுமக்களை அதல பாதாளத்திற்குள் தள்ளிவிட்டு, நாட்டின் தலைவர்கள் எங்கோ இருந்துகொண்டு ஆட்சி செய்கின்ற ஒரு முறையாகத்தான் இருக்க முடியும். ஆகவே, நாங்கள் சிறப்புரிமைகளை மக்களுக்கு அளிக்க வேண்டும்.

இன்று வடக்கு, கிழக்கில் எத்தனையோ தொழிற்சாலைகள் மூடப்பட்டுக் கிடக்கின்றன. இதன் காரணமாக மக்களுக்குத் தொழில் வாய்ப்புக்கள் இல்லை. ஆகவே, மக்களுக்குச் சிறப்புரிமை கொடுப்பதாக இருந்தால், மக்களுக்குத் தொழில் வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுத்து, மக்களின் வாழ்வாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டும். அதனைச் செய்யுங்கள்! அதற்கு நாங்கள் எல்லோரும் உங்களுக்கு ஆதரவைத் தரக்கூடியதாக இருக்கும். நான் சொல்லவருவது என்னவென்றால், "Too much of anything is good for nothing" என்பதுபோல், அளவுக்கதிகமான சலுகைகள், அளவுக் கதிகமான இடாம்பீகமான வாழ்க்கை என்பது ஆபத்தாக அமைந்து விடும் என்பதைத்தான்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, give me only a minute, please.

இப்போது நான் இன்னும் ஒரு விடயத்தைச் சொல்லுகின்றேன். அதாவது, கிழக்கு மாகாணத்தில் தொண்டர் ஆசிரியர்கள் என்போர் 2005ஆம் ஆண்டிலிருந்து யுத்த காலத்தில் அங்குள்ள வெற்றிடங்களை நிரப்பி பணியாற்றியிருந்தார்கள். அவர்களுக்கு 14 ஆண்டுகள் கழித்து 2019இல்தான் நியமனங்கள் வழங்கப்பட்டிருந்தது. அந்த 14 ஆண்டுகள் கழித்து சிலர் 50 வயதிலும் நியமனம் பெற்றிருக்கிறார்கள். எனவே, அவர்கள் மேலும் 10 ஆண்டுகள்தான் பணியாற்றக்கூடியதாக இருக்கும். யுத்த காலத்தில் எங்களுடைய பிள்ளைகளின் கல்வியை முன்கொண்டு செல்வதற்கு அவர்கள் உதவியவர்கள். ஆனால், அவர்களுக்கு எந்தச் சிறப்புரிமையும் வழங்கப்படவில்லை.

இதேபோன்று இன்னுமொரு விடயத்தையும் சொல்லியாக வேண்டும். சுதேச வைத்தியத் துறையை வளர்க்க வேண்டும் என்பதற்காக ஆயுர்வேத வைத்தியம், சித்த வைத்தியம், யுனானி வைத்தியம் போன்றவை பல்கலைக்கழக ரீதியாகக் கட்டியெழுப்பப்பட்டது. ஆனால், இத்துறைகளைக் கற்றவர் களுக்கு 2017இலிருந்து தொழில்வாய்ப்புகள் இல்லை. இன்று பொறியியலாளர்களுக்கே தொழில்வாய்ப்பைப் பெறமுடியாத ஒரு நிலைமை இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்றது. கடந்த காலத்தில் இருந்த ஆட்சியினர் இவ்வாறான நிலைமையை ஏற்படுத்தியுள்ளனர்.

மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில், கடந்த காலத்தில் மாவட்டக் 'கோட்டா' அடிப்படையில் மருத்துவத் துறைக்கு 37 மாணவர்கள் அனுமதிக்கப்பட்டார்கள்; இப்போது அது 36 மாணவர்களாகக் குறைக்கப்பட்டிருக்கின்றது. இதுவும் பாதிப்பை ஏற்படுத்தியிருக்கின்றது.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, could you please wind up now.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, please give me only 30 seconds.

அதேபோன்று SLEASஐ எடுத்துக்கொண்டாலும் எமது நாட்டில் கிழக்கு மாகாணத்தில் மட்டும் கிட்டத்தட்ட 316 உத்தியோகத்தர்கள் தேவைப்படுகிறார்கள். ஆனால், 118 உத்தியோகத்தர்கள்தான் இருக்கின்றார்கள். ஆகவே, இந்த வெற்றிடங்களை நிரப்புவதற்குரிய நடவடிக்கையை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொண்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.18]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරයන්ගේ වරප්‍රසාද කප්පාදු කිරීමට අදාළ පනත තමයි අද පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ. මම හිතන විධියට, ජනාධිපතිවරු තුන්දෙනෙකු අද වනකොට නිල නිවාසවල ඉන්නවා. ඒ, හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා මහින්ද රාජපක්ෂ මැතිතුමා. ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද සම්පූර්ණයෙන්ම අයින් කරන්න ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය සියල්ලම හිතේ තියාගෙන ගෙනාපු පනතක් තමයි මේ පනත. මේ ජනාධිපතිවරු තුන්දෙනාම බලයට ගෙනෙන්න මේ ජේවීපී ආණ්ඩුව, නැත්නම් මාලිමාව ආණ්ඩුව උදවු කළා. 1994දී චන්ද්‍රිකා මැඩම් බලයට ගෙනෙනකොට "මල් බඳුන" ලකුණින් මේ අය තරග කළා. වක්‍රානුකූලව 1988-89 කාලය තුළ සියලුම ශ්‍රී ලංකා නිදහස් පක්ෂකාරයෝ සහ ජේවීපීකාරයෝ මරලා තිබුණු වෙලාවේ, හිර ගෙවල්වල හිටපු වෙලාවේ තමයි 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ආණ්ඩු බලය ගත්තේ. ඊට පස්සේ තමයි අපි ඔක්කෝටම සහනයක් ලැබුණේ. ඊට පස්සේ මේ සම්බන්ධයෙන් හිර ගෙවල්වල හිටපු හැම කෙනෙක්ම අපි බේරා ගත්තා. බොහෝ පිරිසක් මිය ගියා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවටත් වක්‍රානුකූලව උදවු කළා, 1994දී පැවති ජනාධිපතිවරණයේදී. ඒ විතරක් නොවෙයි, 2001දී අපියි, ජේවීපී එකයි මේ පාර්ලිමේන්තුවේම චන්ද්‍රිකා මැඩම්ගේ ආණ්ඩුවට සහයෝගය දුන්නා. මේ ජේවීපී එක එදා පරිවාස ආණ්ඩුවක් හැදුවා. 2004දී චන්ද්‍රිකා මැඩම්ගේ ආණ්ඩුව එක්ක එකතු වෙලා, "බුලත් කොළය" ලකුණින් එක්සත් ජනතා නිදහස් සන්ධානය පිහිටුවා ගත්තා. ඔන්න, චන්ද්‍රිකා මැඩම්ට ජේවීපී එක උදවු කරපු විධිය. 2005දී චන්ද්‍රිකා මැඩම් මහින්ද රාජපක්ෂ මහත්මයාට විරුද්ධ වුණු වෙලාවේ, චන්ද්‍රිකා මැඩම් මහින්ද රාජපක්ෂ මහත්මයාට ඡන්දය දෙන්න එපා කියපු වෙලාවේදීත් ඡන්දය දීලා ජනතා විමුක්ති පෙරමුණ තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමාව ජනාධිපති කළේ. එතකොට ඔන්න දෙදෙනෙකුට ජේවීපී එක උදවු කරලා තිබෙනවා.

ඊළඟට, 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ පරද්දන්න ජනතා විමුක්ති පෙරමුණ තමයි මෛත්‍රීපාල සිරිසේනට උදවු කරලා එතුමාව ජනාධිපති කළේ. තුන්දෙනෙකු බලයට ගෙනාවේ මේගොල්ලනුයි, අපියි එකතු වෙලා. ඒ බලයට ගෙනාපු තුන්දෙනාගේ වරප්‍රසාද තමයි අද අයින් කරන්නේ. කමක් නැහැ. අපි විතරක් නොවෙයි, මේකට සම්මාදම් වෙලා තිබෙන්නේ. මේ තුන් වතාවේදීම ජේවීපී එකත් සම්මාදම් වුණා, ජනාධිපතිවරු තුන්දෙනෙකු බලයට ගෙනෙන්න වාගේම එහෙම ගෙනැල්ලා ඒ තුන්දෙනාම එළවන්න. ඇහැක් නැති වුණා, චන්ද්‍රිකා මැඩම්ගේ.

මහින්ද රාජපක්ෂ මහත්මයා එළවන්න මාර අමාරුවක් නේ තිබුණේ. දැන් එළවන්න. අදින් පස්සේ එතුමා නිල නිවාසයෙන් අයින් කරන්න. කමක් නැහැ. මේ රටේ හැටනවලක්ෂයයි අපියි, ඔයගොල්ලනුයි ළඟ ඉන්නේ. යූඑන්පී එකේ අයයි, සමගි ජන බලවේගයේ අයයි එක පැත්තක්. අපේ හැටනවලක්ෂය තමයි ඔක්කොටම ඉස්සරහට බෙදා ගන්න තිබෙන්නේ. අපිටයි, ඔයගොල්ලන්ටයි ඔක්කොම ලක්ෂ 69ක්, 65ක් තමයි බෙදා ගන්න තිබෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂකාරයන්ටයි, පොහොට්ටුකාරයන්ටයි, ජේවීපීකාරයන්ටයි ඔක්කොටම තිබෙන්නේ හැටපන්ලක්ෂයයි. හැටපන්ලක්ෂය තමයි අපිට බෙදා ගන්න වෙන්නේ. අපි, අපිම තමයි මෙතැන කෙළ ගන්නේ. මේ වෙලාවේදී මම ඒ කාරණය කියන්න ඕනෑ. කමක් නැහැ. මම මීට වඩා ඒ ගැන කථා කරන්න බලාපොෙරොත්තු වෙන්නේ නැහැ.

මේ වෙලාවේ අධිකරණ ඇමතිතුමා ගරු සභාවේ නැහැ. මහින්දානන්ද අලුත්ගමගේ සහ නලින් ප්‍රනාන්දු පසුගිය කාලයේ හිරේ දැම්මා. එතුමන්ලා හිරේට දැම්මේ මොකටද? කැරම් බෝර්ඩ් සම්බන්ධ නඩුවට. ඒකේ සාක්කිකාරයා කවුද? ක්‍රීඩා අමාත්‍යාංශයේ හිටපු ලේකම්, නන්ද මල්ලවාරච්චි. අර දෙදෙනාව හිරේට දමන්න සාක්කි දුන්නේ නන්ද මල්ලවාරච්චි. හැබැයි, දැන් මාර වැඩේ. අර දෙදෙනා හිරේ. සාක්කිකාරයා එළියේ. නීතිපති ඊයේ පෙරේදා ආපසු ඒ නඩුව යටතේම තව නඩුවක් පවරනවා, පොදු දේපළ පනත යටතේ. මොකක්ද දමන නඩුව? නන්ද මල්ලවාරච්චි වැරදිකාරයා කරලා; නන්ද මල්ලවාරච්චිත් චූදිතයා කරලා. මරු නඩු! මාර නඩුවක් මේක. දැන් නන්ද මල්ලවාරච්චිත් චූදිතයා. දැන් නන්ද මල්ලවාරච්චිත් ඇතුළට දමන්න යනවා. අර දෙදෙනාට -මහින්දානන්දට සහ නලින් ප්‍රනාන්දුට- සාක්කි දුන් සාක්කිකරුව නීතිපති විසින් වැරදිකරු කර තිබෙනවා. එතකොට මේ එකම නඩුව දෙවතාවක් පවරලා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව නඩු දාලා දැම්මා, ඇතුළට. දැන් නීතිපති පොදු දේපළ පනත යටතේ මේ දෙදෙනාටම නඩු දමනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මහ අපහාසයක්. සාක්කිකාරයා වුණු නන්ද මල්ලවාරච්චි ඒකේ වැරැදිකාරයා කරලා. මොකක්ද මේ නඩුව? මේ වෙලාවේදී අපි ඒවා ගැන කියන්න ඕනෑ.

මේ වෙලාවේ ගරු සභාවේ අධිකරණ ඇමති නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැලිකඩ බන්ධනාගාරයේ තිබෙනවා, "චමින්ද වාට්ටුව" කියලා එකක්. මේ, චමින්ද වාට්ටුව කියන්නේ මොකටද? ඔබතුමා තවම "චමින්ද" වෙලා නැහැ නේ. වැලිකඩ බන්ධනාගාරයේ තිබෙන මේ චමින්ද වාට්ටුවේ ඉන්න අවුරුදු 80ක වාගේ කට්ටිය අතපත ගාලා බොහොම අමාරුවෙන් දැන් යන්නේ එන්නේ. චමින්ද වාට්ටුවේ ඉන්න කට්ටියට ඉස්සර සහනයක් දුන්නා, පොදු සමා කාලයක් කියලා. නැත්නම් එකතු කරලා සමා කාලය දුන්නා. දැන් ඒකත් නැහැ. මේ ආණ්ඩුව ආවට පසුව චමින්ද වාට්ටුවේ ඉන්න අයටත් ඒ වාගේ තත්ත්වයක් තමයි උදා වෙලා තිබෙන්නේ. මේවා ගැන මේ අධිකරණ ඇමතිතුමා හොයන්නේ නැද්ද දන්නේ නැහැ.

පොලීසිය භාර ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. පොලීසිය භාර ඇමතිතුමනි, අද වෙනකොට ඝාතන 98ක් සිද්ධවෙලා තිබෙනවා. සෙන්චරියට අඩු තව දෙකයි. හෙමිහිට අල්ලාගෙන සෙන්චරිය දාගන්න. මොකද, ඊයේ 98වැනි වෙඩිල්ල පත්තු වුණේ. සෙන්චරියට අඩු තව දෙකයි. හාෆ් සෙන්චරිය ගහලා ගොඩාක් දවස්. තව දෙකයි තිබෙන්නේ සෙන්චරියට. සෙන්චරිය හෙමිහිට දා ගන්න. බලාගෙන ඔබතුමාගේ කෝට් එකත්

උස්සාගෙන යයි. තිස්සමහාරාම පොලීසියේ ජීප් එකත් උස්සාගෙන ගිහිල්ලා. ඒ නිසා ඔබතුමා පොඩ්ඩක් පරිස්සමෙන් ඉන්න. පොලිස්පතිතුමාත් ඔබතුමාගේ පිටුපස්සෙන් යනවා. ඔබතුමා පොලිස්පතිතුමාවත් guard එකට දාගෙන යනවා.

දැන් බලන්න, පොලීසිය දිහා. පොලිස් දින සැමරුම් උත්සවයට ඔබතුමන්ලා ගිහිල්ලා පොලිස් නිලධාරින්ට උසස්වීම් ලබා දුන්නා. අද sergeant, SI, IP, ASP යන තනතුරුවල ඒ promotion එකක්වත් හරියට ලැබිලා නැහැ, පොලීසිය භාර ඇමතිතුමනි. STF එකේ මිනිස්සු ඔබතුමන්ලා guard එකට තියාගෙන ඉන්නවා. බලන්න එපා යැ, නීතිපතිතුමාගේ ඉස්සරහින් කාර් එකයි, පිටුපසින් කාර් එකයි. හැමෝටම guard එක දීලා තිබෙනවා. STF කට්ටිය පිටුපස්සෙන් යනවා. නමුත්, STF එකට promotions නැහැ. STF එකේ ඉඳන් එළියට ආපු මිනිසුන්ට promotions දීලා තිබෙනවා. බැරි නම් ඉලංගකෝන් ගෙනැල්ලා මොකක් හරි තනතුරක් දීලා එතුමාගෙන් හරි අහන්න, පොලීසිය කරගෙන යන ක්‍රමය. ඉලංගකෝන් තමයි මේ රටේ හිටපු හොඳම පොලිස්පති. ඒකත් මේ වෙලාවේදී මම කියන්න ඕනෑ.

පසුගිය දිනයක අපේ ඇල්ල-වැල්ලවාය ප්‍රදේශයේදී බස් අනතුරක් වුණා. ඒ අනතුරින් 15දෙනෙක් මිය ගියා. බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රදේශයේ ජීවත් වන කෙනෙකු හැටියට මම ඒ අනතුරින් පීඩාවට පත් වුණු ජනතාව වෙනුවෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. හැබැයි, ඒ අනතුරින් 15දෙනෙක් මිය ගිය සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා "newshub.lk" website එකේ මොකක්ද කිව්වේ? එතුමා කියනවා, ඒකත් මහින්ද රාජපක්ෂ හදපු පාරවල්වල ප්‍රශ්න ලු. ඔක්කෝම මහින්ද රාජපක්ෂගේ එකවුන්ට් එකට දාන්න එපා. මේ පාර කැපුවේ 1967දී. කවුද? මොන්ටෙගු ජයවික්‍රම. ඒ පාර 1970දී තමයි විවෘත කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සර වැල්ලවායේ ඉඳලා ඇල්ලට යන්න ඕනෑ හපුතලේ, බෙරගල, කොස්ලන්ද හරහා. කුඹල්වෙල හන්දියට කිලෝමීටර 42ක වාසියක් තිබෙනවා. ඒ පාරෙන් කිලෝමීටර 42ක වාසියක් තිබෙනවා. ඒ වාසිය තිබෙන පාර කපපු එකත් මහින්ද රාජපක්ෂගේ සැලසුම් නැති පාරවල් කැපිල්ලක් ලු. බලන්නකෝ, 1967දී මහින්ද රාජපක්ෂ පාර්ලිමේන්තුවට ඇවිල්ලාවත් නැහැ. මහින්ද රාජපක්ෂ පාර්ලිමේන්තුවට ආවේ 1970දී. ඒකත් මහින්ද රාජපක්ෂගේ එකවුන්ට් එකට දානවා. ඉතින්, මේ වාගේ කථා තමයි කියන්නේ.

ඊළඟ එක බලන්න. දැන් මරු වැඩේ. දැන් ඩඩ්ලි සිරිසේන මහත්තයා කියනවා, එයාගේ වැට එයා ගලවා ගන්නම් ලු. නමුත් අර අහිංසක මිනිසුන්ගේ ගෙවල්, වැව් තාවුල්ලේ ඉන්න අහිංසක මිනිස්සුන්ගේ ගෙවල් කැඩුවාම මොකද වෙන්නේ? අරයා කියනවා, එයාගේ වැට කඩා ගන්නම් කියලා. එයාට කොහෙන් හරි ආණ්ඩුව දෙයි. තව ඉඩම් දෙයි. අරහේ හෝටල් හදයි; මෙහේ හෝටල් හදයි. ඉතින් එයා වැට කඩා ගන්නම් ලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතාගෙන හිටියේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයා විතරයි ආප්ප කාලා ගියේ කියලා. බලනකොට ඩඩ්ලිත් ආප්ප කාලා මේ ආණ්ඩුවට ගිහිල්ලා වාගෙයි. ඩඩ්ලිත් ආප්ප කාලාද දන්නේ නැහැ ගිහිල්ලා තිබෙන්නේ. මම හිතාගෙන හිටියේ මෛත්‍රීපාල සිරිසේන විතරයි ආප්ප කාලා ගියේ කියලා. *[බාධා කිරීම්]* එයත් ගිහිල්ලාද කොහේද, මේ ආණ්ඩුවට. මොකද, එයා කියනවා, ආණ්ඩුව ගත්ත නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා. ආණ්ඩුව නීතිය ක්‍රියාත්මක කරන්න, එයාත් වැට කඩාගෙන යන්නම්ලු. මාර කථා නේ. එයාගේ හෝටලයේ වැට එයා කඩා ගිනියි. එයාට ප්‍රශ්නයක් නැහැ. එයාට ඉන්න ගෙවල් තිබෙනවා. නමුත් නුවර වැවේ සහ අනික් වැව්වල වැව් තාවුල්ලේ ගෙවල් හදාගෙන ජීවත් වෙන දහස් ගණනක් මිනිස්සු ඉන්නවා. ඒ මිනිසුන්ගේ ගෙවල් කැඩුවාම ඒ මිනිස්සු කොහාටද යන්නේ? අන්න ඒක තමයි මේ වෙලාවේ කියන්න තිබෙන්නේ. ඉතින් මේ වාගේ අපභ්‍රංස කථා තමයි මේ වෙලාවේ කියන්නේ.

ඒ වාගේම තව කාරණයක් මම කියන්න ඕනෑ. සමහර ඇමතිවරු ජාත්‍යන්තරයට ගිහිල්ලා කථා කරනවා. අපි පිළිගන්නවා, විජිත හේරත් මහත්තයා එදා මානව හිමිකම් කවුන්සලයට ගිහිල්ලා, වැරදිලා හරි හොඳට හරි ඒ කටයුත්ත හොඳට කළා; රට වෙනුවෙන් කළා. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මම එකක් කියන්න ඕනෑ. ඔය ගොල්ලන්ට මතක ඇති, 1995දී මුත්තයියා මුරලිදරන්ගේ සිද්ධිය වෙලාවේ අර්ජුන රණතුංග හැසිරිච්ච විධිය. සුද්දා දණ ගැස්සුවා, ඔස්ට්‍රේලියාවේ ඕවල් ක්‍රීඩාංගණයේදී. සුද්දාව දණ ගැස්සුවා. ඩැරල් හෙයාව දණ ගැස්සුවා, අර්ජුන රණතුංග පිට්ටනියේ. එදා අපි World Cup එක ගත්තේ අර්ජුන රණතුංගගේ ඒ ඩ්ඩිතරභාවය සහ භාෂාව හැසිරවීම නිසා. අර්ජුන රණතුංගගේ ඩ්ඩිතරකම සහ භාෂාව හැසිරවීම. අන්න ඒ නිසා අපේ රට වෙනුවෙන් ආණ්ඩුව නියෝජනය කරමින් කොහේ හරි රටකට නායකයෙක් යනවා නම්, සුද්දන්ව දණ ගස්වන්න පුළුවන් විධියට කථා කරන්න පුළුවන් ඩ්ඩිතරකමක් තිබෙන නායකයින් රට වෙනුවෙන් ඉදිරිපත් කරලා ඔවුන්ව රට වෙනුවෙන් යවන්න. ජාත්‍යන්තර සමුළුවලට, ජාත්‍යන්තර වැඩසටහන්වලට යවනකොට ඒ විධියේ අය යවන්න.

ඊළඟ කාරණය, මේ රජය ඇවිල්ලා, මේ වාගේ ගෙවල් කඩ කඩ ඉන්න වෙලාවක් නොවෙයි, දැන් තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ මහත්තයා අද ගෙදරින් යයි. චන්ද්‍රිකා මැඩම් ගෙදරින් යයි. මේවා නොවෙයි, ප්‍රශ්න. මේ රටේ මීට වැඩිය ප්‍රශ්න තිබෙනවා. වැඩ ගොඩක් තව එහෙමම ඉතුරු වෙලා තිබෙද්දී, මේ ගෙවල් කඩ කඩ ඉන්න ප්‍රශ්න නොවෙයි තිබෙන්නේ. පොලීසිය භාර ඇමතිතුමනි, ඔබතුමා පොලිස් දිනයේදී එදා කථා කළා. මාත් අහගෙනයි හිටියේ. ජනාධිපතිතුමා කථා කළා. ඔබතුමාත් හිටියා. බොහොම හොඳයි. ඔබතුමා ගල්ගමුවේ. පොලීසියේ ඉඳලා ආවා. මේ වතාවේ ගල්ගමුවට තරග කළා. මම දන්නවා. ඉතින් හොඳයි. හැබැයි, ජනාධිපතිතුමාගේ කථාවේදී කිව්වා නේ, නීතියට කාලයක් නැහැ කියලා. නීතියට කාලයක් නැහැ. ඒක හරි. අවුරුදු 20ද, 30ද, 40ද කියලා. ඔබතුමා දන්නවා නේ, දළදාගම හන්දියේදී ගඩාපිට තිබ්බේ බෝම්බය, 1989දී. නමුත් ගඩාපි අහු වුණේ නැහැ. අහු වුණේ කවුද? මහවැලියේ ඉංජිනේරුවා, නෝනා සහ ළමයින් දෙන්නා. ඔවුන් උඩ ගියා. ඔබතුමාගේ area එකේ. ඊළඟට, එප්පාවල පොලීසියට තියපු බෝම්බය. ඊළඟට ගල්නෑව බෝම්බය. ඊළඟට, කැකිරාව බෝම්බය. කැකිරාව පොලීසිය ගත්තා. ඔයගොල්ලෝ 2.00 වෙනකොට ගත්තා, කැකිරාව පොලීසිය. ඉතින් ඔබතුමා ගල්ගමුවේ හිටපු මිනිහාට ඕවා මතකයි නේ. ඒ නිසා ඒවාටත් නීතිය ක්‍රියාත්මක කරමු. ඒවා ගැනත් හොයමු. ගඩාපිට වැඩේ දෙන්න බැරි වුණා. වැඩේට නිකම් මාට්ටු වුණේ අර අහිංසක ඉංජිනේරුවා, නෝනා සහ ළමයින් දෙදෙනා. ඉතිහාසය හොයනවා නම්, වැලිතලාවට යට කරන්නේ නැත්නම්, වැලිතලාවෙන් වැහෙන්න දෙන්නේ නැත්නම් අන්න ඒවාත් අපි හොයන්න බලමු. අර නිමල් ලාන්සා බලන්න. අවුරුදු 19යි මාස 7යි, කා එක්ක හරි ගහ ගත්ත සිද්ධියක් වුණා.

ඒකට ඇතුළට දාලා ඒ මිනිහාට ඔන්න ඊයේ පෙරේදා ඇප දුන්නා. ඒ වාගේ සිද්ධිවලට කාලයක් නැත්නම්, කාලයේ වැලිතලාවලට යට වෙන්නේ නැත්නම්, අනික් දේවල් ගැනත් හොයන්න. මම මේ කිව්වේ පොඩි පොඩි සිද්ධි තුනක්; පොලීසිය භාර ඇමතිතුමාගේ ගමේ, එතුමාගේ area එක කිට්ටුව වෙච්ච සිදුවීම්. ඒවා ගැනත් සොයා බලන්න. සොයලා මේ වැඩ පිළිවෙළ කාටත් සාධාරණ විධියට කරගෙන යන්න.

මම ඉල්ලීමක් කරනවා. අද මේ පනත් කෙටුම්පත සම්මත වෙයි. මහින්ද රාජපක්ෂ මහත්මයා හෙට ගෙදර යයි. ප්‍රශ්නයක් නැහැ. අපි දෙගොල්ලන්, තුන්ගොල්ලන්ම, ඔක්කොම හිතාගන්න

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඕනෑ, අපි ළඟ තිබෙන්නේ ඡන්ද ලක්ෂ 65යි. ඊළඟ ඡන්දයේදී ඒක බෙදා ගන්න වෙනවා, අපි ටිකට. මේගොල්ලන් එකතු වුණොත් - යූඑන්පීකාරයොයි, සමගිකාරයොයි - ඒ මිනිස්සු ගාව කීයද? සජිත් ගිය සැරේ ලක්ෂ 44යි, රනිල් ලක්ෂ 22යි. ලක්ෂ 66යි, ඒ පැත්ත එකතු වුණොත්. අපි ඒ පැත්තට එකතු වෙන්නේ නැහැ. අපි එකතු වෙන්නේ නැහැ කියමුකෝ. එකතු වුණේ නැත්නම් අපියි, ඔයගොල්ලනුයි එක ගොඩේ. *[බාධා කිරීම්]* ඒගොල්ලන් එකතු වෙලා ගේම ගහයි. ඒ නිසා වෛරයෙන් වැඩ කරන්න එපා. වෛරය නවත්වා ගන්න. මම දැන් සභානායකතුමාටත් කිව්වා. මේවා හොඳයි, ජනප්‍රිය තීන්දු. මේවා කරන්න. කරයි. ඡන්දය කාලයේ දීපු පොරොන්දු. ඒක හරි. මේවා කරන්න ඕනෑ. ඡන්ද පොරොන්දු. සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, මේවා කරනකොට අපට දෙපාරක් හිතන්න වෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාට මිනිස්සු ඡන්දය නොදුන් එක වෙනයි. මහින්ද රාජපක්ෂ මහත්මයාව මිනිස්සු ප්‍රතික්ෂේප කරපු එක වෙනයි. හැබැයි, ඔයගොල්ලන් මතක තබාගන්න, සිංහල, බෞද්ධ මිනිස්සු ළඟ මහින්ද රාජපක්ෂ කියන චරිතයට ගරුත්වයක් තිබෙන බව. ඒ අය මහින්ද රාජපක්ෂ කියන චරිතයට ආදරය කරනවා. ඒකට ඔබතුමාගේ දෙනියායෙත්, මාතරත්, මගේ බදුල්ලෙත්, මහියංගනයෙත් භේදයක් නැහැ. ඒ නිසා ඔයගොල්ලන් ඒ ගැන හොඳ අවබෝධයෙන් කටයුතු කරන්න.

මම සභානායකතුමාට කිව්වා, මේ වාගේ ජනප්‍රිය තීන්දු ගන්න පුළුවන්. හැබැයි, ජනප්‍රිය තීන්දු ගත්තා වාගේ නොවෙයි, ඒ තීන්දු වැරදුණාම අනික් පැත්තට මිනිස්සු කටයුතු කරන විධියත් බලන්න. අපේ සිංහල මිනිස්සු ගැන දන්නවා නේ. හැරෙන්න ගියාම කොහොමද හැරිලා දෙන්නේ? ගෝඨාභය ගෙනාවේ කොහොමද? ගෝඨාභය ගෙනාපු විධිය කොහොමද? හැටනව ලක්ෂයක් ඡන්දය දීලා උඩ තියලා ගෙනාවේ. දැන් එහා පැත්තේ එක් මහත්තයෙක් කිව්වා, ඊළඟ ජනාධිපති මෙහෙන් එන්නේ නැහැ, ඊළඟ ජනාධිපතිත් එහෙන් එන්නේ කියලා. ගෝඨාභය ඇවිල්ලා මාස තුනයි, ජනාධිපති වුණා. මේ නිකම් අනන්මනන් කථා කියන්න එපා. ඊළඟ ජනාධිපති කොහේ ඉන්නවාද, කොයි ලෝකයේ ඉන්නවාද, කොයි රටේ ඉන්නවාද කියලා කියන්න බැහැ. *[බාධා කිරීම්]* හරි, හරි. ඉන්නකෝ පොඩ්ඩක්. සමහරවිට මේ මගේ යාළුවා, සමන්ත විද්‍යාරත්න එහෙම වුණොත් මොකද වෙන්නේ? එහෙමත් වෙන්න පුළුවන්. *[බාධා කිරීම්]* ඒක වෙන්න බැරිද? ඒකත් වෙන්න පුළුවන්. *[බාධා කිරීම්]* ඒක වෙන්න බැරිද? අපි මේ දේශපාලනය හොඳට ගිලලා, බීලා වමාරලා ඉන්නේ, වටගල මහත්තයෝ. අපි ජනාධිපතිවරු හදපු මිනිස්සු, ආණ්ඩු නැති කරපු මිනිස්සු. මෙන්න මෙතැන අනුර කුමාර මහත්තයා හිටියේ ඡන්දය ගණන් කරපු දවසේ. ඔන්න, ඔතැන ගණන් කළේ රනිල්ගේ ඡන්දය. එළියට ඇවිල්ලා අනුර කුමාර ජනාධිපතිතුමා මට කියලා ගියා, "උඹ හරි බන්. උඹගේ ගේම් එක හරි" කියලා. එහෙම කියලා තමයි මෙතැනින් ගියේ. ඒ නිසා, අපි ආණ්ඩු හදපු මිනිස්සු. අපි ඒ නිසා හොඳට දන්නවා. ඒ නිසා කල්පනාවෙන් වැඩ කරන්න. ආණ්ඩු පක්ෂයට තීන්දු ගන්න පුළුවන්. මේවා සුන්දර වෙයි. සුන්දර වුණා වාගේ නොවෙයි වැඩේ වැරදුණු වෙලාවට. අනික් පාර කවුරුත් නැහැ මේ ආණ්ඩුවට. ඒක හොඳට හිතාගන්න.

අද නේපාලයට වෙච්ච දේ බලන්න. කොයි දේශපාලන පක්ෂයකවත් මිනිහෙකුගේ ගෙයක් ගිනි තියන්න හොඳ නැහැ, නායකයෝ මරන්න හොඳ නැහැ. එහෙම වෛරී දේශපාලනයක් මා තුළ නැහැ. අපි කියන්නේ මේකයි. මේවා කළාම මේවායේ ප්‍රතිඵල පිටුපසින් එනකොට ඒ ප්‍රතිඵලවලටත් මුහුණ දෙන්න බලාගෙන ආණ්ඩුව වැඩ කරන්න.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. අපි ජනතාවට දීපු පොරොන්දු අතරින් තවත් විශේෂ පොරොන්දුවක් තමයි අද ඉටු කරන්න යන්නේ. ඒක තමයි අද අපි විවාදයට අරගෙන තිබෙන මාතෘකාවට අදාළ කටයුත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේකෙන් අපි කියන්නේ මොකක්ද? අපි තවත් පළිගැනීමක් නොවෙයි මේ කරන්න යන්නේ. මේ රටේ පැවති දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කරන්න ඕනෑ. අපේ වගවීම තිබෙන්නේ ජනතාව වෙනුවෙන්. එහෙම නම් අපි කරන්න ඕනෑ මොකක්ද? අපි මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ඕනෑ. අපට කාගෙන්වත් පළිගන්න ඕනෑ නැහැ. අපේ රටේ පාලකයෝ සිටියාට ඒ පාලකයෝ කවදාවත් ජනතාව වෙනුවෙන් පෙනී සිටියේ නැහැ. ඒ පාලකයන්ගෙන් කවදාවත් ජනතාවට වගවීමක් තිබුණේ නැහැ. ඒ වාගේම තමයි, අපේ රටේ හිටපු පාලකයෝ අපේ රටේ සම්පත් අවභාවිත කළා. එවැනි දේශපාලන සංස්කෘතියක් වෙනස් කිරීම වෙනුවෙන් තමයි, ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත අහෝසි කිරීම අද සිද්ධ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැනදී අපි තේරුම් ගන්න ඕනෑ දෙයක් තිබෙනවා. රාජ්‍ය නායකයෝ, ජනාධිපතිවරු කියන්නේ කවුද? රාජ්‍ය නායකයන්ට තමන්ගේ ධුර කාලය තුළ වගකීමක් තිබෙනවා. ඒ වාගේම, අපේ රටේ රාජ්‍ය සේවකයෝ ඉන්නවා. ඒ රාජ්‍ය සේවකයන්ටත් වගකීමක් තිබෙනවා. ඒ රාජ්‍ය සේවකයන් තමන්ගේ ධුර කාලයේදී ඒ වගකීම් ඉටු කරන කාලයේදී යම් වරදක් කළා නම්, යම් චෝදනාවක් ලැබුවා නම්, ඒ චෝදනාවෙන් නිදහස් වෙනකල් - නඩු මාර්ගයෙන් හරි නිදහස් වෙනකල්- ඒ අයගේ වැටුප අහිමි වෙනවා. ඒ චෝදනා ඇත්ත කියලා ඔප්පු වුණොත් සමහර වෙලාවට ඒ අයගේ විශ්‍රාම වැටුපත් අහිමි වෙනවා. නමුත්, අපේ රටේ දේශපාලනඥයන් සම්බන්ධයෙන් මොකක්ද වෙන්නේ?

පසුගිය කාලයේ අපේ රටේ හිටපු ජනාධිපතිවරු කිහිප දෙනෙකුටම විවිධ චෝදනා තිබෙන බව අපි දන්නවා. නමුත්, ඒ චෝදනාවලට ඔවුන්ට දඬුවම් ලැබුණ බවක් අපි කවදාවත්ම

දැක්කේ නැහැ. ඒ අයගේ වැටුප අහිමි කළා කියලා, ඒ අයගේ විශ්‍රාම වැටුප අහිමි කළා කියලා අපි කවදාවත් දැකලා නැහැ. එම නිසා අපි විශ්වාස කරනවා, අප ගෙන ආ මේ පනත අපේ රටට ඉතාම ආදර්ශවත් එකක් කියලා. අපි පිළිගන්න ඕනෑ මහ ජනතාව සහ පාලකයන් අතර වෙනසක් නැහැ කියලා. අපි සියලුදෙනා නීතිය ඉදිරියේදී එක හා සමානයි. ඒ වාගේම තමයි, දේශපාලනඥයන් ලෙස වගකීම් දරන කාලයේදී අපි රටේ මහ ජනතාවගේ මුදල්, මහ ජනතාවගේ බදු මුදල් ඇතුළු රටේ දේපළ අවභාවිත නොකර වැඩ කටයුතු කරන්න ඕනෑ. විශ්‍රාම ගියා නම්, විශ්‍රාම ගියාට පස්සේ අනිවාර්යයෙන්ම තමන්ගේ වියදමින්, තමන් නියමාකාරයෙන් හම්බ කරපු දේවල්වලින් ජීවත් වෙන්න ඕනෑ. පාලකයන් විශ්‍රාම ගියාට පස්සේ ජනතාවගෙන් යැපෙන දේශපාලන සංස්කෘතිය අපි නැති කරන්න ඕනෑ.

1978 සිට 2024 දක්වා කාලය තුළ අපේ රටේ හිටපු ජනාධිපතිවරුන් අපේ රටට කරපු දේවල් සහ අපේ රටේ ජනතාවට කරපු දේවල් අපි දන්නවා.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் இங்கு முக்கியமானதொரு விடயத்தைக் கூற வேண்டும். இன்று இச்சபையில் நிறைவேற்றப்படவுள்ள சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலமானது இந்த நாட்டு மக்களுக்கு மிக முக்கியமானதொரு செய்தியை வழங்குகின்றது. இஸ்லாமிய வரலாற்றில் உமர் என்ற ஒரு கலீபா இருந்தார். அவர் அரச தேவைகளுக்காக ஒரு விளக்கையும், தனது சொந்தத் தேவைகளுக்காக வேறொரு விளக்கையும் பாவித்தாரென நாங்கள் கேள்விப்பட்டு இருக்கின்றோம். இரவு நேரத்தில் யாராவது அவரைச் சந்திக்க வந்தால், "நீங்கள் வந்திருப்பது பொதுத் தேவைக்கா அல்லது தனிப்பட்ட தேவைக்கா?" எனக் கேட்பாராம். அவரின் பதிலுக்கு ஏற்ப விளக்குகளைப் பாவிப்பாரம். அதாவது, பொதுத் தேவையாக இருந்தால் அரசாங்கத்தின் செலவில் ஏற்றப்பட்ட விளக்கைப் பயன்படுத்தியும், சொந்தத் தேவையாக இருந்தால் தனது சொந்தப் பணத்தில் ஏற்றப்பட்ட விளக்கைப் பயன்படுத்தியும் அவரோடு உரையாடுவாராம். அந்த வகையில், சனாதிபதி களின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலத்தை நிறைவேற்றுவதை நாங்கள் சந்தோஷமான ஒரு விடயமாகவே பார்க்கின்றோம். இங்கு பேசிய கௌரவ உறுப்பினர் ஒருவர் தமிழ் மக்களுடைய சிந்தனைகளின் அடிப்படையில் கருத்துகளை முன்வைத்தார்.

මම දැක්කා අපේ නිර්ප්‍රභූ මන්ත්‍රීවරයා දවසක් කෙඳිරි ගෑවා, "අපේ වරප්‍රසාද නැති කරන්න එපා" කියලා. ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද නැති කරනකොට එතුමන්ලා දන්නවා, ඉදිරියේදී එතුමන්ලාට තිබෙන වරප්‍රසාදත් නැති වෙයි කියලා. ඒ දුක නිසා තමයි එතුමා මෙතැනදී එහෙම කථා කළේ. තව මන්ත්‍රීවරයෙක් කිව්වා පසුගිය කාලයේ අපි චක්‍රාකාරයෙන් ජනාධිපතිවරු බිහි කළා කියලා. හරි, මම අහන්නේ මේකයි. එවකට තිබුණු තත්ත්වයත් එක්ක අපි යම් තීරණයක් ගත්තා නම්, අපි ජනාධිපතිවරයෙක් ගෙනාවා නම්, අපි ඒ ජනාධිපතිවරයා රකින්න ඕනෑ කියලාද කියන්නේ? එහෙම නැත්නම් ඒ අයට වරප්‍රසාද තවත් වැඩියෙන් දෙන්න ඕනෑ කියලාද කියන්නේ?

අපි කියන්නේ මොකක්ද? බුද්ධාගම වේවා, ඉස්ලාම් ආගම වේවා අත් හැරීම තමයි එම ආගම්වලින් පුරුදු කරලා තිබෙන්නේ. අපේ ජනාධිපතිතුමා මුලින්ම එතුමාගේ වරප්‍රසාද අත් හරින්න ලැහැස්ති වෙලා ඉන්නේ. මන්ත්‍රීවරු වන අපිත් ඉතාම කැමැත්තෙන් අපේ වරප්‍රසාද අත් හරින්න ලැහැස්තියි. ඇයි එතකොට හිටපු ජනාධිපතිවරුන්ට එහෙම බැරි? සමහරුන්ගේ ඒ කෙඳිරිගෑම රටට සුබදායී නම් ප්‍රශ්නයක් නැහැ.

අපි මේ කාරණාව වෙනත් පැත්තකින් මතු කරමුකෝ. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව අපේ රටට වාසිද, අවාසිද? එහෙම නැත්නම්, ජනතාවට වාසිද, අවාසිද? අපි නියත වශයෙන්ම හිටපු ජනාධිපතිවරුන්ට ආරක්ෂාව ලබා දෙනවා. ඒක රජයේ වගකීම. අපි එතුමන්ලාගේ විශ්‍රාම වැටුපත් අනිවාර්යයෙන්ම ලබා දෙනවා.

இந்தச் சட்டத்தை நீக்குவதனூடாக நாட்டில் புதியதொரு கலாசாரம் உருவாகும். கடந்த காலத்தில் இருந்த சனாதிபதிகள் எவ்வாறு செயற்பட்டார்கள் என்பது எமது தமிழ், முஸ்லிம் மக்களுக்குத் தெரியும்! 1981ஆம் ஆண்டு யாழ்ப்பாண Libraryஐ எரித்ததாக இருக்கலாம், 1983ஆம் ஆண்டு யூலைக் கலவரத்தை உருவாக்கியதாக இருக்கலாம், கற்பழிப்பு வழக்கில் குற்றம் சுமத்தப்பட்ட ஒருவரைத் தனது நேரடி தலையீட்டால் நிரபராதி ஆக்கியதாக இருக்கலாம், இவ்வாறான குற்றச்சாட்டுக்கள் கடந்த காலத்தில் இருந்த சனாதிபதிகள்மீது உள்ளன. மேலும், தான் தலைமைத்துவம் வகித்த Cabinetமூலம் தனக்குத் தேவையான வரப்பிரசாதங்களை உருவாக்கிய வரலாறும் எமக்குத் தெரியும்! அதுமாத்திரமன்றி, தான் சனாதிபதியாகத் தெரிவு செய்யப் பட்டது குறிப்பிட்டதோர் இனத்தினரின் வாக்குகளால்தான் என்று சொன்ன, 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் நடக்கப் போவதை முன்கூட்டியே அறிந்திருந்தும் அதைத் தடுக்காமல், கண்டுங்காணாமல் இருந்த சனாதிபதிகளும் இந்த நாட்டில் இருந்தார்கள்.

இன்றைய சனாதிபதி அவர்கள், தமிழ், முஸ்லிம், சிங்களம் என மூவின மக்களாலும் தெரிவு செய்யப்பட்ட ஒரு பொதுத் தலைவராகத்தான் இருக்கின்றார். மாண்புமிகு சனாதிபதியாக இருக்கலாம், அமைச்சர்களாக இருக்கலாம், ஆளுங்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம், அவரவர்களது வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்காக நாங்கள் எந்தவொரு சட்டத்தையும் கொண்டு வரவில்லை. மாறாக, நாட்டினதும் நாட்டு மக்களினதும் வளர்ச்சிக்காக, அவர்களது சொத்துக் களைப் பாதுகாப்பதற்காகவே நாங்கள் சட்டங்களை உருவாக்குகிறோம்.

கடந்த காலத்தில் இருந்த சில சனாதிபதிகள் Cabinetஇன் அங்கீகாரத்துடன் 400 மில்லியன் ரூபாயை ஒதுக்கி, தனது சொந்தத் தேவைக்காகப் பயன்படுத்தியதை நாங்கள் கண்டோம். அதேபோன்று, தனக்கென சொந்தமாக ஒரு வீடு இருக்கும்போது, அந்த வீட்டை rentக்குக் கொடுத்துவிட்டு, அரசாங்க வீட்டில் வாழ்ந்த சனாதிபதியும் இந்த நாட்டில் இருந்தார்கள். இது ஒரு தலைவருக்கு அழகும் அல்ல; முன்மாதிரியும் அல்ல. நிச்சயமாக நாங்கள் எமது நாட்டிலுள்ள முன்னாள் சனாதிபதிகளின் பாதுகாப்பை உறுதி செய்வோம். ஆனால், வேறொரு தேசத்தில் இருந்து வந்தவர்கள்போல் கருதி, அவர்களுக்கு இந்த நாட்டில் எந்தவிதமான விசேட வரப்பிரசாதங்களையும் வழங்க மாட்டோம். அவர்களுடைய பாதுகாப்பு உறுதிப்படுத்தப்படும்; அவர்களுக்கு ஓய்வூதியம் கொடுக்கப்படும். அவர்களுக்குள்ள மேலதிக வசதிகள்தான் இந்தச் சட்டத்தின்மூலம் நீக்கப்படும் என்பதை நாங்கள் உறுதியாகக் கூறுகின்றோம். நாங்கள் இந்த நாட்டு மக்களுக்குப் பொறுப்புக் கூறுகின்றவர்கள். அந்த வகையில், இந்த நாட்டு மக்களுடைய வாழ்க்கைத் தரத்தை உயர்த்து வதற்காக இன்னும் இதுபோன்ற பல சட்ட ஏற்பாடுகளைக் கொண்டுவர இருக்கின்றோம். இன்று நாங்கள் மக்களுக்குப் பொறுப்புக் கூறுகின்ற அரசாங்கமாகத் திகழ்கின்றோம். நாங்கள் இதை பழிவாங்கும் நோக்கில் கொண்டுவரவில்லை. இந்த மாற்றம் மக்கள் எமக்குத் தந்த ஆணையை நிறைவேற்றுவதாக இருக்கும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.10]

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතිහාසයේ මේ පාර්ලිමේන්තුව තුළ විවිධ අණ පනත් සම්මත වෙලා තිබෙනවා. නමුත් අපි දන්නවා, අද සම්මත කරනු ලබන මේ පනත් කෙටුම්පත ඉතිහාසගත වෙන එකක් කියලා. මේ පාර්ලිමේන්තුවේ අණ පනත් සම්මත වෙන්න ඕනෑ ජනතාවාදීව, මහජනතාවට, රටට ප්‍රයෝජනයක් වෙන්නයි. නමුත් ඉතිහාසයේ සම්මත වුණු සැලකිය යුතු පනත් ප්‍රමාණයක් මහජනතාවට හිත සුව පිණිස කෙසේ වෙතත්, පාලක පැළැන්තියට වරප්‍රසාද භුක්ති විඳින්න, ඔවුන්ට බෙදා හදා ගන්න පුළුවන් ආකාරයට තමයි සම්මත වුණේ.

අපි ජාතික ජන බලවේගය හැටියට පසුගිය මැතිවරණවලට පෙරාතුව මේ රටේ ජනතාවට අපේ මත ප්‍රකාශ කර තිබෙනවා; අපේ ප්‍රතිපත්ති ප්‍රකාශන එළිදක්වා තිබෙනවා. ජාතික ජන බලවේගය හැටියට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අපි ජනතාවට පොරොන්දුවක් වුණා, මේ විධියේ රටට බරක් වෙන, ජනතාවට සාධාරණයක් ඉෂ්ට නොවන වැරදි අණ පනත් ප්‍රතික්ෂේප කරනවා, ඉවත් කරනවා කියලා. ඒ අනුව අපි පොරොන්දු වුණා, මේ රටේ හිටපු ජනාධිපතිවරුන්ට ලබා දී තිබෙන අසීමිත වරප්‍රසාද අහෝසි කරනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන විශ්‍රාම වැටුප අහෝසි කරනවා කියලා. ඒ අනුව ගත්තාම, ප්‍රගතිශීලී පනත් කෙටුම්පතක් තමයි මේ සම්මත වෙන්නේ කියලා මේ රටේ බුද්ධිමත් ජනතාව තේරුම් ගනියි කියා මා හිතනවා. මේ රටේ ජනතාව තේරුම් ගනියි, ජනතාවාදී පනත් කෙටුම්පතක් තමයි මේ සම්මත වෙන්නේ කියලා. ජනවරමට ගරු කරලා හිටපු පාලකයෝත් කටයුතු කළා නම්, මේ පනත් කෙටුම්පත සම්මත කරන්නට පෙරාතුව ඔය සිංහාසනවලින් බැස යන්න තිබුණා. ගමේ භාෂාවෙන් කිව්වොත්, විළිලජ්ජාවක් කියලා එකක් තිබෙනවා නම් ඒවා මුලින්ම අත් හරින්න තිබුණා. නමුත් එහෙම නොවුණු නිසා අපට සිද්ධ වෙනවා, නීත්‍යනුකූල ලෙසම එය කරන්න. බලහත්කාරය පාවිච්චි කරලා නොවෙයි, නීත්‍යනුකූල ලෙසම අපට සිද්ධ වෙනවා ඒවාට අදාළ කටයුතු සම්පාදනය කරන්න. ඒ අනුව තමයි 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත අහෝසි කිරීම වෙනුවෙන් පනත කෙටුම්පතක් ගෙන එනු ලබන්නේ. ඒ නිසා මේක ජනවරමට අනුකූලයි කියලා අපි මතක් කරන්න ඕනෑ. ඒ වාගේම ජනතාවගේ බලාපොරොත්තුවක් තමයි අපි මේ ඉෂ්ට කරමින් තිබෙන්නේ කියන කාරණයත් මතක් කරන්න ඕනෑ. අපි පොරොන්දු වුණා, 76 වසරක් තිස්සේ තිබුණු දේශපාලන ක්‍රමය, සමාජ ක්‍රමය හා ආර්ථික ක්‍රමය වෙනස් කරනවා කියලා. ඒ අනුව ගත්තාම දේශපාලනයේ කොටසක් තමයි මේ වෙනස් කරන්නේ. මේක වෙනස් කළ පමණින් සියල්ල වෙනස් වෙයි කියලා අපි හිතන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1986දී ගෙනා පනතේ අරමුණ මොකක්ද කියන කාරණය ඔබතුමිය තේරුම් ගනියි කියලා මම විශ්වාස කරනවා. ඒ අරමුණ ඉෂ්ට වෙලාද? ඇයි, විශ්‍රාමික ජනාධිපතිවරුන්ට අපි වරප්‍රසාද ලබා දෙන්නේ? ඒවා ලබා දෙන්නේ රට වෙනුවෙන් හිතලා. නමුත් ඒ වරප්‍රසාද අවභාවිත කරනවා නම්, ඒකේ ප්‍රතිඵලයක් නැහැ. අපි දන්නවා, අපේ රටේ සමහර රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන පාඩු ලබනකොට, අරමුණෙන් පිට යනකොට වහලා දමනවා; ඇවර කරනවා. ඒ වාගේ ඉතිහාසයේ සම්මත කරන ලද සමහර අණ පනත් වුණත් රටට ගැළපෙන්නේ නැත්නම්, ඒ අරමුණ ඉෂ්ට වෙන්නේ නැත්නම් අහෝසි කර දැමීම හැර වෙන ක්‍රියාමාර්ගයක් නැහැ. ඒ අනුව විශ්‍රාමික ජනාධිපතිවරුන්ට ලබා දීපු වරප්‍රසාදවලින් මේ රටේ ජනතාව සුබසිද්ධියක් බලාපොරොත්තු වුණත් ඒක ඉෂ්ට වෙන්නේ නැත්නම්, ඒක අහෝසි කිරීම හැර වෙන විකල්පයක් නැහැ. අපි මෙවැනි කාරණා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනවලට ඇතුළත් කළේ රට ගැන හිතලා මිසක්, ජනප්‍රියවාදී දේශපාලනය ගැන හිතලා නොවෙයි. අපි දන්නවා, ඒ ඒ කාලවල, ඒ ඒ පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශන ගෙනෙන බව. එහෙම කරලා ඡන්ද ටික ගන්නවා. හැබැයි, ලබා දුන් පොරොන්දු ඉෂ්ට කරන්නේ නැහැ. නමුත් මෙන්න දැන් අපි පොරොන්දු ඉෂ්ට වෙනවා. ඒ නිසා මම හිතනවා, ජනතාව ඒ පැත්තෙන් හිතලා සතුටු වෙයි කියලා.

මෙතැනදී සමහරු සඳහන් කළා, වෛරී සහගතව, පළිගැනීමේ චේතනාවෙන් මේවා කරනවා කියලා. ඒක සෑහෙන කාලයක් ගහන පදය නේ, මේ කට්ටිය. ඇත්තටම වෛරීසහගතව කටයුතු කරලා තිබෙන්නේ මේ රටේ ජනතාවට. ජනතාවගෙන් තමයි පළි අරගෙන තිබෙන්නේ. ඉතින්, ඒවා වෙනස් කිරීම සඳහා තමයි සමහර තීන්දු, නීති රීති මේ රටේ ක්‍රියාත්මක වෙන්නේ කියන එක මම මතක් කරන්න කැමැතියි.

ඇත්තටම ගත්තොත්, අපි එක් එක් අයගේ නමින් කථා නොකළාට මේ විශ්‍රාමික ජනාධිපතිවරුන් ඉන්න හිටින්න ගෙයක් දොරක් නැති අය නොවෙයි, ජීවත් වෙන්න ක්‍රමයක් නැති අය නොවෙයි. අනුර කුමාර අපේ ජනාධිපති සහෝදරයාගේ දේපළ, මේ රටේ ඔය කියන හිටපු ජනාධිපතිවරුන්ගේ දේපළත් එක්ක සැලකුවොත් අපේ ජනාධිපතිතුමාට එහෙම දේපළක් නැහැ. එතකොට මේ පනත ගෙන ඒමෙන් ටිකක් හරි ලැබෙන වරප්‍රසාදයත් අහිමි වෙනවා නම් අහිමි වෙන්නේ අනාගතයේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට.

නමුත්, ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තා, මේ වරප්‍රසාදය ලැබෙන්න ඕනෑ මේ රටේ ජනතාවටයි කියලා. වරප්‍රසාද අහිමි වෙච්ච විශාල ජනතාවක් මේ රටේ ඉන්නවා. ඔවුන් වෙනුවෙන් කටයුතු කිරීම තමයි මහජන නියෝජිතයන්ගේ කාර්යභාරය. එ්ක පසෙකලා කටයුතු කිරීම තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ඒ හින්දා මේ පනත ගෙන ඒම සාධාරණ ද, අසාධාරණ ද කියලා රටේ ජනතාව තීන්දු කරයි. ජනතාවගේ පැත්තෙන් මේක සාධාරණ, යුක්ති සහගත, ප්‍රගතිශීලී, ජනතාවාදී පනතක් හැටියට අඳුර ගනියි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාරණය ඔබතුමිය තේරුම් ගනියි කියලා අපි හිතනවා. ජනතාවත් මේක තේරුම් ගන්නවා. ඒ තමයි අපි මේ වරප්‍රසාද දුන්නේ කාටද, මොන අරමුණකින්ද දුන්නේ, ඒ අය මොන අරමුණකින්ද ඒවා පාවිච්චි කළේ කියන එක. වරප්‍රසාද විධියට දීපු නිල නිවාස හරි, මොනවා හරි දේපළ ඒ කට්ටිය තවමත් පටු දේශපාලන වුවමනාවලට පාවිච්චි කරනවා, ජාතිවාදී, ආගම්වාදී වුවමනාවලට පාවිච්චි කරනවා, සමහර විට පාතාලය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පාවිච්චි වෙනවා, සමහර විට කුඩුකාරයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් පාවිච්චි වෙනවා. ඉතින්, ඒ වාගේ දේවල්වලට තමයි මේවා පාවිච්චි වුණේ කියන එකත් මතක් කරන්න ඕනෑ. ඒ හින්දා අපට සිද්ධ වෙනවා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනතාව වෙනුවෙන් තීන්දු ගන්න. මේ තීන්දු විතරක් නොවෙයි, ඉස්සරහට පෝලිමේ තව ජනතාවාදී අණපනත් එනවා. එයින් එකක් තමයි මේ ආවේ කියන එක මම මතක් කරන්න කැමැතියි.

මෙතැනදී කරුණු දක්වපු විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විශේෂයෙන්ම මහන්සි ගත්තා, මේක යම් පළි ගැනීමක්, අයිතිවාසිකම් පැහැර ගැනීමක් හැටියට අර්ථකථනය කරන්න. වෛරීසහගත සිරියාවක් තමයි ඒ කථාව තුළ අපට පෙනුණේ. කොහොම වුණත්, සමහර අය හීනමානයෙන් පෙළෙමින් කථා කරනවා. හැබැයි, මේ රජය - ජාතික ජන බලවේගයේ රජය- ජනතාවාදී ලෙස කල්පනා කරලා, ජනතාවගේ සුබසිද්ධිය ගැන හිතලා තීන්දු තීරණ ගන්නවා. මේවා සුළුපටු දේවල් නොවෙයි. ඔබතුමියත් ඒක පිළිගනියි කියලා මම දන්නවා. ඒක මේ සභාවත් දන්නවා.

දැන් මේ වරප්‍රසාද ගත්තාම, ඒවා දීපු පනත ඉක්මවා අසීමිත වරප්‍රසාද ගත්ත බව අධිකරණයෙන් පවා පැහැදිලි කරලා තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ජනාධිපති මන්දිරය භුක්ති විඳින්නේ නැතුව රජයේ නිවාසයක වෙනම පදිංචි වෙලා හිටියා. එතුමා කැබිනට් මණ්ඩලයේ මූලාසනායේ ඉන්න ගමන් කැබිනට් පත්‍රිකාවක් දාලා, ඒ නිල නිවාසයම එතුමා විශ්‍රාම ගියාම පාවිච්චි කරන්න වෙන් කරගත්තා. විශ්‍රාම ගියාම පාවිච්චි කරන්න වෙන් කර ගත්තා. එතුමා විශ්‍රාම යන්නට පෙරාතුව විශාල මුදලක්, රුපියල් ලක්ෂ තුන්දහස් ගණනක වාගේ මුදලක් දාලා ඒක අලුත්වැඩියා කරගත්තා. මේ රටේ ජනතාවගෙන් මම අහනවා, ඒවා සාධාරණද කියලා. අන්තිමට මේ ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරුවරුන් ඒක විනිශ්චය කරලා තීන්දුවක් දුන්නා, ඒක සදාචාර සම්පන්න නැහැ කියලා. තමන්ම මූලාසනයේ ඉඳන් තමන්ටම බෙදාගත්ත එක නීත්‍යානුකූල නැහැ. ඒ හින්දා එතුමාට ඒ නිවාසයෙන් යන්න වුණා.

චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමිය ජනාධිපති ධුරයේ ඉන්න කාලයේ ඒ විධියට එතුමියට බත්තරමුල්ලෙන් ඉඩමක් වෙන කරගත්තා. ඒ සම්බන්ධයෙනුත් අධිකරණයට ගියාම ඒ ඉඩමත් අහෝසි වුණා. දීපු වරප්‍රසාද අවභාවිත කරලා එතැනින් එහාට ගිහිල්ලා එතුමන්ලා ඒවා පාවිච්චි කළා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඔය දැන් ඉන්න විජේරාම නිවසේ අලුත්වැඩියාවක් කරන්න පාවිච්චි කරපු මුදල අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ සඳහන් වෙලා තිබෙනවා. එ් මුදල ලක්ෂවලින් කිව්වොත්, රුපියල් ලක්ෂ 4,725ක්. මිලියනවලින් කිව්වොත්, රුපියල් මිලියන 472ක්. එච්චර විශාල මුදලක් එතුමා වැය කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මුදල් වැය කළේ කොයි කාලයේද කියලා ඔබතුමිය දන්නවාද? මේ මුදල් වැය කළේ කොවිඩ් -19 -කොරෝනා- තිබුණු කාලයේ; ආර්ථික අර්බුදය තිබුණු කාලයේ. මේ රටේ ජනතාවගේ වරප්‍රසාද අහිමි වෙමින් තිබුණු කාලයක මේ විධියට කරපු දේවල් සාධාරණද කියලා මම මේ සමාජයෙන් අහනවා.

මේ වෙනකොට රුපියල් මිලියන, බිලියන ගණන්වලින් විශ්‍රාමික ජනාධිපතිවරුන්ට දීලා තිබෙනවා. ඔය විශ්‍රාමික ජනාධිපතිවරු ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු ආරක්ෂා කර ගැනීම රජයක් හැටියට අපේ රජයේ වගකීමක්. ඒ හින්දා හිටපු ජනාධිපති කෙනෙකුට යම් මොහොතක මොනයම් හෝ ප්‍රශ්නයක් ආවොත් ඒකේ වගකීම රජයක් හැටියට ගන්න අපි සූදානම්. නිවසක් නැත්නම් නිවසක් දෙන්න සූදානම්. ඒක දෙන්න සූදානම්. ඒවා නැති අය නොවෙයි මේ ඉන්නේ. ඒ අයට ගෙවල් දෙකතුන තිබෙනවා, ආදායම තිබෙනවා. නමුත් අසාධාරණ, අයුක්තිසහගත ලෙස ජනතාවගේ බදු මුදල් මේ විධියට පාවිච්චි කරන්න දෙන්න පුළුවන්කමක් නැහැ. මේ රටේ ආර්ථිකය ගැන කවුරුත් දන්නවා. ඒක බිඳ වැටිලා තිබෙන මොහොතකයි අපි මේ කටයුතු කරන්නේ. මෙන්න මේ විධියට මේ රටේ මහජන මුදල් අරගෙන තිබෙනවා. මේ රටේ නීති-රීති උල්ලංඝනය කරලා තිබෙනවා. මේ පනතට එහායින් ගිහිල්ලා සමහර කැබිනට් තීන්දු අරන් තිබෙනවා. මේ පනතට එහායින් ගිහිල්ලා සමහර වරප්‍රසාද අරගෙන තිබෙනවා. ඒවා ඒ විධියට දෙන්න පුළුවන්කමක් නැහැ. මම මේ රටේ ජනතාවට මේක කියන්න කැමැතියි. මේ විධියට මේ කට්ටිය මිලියන, බිලියන ගණන්වලින් වරප්‍රසාද භුක්ති විඳිනකොට, සමහර විශ්‍රාමික ජනාධිපති මන්දිරවල සමහර මාසවල ලයිට් බිල රුපියල් ලක්ෂ 10යි, 12යි. මාසයක වතුර බිල රුපියල් ලක්ෂ 10යි, 12යි. ජනතා බදු මුදල්වලින් තමයි මේවා නඩත්තු කරන්නේ. හැබැයි තමන්ගේ ගෙදර බිල ඔය ගානට යන්නේ නැහැ. රජයේ ගෙදර බිල ඒ ගානට යනවා. ඉතින් කොහොමද රටක් ගෙනියන්නේ?

මම මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබතුමිය මේක තේරුම් ගන්න. මගේ අමාත්‍යාංශය වැවිලි කටයුතු අමාත්‍යාංශය. අපේ ලැයිම් කාමරවල ඉන්න ජනතාවට ඔවුන්ට කියලා ඉඩමක් නැහැ, ඔවුන්ට කියලා නිවසක් නැහැ, ඔවුන්ට කියලා ලිපිනයක් නැහැ. හැබැයි ඒ ජනාධිපතිකම් කරපු කාලයේ ඒ මිනිස්සුන්ට ඒ වරප්‍රසාද දුන්නා නම්, වරප්‍රසාද නොවෙයි මානව අයිතිවාසිකම් ලෙස සලකලා ඒ ලිපිනය දුන්නා නම්, ඉඩම දුන්නා නම්, ගේ දුන්නා නම් ඒ මිනිස්සුන්ට එහෙම වෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මේකේ අභාවාවක තත්ත්වය, ඛේදජනක තත්ත්වය මේකයි. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය - NBRO එක - නිකුත් කරපු වාර්තාවලට අනුව මේ රටේ අධිඅවදානම් මට්ටමේ නිවාස තිබෙනවා පහළොස්දහස් ගණනක්. ඒවා කොයි වැස්සකට නාය යයිද දන්නේ නැහැ. කොතැන වැළලෙයිද දන්නේ නැහැ.

අපේ ප්‍රදේශයේ මන්ත්‍රීවරු මේක දන්නවා. 2014දී හපුතලේ, හල්දුම්මුල්ලේ මීරියබැද්දේ ලැයිමක් නාය ගියා. 34දෙනෙක් මිහිදන් වුණා; පස් කන්දට යට වුණා. සාමසර කන්ද නාය ගියා. මීරියබැද්ද නාය ගියාට පසු 2007දී NBRO එක වාර්තාවක් නිකුත් කරලා තිබුණා, අධිඅවදානම් කලාපයෙන් වහාම ඉවත් කරන්න කියලා. නමුත් ඉවත් කළේ නැහැ. ඒ මිනිස්සුන්ට ගේ හදන්න සල්ලි නැහැ. ඒ මිනිස්සුන්ගේ ජීවිතය ආරක්ෂා කරන්න සල්ලි නැහැ. නමුත් අපි ඔක්කෝම එක්කහු වෙලා මෙයාලා ආරක්ෂා කරමු කියලාද අපට කියන්නේ? මේ රටේ ජනතාවට තවම යැපෙන්න වෙලා තිබෙන්නේ සමෘද්ධියෙන්, අස්වැසුමෙන්. තවම බෙහෙත් පෙත්ත හොඳින් දී ගන්න අමාරුකම් තිබෙනවා, මේ රටේ. එවැනි ආර්ථිකයක් තිබෙද්දි අපි හිතනවා, මෙවැනි නඩත්තුවක්, මෙවැනි වරප්‍රසාදයක් තවදුරටත් ලබා දීම අපට කරන්න පුළුවන්කමක් නැහැ කියලා. ඒ හින්දා සදාචාර සම්පන්න රටක් හැදීමේ වගකීම අපි කා මතත්, කාගේත් කර, උර මත පැටවිච්ච මොහොතක් මේක, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ රටේ පවතින දූෂිත දේශපාලන ක්‍රමය අපි නිවැරදි පීල්ලට ගෙනෙන්න ඕනෑ; සදාචාරසම්පන්න දේශපාලන පීල්ලට ගෙනෙන්න ඕනෑ. අපි මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න ඕනෑ. මේ රටේ ආර්ථිකය ගොඩනැඟුවාට පසුව මේ රටේ ජනතාව තීන්දු කරනවා නම්, "දැන් මෙන්න මේ කණ්ඩායම් ආරක්ෂා විය යුතුයි, මේ අයටත් යම් යම් විධියට සලකන්න ඕනෑ" කියලා, ඉස්සෙල්ලා ජනතාව රැකලා, ඊළඟට පාලකයෝ දෙසට හැරෙන්න පුළුවන්. දැන් අපට අවශ්‍ය වෙන්නේ මේ රටේ ජනතාවට දීපු එකඟතාවට අනුව, ජනතාව දුන් ජනවරමට අනුව පවතින අයුක්ති සහගත, අසාධාරණ අණපනත් වෙනස් කරලා ජනතාවාදී නීති මේ රටට ගෙන ඒමයි. එය අවශ්‍ය කටයුත්තක්. ඒ නිසායි මේ පනත් කෙටුම්පත ගෙනාවේ කියලා අපි තහවුරු කරලා කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාරණය තේරෙන නායකයෝ පිරිසක් විපක්ෂයේත් ඇති කියලා මම හිතනවා. එතුමන්ලා මේවාට සහයෝගය දෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ අය සහයෝගය නොදුන්නත් මේ රටේ ජනතාව මේවා ඉහළින්ම අනුමත කරනවාය කියන එකත් අපි දන්නවා. මම මුලින් කිව්වා වාගේ, ඉදිරියේදී තවත් ජනතාවාදී යෝජනා ගෙනෙන්න පුළුවන්. ඒ නිසා, මේ රටේ ජනතාවට අපි

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

වෙච්ච පොරොන්දුවලට අනුව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ලබා දෙන්න අපි සූදානම් වෙමින් ඉන්නවා. ඒ තත්ත්වයට රට ගෙනෙනකොට, රට ඇතුළේ දේශපාලනඥයෝ නැති වෙනවා නොවෙයි. හිටපු ජනාධිපතිවරුත් පොහොසත් රටේ ඉන්නවා; ලස්සන ජීවිතයක් ගත කරනවා. කවුරුවත් දුක්ඛිත තත්ත්වයට පත් කිරීමේ පෞද්ගලික අරමුණක් අපේ දේශපාලන ව්‍යාපාරයට නැහැ. අපට තිබෙන්නේ මේ රට හැදීමේ වුවමනාවක්. මේ රටේ නිවැරදි දේශපාලනයක් ගොඩනැඟීමේ වුවමනාවක්. අන්න ඒ සඳහා සකස් කරපු පනත් කෙටුම්පතක් හැටියට මේක හඳුන්වන්න පුළුවන්. මෙය සම්මත වෙන්නේ ජනතා ආශිර්වාදයෙන්. මේ 225දෙනාට වඩා මෙය සම්මත වන කල් රටක් බලාගෙන ඉන්නවා. ඒ නිසා පනත් කෙටුම්පත සම්පත කරලා ජනතාවට යුක්තිය, ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න ජාතික ජන බලවේගය රජය හැටියට අපි කටයුතු කරනවාය කියන එක පැහැදිලි කරමින්, මම නවතිනවා.

බෙහෙවින්ම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.24]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද සාකච්ඡා කරන ප්‍රධාන කාරණාවට එන්න කලින් මම කාරණයක් කියන්න කැමැතියි. ඊයේ පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා අපේ කණ්ඩායම් නායක නාමල් රාජපක්ෂ මැතිතුමාට ආණ්ඩු පක්ෂයෙන් දිගින් දිගටම චෝදනා එල්ල කළා. හැබැයි, ඒ පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ. හැබැයි, එක නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විතරක් -ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා- දැන් ගරු සභාවේ ඉන්නවා. ඒක නිසා තමයි මම මේ කාරණය කියන්න ඕනෑ කියලා හිතුවේ. ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා වැරදීමකින් ද දන්නේ නැහැ පාර්ලිමේන්තුවෙන් එළියේ කියනවා, නාමල් රාජපක්ෂ මැතිතුමා මත් ද්‍රව්‍ය ජාලය පිටිපස්සේ හිටියා කියලා. එතුමා එ්ක කියලා ඡායාරූප පවා පෙන්වුවා. ඒක නිසා අද නාමල් රාජපක්ෂ මැතිතුමා තීරණය කරලා තිබෙනවා, එතුමාට විරුද්ධව නීතිමය කටයුතු කරන්න. මේ වෙද්දීම එය සිදු වෙලා තිබෙනවා. අද මෙතුමාට එන්තරවාසිය post කරලාත් එවා තිබෙනවා. මෙතැන ඉන්න නිසා එය මම ඔබතුමාගේ ළඟටත් එවන්නම්. *[බාධා කිරීම්]* මොකක්ද? *[බාධා කිරීම්]* ගණනත් මම කියන්නම්. පොඩ්ඩක් ඉන්න. ඔබතුමා හදිසි වෙන්න එපා. ඔබතුමාට ගෙවන්න පුළුවන් ගණනක් දෙන්නම්. ඔබතුමාට බැරි නම් පැලවත්තෙන් - *[බාධා කිරීම්]* මොකක්ද මන්ත්‍රීතුමා?

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු මන්ත්‍රීතුමා, අපි ඉන්නේ,-

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
හරි, පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් වාඩි වෙන්නකෝ. ඔබතුමා අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේ. වාඩි වෙන්න. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාටත් මම ආරාධනා කරනවා, ඒක පාර්ලිමේන්තුවෙන් එළියේ ගිහිල්ලා කියන්න කියලා. මොකද, පාර්ලිමේන්තුව ඇතුළේදී වරප්‍රසාද තිබෙනවා නේ. ඒ නිසා පාර්ලිමේන්තුවෙන් පිටතදී කියන්න. ඊයේ වසන්ත සමරසිංහ ඇමතිතුමා හිටියා, මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා හිටියා. මම නම් දන්නේ නැති ගොඩක් මන්ත්‍රීවරු නාමල් රාජපක්ෂ මැතිතුමාට චෝදනා එල්ල කළා. මෙන්න පොහොට්ටුවේ අභියෝගය. පුළුවන් නම් ඒ කියපු දේ පාර්ලිමේන්තුවෙන් එළියේ කියන්න. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, පුළුවන් නම් ඇවිල්ලා එළියේ කියන්න. වසන්ත සමරසිංහ ඇමතිතුමනි, මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිතුමා සම්බන්ධයෙන් අපි අවශ්‍ය නීතිමය කටයුතු කරනවා.

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, අපට පාර්ලිමේන්තුවේ ඇතුළේදී එකයි, එළියේදී එකයි කියලා දෙකක් නැහැ. අපි ඡන්දයට කලිනුත් මේ කරුණු කිව්වා. පාර්ලිමේන්තුවේ ඇතුළෙත් මේවා කියනවා. හෙට දවසේ එළියේ කියන්නත් අපි ලැහැස්තියි. පවරන නඩුවක් පවරන්න. එවන එන්තරවාසියක් එවන්න. ඔබතුමන්ලා උසාවියට එන්න. අපි ලැහැස්තියි ඒක උසාවියේදී බේරා ගන්න. මේ රටට කරපු අපරාධ හංගන්න දෙයක් නැහැ. ඒ අපරාධ ගැන අපි පාර්ලිමේන්තුව ඇතුළෙත්, එළියෙත් දෙකේදීම කියනවා. ඒ නිසා කලබල වෙන්නේ නැතුව ඉන්න. දැන් කලබල වෙලා ඉන්න හැටි පෙනෙනවා. එන්තරවාසි එවන එකෙන් පෙනෙනවා, කලබල වෙලා ඉන්න හැටි. ඔය එන්තරවාසිවලට භය නම් අපි මේවා කියන්නේ නැහැ, මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා එවන එන්තරවාසියක් එවන්න. අපේ 160දෙනාටම එවන්නකෝ. කලබල වෙන්න එපා. ඉස්සරහට තව එනවා. කලබල වෙන්න එපා, ඉදිරියේදී තව එළියට එනවා. එතුමාට කියන්න කෝ මෙතැනට ඇවිල්ලා කියන්න කියලා. ඊයේ මම කිව්වා නේ.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒක කියන්නේත් වරප්‍රසාදවලට මුවා වෙලා නේ.

නලින්ද ජයතිස්ස මැතිතුමා මෙතැන ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 1 සිට 8 දක්වා තිබෙනවා. මේ ඕනෑම එකක මාධ්‍ය සාකච්ඡාවක් තියන්න කියලා මහින්ද ජයසිංහට මැතිතුමාට අභියෝග කරනවා. අපි ඔබතුමා

අධිකරණයට ගේනවා. ඔන්න අපි දැන් පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිතුමාට එරෙහිව නීතිමය කටයුතු කරනවා. ඔබතුමන්ලා මේ සභාවේ වරප්‍රසාදවල හැංගිලා කටයුතු කරන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ඔබතුමන්ලා ජනාධිපතිවරයන්ගේ වරප්‍රසාද අයින් කරන්න පනත් කෙටුම්පතක් ගෙනැවිත් තිබෙනවා. මම හිතන විධියට, පසුගිය ආණ්ඩුවත් මන්ත්‍රීවරුන්ට තිබුණු වරප්‍රසාද විශාල ප්‍රමාණයක් ඉවත් කළා. මන්ත්‍රීවරුන්ට තිබුණු වාහන පර්මිට් එක පසුගිය අවුරුදු හතරේ ලබා දුන්නේ නැහැ, 2019 ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ආවාට පස්සේ. රජයේ සේවකයන් 20,000කට රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ පර්මිට් දුන්නා. හැබැයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225ට කිසිම පර්මිට් එකක් ගිය ආණ්ඩුවෙන් දුන්නෙත් නැහැ. ඔබතුමන්ලා වරප්‍රසාද කපන එකේ ප්‍රශ්නයක් අපට නැහැ. හැබැයි, රටේ ජනාධිපතිවරයෙක් එතුමාගේ පාලන කාලය තුළ රට වෙනුවෙන් කරපු දෙයක් වෙනුවෙන් යම් කිසි අනතුරක් තිබෙනවා නම්, ඒකට සාධාරණ ආරක්ෂාවක් ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. රටේ ගොවි ජනතාවට දීපු පොරොන්දු, රටේ මහජනතාවට දීපු පොරොන්දු සමහර අයට අමතක වුණාට, එල්ටීටීඊ ඩයස්පෝරාවට දීපු පොරොන්දු නම් අමතක වෙලා නැහැ. එක පැත්තකින් එල්ටීටීඊ ඩයස්පෝරාව මහින්ද රාජපක්ෂ මැතිතුමා එළියට දමනවාටත් කැමතියි, ආරක්ෂාව අයින් කරනවාටත් කැමැතියි, මේ වරප්‍රසාද කපන එකටත් කැමැතියි.

ඔබතුමන්ලා හිටපු ජනාධිපතිතුමාට විතරක් නොවෙයි ගහන්නේ. ගිහිල්ලා බලන්න, නාවික හමුදාපතිතුමා අද ඉන්නේ හිර ගෙදර. මොකක්ද ඒකට හේතුව? එල්ටීටීඊ බුද්ධි අංශයේ සාමාජිකයකුගේ කටඋත්තර පදනම් කරගෙන තමයි අද එතුමා හිර ගෙදර ඉන්නේ. අද CID එකයි, පොලීසියයි එකතු වෙලා නඩු හදනවා. පොලීසියේ OIC කෙනෙක් CID එකට ගෙනැල්ලා කියනවා, නාවික හමුදාපතිතුමාට විරුද්ධව කටඋත්තර දෙන්න කියලා. නාවික හමුදාපතිතුමා ඇවිත් මෙයා උස්සාගෙන ගියා කියලා කටඋත්තර දෙන්න කියලා CID එකෙන් OIC කෙනෙක් ගෙනැත් කියනවා. ඒ OIC මොකක්ද කරන්නේ? ඒ OIC යනවා, අභියාචනාධිකරණයට. එයා අභියාචනාධිකරණයට ගිහින් රිට් එකක් දමනවා, "මෙන්න මෙහෙම බලපෑම් කරනවා. රටේ හිටපු නාවික හමුදාපතිතුමා හිරේ දමන්න මෙන්න මෙහෙම සාක්ෂි දෙන්න කියනවා" කියලා. මම ඒ ලේඛනය **සභාගත*** කරනවා.

ඒ වාගේම ඔහු අත්අඩංගුවට ගන්න බැරි වෙන්න අභියාචනාධිකරණයෙන් ලබා දීපු නියෝගය මා සතුව තිබෙනවා. එල්ටීටීඊ ඩයස්පෝරාවට ලබා දීපු පොරොන්දු ඉටු කිරීම තමයි තනිකරම මේ කරගෙන යන්නේ. මම හිතන විධියට, ලෝකයේ කිසිම රටක බුද්ධි අංශවලට මෙහෙම ගහලා නැහැ. ලෝකයේ කිසිම රටක හමුදාවට මෙහෙම ගහලා නැහැ. ලෝකයේ කිසිම රටක,- *[බාධා කිරීමක්]* මේක එළියේ කියන්න ප්‍රශ්නයක් නැහැ. මේක උසාවිය ලබා දුන් නියෝගයක්. මේක ලබා දීපු රිට් එකක්. එළියේ නොවෙයි, මම මේක ඕනෑ තැනක කියන්නම්. කිසිම ප්‍රශ්නයක් නැහැ. අභියාචනාධිකරණයෙන් දීපු නියෝගයක් ගැන මම කියන්නේ. මම මේ නියෝගයත් **සභාගත*** කරනවා. එතකොට ඔබතුමන්ලාට බලාගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වරප්‍රසාද අයින් කරන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට, අමාත්‍යවරු හැටියට සිටි කාලයේ අපි වරප්‍රසාද අඩුවෙන්ම පාවිච්චි කරපු අය. මම අමාත්‍යාංශයේ අවුරුදු හතරක් හිටියා. ඒ කාලයේ රජයේ කටයුතුවලට පිට රට ගියත් මම රජයේ වියදමින් ටිකට් එකක්වත් අරගෙන නැහැ. ඔය අවුරුදු හතර ඇතුළත රජයේ වැඩ කටයුතුවලට දසවතාවකට වැඩිය මම රට ගිහින් තිබෙනවා. ඒ වෙලාවකවත් අපි රජයේ වියදමින් ටිකට් එකක් අරගෙන නැහැ. අප ළඟට එන අයට තේ එකක් දෙන සල්ලිවත් අපි අරගෙන නැහැ. අපි වරප්‍රසාද අඩුවෙන්ම ගත්ත අය. අපි පර්මිට් අරගෙන නැහැ. ඒක නිසා ඔබතුමන්ලා වරප්‍රසාද අයින් කළාට අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, රටේ නායකයන්ට නිසි ආරක්ෂාව දෙන්න ඕනෑ. අනුර කුමාර දිසානායක මහත්මයා ජනාධිපති තනතුරින් අයින් වුණාට පසුව පාතාලයෙන් තර්ජනයක් එනකොට තමයි ඔබතුමන්ලාට මේක තේරෙන්නේ. රටේ නායකයන් එතුමන්ලාගේ කාල සීමාව තුළ රට වෙනුවෙන් කරන දේවල් සම්බන්ධයෙන් යම් කිසි තර්ජනයක් ඇති වෙනවා නම්, ඒ අයගේ ආරක්ෂාව තහවුරු කරන්න වර්තමාන ආණ්ඩුවට වගකීමක් තිබෙනවා. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්මයාට නම් ප්‍රශ්නයක් නැහැ. එතුමා කලින්ම කියලා තිබුණේ. එතුමා සූදානම් මැදමුලනට යන්න. තංගල්ලට යන්න එතුමා සූදානම් වෙලා ඉන්නේ. කවුරු හෝ සතුටු කරන්න ඔබතුමන්ලා එහෙම දෙයක් කරනවා නම්, මහින්ද රාජපක්ෂ මහත්මයාට ඒක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.32]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ජනාධිපතිවරයන්ගේ වරප්‍රසාද සම්බන්ධයෙන් 1986දී සම්මත කරන ලද ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත අහෝසි කිරීමක් තමයි අද සිද්ධ කරන්නේ. මේ අවස්ථාවේදී අපට පෙනෙනවා, සැහෙන දුස් තොරතුරු ප්‍රමාණයක් ඉදිරිපත් වන ආකාරය. විපක්ෂය බොහොම හොඳට කරන්නේ ඒක තමයි. සාමාන්‍යයෙන් වැරදි තොරතුරු ජනගත කිරීම තමයි ඔවුන් කරන්නේ. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමාත් කිව්වා, ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව අපි අයින් කරන්න හදනවා කියලා. හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව අයින් කිරීම සම්බන්ධයෙන් මේ පනතේ කිසිම තැනක මොකක්වත් සඳහන් වෙන්නේ නැහැ. මේ පනතින් ලබා දීලා තිබෙන්නේ, හිටපු ජනාධිපතිවරුන්ට ඉන්න නිවසක්, ලේකම්වරයාට ගෙවන දීමනාවක් - secretarial allowance එකක් - වාගේම හිටපු ජනාධිපතිවරුන්ගේ ඇවෑමෙන් ඔවුන්ගේ වැන්දඹුවන්ට ගෙවන pension එක සහ ඒ අයට ඒ නිවස ලබා දීමයි. ඒ වාගේම secretarial allowance එකක් වැන්දඹුවන්ට ලබා දෙනවා. එතකොට, ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක් මේ පනතට අදාළත් නැහැ, මේ පනතට සම්බන්ධයකුත් නැහැ. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට ව්‍යංගාර්ථයෙන් තර්ජනයක් කරනවා, පාතාලය ඉවර කළොත් අපි බලාගන්නම් කියලා. ඒ වාගේ කථාවක් තමයි ඇත්තටම මෙතැන කියන්නේ. අපි ඒවාට බය වෙන්නේ නැහැ. කවුරුවත් හදපු පාතාලය අපි ඉවර කරන්න බය වෙන්නේත් නැහැ. අනුර කුමාර දිසානායක සහෝදරයාට ඔයගොල්ලන්ගේ ආරක්ෂාව ඕනෑත් නැහැ. ඒකට අපිත් එක්ක

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

මහජනතාව ඉන්නවා. මහජනතාවගේ ආරක්ෂාව තමයි ජනාධිපතිවරයෙකුට, පාලකයෙකුට වැඩියෙන්ම තිබෙන්න ඕනෑ. මහජනතාවගේ ප්‍රසාදය, මහජනතාවගේ ගෞරවය, මහජනතාව දක්වන ආදරය ජනාධිපතිවරයෙකුට තිබෙන්න ඕනෑ. ඒක මේ ජනාධිපතිතුමාට තිබෙනවා. එහෙම නැති ජනාධිපතිවරුන්ට මොකක්ද වෙන්නේ කියන එක ලංකාවේත් අපි දැකලා තිබෙනවා.

විපක්ෂයේ කිසිම කෙනෙකුට සමකාලීන අවබෝධයක් නැහැ, ලෝකයේ දේශපාලනය තුළ මොකක්ද වෙන්නේ, ලංකාවේ දේශපාලනය තුළ මොකක්ද වෙන්නේ, ජනතාවගේ සිතුම් පැතුම් මොනවාද කියන ඒවා ගැන. ඒගොල්ලන් පෙන්වන්න හදනවා, මේක වෛරී දේශපාලනයක් කියලා. ඒ වාගේම නිර්ප්‍රභූ - ප්‍රභූ කතන්දරයක් දිගින් දිගටම කිව්වා. ඒගොල්ලන් ප්‍රභූ, අපි නිර්ප්‍රභූ, ඒක හින්දා ප්‍රභූන්ට එරෙහිව කටයුතු කරනවා වාගේ කථාවක් කියනවා. වෛරී දේශපාලනයක් ඇති කරනවා කියලා අදහසක් ද ඔවුන් ඇති කරගෙන යනවා. මෙන්න මේකට අපි උත්තරයක් දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම අද ලෝකයේ සිද්ධ වන දේවල් බැලුවාම ඔබතුමියත් දකිනවා ඇති newsවල යනවා, සමාජ මාධ්‍යයේත් තිබෙනවා, අපට කලින් බංග්ලාදේශය, ඒ වාගේම ඉන්දුනීසියාව, පිලිපීනය, නේපාලය ආදී රටවල ජනතාව තුළ යම් යම් මාදිලිවලින් මතු වන ප්‍රශ්න තිබෙන බව. අපි කිසිම අවස්ථාවක ප්‍රචණ්ඩත්වය අනුමත කරන්නේ නැහැ. නමුත් අපට පොදුවේ පෙනෙන දේ මොකක්ද? මේක ලංකාවේ විතරක් තිබෙන දෙයක් නොවෙයි. සමකාලීන ගෝලීය දේශපාලනයේ තිබෙන කතන්දරය මොකක්ද? ජනතාව ඉල්ලා සිටිනවා, සමානාත්මතාවක්. ජනතාව ඉල්ලා සිටිනවා, ගරුත්වයක්. ඒක ලංකාවේ ජනතාව විතරක් නොවෙයි, ලෝකයේ හැම රටකම සිටින ජනතාව ඉල්ලා සිටිනවා. අපි වාගේ සංවර්ධනය වෙමින් පවතින රටවල, සදාකාලිකව සංවර්ධනය වෙමින් පවතින රටවල ජනාධිපතිවරු, ඇමතිවරු, දේශපාලනඥයන්, ඔවුන්ගේ හිතවතුන් විතරක් ධනවතුන් වීම සම්බන්ධව ඒ රටවල ජනතාව තුළ අප්‍රසාදයක් තිබෙනවා. ඒ අප්‍රසාදය තමයි, උද්ඝෝෂණ ආකාරයට, සමහර වෙලාවට ප්‍රචණ්ඩ ආකාරයට ඉතාම අවාසනාවන්ත විධියට පිළිබිඹු වෙන්නේ. ඉතින් අපි මෙන්න මේක තේරුම් ගනිමු.

අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙලා තිබෙන්නේ, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන රජයක් සිටින නිසායි; අපේ රටේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මේ වෙනස්කම් සිදු කිරීමට උත්සාහ කරන නිසායි. අපි ජනතාවට ගරු නොකර, ජනතාවට ඉහළින් සිටින්නට උත්සාහ කරනවා නම්, අපි මේ සමානාත්මතාවෙන් - දේශපාලනඥයා, පාලකයා සහ ජනතාව සමානයන් ලෙස කටයුතු කරන්න ඕනෑය කියන එකෙන් - වැළකෙනවා නම් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙන්නේ නැහැ.

මෙතැනදී තනතුරු සම්බන්ධයෙන් ගත්තොත්, ඕනෑම තනතුරකට අදාළව වරප්‍රසාද තිබෙන්න පුළුවන්, ඒ තනතුරේ කාර්යය සඳහා ලබා දෙන පහසුකම් තිබීමට පුළුවන්. ඒකේ ගැටලුවක් නැහැ. නමුත් මහජනතාවගේ ධනයෙන් සුඛිත මුදිත වෙන ගමන් ජනතාවට කිසිදු දෙයක් ඉතිරි නොකිරීම හේතුවෙන් ලෝකය පුරාම අද ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනයක් ඇති වෙලා තිබෙනවා. ඒක තේරුම් ගන්න. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න ඕනෑ නම් පාලකයන් වෙනස් විය යුතුයි. ඒක තමයි විධිය. පාලකයන් සමානාත්මතාව පිළිගත යුතුයි. පාලකයන් ජනතාව සමඟ එකට සිටගෙන, ඔවුන් ළඟින් සිටගෙන, ඔවුන්ගේ සිතැඟි අනුව කටයුතු කරන පිරිසක් බවට පත් විය යුතුයි. ඒ නිසා මේ මන්ත්‍රීවරුන් ජනාධිපතිතුමාට එරෙහිව කළේ ඉතාම බරපතළ තර්ජනයක්. මොකද, මේගොල්ලන්ගේ පක්ෂවල සාමාජිකයන්ගේ ඉඩම්වලින් මතු වන දේවල් එක්ක බැලුවාම එය බරපතළ තර්ජනයක්. නමුත් අපට විශ්වාසයි, ජනතාවගේ ආදරය දිනාගත් ජනාධිපතිවරයෙක් අපට සිටිනවා කියලා. මේගොල්ලන්ගේ ආරක්ෂාව අපට වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි අපි තේරුම් ගන්න ඕනෑ, මේ අවස්ථාවේ මේ වාගේ පනතක් ලංකාවට අවශ්‍ය වෙන්නේ ඇයි, හිටපු ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද කප්පාදු කිරීමට අවශ්‍ය වෙන්නේ ඇයි කියන එක.

මේක ජාතික ජන බලවේගය විසින් ලබා දීපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කොටසක්. ඒ තමයි ජනාධිපතිවරුන්ට තිබෙන අසීමාන්තික බලතල, අසීමාන්තික වරප්‍රසාද අහෝසි කරනවාය කියන එක. ඒ අනුව මේක අපේ ජන වරමේ කොටසක්. ඒක තමයි පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය තමයි, මේ රටේ ජනාධිපතිවරුන් හැසිරිලා තිබෙන ආකාරය හා ඔවුන්ගේ නිල බලතල පාවිච්චි කළ ආකාරය. ජනාධිපතිවරයා තමයි කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වෙන්නේ; Cabinet එක head කරන්නේ ජනාධිපතිතුමා. අපේ රටේ ඉතිහාසයේ අවස්ථා දෙකකදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නඩු තීන්දු දෙකක් ලබා දී තිබෙනවා, ජනාධිපතිවරුන්ගේ බලය පාවිච්චි කරමින් තමන්ටම වාසිසහගත වන ආකාරයේ තීරණ ලබා ගැනීම සම්බන්ධව. විශේෂයෙන්ම විශ්‍රාම යැමෙන් පසු නිල නිවාස ලබා ගැනීම සම්බන්ධයෙන් ඔවුන් ගන්නා තීරණ සම්බන්ධව අවස්ථා දෙකකදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු ලබා දී තිබෙනවා. එක තීන්දුවක් මෑත කාලයේදීත් ලබා දුන්නා. ඒ තමයි, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා විසින් වෙන් කර ගත් නිල නිවාසයක් සම්බන්ධ ලබා දුන් තීන්දුව. බොහොම පැහැදිලිව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ කාරණය විමසා බලා තමයි ඒ තීන්දුව ලබා දුන්නේ. ජනාධිපතිවරයෙකුට ලැබිය යුතු නිවස මොන වාගේ එකක් විය යුතුද, ඒකට යම්කිසි සාධාරණත්වයක් තිබිය යුතුයි, ඒක reasonable වෙන්නට ඕනෑ යනාදී වශයෙන් එම තීන්දුවේ සඳහන් වනවා. ඒ නිසා තමන්ට හිතුණු හිතුණු විධියට තීරණ අරගෙන නිල නිවාස වෙන්කර ගැනීමට හැකියාවක් නැහැ. ඒකෙදි විශේෂයෙන්ම සොයා බලන දෙයක් තිබුණා.

ජනාධිපතිවරුන් Cabinet එක head කරන ගමන් තමන්ට වෙන්කර ගන්න නිල නිවාස සඳහා රුපියල් මිලියන 180ක් - ජනාධිපති හැටියට ඉන්න කාලයේදී - වියදම් කරලා renovate කරලා, සංවර්ධනය කරනවා. ඊට පසුව ජනාධිපති හැටියට - කැබිනට් එකේ head හැටියට, ප්‍රධානියා හැටියට - තීරණයක් ගන්නවා, මේ නිල නිවස තමන් විශ්‍රාම ගියාට පස්සේ තමන්ටම ලැබෙන්න ඕනෑය කියලා. ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියටත් 2007දී මෙවැනි නඩු තීන්දුවක් ලබා දී තිබෙනවා. එතුමිය ජනාධිපතිවරිය හැටියට සිටි අවස්ථාවේදී Senarath and others vs Chandrika Bandaranaike Kumaratunga and others කියන නඩුවේදී බොහොම පැහැදිලිව ශ්‍රේෂ්ඨාධිකරණය විමසා තිබෙනවා, නාගරික සංවර්ධන අධිකාරියට අයත් වෙලා තිබිච්ච, රුපියල් මිලියන 800ක් යොදවා සංවර්ධනය කරන ලද පාර්ලිමේන්තුව අසල තිබෙන ඉඩමක් එවකට හිටපු ජනාධිපතිවරිය, කැබිනට් මණ්ඩලයේ head හැටියට කටයුතු කරමින් සිටියදී විශ්‍රාම යැමෙන් පසුව තමන්ගේ පරිභෝජනය සඳහා, තමන්ගේ බුක්තිය සඳහා වෙන්කර ගැනීම කියන කාරණාව. එතකොට අපට පෙනෙන්නේ මොකක්ද? හිටපු ජනාධිපතිවරුන් තමන්ගේ බලය පාවිච්චි කරනවා, තමන්වම සුඛිත මුදිත කර ගැනීමට. ඒ කාලය තුළ ලංකාවට මොකද වුණේ කියන එක අපි හැමෝම දන්නවා. මහින්ද රාජපක්ෂ මහත්මයා දැන් ඉන්න නිවසත් එහෙම තමයි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ නිවසත් එහෙම තමයි. ඒවා, ගෙවල් දෙකක් එකතු

කරලා හදා ගත් නිවාස. මහින්ද රාජපක්ෂ මහත්මයා දැන් ඉන්න නිවසත්, ගෙවල් දෙකක් එකතු කරලා හදාගත් නිවාසයක්. ඒවා renovate කරනවා. ආර්ථික අර්බුද අවස්ථාවලදී, කොවිඩ් වසංගත අවස්ථාවේදී, රටේ ජනතාවට කන්න, බොන්න නැති අවස්ථාවලදී පවා ඒවාට සල්ලි වෙන් කළා. රුපියල් මිලියන 300ක්, 400ක් වෙන් කර ගනිමින් ඒවා renovate කර ගන්නවා. මෙන්න මේ අකාරුණික බව, මේ අසංවේදී බව ගැනයි මම කියන්නේ.

ජනාධිපතිවරයා කියන්නේ රටේ බලවත්ම පුද්ගලයා. ජනතාව ජනාධිපතිවරයා විශ්වාස කරනවා, ජනාධිපතිවරයාට ආදරය දක්වනවා. එතකොට ඒ ජනාධිපතිවරයාට වගකීමක් තිබෙනවා, ජනතාවගේ ඒ විශ්වාසය ආරක්ෂා කරන්න. ඒක ආරක්ෂා නොකරන නිසා තමයි ඒවා ඉවත් කරන්න කියලා ජනතාව ඉල්ලා සිටින්නේ. ඒ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීම විතරයි අපි මේ කරන්නේ. මේ රටේ දේශපාලන සංස්කෘතිය අපි හරි ගස්සන්නට අවශ්‍යයි. ජනාධිපතිවරයෙකුගේ කාර්යභාරය, ජනාධිපතිවරයාට ලබා දෙන විශ්වාසය අනුව ප්‍රමිතිගත ලෙස ජනතාවට සමානාත්මතාව හිමිවන ආකාරයෙන්, ගරුත්වය හිමිවන ආකාරයෙන් ජනතාව ලබා දීලා තිබෙන බලය අවභාවිත නොකර ශිෂ්ට ලෙස දේශපාලනය කිරීමේ සම්ප්‍රදායක් අපි ඇති කර ගන්න අවශ්‍යයි. හිටපු ජනාධිපතිවරයෙකු ජනතා මුදලින් යම්කිසි ප්‍රමාණයක් වියදම් කරලා නඩත්තු කරන එක වෙනත් රටවල වෙන්න පුළුවන්. ඒක යම්කිසි තත්ත්වයක් යටතේ සිදු වෙන්න පුළුවන්. නමුත් අපේ රටේ ඊට වඩා සුවිශේෂී ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ දේශපාලන සංස්කෘතිය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, මේක reset කරන්න අවශ්‍යයි කියලා. මේක අපි නැවත පටන්ගන්න අවශ්‍යයි. අපි දේශපාලනඥයාගේ ප්‍රමිතිය හදන්න අවශ්‍යයි. ජනාධිපතිවරයාගේ ප්‍රමිතිය හදන්න අවශ්‍යයි. තමන්ට ලැබෙන බලය මේ ආකාරයෙන් අවභාවිත කිරීමට එරෙහිව නීති සකස් කරන්න අවශ්‍යයි. ඒ නිසා තමයි අපි අද මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා සම්මත කර ගන්න හදන්නේ. ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව වෙනුවෙන්, ජනතාවගේ අභිලාෂයේ ආරක්ෂාව වෙනුවෙන්, ලංකාවේ දේශපාලනය ශිෂ්ට කිරීමේ අරමුණ වෙනුවෙන් තමයි අපි මේ පනත ගෙනෙන්නේ. එම නිසා ඒ සම්බන්ධයෙන් විපක්ෂයත් සහයෝගය ලබා දෙයි කියලා අපි අපේක්ෂා කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපට නැවතත් විපක්ෂයේ ආරක්ෂාව අවශ්‍ය නැහැ. අපි මහජනතාවගේ ආරක්ෂාව මත සිටින රජයක්.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.43]

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙය අපි අතිශය වැදගත් පනත් කෙටුම්පතකට ඡන්දය දීමට සූදානම්ව ඉන්න මොහොතක්. අපේ ගරු අධිකරණ අමාත්‍යතුමාගේ කථාවේදී මුලින්ම පාලකයා පිළිබඳව මිහිඳු මහ රහතන් වහන්සේ සිදු කළ දේශනාවක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. එහිදී මිහිඳු මහ රහතන් වහන්සේ දේශනා කරනවා, "රජතුමනි, ඔබ මේ භූමියේ භාරකාරයා මිස අයිතිකාරයා නොවෙයි" කියලා. ඉස්සර රජ දරුවෝ ජනතාව රංජනය කිරීම යන අර්ථයෙන් තමයි රජ්ජුරුවෝ වුණේ. හැබැයි, ඒ රාජ්‍ය යුගය 1815දී අවසන් වෙනවා. අවාසනාවට, ආපසු කෘත්‍රිමව මාධ්‍ය හරහා වාගේම ප්‍රචාරණය හරහා රජ යුගයක් නිර්මාණය කිරීම 2005 අවුරුද්දෙන් පසුව සිද්ධ වෙනවා. හැබැයි, ඒ රජ යුගයත්, මේ රජ යුගයත් අතර වෙනසක් තිබෙනවා. ජනතාව රංජනය කිරීම නොවෙයි, ජනතාවගෙන් රංජනය වීමේ යුගයක් තමයි ඒ ආරම්භ කරන්නේ. අවුරුදු 5ක්, 10ක් ජනාධිපති ධුරය දරමින් ඉඳලා ඊට පඩි ගාණක් පල්ලෙහාට බැහැලා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දක්වා පල්ලම් බහින දේශපාලනයක් තිබුණේ. ඒ දේශපාලනය අතිශයින්ම කැතයි, නිර්ලජ්ජිතයි. ඒ නිර්ලජ්ජිතභාවය සංකේතාත්මකව පෙන්වන දෙයක් තමයි ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද උරුම කර ගන්නා වූ මේ ක්‍රමවේදය. මට කලින් කථා කළ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලා ඉතා පැහැදිලිව කිව්වා, තමන් නායකත්වය දෙන කැබිනට් මණ්ඩලයේ මුලසුනේ සිට තමන්ගේ ගොඩට, තමන්ගේ වරප්‍රසාද තහවුරු කර ගන්නා වූ, තමන්ගේ වරප්‍රසාද වැඩිදියුණු කර ගන්නා වූ ක්‍රමවේදයක් පාවිච්චි කිරීම ගැන. මේක අපේ ගැමියෙක් පවා ඉතා නිර්ලජ්ජී විධියට හඳුන්වන දෙයක්. අපි ඒකට කියන්නේ ලොකුම හැන්දෙන් තමන්ට බෙදා ගන්නවාය කියායි. මේක විධායක බලය හොබවන ජනාධිපතිවරයෙක් අර්ථයෙන් ගත්තාම කොච්චර කැතද? හැබැයි, අපි නම කියද්දී කියන්නේ කොහොමද? මුලින් කියන්නේ, "ගරු" නොවෙයි, "අතිගරු" කියලා. සමහරු නමේ අවසානයට එකතු කරනවා, "උතුමාණන්" කියලා. "උතුමාණන්" විතරක් නොවෙයි, "උතුමාණන් වහන්සේ" කියාත් කියනවා. උතුමාණන් වහන්සේලා, අතිගරු උත්තමයෝ කළේ එහෙමයි. තමන් විශ්‍රාම ගියාට පසුව වැජඹෙන්න ගෙවල් හදා ගත්තා; ගොඩනැඟිලි හදා ගත්තා. කොවිඩ් හැදිලා එකා පිට එකා මැරිලා වැටෙන රටක් තුළ ඒ කාලයේ දවල් ප්‍රවෘත්ති ඇහුවාම එකසිය ගාණක් මැරිලා. හැන්දෑවේ ප්‍රවෘත්ති අහනකොට තවත් සිය ගාණක් ඒ ගොඩට එකතු වෙලා. ජනතාව වේදනාවෙන් වේදනාවට පත් වෙලා හිටපු එවැනි තත්ත්වයක් තුළ තමයි ඒ ජනාධිපතිවරු තමන්ගේ නිල නිවාස පුළුල් කර ගත්තේ, සැපය කැඳවා ගත්තේ. අන්න ඒකයි මම කියන්නේ, ජනතාව රංජනය කිරීම නොවෙයි, ජනතාවගෙන් රංජනය වීමයි අපි මේ වළක්වන්න උත්සාහ කරන්නේ කියන එක.

උදේ වරුවේ කථා කළ විපක්ෂයේ නීතිඥ මහත්මයෙක් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ගැන කිව්වා. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මොකක්ද? ජනතාවගේ පරමාධිපත්‍යය ප්‍රකාශයට පත් කරන්න අපි නියෝජිතයෙක් පත් කරනවා. ඒ නියෝජිතයා තමන්ගේ නිල කාලය ඉවර වෙනකොටම ආපසු සාමාන්‍ය පුරවැසියෙක් බවට පත් වෙන්න ඕනෑ. ඒකයි ප්‍රජාතන්ත්‍රවාදය. හැබැයි, නියෝජිතභාවය අත්පත් කර ගන්නවා. එතැනදී ඔවුන් මැතිවරණ ප්‍රකාශන හරහා නානාප්‍රකාර දේවල් කියනවා.

මගේ මතකය හරි නම්, ඔය "භූමියේ භාරකාරයා" කියන එකත් එක්තරා ජනාධිපති අපේක්ෂකයෙකුගේ -"මිහිඳු" කියන නමට වුවටක් කිට්ටුවෙන් යන අපේක්ෂකයෙකුගේ- ප්‍රතිපත්ති ප්‍රකාශනයක තිබුණා. හැබැයි, බලය ගත්තාට පස්සේ ප්‍රතිපත්ති ප්‍රකාශනය හමස් පෙට්ටියට යනවා; දේශපාලනඥයාගේ සැබෑ ස්වරූපය එළියට එනවා. ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා නිරන්තරයෙන් වේදිකාවල කියපු කථාවක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. ඒ තමයි, "මේ රට අරුම පුදුම රටක්. දේශපාලනඥයා ආර්ථික වශයෙන් පඩියෙන් පඩියට පිම් විධියට ඉහළට යනකොට ජනතාව දුප්පත්කමේ ප්‍රපාතයට වැට්ච්ච රටක්" කියන එක. ඒක කොහොමද වෙන්නේ? අන්න ඒක තමයි දූෂණය, අල්ලස, කොමිස්, සූරා කෑම කියන එක මූර්තිමත් වන, දර්ශනය වන දර්ශකය. මේක නැද්ද කියලා බලන්න. අල්ලස් හා දූෂණ චෝදනාවලට අදාළව දිනපතා ප්‍රවෘත්ති අසන්න ලැබෙන්නේ, අන්න ඒ දර්ශකයේ නිර්ණායක පෙන්නුම් කිරීමක් විධියටයි. ඒ තත්ත්වය අපි කොහොමද භාර ගන්නේ? ජනතාවට

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

ඒක උහුලන්න පුළුවන් කාලයක් තිබේවි. නමුත් බැරිම තැන ජනතාව නීතිය අතට ගන්නවා. ජනතාව ජනාධිපතිවරුන් ගෙදර යවනවා; පලවා හරිනවා.

හැබැයි. කනගාටුවට කරුණ තමයි, කිසිම ජනතා මතයක් නැති කෙනෙක් වංගුවෙන් ජනාධිපති ලෙස පත් වන එක. ඔහු මර්දනයේ හස්තය ජනතාව මත පතිත කරනවා. බදු පිට බදු ගහමින්, පාලකයන්ට වරප්‍රසාද උරුම කර ගන්නා වූ දේශපාලනයක් හඳුන්වා දෙනවා. ඒ දේශපාලනයට තිත තියන්න ඕනෑ නැද්ද? ඒ දේශපාලනය අවලංගු කරන්න ඕනෑ නැද්ද? අන්න ඒ ප්‍රශ්නය අපි ජනතාවගෙන් ඇහුවා, ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත්. ජනතාව එක වරම අත් දෙකම ඔසවලා කිව්වේ, මේ කැත, අවලම්, ජනතා ද්‍රෝහී දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ඕනෑ කියන එකයි. අන්න ඒ කාරණය අපි ජාතික ජන බලවේගය විධියට හිස නමා ගරුත්වයෙන් පිළිගත්තා. ඒ යෝජනාව අපි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශන හරහා ගෙනාවා. ඒ ප්‍රතිපත්තියට ලැබිච්ච අනුමැතිය, ඒ ප්‍රතිපත්තියට ලැබිච්ච මහජන අනුමැතිය ක්‍රියාත්මක කිරීමේ එක අදියරක් තමයි මේ අද සම්මත වෙන පනත. මේ සම්මත වෙන පනතට විරුද්ධව කාටද කථා කරන්න පුළුවන්? අපි අහිමි කරන්නේ මොනවාද? නීත්‍යානුකූලව ජනාධිපතිවරයෙකුට, විශ්‍රාමික ජනාධිපතිවරයෙකුට ලබා දිය යුතු සියලු දේ ලබා දෙමින්, ඔහු විසින් ජනාධිපති ධුරය දරමින් ස්වකීය කැබිනට් මණ්ඩලයෙන් අමතරව ලබා ගත්ත වරප්‍රසාද හා වරදානයි මේ අවසන් කරන්නේ. මේ වරප්‍රසාද හා වරදානවල තත්ත්වය අපේ සහෝදර මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් කිව්වා. ඒක දරා ගන්න බැරි බරක් විතරක් නොවෙයි, දරා නොගත යුතු බරක්. අපි රටක් විධියට ආර්ථිකයේ පතුලට එරිලා ජනතාවගේ හුස්ම හිර වෙච්ච වෙලාවකත් ගෙවන බද්දෙන් මෙන්න මේ කණ්ඩායම් නඩත්තු කිරීමේ වගකීම ජනතාව දරන්නේ ඇයි? ජනතාව රංජනය කරන්න ආවා නම් අන්න ඒ වැඩේ කරන්න ඕනෑ. ඒ වැඩේ ඉවර කරලා සමු ගන්නා වෙලාවට ජනතාව ඊළඟ අවස්ථාව නිර්මාණය කරාවි. ඒ නිසා මම කියන්නේ, කිසිදු කෙනෙකුට මේ පනතට විරුද්ධව ඡන්දය දෙන්න බැහැ කියන එකයි. ඡන්දය දෙනවා නම් ඔවුන් අනෙක් පැත්තෙන් ජනතා ද්‍රෝහීන් වෙනවා. අධිවරප්‍රසාද ලබන කණ්ඩායමකට ජනතා බදු මුදල් ගසා කන්න, ජනතා බදු මුදල් පාවිච්චි කරන්න අවස්ථාව දෙන්න කැමැති නම් තමයි මේ පනතට විරුද්ධ වෙන්න ඕනෑ. ඒ නිසා මම මේ කාරණය යෝජනා කරනවා. ඒ වාගේම මේ ගරු පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා, ජනතාවාදී නියෝජිත කණ්ඩායමක් විධියට මේ පනතට පක්ෂව ඡන්දය භාවිත කරලා, ජනතාවගේ දෝතින් සුරක්ෂිත වන සංස්කෘතියක් තුළ දේශපාලන සංස්කෘතියක් ගොඩනැඟීමේ කර්තව්‍යයට කර දෙන්න, උර දෙන්න, සහයෝගය දෙන්න කියලා.

මට කථා කරන්න කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.53]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Deputy Chairperson of Committees, අද මේ ගරු සභාවේ විවාද කරන්නේ ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත ගැනයි. මම ටිකක් හොයලා බැලුවා ඇයි මේක "ජනාධිපතිවරයන්ගේ වරප්‍රසාද" කියා නැතිව, "හිමිකම්" කියා තිබෙන්නේ කියලා. බැලින්නම්, මේකේ "හිමිකම්" කියලා තමයි ලියලා තිබෙන්නේ. කෙසේ නමුත්, 1986 අංක 4 දරන පනතේ තිබුණේ හිටපු ජනාධිපතිවරුන්ගේ සහ ඔවුන්ගේ වැන්දඹු බිරිඳට ලබා දෙන හිමිකම් සම්බන්ධවයි. ඒක පොඩ්ඩක් විශ්ලේෂණය කරලා බැලුවාම ඇත්තටම ඒකේ "හිමිකම්" කියලා තිබුණාට, වරප්‍රසාද තමයි තිබෙන්නේ. එතකොට හරි. ඉවත් කරන්නේ වරප්‍රසාද, ඒ පනතේ හිමිකම් කියන වචනය තිබුණාට.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වන ව්‍යවස්ථාවේ තමයි ජනාධිපතිවරුන්ගේ හිමිකම්, ඒ කියන්නේ වැටුප, විශ්‍රාම වැටුප් සහ අනෙකුත් දීමනා සම්බන්ධ ප්‍රතිපාදන තිබෙන්නේ. හැබැයි, මම හිතන්නේ එම 36 වන වගන්තියට නම් අත තියලා නැහැ. ඒ වගන්තිය එහෙමම තිබෙනවා. ඒක සමහර විට මේ කට්ටිය දන්නේ නැතිව ඇති. ඒ අනුව ජනාධිපතිතුමාට හිමි විය යුතු විශ්‍රාම වැටුප්, අනෙකුත් හිමිකම් මේ පනත් කෙටුම්පතෙන් අහෝසි වෙන්නේ නැහැ. ඒ කියන්නේ අද ඉන්න ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයාගේත් වැටුප්, විශ්‍රාම වැටුප් එහෙමම තිබෙනවා. සමහර විට කට්ටිය හිතනවා ඇති හිටපු ජනාධිපතිවරුන්ගේ විශ්‍රාම වැටුප් හා එතැනින් ගියාම වැන්දඹුවන්ගේ හිමිකම් ඉවත් කළාම ඉන්න ජනාධිපතිවරුන්ගේත් අහෝසි වෙනවා කියලා. එහෙම අහෝසි වෙන්නේ නැහැ. එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පිළිබඳව මම නම් දැනුවත් නැහැ. I hope somebody would be able to enlighten me. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වන ව්‍යවස්ථාව යටතේ නම් තිබෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වී මාසයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් යෝජනා සම්මතයක් එන්න ඕනෑ කියලායි. එවැනි යෝජනා සම්මතයක් ගෙනාවා ද දන්නේ නැහැ. සමහර විට විසර්ජන පනත යටතේ ලබා දෙනවා වෙන්න ඇති.

ඒ කෙසේ වෙතත්, මේ ප්‍රශ්නය ඇත්තටම තිබෙන්නේ හිටපු ජනාධිපතිවරුන් ලබා ගෙන ඇති නිල මන්දිර- නිල නිවාස - ගැනයි. ඒක මන්දිරයක් බවට පත් කර ගත්ත එක ශාපයක්. එහෙම නොවෙයි, ඇත්තටම නිල නිවසක් දෙන්න ඕනෑ. එහිදී අනිසි ලෙස තමන්ට වෙන් කර ගත්ත ඒ නිල මන්දිර නැවත ලබා ගැනීමේ ප්‍රශ්නය තමයි මේ ආණ්ඩුවට ඉස්සෙල්ලාම තිබුණ අභියෝගය. ඔක්කෝම බලාපොරොත්තු වුණා මාසයක්, දෙකක් ඇතුළත අධිකරණමය ක්‍රියාවලියක් හරහා මේක කරන්න පුළුවන් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මොනවා හරි හේතුවක් නිසා මේ ආණ්ඩුවට අධිකරණ ක්‍රියාවලිය හරහා යන්න පොඩි ප්‍රශ්නයක් තිබෙනවා තමයි. දැන් මේ පනතක් ගෙනැල්ලා 1986 අංක 4 දරන පනත සම්පූර්ණයෙන්ම අහෝසි කරලා තමයි දැන් මේක එළියට දාන්න යන්නේ. හැබැයි, ඔතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මොකක්ද දන්නවාද? වග වීමක් නැහැ. මේ පනතේ කොහේවත් නැහැ යම්කිසි හිටපු ජනාධිපති කෙනෙක් ඔහුට හෝ ඔහුට පසුව තමාගේ වැන්දඹුවට -එහෙම එකක් වෙලා නැතිව ඇති- හිටපු විශ්‍රාම ගිය -විශ්‍රාම ගියේ නැහැ. ඇත්තටම විශ්‍රාම වීමක් නැහැ. ඒකත් හරි- අර්ථානුකූලව බැලුවොත් ජනාධිපතිතුමා විශ්‍රාම යන්නේ නැහැ. අවුරුදු 5කට පස්සේ ජනතාව ඔහුව තෝරා ගත්තේ නැත්නම් ගෙදර යනවා මිසක්. එතකොට එහෙම ගිය ජනාධිපතිතුමා අනිසි ලෙස තමා යම්කිසි නිල නිවසක්, නැත්නම් මාලිගාවක් පාවිච්චි කළොත් මෙතැන වග වීමක් නැහැ. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට ලබා දුන්න නඩු තීන්දුවේත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට දීපු නඩු තීන්දුවේත් සිද්ධ වුණා වග වීමක් වෙන්න. මම කල්පනා කරන්නේ, මේ ආණ්ඩුව යම්කිසි අනිසි ප්‍රයෝජනයක් තමා වෙනුවෙන් කරගෙන තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ගයකට නොගියාම වග වීමක් නැහැ. එළියට දාන එක විතරයි වෙන්නේ.

අධිකරණ ක්‍රියාවලිය ගැන කථා කරනකොට මට තවත් කාරණාවක් මතක් වෙනවා. මොකද, මේ රජයට තමන්ගේ පක්ෂ කාර්යාලයක් නැවත ගන්නකොටත් අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව එච්චර විශ්වාසයක් තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අධිකරණයෙන් නියෝගයක් තිබෙනවා, නමුත් පිස්කල් මාර්ගයෙන් නොවෙයි ඒවා ක්‍රියාත්මක වෙන්නේ. ඒක අපට අදාළ නැහැ. ඒ ගොල්ලන්ගේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයායි, පෙරටුගාමී සහෝදරයායි ගහගත්ත ප්‍රශ්නය මට අදාළ නැහැ.

නමුත් මේ වෙලාවේ විශාරද ගුණදාස කපුගේ මහත්මයාගේ සින්දුවක් මට මතක් වුණා. ඇත්තටම ඒක මට මතක් වුණා කියනවාට වැඩිය, විග්‍රහශීලී යුටියුබ් මාධ්‍යවේදියෙක් ඔය සින්දුව ලස්සනට ඔහුගේ සාකච්ඡාවේ කියලා තිබුණා. මේක ගුණදාස කපුගේ මහත්මයාගේ සින්දුවක්. දැන් සිංදුව කියන්න ගියොත් නම් කරදර වෙන්න වෙයි. *[බාධා කිරීමක්]* කමක් නැද්ද? එහෙනම් මම කියන්නම්.

"අයියණ්ඩියේ නුඹ ඇවිදින් ගිය දවසේ
ගිණි ඇවිළුණා කැණිමඬලට අපෙ නිවසේ ..."

සින්දුවේ ඉතිරි ටික මම කියන්නේ නැහැ. මේකෙන් කියන දේ මට අදාළ නැහැ. "මං අමතකද නුඹ රජ වූ අද දවසේ" කියලා මේ ගීතයේ කියනවා. ඒ සහෝදරයින් ගහගත්තාට ඒක මට අදාළ නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි.

"වී පැලකට ඇයි නුඹ විරසක වෙන්නේ."

ජන කවියක් ආශ්‍රයෙන් තමයි ඒ සින්දුව ලස්සනට හදලා තිබෙන්නේ.

"සඳට සැපක්දෝ ගනඳුර පීදීම
මහ පොළවකට නඩු හබ ඇයි ගතු කීම"

දැන් මම මේ ගීතය කිව්වේ වෙන මොකවත් නිසා නොවෙයි. මේ සම්බන්ධයෙන් කරුණු කියනකොට මගේ සේවා දායකයෙක් කථා කරලා කිව්වා, "අනේ සර්, අපටත් පක්ෂපාතව නඩුවක තීන්දුවක් හම්බ වුණා. අපට ඒ ඉඩම ලබා ගන්න ඇස්කීසි ගන්න කියනවා. පිස්කල් මාර්ගයෙන් එන්න කියනවා. එතැනට ගියාම කියනවා, appeal කරලා කියලා. ඒක එතැනින් නැවතිලා දැන් අවුරුදු ගණනක් ගිහිල්ලා තිබෙනවා. දැන් බලන්නකෝ, ආණ්ඩුව ඒ පිළිබඳව ලස්සන කථාවක් කියලා තිබෙනවා, අපට නියෝගයක් තිබෙනවාලු ගන්න පුළුවන් කියලා" යනුවෙන්. ඒක වැදගත්. වෙන මොකවත් නිසා නොවෙයි මම ඒක කියන්නේ. නීතියේ ආධිපත්‍යය පිළිබඳව වැරදි ආදර්ශයක් තමයි මෙතැනදී අපි ලබා දෙන්නේ. ඒ කාරණාවත් මේ අවස්ථාවේ පොඩ්ඩක් මතක් කරන්න කැමැතියි.

ඊළඟ කාරණය මෙයයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ තීන්දුව ඊයේ තමයි පාර්ලිමේන්තුවේ සභාගත කළේ. අද අපි මේ නීතිය පනතක් හැටියට ගේනවා. නමුත් මේ සඳහා තිබෙන හදිසිය, එහෙම නැත්නම් මේ සභාවට තිබෙන වුවමනාව පළාත් සභා මැතිවරණය පවත්වන්න නැහැ.

எனக்கு முன்பு பேசிய கௌரவ உறுப்பினர் சொன்னார், நேற்று உயர்நீதிமன்றத் தீர்ப்பு அறிவிக்கப்பட்ட ஒரு சட்டமூலத்தை இன்னும் 24 மணித்தியாலம்கூட கழிந்திராத நிலையில், இன்று அவசரமாக அதனைச் சட்டமாக்குவதற்காக சபைக்குக் கொண்டுவந்திருக்கிறார்கள்; ஆனால், மாகாண சபைத் தேர்தலை நடத்துவதற்கான எந்த ஒரு சட்ட மூலத்தையும் காணவில்லை என்று. அதுமாத்திரமல்ல, அரசியலமைப்பில் நாங்கள் கொண்டுவர எதிர்பார்க்கின்ற மாற்றங்கள், ஜனாதிபதி முறைமையைப் பற்றி கொண்டு வரவிருக்கின்ற மாற்றங்களைப் பற்றி எந்தவிதமான ஓர் அவசரமோ, அதைச் செய்ய வேண்டிய தேவையோ இந்த அரசாங்கத்திற்கு இருப்பதாகத் தெரியவில்லை. ஆனால், அமைச்சரவைப் பேச்சாளராக இருக்கின்ற கௌரவ அமைச்சர் அவர்கள் நேற்று சொல்கிறார், -

"අපි විධායක ජනාධිපති ධුරය දැන්මම ඉවත් කරන්නේ නැහැ, කාලය කෙටියි, අපට තව යන්න තිබෙනවා, ඒකට ඉස්සෙල්ලා මේ ආර්ථිකය සකස් කරගෙන ඉන්න ඕනෑ" කියලා කියනවා. ඒකට ප්‍රශ්නයක් නැහැ, ආර්ථිකය සකස් කර ගන්න. හැබැයි මට තේරෙන්නේ නැහැ, මේ විධායක ජනාධිපති ක්‍රමය සඳහා වන සංශෝධන, එහෙම නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ සංශෝධන, එහෙමත් නැත්නම් පළාත් සභා ආදි මැතිවරණ පැවැත්වීම සඳහා වන පනත්වලට අදාළ සංශෝධන ගේන්න කියන කොට මොනවා හෝ හේතුවක් කියලා මඟ හරින්න හදන්නේ ඇයි කියලා. ඒක තමයි මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය.

දැන් පළාත් සභා මැතිවරණය ගැනත් අලුත් කථාවක් කියන්න පටන් අරගෙන තිබෙනවා, "නැහැ, නැහැ, ඊට කලින් delimitation කරන්න වෙයි" කියලා. அதாவது, மாகாண சபைத் தேர்தலை நடத்துவதற்கான எந்தவிதமான ஆயத்தமும் இந்த அரசாங் கத்திடம் இல்லை என்பதைத்தான் இது காட்டுகின்றது.

එපමණක් නොවෙයි, බලාගෙන යන කොට මෙතැන විශේෂ කාරණාවක් තිබෙනවා. රජය කියන විධියට, රජය පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේදී සහ තමාගේ න්‍යාය පත්‍රය සැකසීමේදී එය සියලු ජනතාවගේ අරමුණු, අභිලාෂ ඉටු කර ගැනීම සඳහා ඉදිරිපත් කරන න්‍යාය පත්‍රයක් වාගේ පෙනෙන්නේ නැහැ. තමන්ගේ පක්ෂයේ තිබෙන්නාවූ ප්‍රමුඛතාව පදනම් කරගෙන ඔවුන් මේ න්‍යාය පත්‍රය සකස් කරලා තිබෙනවා කියලා තමයි අපට පෙනෙන්නේ. ඒක ගැන අපට හරි දුකයි. මොකද, අපට මුස්ලිම් ජනතාව හැටියටත් -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
விசேடமாக, தமிழ் பேசுகின்ற தமிழ், முஸ்லிம் மக்கள் என்ற அடிப்படையில், அந்தச் சமூகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்கள் என்ற அடிப்படையில், நாங்கள் எதிர்பார்ப்பது இந்தச் சட்டமூலத்தை மாத்திரமல்ல, சிறுபான்மை மக்களுடைய தேவைகளுக்கான சட்ட மூலங்களையும்தான். அந்த வகையில், இந்த அரசாங்கம் அத்தகைய சட்டமூலங்களை அவசரமாகக் கொண்டுவந்து நிறைவேற்ற வேண்டுமென்று கேட்டு, என்னுடைய பேச்சை முடித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.03]

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද අප මේ කථා කරමින් ඉන්නේ 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත ඉවත් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පත පිළිබඳවයි. මේ වෙලාවේ මම මුලින්ම අවධානය යොමු කරන්න කැමැතියි, 2023 වර්ෂයේ පළවුණු පුවත්පතක උපුටා ගැනීමක් කෙරෙහි. මම එය අරගෙන ආවා. මෙහි සඳහන්ව තිබෙන පරිදි පවුල් 789,242කට ස්ථිර ගෙයක් නැහැ. තාවකාලික සෙවිලි සහිත නිවාස 486,426ක් තිබෙනවා. මා අතේ මේ තිබෙන්නේ එම පුවත්පතෙන් උපුටා ගත්තු උපුටනය. ඒ වාගේම මෙහි කියනවා, පවුල් 278,192ක් තාවකාලික නිවාසවල පදිංචියි; පවුල් 44,419ක් පොල් අතු සෙවිලි කළ නිවාසවල පදිංචියි; පවුල් 216,197කට ඉඩමක් හෝ ගෙයක් නැහැ; පවුල් 166,841කට ඉඩමක් තිබුණත් ගෙයක් නැහැ කියලා.

තාවකාලික නිවාස වැඩිම පුත්තලම, මඩකලපුව, යාපනය, කුරුණෑගල, නුවරඑළිය, රත්නපුරය, මහනුවර සහ බදුල්ල යන ප්‍රදේශවලයි. ඒ ප්‍රදේශවල ඉන්නේ අපේම ජනතාව. 2024දී අප මේ ආණ්ඩුව භාර ගන්න කොට, නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශයේ සංඛ්‍යා දත්ත අනුව, නිවාස අහිමි ජනතාව ලක්ෂ නවයහමාරක් විතර හිටියා. එහෙම සිටියදී තමයි අද අප මේ කථා කරන පනත් කෙටුම්පතට අදාළ ප්‍රස්තුතය බිහි වෙන්නේ. ජනතාව තමන්ට පොල් අතු සෙවිලි කරපු නිවාසයක්වත් නැතුව ඉඳිද්දී, තමන්ට ඉන්න ස්ථිර ගෙයක් නැතුව ඉඳිද්දී, ඉඩමක් තිබුණත් ගෙයක් නැතුව ඉඳිද්දී, අනුන්ගේ වහලවල් යට ඉඳිද්දී, මහ පාරේ ඉඳිද්දී තමයි ඒ ජනතාවගේ කතිරයෙන් බලයට ආපු අය මිලියන තුන්හාරසිය ගණන් වෙන් කරගෙන තමන්ගේ නිවාස අලුත්වැඩියා කර ගත්තේ. තමන්ගේ ධුර කාලය ඇතුළේ තමන්ගේ නිල බලයට ලැබුණු නිල නිවාසය ධුර කාලය අවසන් වනකොට තමන්ගේ හිමිකමක් බවට පත් කර ගත්තේ; ඒක හිමිකමක් ලෙස පවරා ගත්තේ; කැබිනට් පත්‍රිකාවලින් තමන්ගේ හිමිකමක් බවට පත් කර ගත්තේ.

මට ඉහත කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා පනතේ "හිමිකම්" කියන එක තිබෙනවා කියලා. වරප්‍රසාදය හිමිකමක් බවට පත් කර ගත්තේ කොහොමද කියන එක අපි මෙතැනදී මතු කර ගන්න ඕනෑ. ලංකාවේ මාණ්ඩලික, විධායක, පරිපාලන ශ්‍රේණිවල නිලධාරින්ට තමන්ගේ නිල කාලය තුළ නිල නිවාස ලබා දෙනවා; නිල වාහන ලබා දෙනවා. හැබැයි, ඒ අදාළ ධුර කාලය -නිල කාලය- අවසන් වන කොට ඒ නිල නිවස, නිල වාහනය භාර දීලා ඔවුන් යන්න ඕනෑ. වරප්‍රසාදලාභී හිටපු ජනාධිපතිවරුන්ට මේ ලබා දීලා තිබෙන හිමිකම ඇතුළේ, තමන්ගේ ධුර කාලය අවසන් වෙලා නිවසට ගියත්, තමන්ගේ ධුර කාලය අහෝසි නොවී ජනතාවගේ ජනවරමින් ප්‍රතික්ෂේප වෙලා නිවසට ගියත් ඒ හිමිකම අත් හරින්න හිත දෙන්නේ නැහැ. ඒ වරප්‍රසාදය හිමිකමක් බවට පත් කරගෙන බුක්ති විඳපු එක අහෝසි කිරීම ගැන තමයි අද අපි මේ පනත් කෙටුම්පතෙන් කථා කරන්නේ.

මම නැවතත් ප්‍රශ්න කරනවා, තාවකාලික නිවාස වැඩියෙන්ම තිබෙන මඩකලපුව, පුත්තලම, යාපනය, කුරුණෑගල, නුවරඑළිය, රත්නපුරය, මහනුවර සහ බදුල්ල දිස්ත්‍රික්ක නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වාඩි වෙලා ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ පනත් කෙටුම්පතට එරෙහි වෙන්න පුළුවන්කමක් තිබෙනවාද කියලා. එහෙම කළොත්, ඒක ජනතාවට එරෙහි වීමක්. ගෙවල් නැතිව දුක් විඳින මිනිස්සුන්ට උත්තරයක් නොදී, ඒ මිනිස්සුන්ගේ කතිරයේ බලයෙන් බලයට ආපු විපක්ෂයේ මේ මන්ත්‍රීවරුවන්ට පුළුවන්කමක් නැහැ, අද සම්මත කරන මේ පනත් කෙටුම්පතට එරෙහිව අත ඔසවන්න.

අපි ජනතාවට වග කියන පාලන ක්‍රමයක් වෙනුවෙන් කැප වෙනවා. එම නිසා විශේෂයෙන්ම අද අප මේ කථා කරමින් ඉන්නේ ජනතාවට වග කියන පාලනයක් ඇති කිරීම ගැනයි. අපේ දේශපාලන සංස්කෘතිය ඇතුළේ වග වන දේශපාලනයක් නිර්මාණය කරනවා කියලා අපි පොරොන්දු වුණා. සමෘද්ධිමත් ජාතියක් සහ සුන්දර ජීවිතයක් අපේක්ෂා කරනු ලබන සියලු ශ්‍රී ලාංකිකයන්ට මැතිවරණයේදී අපි පොරොන්දුවක් ලබා දුන්නා, නාස්තිය පිටු දකිනවා, විනාශකාරී දේශපාලන සංස්කෘතිය ආපස්සට හරවනවා කියලා. අන්න ඒ වෙනුවෙන් තමයි අද අප ගෙනැවිත් තිබෙන මේ පනත් කෙටුම්පත වැදගත් වෙන්නේ.

අපේ දේශපාලන ව්‍යාපාරය, මේ රටේ ජනතාවට පොරොන්දු දුන්නා වාගේම ඒ පොරොන්දු ඉටු කරන ජනතාවාදී දේශපාලන ව්‍යාපාරයක්. අපට ඉලක්කයක් තිබුණා. ඒ තමයි, මේ රටේ මහ ජනතාවගේ මුදල් අසීමිත ලෙස වැය කරමින්, කාබාසිනියා කරමින් වැජඹිලා ඉන්න මේ ප්‍රභූ දේශපාලන සංස්කෘතියට තිත තියලා, අලුත් පියවරක් තැබීම. රටට සේවය කරපු, එහෙම නැත්නම් රටට සේවය කරමින් හිටපු ජනාධිපතිවරුන්ටයි මේ අවස්ථාව අහිමි වෙන්නේ කියලා කෙනෙකු තර්ක කරන්න පුළුවන්. හැබැයි, ජනාධිපතිවරු විතරක් නොවෙයි මේ රටට සේවය කරන්නේ. ඉස්, මස් දන් දීලා සටන් කරපු රණ විරුවෝ, රාජ්‍ය සේවයේ අද වනකල් ඉන්න හැම රාජ්‍ය සේවකයෙක්ම, විධායක, මාණ්ඩලික ශ්‍රේණිවල ඉන්න හැම කෙනෙක්ම මේ රට වෙනුවෙන් වැඩ කරපු, වැඩ කරන මිනිස්සු. අහිංසක ගොවි ජනතාව කියන්නේ මේ රට වෙනුවෙන් වැඩ කරන මිනිස්සු, වතු කම්කරු ජනතාව කියන්නේ මේ රට වෙනුවෙන් වැඩ කරන මිනිස්සු. ඔවුන් උපයා දෙන දෙයින් තමයි ජනාධිපතිවරුන්ට වැටුප් ගෙවන එක, විශ්‍රාම වැටුප් ගෙවන එක, නිල නිවාස ලබා දෙන එක ආදී සියල්ල සිද්ධ වෙන්නේ. එහිදී විශේෂයෙන් කිව යුතුයි, ජනතාවට නිවාස නැතිව ඉඳිද්දී ඒ දේශපාලනඥයන්ට ලබා දෙන නිල නිවාස ඒ අය වරප්‍රසාදයක් හා හිමිකමක් කරගෙන තිබෙන බව. ඒවා නිවාස නොවෙයි, ඇත්තටම ගත්තොත්, සුඛෝපභෝගී මාළිගා. ඒ මාළිගා නඩත්තු කරන ක්‍රමය තමයි අද මේ පනත් කෙටුම්පත හරහා අහෝසි වෙන්නේ. අපි මෙතැනදී හිටපු ජනාධිපතිවරුන්ගේ විශ්‍රාම වැටුප් ගැන කථා කරලා නැහැ; ඔවුන්ගේ ආරක්ෂාව ඉවත් කරලාත් නැහැ.

1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත ඉවත් කිරීම තුළින් මොනවාද නැති වෙන්නේ? අපි මේ වෙලාවේ ඒ ගැන කියන්න ඕනෑ. මෙම පනතේ තිබුණා, හිටපු සෑම ජනාධිපතිවරයෙකුට හෝ හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවට ඔහුගේ හෝ ඇයගේ ජීවිත කාලය තුළ වාසය සඳහා උචිත නිවාසයක් නිවාස කුලියකින් තොරව සැපයිය යුතු බව. එය ධුර කාලයට අදාළව ලබා දෙනවා කියන එක අපට පිළිගන්න පුළුවන්. හැබැයි, අද සම්මත කරන මෙම පනත තුළින් ජීවිත කාලයටම එය ලබා දෙනවා කියන කොන්දේසිය ඉවත් වෙනවා. අපි එම නිවස ලබා දිය යුතු වන්නේ ධුර කාලය සඳහා විතරයි. ධුර කාලයේදී ලබා දීම කියන එක වලංගුයි. නමුත්, හිටපු ජනාධිපතිවරයාට හෝ ඔහුගේ වැන්දඹුවට ජීවිත කාලයටම නිවාස කුලියකින් තොරව නිවසක් ලබා දීම නතර කරනවා. ඉවත් වන වරප්‍රසාදවලට ඇයි මේ අඬන්නේ කියා කල්පනා කර බලන කොට කාරණය

පැහැදිලිව තේරෙනවා. යම්කිසි හේතුවක් නිසා හිටපු ජනාධිපතිවරයෙකුට හෝ හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවට වාසයට උචිත නිවාසයක් නොසපයන අවස්ථාවක, ඒ හිටපු ජනාධිපතිවරයාට හෝ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවට ගෙවන මාසික විශ්‍රාම වැටුපෙන් තුනෙන් එකකට සමාන මාසික දීමනාවක් ගෙවිය යුතු වෙනවා. දැන් මේ පනත අනුව ඒකත් ඉවත් වෙනවා. මේකේ, පෞද්ගලික ලේකම්වරයාට ගෙවන මාසික වැටුපක් ගැනත් තිබෙනවා. ඒ වාගේම මේ වරප්‍රසාද ඇතුළේ විශ්‍රාම වැටුප ලබා දීමට අමතරව ජනාධිපතිවරයාට විතරක් නොව, ඒ ජනාධිපතිවරයන්ගේ වැන්දඹුවන් පවා නඩත්තු කරමින්, ඒ නිවාසවල ලයිට් බිල්, වතුර බිල් පවා ගෙවලා තිබෙන්නේ, මේ රටේ මහජන මුදලින්. ඔවුන්ට ජීවත් වීමට නිවසක් ලබා දීමට එහා ගිහිල්ලා ඒ නිවසේ පරිහරණය කරන විදුලිය සහ ජලය වෙනුවෙන් බිල්පත් ගෙවීම කියන එකත් මේ රටේ මහ ජනතාවට බරක් කරලායි තිබුණේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ වෙනස ඇති විය යුතුමයි කියලා.

சனாதிபதி அவர்கள் அரச தலைவராகவும் அரசாங்கத்தின் தலைவராகவும் அதிகாரத்தின் தலைவராகவும் முப்படைகளின் தலைவராகவும் இருக்கின்றபோது, அவர் கட்டாயமாக இந்த நாட்டு மக்களுடைய பாதுகாவலராக, மக்களுடைய உரித்தாளியாக நியமிக்கப்படுகிறார். ஆகவே, ஒரு சனாதிபதி யுடைய முக்கிய கடமை என்னவென்றால், வீடுகள் இல்லாமல் கஷ்டப்படுகின்ற மக்களுக்கு, அநாதரவாக விடப்பட்டிருக் கின்ற தொழிலாளர்களுக்கு, முக்கியமாக மலைய கத்தில் வசிக்கின்ற மக்களுக்கு, அவர்களுடைய காணி உரிமை, வீட்டுரிமை கிடைக்க வழிசெய்வதாகும். ஆனால், அந்த மக்களுக்கு இவை எதுவுமே இல்லாமலிருக்கும் பட்சத்தில், இவர்கள் தமது சுகபோக வாழ்வுக்காக இவ்வாறான அதிசொகுசு வீடுகளில் வாழ்கின்ற நிலையை நீக்குவதற்காகத் தான் 1986ஆம் ஆண்டின் 4ஆம் இலக்க, சனாதிபதிகளின் உரித்துரிமைகள் சட்டத்தினை நீக்குவதற்கான இச்சட்ட மூலத்தை நாங்கள் கொண்டுவந்திருக்கின்றோம்.

இந்த நாட்டில் வாழ்கின்ற மக்கள், குறிப்பாக 'கொவிட்' காலத்தில் அத்தியாவசிய உணவுப்பொருட்கள்கூட இல்லாமல் வாடி வதங்கியிருந்தபோது, அன்றாடத் தேவைக்குக்கூட எரிபொருள் இல்லாத நிலையில் இருந்தபோது, இவர்கள் தங்களுடைய வீடு வாசல்களை அழகுபடுத்தி அமைத்துக் கொள்வதற்காக 400 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்து, அதனைப் பயன்படுத்தினார்கள். ஆகவேதான் பதவியை இழந்தாலும் சலுகைகளை விட்டுவிட மனமில்லாத அரசியல் கலாசாரத்தை மாற்றவேண்டுமென்று நாங்கள் சொல்கின்றோம். பதவியை ஒப்படைக்கும் நாளில் சலுகைகளையும் கைவிட்டுச் செல்லக்கூடிய தாழ்மையான, கௌரவமான, ஒழுக்கமான அரசியல் கலாசாரத்தை நாம் உருவாக்க வேண்டும். அதற்கு இந்தச் சட்டமூலம் உதவும் என்று நாங்கள் முழுமையாக நம்புகின்றோம்.

அதேபோல, நான் கூற விரும்புகின்ற இன்னொரு விடயம் இருக்கின்றது. அதாவது, சட்டத்திற்குப் பொறுப்புக்கூறல், அரச நிருவாகத்தின் நேர்மை மற்றும் தேசிய வளங்களைப் பொறுப்புடன் கையாளுதல் ஆகியவற்றையும் நாம் இந்தச் சட்டமூலத்தின்மூலம் எதிர்பார்க்கின்றோம். அத்துடன் நாட்டு மக்கள் துன்பப்படும்போது இவர்கள் சுகபோக வாழ்க்கையை எதிர்பார்ப்பதை நாங்கள் இந்தச் சட்டமூலத்தின்படி நிராகரிக்கின்றோம். எமது நாட்டில் ஒரு புதிய அரசியல் கலாசாரத்தை உருவாக்க வேண்டும் என்பதற்காகத்தான் நாங்கள் இந்தச் சட்டமூலத்தைக் கொண்டுவந்திருக்கிறோமே தவிர, எவரையும் பழிவாங்கும் நோக்கத்துடனோ, எவரையும் தாழ்த்துவதற்காகவோ அல்ல.

පළි ගැනීමේ අදහසකින් නොවෙයි, අද මේ පනත් කෙටුම්පත අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. මේ පනත් කෙටුම්පතින් අපි බලාපොරොත්තු වෙන්නේ මේ රටේ ජනතාවට අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමයි. වග වීමේ දේශපාලන සංස්කෘතියක් අපි හදන්නට ඕනෑ. ඒ වාගේම ජනතාව වෙනුවෙන් අපි පොරොන්දු වෙච්ච දේ ඉටු කිරීම. ඒ කියන්නේ ජනතාවාදී දේශපාලන ව්‍යාපාරයක් ඇතුළේ අපි බලාපොරොත්තු වෙන විධියට මේ රටේ ඉදිරි අනාගතයට ලබා දෙන පූර්වාදර්ශය නම්, "ජනතාවට නැති කිසිවක් අපි බුක්ති විඳින්නේ නැහැ" කියන එක අපේ දේශපාලන සංස්කෘතිය ඇතුළේ අපි කිව්වා.

ඒ නිසාම තමයි මේ පොල් අතු සෙවිලි කරපු වහලවල් අපි අලුත් නිවාස බවට පත් කරන්න කටයුතු කරලා තිබෙන්නේ. අපි රටේ ජනතාවට නිවාස ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. වතුකරයේ ජනතාවට මේ වසරට නිවාස දස දහසක් ලබාදීම සඳහා අපි කටයුතු කරමින් තිබෙනවා. උතුරු නැගෙනහිර නැවත පදිංචි කිරීම් කරමින් තිබෙනවා; නිවාස ඉදි කරමින් තිබෙනවා. ඒ වාගේම තමයි සනීපාරක්ෂක පහසුකම් ලබා දීලා තිබෙනවා. වතුකරයේ ජනතාවට ලැයිම් නිවාස වෙනුවට තනි නිවාස ලබා දීමේ ව්‍යාපෘතිය අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ සියල්ල වෙනුවෙන් මේ මුදල් ආයෝජනය කරමින්, මේ මුදල් යොදවමින් ජනතා ජීවිතය නැගිට්ටවමින් තිබෙනවා. ඒ නිසා මේ ගෙනෙන ලද මේ පනත් කෙටුම්පත කිසිවිටෙකත් පෞද්ගලික අරමුණු වෙනුවෙන් පළි ගැනීමේ චේතනාවකට ලඝු කරන්න, ආරක්ෂාව අහිමි කරන්න කියන කාරණාවකට ලඝු කරන්න, එවැනි වචනයකට සීමා කරන්න එපා කියන ඉල්ලීම අපි කරනවා.

ඒ වාගේම මේ නාස්තිකාර, මේ විනාශකාරී දේශපාලන සංස්කෘතිය පරාජය වෙනවාය කියන එක ලෝකය පුරාම පෙනෙන්න තිබෙනවා. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව, ඒ වාගේම බංග්ලාදේශය, අද නේපාලය ආදී රටවල්වල ආදර්ශය ගත්තාම ඒ බව පෙනෙනවා. මීට කලින් කථා කරපු මන්ත්‍රීවරු කිව්වා, අපටත් මේ තත්ත්වය උදා වෙන්න පුළුවන් කියලා. නැහැ. අපි ඒ තත්ත්වය පසු කරලායි ඇවිල්ලා තිබෙන්නේ. ඒ ජනතාවගේ නැගිටීමෙන් පසුව තමයි ජනතාව ඒ සංස්කෘතිය ප්‍රතික්ෂේප කළේ. ඊට පසුව තමයි ජනතාවට වගකියන දේශපාලන පක්ෂයක් වෙනුවෙන්, දේශපාලන සංස්කෘතියක වෙනසක් වෙනුවෙන් අපට බලය දුන්නේ. අපි ඒ ලබා දීපු බලයට වග කියනවා. ඒ වෙනුවෙන් ජනතාව තබපු විශ්වාසය වෙනුවෙන් අපි කැපවීමෙන් කටයුතු කරනවා. ඒකේ පළමු පියවර හැටියට ජනාධිපතිවරුන්ට ලබා දීලා තිබෙන මේ හිමිකම් ඉවත් කිරීම වෙනුවෙන් වන මේ පනත් කෙටුම්පත කාලෝචිතයි, ජනතාවාදීයි. ජනතාවගේ අනාගතයට එය උදවු වෙනවා කියන පණිවුඩයත් ලබා දෙමින් මා නවතිනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.17]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනාධිපති හිමිකම් අහෝසි කිරීමේ මේ පනත් කෙටුම්පත පිළිබඳව තමුන්නාන්සේලා මැතිවරණයේදීත් කථා කළා. පසුගිය ජනාධිපතිවරණයේදී, ඉන් පසුව පාර්ලිමේන්තු මැතිවරණයේදී තුනෙන් දෙකක ආණ්ඩු බලයක් තමුන්නාන්සේලාට ලැබුණා. මම

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

සතුටු වෙනවා, ඔබතුමන්ලා ඒ කිව්ව දේ ඉටු කරන්න මේ වෙලාවේ මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම පිළිබඳව. හැබැයි, තමුන්නාන්සේලා කියන විධියට අර අවුරුදු 76ම මේ රටේ හිටපු නායකයෝ මෙහෙම ගසා කාපු අය නොවෙයි කියන එක අපි සිහිපත් කරන්න ඕනෑ. අපේ ජෝන් කොතලාවල මැතිතුමා එතුමාට තිබුණු ඉඩ කඩම් පරිත්‍යාග කළා. ඔබතුමන්ලා දන්නවා ඇති, කොතලාවල විශ්වවිද්‍යාලය නිර්මාණය වුණේ එතුමාගේ පරිත්‍යාග කරපු ඉඩමක බව. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාත් එතුමාගේ ඉඩම් පරිත්‍යාග කළා. කැලණිය, බියගම, මානෙල්වත්ත පූජා භූමිය එතුමා පරිත්‍යාග කරපු එකක්. මේ කොළඹ 7 ජේ.ආර්. ජයවර්ධන කේන්ද්‍රය, එතුමා පරිත්‍යාග කරපු එකක්. ඒ නිසා ඔබතුමන්ලා කිව්වා වාගේ අර අවුරුදු 76ක් තුළම හිටපු නායකයෝ මේ රට විනාශ කළා කියන එකට අපි එකඟ වෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, අපේ ඩඩ්ලි සේනානායක මැතිතුමා ඇතුළු අපේ නායකයෝ විශාල පිරිසක් මේ රට වෙනුවෙන් විශාල පරිත්‍යාග කරලා තිබෙනවා. හැබැයි, වෛරය පතුරුවලා ඔබතුමන්ලා මේ රටේ ජනතාවගේ මානසිකත්වය වෙනස් කළා, මේ පාලකයෝ ඔක්කෝම හොරු කියලා. ඒකටත් සාධාරණ හේතු කාරණා තියෙනවා කියන එකත් මම මේ වෙලාවේ කියන්න ඕනෑ.

මේ රටේ නායකයන් ජනාධිපති හිමිකම්, වරප්‍රසාද අයුතු විධියට ප්‍රයෝජනයට ගත් අවස්ථා තිබෙනවා, අපි දන්නවා. ඒ වාගේ අවස්ථා අපි දැකලා තිබෙනවා. සමහර වෙලාවට පවුල් පිටින් **එකතු වෙලා** අනවශ්‍ය විධියට කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරමින් ඒ නිල නිවාස වෙනුවට මහා මන්දිර, මහා මාලිගා නිර්මාණය කරපු බව මේ රටේ ජනතාවත් දන්නවා. එතකොට, මේක සම්පූර්ණ වශයෙන් නැති කරලා දාන එකද, එහෙම නැත්නම් මේකට යම් limits, යම් standards, යම් නිර්ණායක ලබා දීමද කළ යුත්තේ කියන එක අපි දැන් කල්පනා කරන්නට ඕනෑ. ජනාධිපතිවරයෙකුට යම් වරප්‍රසාද තිබිය යුතුයි කියා මා විශ්වාස කරනවා. ජනාධිපති ධුර කාලසීමාවේදී පමණක් නොවෙයි, ජනාධිපති ධුරය අවසන් වුවාට පසුවත් යම් වරප්‍රසාද තිබිය යුතුයි. නමුත් ඔබ දැන් මේ නිර්මාණය කරන්න හදන්නේ ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසන් වුණාට පසුව කිසිදු වරප්‍රසාදයක් නැතුව පෙන්ෂන් එකකට පමණක් සීමා කිරීමටයි. ඔහොම කරනවා නම්, පෙන්ෂන් එකත් නැති කරන්න **පුළුවන්**. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාට පෙන්ෂන් එක ඕනෑ නැහැ. තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් ඒකත් බලා ගනී. හැබැයි, ඔබ ඔබේ පක්ෂය නිර්මාණය කරපු රෝහණ විජේවීර මැතිතුමා මිය ගියාට පස්සේ ඒ පවුලේ අයව නම් බලා ගත්තේ නැහැ. ඒක නිසා මම දන්නේ නැහැ, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාව බලා ගනීද කියලා. ඒක තමුන්නාන්සේලාගේ වැඩක්. නමුත් අපි විශ්වාස කරනවා, හිටපු ජනාධිපතිවරයෙකුට යම් වරප්‍රසාද තිබිය යුතු බව. එය සාධාරණ වෙන්න ඕනෑ. මොකද, ඒ ගෞරවය ලැබෙන්න ඕනෑ. ඒ වාගේම එම රාජකාරියෙන් විශ්‍රාම යනවා කියලා ගෙදර යන එක විතරක් නොවෙයි, රට වෙනුවෙන් වැඩ කරපු හිටපු ජනාධිපතිවරු ගණනාවක් මේ රටේ ඉඳලා තිබෙනවා. එම නිසා ඒ අයට අවශ්‍ය යම් වරප්‍රසාදයක්, යම් හිමිකමක් එහෙම නැත්නම් රජයෙන් ලබා දිය යුතු යම් දෙයක් තිබීම වැරැද්දක් හැටියට මම දකින්නේ නැහැ.

ඒ වාගේම තමයි "මේ වෙලාවේ මෙච්චර මහා ලොකු වියදමක් මේ වෙනුවෙන් දරලා තිබෙනවා, මේ වියදම ඉතුරු කිරීමෙන් මේ රටේ තිබෙන සියලු ප්‍රශ්න ටික විසඳාගන්න පුළුවන්" කියන කථාවක් තමයි අපට මේ ආණ්ඩු පක්ෂයෙන් අහන්න ලැබිලා තිබෙන්නේ; ආණ්ඩු පක්ෂයෙන් ඇහෙන්නේ. ඒක නිසා දැන් මේ රටේ මේ තිබෙන ප්‍රශ්න, ඉතා පැහැදිලිව මෙන්න මේ වෛරයත් එක්ක අමතක කරන්න යම් උත්සාහයක යෙදෙනවා. මේ රටේ ජනතාවට දැන් තිබෙන ලොකුම ප්‍රශ්නය මේකද? මේකෙන් තාවකාලික පොඩි චූන් එකක් ගන්න පුළුවන්. හරිද? මේකෙන් තාවකාලික චූන් එකක් ගන්න පුළුවන්, "ආ ජනාධිපතිවරුන්ගෙ වරප්‍රසාදත් දැන් අයින් කරලා තිබෙන්නේ; නියමයි, උන්ට කෙළවිලා ගිය දෙන්" කියලා. හැබැයි, ඒ විතරක් නොවෙයි. දැන් රාජකාරියේ ඉන්න ජනාධිපතිවරයාගේ ජනාධිපති නිල නිවාසවලින් යම් ප්‍රමාණයක් පෞද්ගලික අංශයට දෙනවා කියලාත් කියා තිබෙනවා. මම විශ්වාස කරනවා, යම් නිල නිවාස ප්‍රමාණයක් තිබිය යුතුයි. කොළඹ තිබෙන නිල නිවාසයට අමතරව යම් නිල නිවාස ප්‍රමාණයක් තිබිය යුතුයි. අපට ආරංචියි නුවර තිබෙනවා කියලා. නුවර විතරක් නොවෙයි, තව එකක් දෙකක් තිබිය යුතුයි. මොකද, උදාහරණයක් හැටියට නුවරඑළියේ තිබෙන නිල නිවාසයේ නැතුව ජනාධිපතිවරයා ඇවිල්ලා වෙනත් හෝටලයක හිටියොත්, එය එක පැත්තකින් එතුමාගේ ජීවිත ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් වෙන්න පුළුවන්. ඒ වාගේම එතුමා හෝටලයේ සිටින වෙලාවට ඒ හෝටලයේ ඉන්න අනෙක් අයගේ ජීවිත ආරක්ෂාව පිළිබඳවත් එය ගැටලුවක් වෙන්න පුළුවන්. නමුත් හතු පිපෙනවා වාගේ හැම තැනම නිල නිවාස තිබීම අවශ්‍ය නැහැ.

නමුත්, යම් නිල නිවාස ප්‍රමාණයක් ජනාධිපතිවරයෙකුට තිබිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා තමුන්නාන්සේලා මේවා ප්‍රසිද්ධියට, එක එක අය චූන් කරන්න කළාට මේ ගැන දෙවතාවක් හිතන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි, දැන් මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද ඉවත් කිරීම තුළින් සම්පූර්ණ වෙනවාද? මේ ප්‍රශ්න ඔක්කොම අවසන් වෙයිද? අපට දැනගන්න ලැබුණා, ඊයේ වෙනකොට විදුලි බිල සියයට 7කට ආසන්න ප්‍රමාණයකින් වැඩි කරන්න යනවා කියලා. මේ තුළින් ඒ විදුලි බිල වැඩි කරන එක නතර කරන් වා නම් ඔන්න කිසි ගැටලුවක් නැහැ. හැබැයි, විදුලි බිල සියයට 7කට ආසන්න ප්‍රමාණයකින් වැඩි කරන එක නතර වෙනවාද? නැහැ. මේ අවුරුද්ද තුළ තුන්වැනි වතාවටයි තමුන්නාන්සේලා විදුලි බිල වැඩි කරන්නේ. මේ අහිංසක ජනතාව ගැන කථා කරනවා, හරි දුකෙන් ඉන්නේ, ගෙවල් නැහැ, මෙහෙම තිබෙනකොට තමයි මෙච්චර වියදම් කරන්නේ කියලා. ඒ වේදනාව දැනෙනවා නම් කරුණාකර විදුලි බිල වැඩි කරන එක නතර කරන්නකෝ. මොනවාද මේ කියන්නේ? ඇයි මේ රටේ ජනතාව රවටන්නේ? තමුන්නාන්සේලාට මේ ජනතාවගේ වේදනාව දැනෙනවා නම් කරුණාකර විදුලි බිල සියයට 7කින් වැඩි කරන එක නතර කරන්න. තමුන්නාන්සේලා මේ අවුරුද්ද තුළ තුන්වැනි වතාවටයි විදුලි බිල වැඩි කරන්න යන්නේ.

විදුලි බිල වැඩි කරන්න යනවා විතරක් නොවෙයි, දැන් තමුන්නාන්සේලා පාතාලය ගැන කථා කරනවා. දැන් පාතාලය මර්දනය කරනවා කියනවා. හැබැයි, හැම දාම අපට news alerts එනවා, මෙන්න මෙතැන වෙඩි තැබීමක්, මෙන්න අතැන වෙඩි තැබීමක් කියලා. මේ පිළිබඳව තමුන්නාන්සේලා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? දැන් මේ පාතාලය ගැන කථා කරනකොට ඔබගේ පිළිතුර වෙන මොකවත් නොවෙයි, දේශපාලනඥයන් සම්බන්ධයි කියන එක. මේක නිකම් TV show එකක් වෙලා. ජනාධිපතිවරයාගේ සිට, පොලිස්පතිවරයාගේ සිට, මැති ඇමතිවරු සියලු දෙනාම පාතාලය ගැන කථා කරනකොට කියන්නේ වෙන මොකවත් නොවෙයි, පාතාලය එක්ක දේශපාලනඥයන් සම්බන්ධයි කියලා. දේශපාලනඥයන් සම්බන්ධ නම් ඒ අයට නීතිය ක්‍රියාත්මක කරන්න. කවුද කියලා කියන්න. ඒක මර්දනය කරන එක නතර කරලා, තමුන්නාන්සේලා දිගින් දිගටම දේශපාලනඥයන් සම්බන්ධයි; දේශපාලනඥයෝ තමයි පාතාලයට උදවු කළේ; දේශපාලනඥයෝ තමයි කුඩු ගෙනෙන්නේ; දේශපාලනඥයෝ තමයි කුඩුවලට සම්බන්ධ කියලා කියනවා. එහෙම කවුරුහරි සම්බන්ධ නම්; මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225න් කවුරුහරි කෙනෙක් සම්බන්ධ නම් කරුණාකර ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න. ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීම තුළින් තමයි මේ කටයුත්ත කළ හැක්කේ.

ඒ වාගේම තමයි, අර කන්ටේනර් 323. ඒ කන්ටේනර්වලින් ගෙනාපු බඩු මොනවාද? කන්ටේනර් දෙකක මෙහෙම නම් ඉතුරු කන්ටේනර්වල මොනවා තිබෙන්න ඇද්ද? කුඩුද, ආයුධ ද, එහෙම නැත්නම් වෙනත් දේවල් ද?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ආයුධ තිබුණේ.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මෙතුමා කියනවා ආයුධ ලු තිබුණේ. එල්ටීටීඊයට සම්බන්ධ දේවලුත් තිබුණා කියනවා. රත්තරන් ද, ඒ මොනවාද? ඒ නිසා කරුණාකර තමුන්නාන්සේලා තාවකාලික වශයෙන් වුන් කිරිල්ල නතර කරලා මේ රට ඉදිරියට ගෙනයන්න අවශ්‍ය වැඩකටයුතු ටික ආරම්භ කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.27]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මේ ගරු සභාවේ ඩී.වී. චානක මන්ත්‍රීතුමා විසින් කිව්වා, ඔහුගේ ජාතික සංවිධායක නාමල් රාජපක්ෂ මහත්මයා විසින් මාහට එන්තරවාසියක් එවා ඇති බව. සමාජ මාධ්‍ය පරිහරණය කළාම ඒ එන්තරවාසිය සමාජ මාධ්‍යයේ තිබෙනවා. එය නිල වශයෙන් මට ලැබී නැහැ. ඉතින්, එතුමා දමන්න යන්නේ අපහාස නඩුවක්. මම හිතන්නේ එතුමා උසාවියේ practise කළේ නැති නිසා දන්නේ නැතුව ඇති, අපහාස නඩුවක ස්වභාවය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපහාස නඩුවක ප්‍රධාන ස්වභාවය තමයි, අපහාස නඩුවකදී පැමිණිලිකරුගෙන් විත්තිකරුට ඕනෑම ප්‍රශ්නයක් අහන්න පුළුවන්. වෙනත් නඩුවල එහෙම කරන්න බැහැ. ඉඩම් නඩුවලදී විෂයයට අදාළ කාරණා විතරයි අහන්න පුළුවන්. විෂයෙන් පරිබාහිර ඕනෑම ප්‍රශ්නයක් අහන්න ඉඩදෙන එකම නඩු වර්ගය අපහාස නඩු. ඒ නිසා විශේෂයෙන්ම අපහාස නඩුවක පැමිණිලිකරු වීදුරු ගෙවල්වල ඉන්න හොඳ නැහැ. දැන් මේ වීදුරු ගෙවල්වල ඉන්න මහත්මයෙක් අපට ඇඟිල්ල දිගු කර කියනවා, ඔන්න දැන් ඔයාට රුපියල් බිලියනයක් ඉල්ලා එන්තරවාසියක් එව්වා කියලා. එම එන්තරවාසියේ පිටපතක් සමාජ මාධ්‍යයක තිබිලා printout එකක් ගත්තා. එහි එකම සාධකයයි තිබෙන්නේ. චරිතය තමයි විෂයගත කාරණාව වෙන්නේ; the character is the issue. අපහාස නඩුවක් පවරන කෙනා පිරිසිදු දෑතින් ඉන්න ඕනෑ. චරිතය තමයි ප්‍රශ්න වෙන්නේ. එතුමාගේ චරිතය ශුද්ධ වෙන්න ඕනෑ.

එතුමාගේ කොළයේ ලියා තිබෙනවා, එතුමා එංගලන්තයේ සිටි විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ලැබුවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා නඩුව දැමුවාට පසුව එතුමාගෙන් හරස් ප්‍රශ්න කිහිපයක් අහන්න මම බලාපොරොත්තු වෙනවා. අපි වගකීමෙන් කියනවා, අද සිට දින 14යි දීලා තිබෙන්නේ. මම හිතන විධියට අදාළ දිනය ලබන 24වැනි දා හෝ 25වැනි දා වෙන්න ඕනෑ. 25වැනි දා ඔබතුමා කොළඹ දිසා අධිකරණයේ නඩුව දමන්න.

ඔබතුමා නඩුව දැම්මාට පස්සේ මට තිබෙනවා, හරස් ප්‍රශ්න කිහිපයක් අහන්න. මොකද, එතුමාගෙන් ගන්නේ මූලික සාක්ෂි නේ. ඊට පස්සේ මට තිබෙන්නේ හරස් ප්‍රශ්න අහන්න. හරස් ප්‍රශ්නවලදී මම මෙන්න මේ දේවල් ටික අහනවා - "නීති විද්‍යාලයට ඇතුළත් වීම සඳහා ඔබ අවම සුදුසුකම් සපුරා ඇත් ද?" "එංගලන්තයේ සිටි විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය සත්‍ය උපාධියක් ද?" ඊළඟ ප්‍රශ්නය මෙයයි. "ඔබ නීති විද්‍යාලයේ අවසාන විභාගය සමත්වීමේදී වෙනම කාමරයක සිට එම නීති විද්‍යාලයේ නීති විභාගය ලිවීම තුළින් නිසි සුදුසුකම් සපුරා ඇත් ද?" *[බාධා කිරීමක්]* ඕනෑම එකක් අහන්න පුළුවන් නේ. ඊළඟට මම මේ ප්‍රශ්නය අහනවා. "තාජුඩීන්, ලසන්ත වික්‍රමතුංග, එක්නැලිගොඩ ඇතුළු ඝාතන රාශියකට ඔබ ඇතුළු ඔබේ පවුල සම්බන්ධ ද?" *[බාධා කිරීමක්]* ඊළඟට මම අහන ප්‍රශ්නය අහගන්න. "ජුලම්පිටියේ අමරේ නාමල් රාජපක්ෂගේ bodyguard ද?" මට දැනට මතක් වෙන අන්තිම ප්‍රශ්නය විධියට අහන්නේ මෙයයි - "නිමල් ලාන්සා නැමැත්තෙකු STF එක හඹාගෙන එනකොට ඔබතුමාගේ පියා විසින් ඔහුව ආරක්ෂා කිරීමේ මුවාවෙන් බදා ගත්තේ ද?" මම ඔන්න ඔය හරස් ප්‍රශ්න ටික අහනවා. අනිවාර්යයෙන්ම තව දින 14ක් යන්න කලින් ඔය නඩුව දාන්න. නැත්නම් මම මොකක්ද දන්නවාද කරන්නේ? නඩුවක තිබෙනවා, හරස් ඉල්ලීම කියලා එකක්. මම ඉල්ලනවා, ඔයගොල්ලන්ගෙන් වන්දි. අන්න ඒක දැනගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දිනයේ විවාදයට පාදක වන්නේ ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනතයි. ඒ පනත පැන නැඟුණේ කොහොමද? අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36(2) ව්‍යවස්ථාව හරහා තමයි මේකට මූල පාදක ආවේ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන කැතම කැත වගන්තිය මොකක්ද? අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන මජර වගන්තිය මොකක්ද? තවත් බාල වචනයක් තිබෙනවා, මම ඒ වචනය පාවිච්චි කරන්නේ නැහැ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සවුත්තු වෙලා තිබෙන්නේ, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කැතවෙලා තිබෙන්නේ ඇතැම් වගන්ති කිහිපයකින්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36(2) ව්‍යවස්ථාවේ තිබෙන්නේ මොකක්ද? තමන්ටම විතරක් විශ්‍රාමය, විරාත් කාලයක් තිස්සේ විශ්‍රාමය, අනාගත පාර්ලිමේන්තුවකට ද වෙනස් කළ නොහැකි විශ්‍රාමය. ඔන්න සම්මත කර ගත්තා, ඒ වෙනුවෙන් පනතක්. ඒ පනත සම්මත කරගෙන ටික දවසක් යනකොට භාර්යාවට පෙරේතකමක් ඇති වුණා. සමාවෙන්න, "භාර්යාව" නොවෙයි, "ආර්යාව". ආර්යාවට පෙරේතකමක් ඇති වෙලා මෙහෙම කියන්න ඇති? "ඔයාට විතරක් මොකද, මටත් ටිකක් ගන්න කෝ, මටත් ටිකක් දෙන්න කෝ, මටත් විශ්‍රාමය දෙන්න කෝ, මටත් නිල නිවස දෙන්න කෝ, මගේ දරුවන්ටත් දෙන්න කෝ." ඒ අනුව තමයි ඔය පනත ඉපදුණේ.

මොකක්ද ඒ පනත? 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත. ඒ, බෙදාගෙන කන්න. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් බිහි වුණු මේ පනත තරම් සවුත්තු පනතක් තව තිබෙනවාද? මේ පනත සවුත්තුයි කියලා ඇයි අපි කියන්නේ? දූන් වරප්‍රසාදය අවභාවිත කළා. මේ පනතින් සම්මත කර ගත්තා, ආර්යාවට ගෙයක්. මේ පනතින් සම්මත කර ගත්තා, නිල නිවාසයක්. අනේ! ජනාධිපතිට කියලා නිල නිවාසයක් දුන්නා. ඊට පස්සේ පෙරේතකමක් ඇති වුණා. ඊට පස්සේ ටික දවසක් යනකොට මේ නිල නිවස තමන්ගේ කර ගන්න පුළුවන් ද කියලා බැලුවා.

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තයා හිතුවා, මේක මගේ කර ගත්තොත් හොඳයි නේ කියලා. කැබිනට් පත්‍රිකාවක් දාලා ඒ නිල නිවස තමන්ගේ කර ගත්තා. අන්තිමට මොකද වුණේ? ඒක බේරන්න සිද්ධ වුණා, ශ්‍රේෂ්ඨාධිකරණයට. ඔන්න පෙරේතකම කෙළවර වෙච්ච හැටි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට මොකක්ද වුණේ? එතුමියගේ පෙරේතකම කොතැනින්ද කෙළවර වුණේ? මේ කිට්ටුව නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් කැබිනට් පත්‍රිකාවක් දාලා තමන්ගේ නමට ලියා ගත්තා. එතැනින් නතර වුණේ නැහැ. නිල නිවසින් නතර වුණේ නැහැ. ඉඩම් ටික ලියාගන්න පටන් ගත්තා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙන්න මේකට තමයි පෙරේතකමේ සීමාවක් නැහැ කියන්නේ. මජරකමේ සීමාවක් නැහැ කියන්නේ මේකටයි.

එතකොට ජනතාව අතර සංවාදයක් ඇති වෙන්නේ නැද්ද, මෙවැනි දේ වෙනස් කරන්න ඕනෑ කියලා. අපි නොවෙයි මේක කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ මොකක්ද කියන්නේ? මෙන්න මේ හරයාත්මක කාරණාව කියන්න මට ඉඩ දෙන්න. වෙලාව ඉවර වුණොත් මම අපේ කණ්ඩායමෙන් විනාඩි දෙකක කාලයක් ඉල්ලනවා. මොකද, මේක කියන්නම ඕනෑ. කවුරුවත් මේක කිව්වේ නැහැ. ඊයේ පාර්ලිමේන්තුවට ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ මෙසේ කියනවා. මම එය උපුටා දක්වනවා:

> "...it is only those three items,…………"

මොනවාද?

> "i.e. salary, allowances and pension,…"

හරි. මේ කාරණා තුන ගැන තමයි කියන්නේ.

> "…… that the framers of the Constitution….."

මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදපු අය. මේක කියන්නේ අග්‍රවිනිශ්චයකාරතුමා.

> "….. had wanted to confer on any person who holds office as President. It is only those three items,....."

මොනවාද, ඒ items?

> ".......i.e. salary, allowances and pension, that the framers of the Constitution had wanted to jealously guard against being taken away by any subsequent amendment, repeal or replacement."

Jealously guard කියන්නේ මොකක්ද? තමන්ටම විතරක් කොහොම හරි තබා ගන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දැම්මා කියන එකයි. මේක කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන්. ඊට පස්සේ කියන්නේ මොකක්ද?

> "We therefore, proceed to hold that Act No. 04 of 1986 is a stand-alone piece of legislation passed in 1986, i.e. 08 years after the promulgation of the 1978 Constitution..."

මේ පනත ගේන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව pass කරලා අවුරුදු 8කට පස්සේ.

> " ..Thus, it is clear that Act No. 04 of 1986 has only introduced some additional benefits…"

අන්න අර භාර්යාවන්ට දෙන ඒවා.

> "….which the Constitution had never contemplated to grant to a person who holds office as President."

මෙන්න මේ කාරණයත් කියන්න මට ඉඩ දෙන්න. මොකද එහි කියනවා, මෙන්න මෙහෙම කථාවක්.

> "It has to be noted that the President's Entitlement Act No. 04 of 1986 is a unique piece of legislation which grants entitlements only to former Presidents and their widows. Intrinsically it is an exception to the concept of equality before the law,…."

"නීතියේ සමානකම" ගැන කියන්නේ Supreme Court එකෙන්. මොකක්ද, නීතිය ඉදිරියේ සමානකමට මේ පනත්වලින් වෙලා තිබෙන්නේ? ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා, මෙන්න මේ කථාව.

> "It appears that there is no similar legal provision in any other country."

මෙහෙම වගන්තියක් ලෝකයේ වෙන රටක නැති ලු. මෙහෙම පනතක් ලෝකයේ වෙන කොහේවත් නැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා. ඉතින්, මොකද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මම හිතනවා, තව විනාඩියක කාලයක් මට ලබා දෙයි කියලා.

එහි තවදුරටත් "The provisions of this Act being an exception in itself to equality before the law, have to be strictly …." කියලා තව තව දේවල් ටිකක් කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මොකක්ද කියන්නේ?

අද අපි - ජාතික ජන බලවේගය - මේ පනත අහෝසි කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සාධාරණයක් ඉෂ්ට කරලා තිබෙනවා. මොකක්ද, කරලා තිබෙන සාධාරණය? නීතිය ඉදිරියේ සමාන නැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියපු පනත අද අපි ඉවත් කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නීතිය ඉදිරියේ සමානකම ලබා දීලා තිබෙනවා. අන්න එ්ක තමයි අද අපි ලබපු ජයග්‍රහණය.

බොහොම ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.38]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ වෙලාවෙන් විනාඩියක් අඩු කරගත්තා.

Thank you, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම මේ කථාව සිංහලෙන් පටන් ගන්නම්. මොකද, මම දෙමළ නේ. සිංහලෙන් කථා කළාම ඔයගොල්ලන්ට සතුටුයි නේ.

මම පොඩ්ඩක් කියන්න කැමැතියි, පුළුවන් නම් ඔයගොල්ලන්ගෙන් කවුරු හරි අත උස්සලා කියන්න, ප්‍රභාකරන් ත්‍රස්තවාදියෙක් කියලා. පුළුවන් නම් අත උස්සන්න, ගණන් කරලා බලන්න. එක්කෙනෙක්වත් අත උස්සලා නැහැ. මම ඒ කථාව කිව්වේ ඇයි? *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න කෝ. මම ඒ

කථාව කිව්වේ මේ නිසායි. ඒ වාගේ මම අත උස්සනවා, රෝහණ විජේවීර ත්‍රස්තවාදියෙක් නොවෙයි කියන එකට. ඒක මට කියන්න පුළුවන්. හේතුව, උතුරේ අපි ඔයගොල්ලන්ට ඡන්දය දුන්නේ ඔයගොල්ලන් සිංහල ප්‍රභාකරන් කියලා හිතාගෙන. ඒක මතක තියාගන්න.

ඔයගොල්ලන් මොනවා කළත්, -ඔය ඉන්න ඉලංකුමාරන්, චන්ද්‍රසේකර් අමාත්‍යතුමා වාගේ එක එක්කෙනා මොනවා කළත්- ඒවා මිනිස්සු කවුරුවත් දන්නේ නැහැ. අපි විශ්වාස කළා. මම මේ පපුවේ ඉඳන් එන දේ කියන්නේ. ඔයගොල්ලන් කාත් එක්කවත් මට කිසිම රණ්ඩුවක් නැහැ. කිසිම ප්‍රශ්නයක් නැහැ. පෞද්ගලිකව මම ඔයගොල්ලන් එක්ක තරහ වෙන්නේ නැහැ. ඒ නිසා කියන්න.

අපි ඔයගොල්ලන්ට ඡන්දය දුන්නේ මේ නිසායි. 1988දී අපි වාගේම ඔයගොල්ලනුත් එවකට ආණ්ඩුවට විරුද්ධව, ආණ්ඩුව කරන ජරා වැඩවලට විරුද්ධව කටයුතු කළා කියලා උතුරේ ඉන්න මිනිස්සු විශ්වාස කළා. හැබැයි, මට දුකයි. අද මේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. 159ක් නැහැ, හැබැයි, මම නිකම් කියන්නම්, සිංහල මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා කියලා. මම මේකත් කියන්නම්. මම දෙමළ; අම්මා දෙමළ; තාත්තා දෙමළ. මම කථා කළේ දෙමළ. මම ඉපදෙනකොටත් දෙමළ. මම 'අම්මා' කියලා කිව්වේත් දෙමළෙන්. ඔයගොල්ලන් ඉපදෙනකොට 'අම්මා' කියලා තමයි කිව්වේ. ඔයගොල්ලන් අද වෙනකම් කථා කරන්නේ තනිකර සිංහල. එතකොට අපි වෙනුවෙන් හිටපු ප්‍රභාකරන්ට,- අද ඔයගොල්ලන්ගේ මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. ආණ්ඩුවක් තිබෙනවා. ඔක්කොම තිබෙනවා. හැබැයි, මම එක දවසක්වත් කියලා තිබෙනවාද, මගේ දෙයියෝ නැහැ කියලා? එක දවසක්වත් මම මේ පාර්ලිමේන්තුවේදී එහෙම කියලා තිබෙනවාද? අවුරුදු 35කට පස්සේ එක දෙමළ පුද්ගලයෙක් මේ පාර්ලිමේන්තුව ඇතුළට ඇවිල්ලා තමන් වෙනුවෙන් මැරුණු එක්කෙනෙක් තමන්ගේ දෙයියෝ කියලා කියනවා නම්, එහෙම කියන්නේ මම විතරයි.

මම මේ කාරණයත් කියන්න කැමැතියි. මම මේක සිංහලෙන් කියන්නම්. ඔබතුමන්ලාගේ රෝහණ විජේවීරත් අපි දෙයියෝ විධියට සලකනවා. මොකද, එක දවසක්වත් තමන් ගැන හිතන්නේ නැතුව තමන්ගේ ඥාතීන් වෙනුවෙන් ඔහු මැරුණා. හැබැයි, අපිට ඒ ගැන දුකයි. අපි ඔබතුමන්ලාගේ MPsලා හතරදෙනෙකුට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව දුන්නා. මම ඔයගොල්ලන්ට මේක කියන්නම්. කරුණාකරලා හිතන්න, ඔයගොල්ලන්ගේ MPsලා Jaffnaවල කරන වැඩේ. මම ඔයගොල්ලන්ට මේක submit කරන්නම්, ඕනෑ නම්. වීඩියෝ එකක් තිබෙනවා. ඒක අනුව, දැන් ඉන්න ධීවර ඇමති කියනවා, - මම දන්නේ නැහැ, ඒකට සිංහලෙන් කියන්නේ කොහොමද කියලා - "මුදුකරේ acres 5ක් අල්ලලා තිබෙනවා. ඒකෙන් එකහමාරක් තියා ගන්න ඔයගොල්ලන්. හැබැයි ආණ්ඩුවට භාගයක් ගෙවන්න" කියලා. ඒ වීඩියෝව තිබෙනවා. ඕනෑ නම් මට ඒක play කරලා පෙන්වන්න පුළුවන්. බලන්න, වංචා, දූෂණ කොච්චර තිබෙනවාද කියලා.

දෙවැනි කාරණය මේකයි. උතුරේ වංචා, දූෂණ තිබෙනවා කියලා මම කිව්වාට ඔයගොල්ලන් අද වෙනකම් උතුරු, නැඟෙනහිර එක වංචාවක්වත්, දූෂණයක්වත් ඇල්ලුවේ නැහැ. හැබැයි, ඔයගොල්ලන් ඇල්ලුවේ කවුද? රනිල්ව. ඔයගොල්ලන් රනිල්ව මරා ගත්තා නම් දෙමළ විධියට "ප්‍රභාකරන් මගේ දෙයියෝ" කියලා කියන එක්කෙනෙකුට අනිවාර්යයෙන් සතුටක් ලැබෙනවා. අපි සතුටු වෙනවා. හැබැයි, එහෙම එක එක පුද්ගලයා මරා ගන්න එකට හරි, නැත්නම් නේපාලයේ වාගේ පාර්ලිමේන්තුව පුච්චන එකට හරි මම කවදාවත් ඔයගොල්ලන් එක්ක එකඟ වෙන්නේ නැහැ. ඔයගොල්ලන්ගේ මන්ත්‍රීවරු හතරදෙනෙක් ඇවිල්ලා පාර්ලිමේන්තුවෙන් එළියේ ඉඳන් කිව්වා, "මේ පාර්ලිමේන්තුව පුච්චන්න" කියලා. ඒ පාර්ලිමේන්තුවෙන් දීපු වාහනයෙන් තමයි ඔයගොල්ලන් අද යන්නේ. ඒ පාර්ලිමේන්තුවේ පඩිය අරගෙන තමයි ඔයගොල්ලන් අඩියක් ගහන්නේ. ඔයගොල්ලන් මේ මන්ත්‍රී නිල නිවාසයේ අඩියක් ගහන්නේ මේ පාර්ලිමේන්තුවෙන් ගෙවන පඩිවලින්. හැබැයි, අපි කවදාවත් ඒවා කරන්නේ නැහැ. එක මන්ත්‍රී කෙනෙක් හරි නැඟිටලා කියන්න, මම - රාමනාදන් අර්චුනා - වැරදිකාරයා, මම වංචා, දූෂණ කරලා තිබෙනවා, මම සල්ලි හොරකම් කරලා තිබෙනවාය කියලා. ඔයගොල්ලන් එක්කෙනෙක් හරි ඒ ගැන කියන්න. ඔයගොල්ලන් ඔක්කෝම මට කිව්වේ මොකක්ද? "කොටි" කියලා. ඒකට හේතුව මම ප්‍රභාකරන් ගැන කියපු එකක්. ඔයගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ. මොකද, අද ඔයගොල්ලන් trouser එකක් හා shirt එකක් ඇඳගෙන, tie එකක් දමලා මෙතැන ඉන්නේ ඒ යුද්ධ තියනකොට කවදා හරි ඔයගොල්ලන්ව බේරා ගත්තේ ඔය ඉන්න නායකයෝ නිසා. ඒ කාලයේ ඔයගොල්ලන් හිටියේ ඇඳ යට. ඒක මතක තියා ගන්න. ඔයගොල්ලන්ගේ MPsලා ඔක්කෝම ඒ කාලයේ හිටියේ ඇඳ යට. Frontline එකට ගිහිල්ලා ඔයගොල්ලන්ව බේරුවේ කවුද? ඔයගොල්ලන්ගේ රණවිරුවෝ. ඔයගොල්ලන්, ඒගොල්ලන් ඔක්කෝටම නඩු දැම්මා. නඩු දමලා ඒවා ඇදගෙන යනවා. දැන් ඒගොල්ලන්ගේ මන්ත්‍රීකමත් අයින් කරනවා. ඒගොල්ලන් පාර්ලිමේන්තුවෙනුත් අයින් කරනවා. "කුඩු නාමල්" කියලා දැන් කිව්වා. හොඳයි.

Jaffnaවල වංචා, දූෂණ තිබෙනවා කියලා මම කියනකොට මේ ආණ්ඩුවෙන් මට නඩු 25ක් දැම්මා. ඒවා එකක්වත් මගේ පෞද්ගලික නඩු නොවෙයි. මම කාටවත් බැණලාත් නැහැ, ගහලාත් නැහැ. මම doctor කෙනෙක්. ඉපදිච්ච දවසේ ඉඳන් අද වෙනකම් මට එක නඩුවක් තිබුණේ නැහැ. හැබැයි, මම මේ පාර්ලිමේන්තුවට ආවාට පස්සේ මට විරුද්ධව නඩු 25ක් දැම්මා, ඔයගොල්ලන්ගේ පොලීසියෙන්. ඒ ගැන ඔයගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ. පොලීසියෙන් ජනවාරි මාසයේ දාපු නඩුවක් මාස 9කින් පස්සේ අද මහේස්ත්‍රාත් කැඳවනවා. මහේස්ත්‍රාත් කැඳවපු "B" Report එකේ කාට හරි විරුද්ධව නඩුවක් දාලා තිබෙනවා. ඒකේ නම නැහැ. ඊට පස්සේ මහේස්ත්‍රාත් Jaffna OICගෙන් අහනවා, "කෝ, කාට විරුද්ධවද නඩුවක් දාලා තිබෙන්නේ?" කියලා. ඔහුගෙන් ඇහුවාම ඔහු මෙහෙම ඉන්නවා. ඊට පස්සේ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාගේ කට්ටිය මට කථා කරලා කිව්වා, "Doctor, ඒ නඩුව උසාවියට අරන් යන්න එපා" කියලා. හැබැයි, මම private plaint එකක් දැම්මා. ඒ තරම් ජරා වැඩ ඔයගොල්ලන් කරන්නේ. බලන්න, මම signal light දමාගෙන ගියා කියලා මට නඩුවක් දමලා මාව arrest කළා, ඔයගොල්ලන්. හැබැයි, වසන්ත සමරසිංහ හැම දාම අනුරාධපුරයට නාන්න යනවා නේද? ඒ ගැන ලියපු එක්කෙනා පිටුපස්සේ ඉන්නේ. මම එතුමාගේ නම කියන්නේ නැහැ. ඒ ඔප්පුවත් මම පාර්ලිමේන්තුවේ table කළා. ඔයගොල්ලන් අද වෙනකම් ඒ සම්බන්ධයෙන් මොනවා හරි කළාද? නැහැ. ඔයගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ. ඔයගොල්ලන් මේ වාගේ පනතක් ගෙනෙනකොට ගහන්නේ ඔයගොල්ලන්ව බේරපු මිනිස්සුන්ට. අද වෙනකම් මේ පාර්ලිමේන්තුවේ ගොට්ට අල්ලන්නේ නැති කෙනෙකුට ඉන්නේ මම විතරයි කියලා මම විශ්වාස කරනවා. අනෙක් ඔක්කෝම ටික ගොට්ට අල්ලනවා. මම කවදාවත් ගොට්ට අල්ලන්නේ නැහැ. අපි වෙනුවෙන් මැරුණු කෙනා වෙනුවට මම අනිවාර්යයෙන් පෙනී හිටිනවා. ඔයගොල්ලන් මාව මරලා දැම්මත්, මොනවා කළත් මම අදත් මේ පාර්ලිමේන්තුවට ඒක කියනවා. එහෙම කියන්න මට කොච්චර හයක් තියෙන්න ඕනෑද? මේ රටේ මිනිස්සු ලක්ෂ 225ක් ඉන්නවා. අපි මේක පිටතට කිව්වා කියලා එළියේ යනකොට මම හය වෙන්නේ නැහැ. ඔයගොල්ලන් මට ආරක්ෂාව දීලාත් නැහැ. මම ඇත්ත කියන්නේ.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

හැබැයි, මම කවදා හරි සිංහල මිනිසුන් වෙනුවෙන් පෙනී ඉන්න ඕනෑ. අනිවාර්යයෙන් මම ඒගොල්ලන්ට ගරු කරනවා. ඔබතුමන්ලාට ඡන්දය දීලා පාර්ලිමේන්තුවට එව්වාට ඔබතුමන්ලා මොනවාද කළේ? පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඒගොල්ලන්ව පාවා දීලා, ඒගොල්ලන් සෙබළියෝ කිව්වා. අන්තිමට මේක අයින් කළා.

නාමල්ව arrest කරන එකත් හොඳයි. නාමල්ව arrest කරනවා නම් ඒ විධියට,- *[බාධා කිරීම්]* ඔහොම ඉන්නකෝ. ඒ විධියට,- *[බාධා කිරීම්]* කෑ ගහන්න එපා. කවුරු හරි ඒ බබාට milk bottle එකක් දෙන්න. තනිකර දෙමළෙන් කථා කරන්නත් බැහැ. සිංහලෙන් කථා කරන්නත් බැහැ. කියලා වැඩක් නැහැ. කරදර කරන්න එපා. හැබැයි, මේ වාගේ අය තමයි අද පාර්ලිමේන්තුවට ඇවිත් ඉන්නේ. ඇත්තටම මේකේ ඉන්න ගොඩක් අයියලාව මම පෞද්ගලිකව හඳුනනවා. ඒගොල්ලන් ගොඩක් හොඳයි.

ජනාධිපතිතුමා Jaffnaවලට ගියා. ඒ මොකටද? Cricket stadium එකක් හදන එකට. අපි cricket stadium ද ඉල්ලුවේ? එතුමා ගියා, passport office එකක් ආරම්භ කරන එකට. අපි passport office එකක්ද ඉල්ලුවේ? අපි ඉල්ලුවා,- *[බාධා කිරීම්]* මේක කියනකල් කෑ ගහන්නේ නැතුව ඉන්නකෝ, මන්ත්‍රීතුමා. ඇයි, wifeට කෑ ගහනවා වාගේ මට කෑ ගහන්නේ? පොඩ්ඩක් ඉන්න. ගිහිල්ලා wifeට බණින්න; මට කථා කරන්න ඉඩ දෙන්න. අපි ඔයගොල්ලන්ගෙන් passport office එකක් ඉල්ලුවාද? අපි ඉල්ලුවේ ජාතික ප්‍රශ්නය ඉවර කරලා දෙන්න කියලා. අද වනකල් ඔබතුමන්ලාගේ ආණ්ඩුව එක වචනයක්වත් කියලා තිබෙනවාද, ජාතික ප්‍රශ්නය ඉවර කරනවා කියලා? මම දැන් ඒ ගැන කියන්නම්. තනිකර සිංහලෙන් කියන්නම්. මම ජිනීවා යනවා. ගිහිල්ලා මට වෙච්ච දේවල් කියනවා. IPU එකෙන් ලියුමක් ඇවිත් තිබෙනවා, statement එකක් දෙන්න කියලා. මම ජිනීවාවලට ගිහිල්ලා ඒ ගැන කියනවා. *[බාධා කිරීම්]* කෑ ගහන්න එපා. අපි යනකොට ඒක කර ගනිමු. පොඩ්ඩක් ඉන්නකෝ.

දෙවැනි එක මේකයි. මම ගිහිල්ලා අපේ මිනිසුන් වෙනුවෙන් ජිනීවාවල පෙනී හිටිනවා. මම ගිහින් එනකොට arrest කරන්න. කිසි අවුලක් නැහැ. හැබැයි, මම ඔබතුමන්ලා කරපු වැරැද්ද කරන්නේ නැහැ. මම ඔබතුමන්ලා වාගේ පරාජය කරලා, ඔබතුමන්ලාව බේරපු මිනිසුන්ව කපලා වළ දාන්නේ නැහැ. අද වනකල් රණ්ඩු වනවා. ඔබතුමන්ලා කියනවා නේ, ප්‍රභාකරන් බෝම්බ පිපිරෙව්වා කියලා. මම ඒක පිළිගන්නවා. එය වැරදි නම් මම ඒකට සමාව ගන්නවා. හැබැයි, පුළුවන් නම් ඔබතුමන්ලාගෙන් කවුරු හරි කෙනෙක් නැඟිටලා කියන්න, ඔබතුමන්ලාගේ රෝහණ විජේවීර කරපු ඒවා ඔක්කෝම හරි කියලා. ඔයගොල්ලන් ඒ වෙනුවට අර කෙනා මරලා; ඔහු ඉවරයි. හැබැයි, දැන් ආතල් ගන්නේ,- *[බාධා කිරීමක්]*

දැන් කැබ් එකක් ගෙනෙනවා කිව්වා. ඒ කැබ් කථාව මම කියන්නම්. පිටුපස පේළියේ ඉන්න මන්ත්‍රීතුමන්ලා ටිකක් දැන් කෑ ගහනවා. මට නමත් එක්ක කියන්න පුළුවන්. ඔබතුමන්ලාගේ කට්ටියක් ඇවිත් කිව්වා, "මචං, ඕක කථා කරපන් පාර්ලිමේන්තුවේ. එතකොට අපටත් කැබ් එකක් හම්බ වෙනවා" කියලා. මම කැබ් එකක් ඉල්ලන්න ආවේ නැහැ, පාර්ලිමේන්තුවට. හැබැයි,- *[බාධා කිරීම්]* නැහැ. ආරක්ෂාවත් ඉල්ලුවේ නැහැ. ඇත්තටම මට ආරක්ෂාව ඕනෑ, මිනිසුන්ගේ ප්‍රශ්නයක් නිසා නොවෙයි. ආරක්ෂාව ඕනෑ, පිටුපස්සේ මන්ත්‍රීතුමන්ලා ඉන්නවා නේ. ඒ අය ළඟට එනකොට මට හයයි, ඒ අය කපයිද කියලා. Wife කියලා හිතාගෙන,- බඩ කපයි කියලා මට හයයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම මේ කාරණයත් කියන්නම්. මට තත්පර 10ක් දෙන්න. ජිනීවා ගිහිල්ලා, අපේ රට ඇතුළේ අපේ මිනිසුන්ව කොහොමද මැරුවේ කියලා මම කියනවා. පුළුවන් නම් ඕනෑ නඩුවක්,-

සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, මම ගිහිල්ලා එනකොට Airport එකේදී අල්ලා ගන්න පුළුවන්. හැබැයි, මම පෙනී හිටින්නේ මට ඡන්දය දීපු මිනිසුන් වෙනුවෙන්. මම සිංහලුන්ට ආදරෙයි. මම වැඩ කරපු hospitalsවලට ගිහිල්ලා බලන්න. මට යන්න එපා කියලා අපේ staff එකේ අය strike කරලා තිබෙනවා; ඒ අයව දාලා යන්න එපා කිව්වා. මම පේරාදෙනියේ වැඩ කළා. කළුබෝවිල වැඩ කළා. නමුත් අද වනකල්,- *[බාධා කිරීම්]* අනේ, මන්ත්‍රීතුමන්ලා ඉන්න. මන්ත්‍රීතුමන්ලාට කියන්නකෝ, පොඩ්ඩක් කට වහගෙන ඉන්න කියලා. හැබැයි, මම එකක් කියන්නම්. කවදා හරි දවසක මම සිංහල මිනිසුන් ජීවත් වන පැත්තෙන් ඡන්දය ඉල්ලනවා. එතකොට ඔය මන්ත්‍රීතුමන්ලා කීදෙනෙක් ඉතුරු වෙයිද කියලා බලමු.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.48]

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, இன்றைய தினம் உங்களுடைய YouTube எகிறும்!

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். 1986ஆம் ஆண்டின் 04ஆம் இலக்க சனாதிபதிகளின் உரித்துரிமைகள் சட்டத்தினை நீக்குவதற்கான சட்டமூலம், உண்மையில் நியாயமான முறையில் இன்றைய தினம் எங்களால் நிறைவேற்றப் படவிருக்கின்றது. நான் இங்கு உரையாற்றிய பலரது உரைகளையும் நன்றாகக் கேட்டுக் கொண்டிருந்தேன். அவர்கள் தங்களுடைய எஜமானர்களுக்காகத் தமது குழல்களை நன்றாக ஊதுகின்றார்கள். ஆனால், தாங்கள் ஊதுவது துருப்பிடித்து, ஓட்டைவிழுந்த குழல்கள் என்று அவர்களுக்குத் தெரியவில்லை. அவ்வாறு ஓட்டைவிழுந்த குழல்களில் ஊதுகின்றபோது நிச்சயமாக அதிலிருந்து நாதமோ, கீதமோ, இசையோ வரப்போவதில்லை. இந்தக் குழல்களில் வெறுமனே காற்றுதான் வரும்! எனவே, அவர்கள் அந்தக் குழல்களை மாற்ற வேண்டும் அல்லது ஊதாமல் இருக்க வேண்டும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று விவாதிக்கப்படுகின்ற சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம் என்பது உண்மையிலேயே மிகவும் காத்திரமான ஒன்றாகும். கடந்த காலங்களில் ஆட்சிபுரிந்த சனாதிபதிகளின் வரிசையை எடுத்து நோக்குவோமானால், அவர்கள் தாங்கள் ஆட்சிபுரிந்த காலப் பகுதிகளில் தங்களது

அதிகாரத்தைப் பயன்படுத்தித் தங்களுக்குத் தேவையான வகையில் தங்களுடைய வரப்பிரசாதங்களையோ, வசதி வாய்ப்புகளையோ அல்லது சலுகைகளையோ அதிகரிப் பதற்குத் தேவையான விதத்தில் அமைச்சரவைப் பத்திரங் களைத் தயார் செய்து அதற்கேற்றவாறு தங்களை வசதிப்படுத்திக் கொண்டார்கள்.

முன்னாள் சனாதிபதிகளில் ஒருவர் தனது ஆட்சிக் காலத்தில் என்ன செய்திருக்கின்றார்? 'கொவிட்-19' பிரச்சினையால் மக்கள் ஒருவேளை உணவை உண்பதற்குகூட வேலைக்குச் சென்று உழைக்க முடியாமல், பொருளாதாரம் அற்ற நிலையில் வீடுகளில் முடங்கியிருந்த காலப்பகுதியில், சொல்லொணாத் துன்பங்களை அனுபவித்த அந்தக் காலப்பகுதியில், 400 மில்லியன் ரூபாய்க்கு மேலதிகமான நிதித் தொகையில் தன்னுடைய அதிகாரபூர்வ இல்லமான விஜேராமவில் உள்ள வீட்டினை புனரமைத்திருந்தார். அதாவது, அதிக செலவு செய்து அதனை அழகுபடுத்தி யிருக்கின்றார், அலங்கரித்திருக்கின்றார், சௌகரியமாக்கி இருக்கின்றார். இந்த விடயம், 'உரோம் நகரம் தீப்பற்றி எரிந்தபோது நீரோ மன்னன் பிடில் வாசித்தாராம்' என்ற கதையை ஒத்ததாக இருக்கின்றது. அந்தக் கதையினூடாகக் கூறப்படுகின்ற கருத்து, மக்கள் துன்பத்தில் இருக்கின்றபோது மன்னன் இன்பத்தை அனுபவித்தான் என்பதாகும்.

இதுதான் அவர்கள் மக்களுக்குச் செய்த சேவையா? என்று நான் அவர்களிடம் கேட்பதற்கு விரும்புகின்றேன். இப்பொழுது அவர்களுக்காக நீங்கள் ஊதுகுழல் ஊதுகின்றீர்கள். இந்தப் பணத்தை அன்றைய தினம் 'கொவிட்'இனால் வாடிய மக்களுக்குக் கொடுத்திருந்தால் அல்லது நிவாரணமாக வழங்கி யிருந்தால் நாங்கள் பெருமைப்படக்கூடியதாக இருந்திருக்கும். இவ்வகையான பலவீனமான ஒரு சட்டம் எங்களுடைய நாட்டுக்குத் தேவையில்லை. இந்தச் சட்டத்தின்மூலம் கிடைக்கின்ற வரப்பிரசாதங்களை அனுபவிப்பதற்கு அவர் ஒன்றும் கடவுளுமில்லை; மேலிருந்து குதித்தவரும் இல்லை. மக்களால் தெரிவுசெய்யப்பட்ட சனாதிபதி மக்களுடைய கஷ்டங்களைப் புரியாதவராக இருந்தால், நிச்சயமாக இவ்வாறான சட்டங்களை நீக்குவது அவசியமானதாகும்.

அதுமட்டுமல்ல, இன்னொரு ஜனாதிபதி என்ன செய்தார்? தன்னுடைய காலப்பகுதியிலேயே தன்னுடைய வீட்டைப் புனரமைப்பதற்காக ஓர் அமைச்சரவைப் பத்திரத்தைத் தாக்கல் செய்தார். தான் பதவியில் இல்லாவிட்டாலும் அல்லது ஓய்வுபெற்ற பின்னரும், இறக்கும்வரை அந்த வீட்டைப் பயன்படுத்தக்கூடிய வகையில், சௌகரியமாக இருக்கக்கூடிய வகையிலே தனக்கேற்றவாறு அதனைப் புனரமைப்பதற்கு அமைச்சரவைப் பத்திரத்தைத் தாக்கல் செய்தார்; இரண்டு வீடுகளை ஒன்றாக்கிப் புனரமைத்தார். இன்னொரு ஜனாதிபதி என்ன செய்தார்? கோடிக்கணக்கான பெறுமதியான தன்னுடைய வீட்டை வாடகைக்குக் கொடுத்துவிட்டு, தனக்கு அரசாங்க வீடு வேண்டுமென அரசாங்கத்திடம் கையேந்தினார். இதுதான் நாட்டு மக்களை நேசித்த ஜனாதிபதிகளுடைய உண்மையான கடமையுணர்வா? மக்கள் அனைத்தையும் உணர்வார்கள், மக்களுக்குத் தெரியும்! அதனால்தான் அவர்கள் தேசிய மக்கள் சக்திக்கு வாக்களித்து இன்று 159 பாராளுமன்ற உறுப்பினர்களை இங்கு அனுப்பி வைத்திருக்கிறார்கள், வேறொன்றுமல்ல! இவ்வாறு தேவையற்ற ஆணிகளாக இருக்கின்ற இவ்வகையான சட்டமூலங்களை நிச்சயமாக எங்களுடைய ஆட்சிக் காலத்திலே பிடுங்கி எறிவோம்!

உங்களுக்குத் தெரியும், எங்களுடைய நாட்டில் இன்றும் எத்தனையோ மக்கள் வீடில்லாமல் இருக்கின்றார்கள். எங்களுடைய வட பகுதியை எடுத்துக்கொண்டால், யுத்தத்தால் பாதிக்கப்பட்டு வீடுகளை இழந்த பலர் இருக்கிறார்கள். அவர்களுக்கு வீடுகளைக் கட்டிக் கொடுக்க வேண்டிய தேவை இருக்கின்றது. அதேபோல, மலையகப் பகுதிகளிலே இருக்கின்ற மக்களுக்கும் வீட்டு வசதிகளைச் செய்து கொடுக்க வேண்டியிருக்கின்றது. எனவே, எதிர்காலத்தில் எந்தவொரு ஜனாதிபதியோ, அமைச்சரோ, பாராளுமன்ற உறுப்பினரோ அரசாங்க நிதியிலிருந்து செலவுகளைச் செய்யும்போது, வியர்வை சிந்தி, குருதி சிந்தி உழைக்கின்ற ஏழை மக்களுடைய ஒவ்வொரு சதத்தையும் வீண் விரயம் செய்யாமல் அவதானமாக இருக்க வேண்டும் என்பதற்காகவே ஜனாதிபதிகளின் உரித்துரிமைகள் சட்டத்தை நீக்குவது பிரதானமாக இருக்கின்றது. அந்த வகையிலே எதிர்காலத்திலே மக்கள் நிம்மதியாக வாழ்வதற்கு ஏற்ற வசதி வாய்ப்புக்களைச் செய்வதற்காகப் புதிய சட்டமூலங்களை நாங்கள் நிச்சயமாகக் கொண்டு வருவோம்.

அதுபோல், உண்மையிலேயே மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தமிழ் மக்கள்மீது மிகுந்த கரிசனையோடு இருக்கின்றார். கடந்தகால ஜனாதிபதிகள் வட பகுதிக்கு விஜயம் செய்தபோது, தங்களுடைய வரப்பிரசாதங்களை எவ்வாறு பயன்படுத்தினார்கள் என்பது உங்களுக்குத் தெரியும். யாழ்ப்பாணம் செல்வதற்கு இரண்டு உலங்கு வானூர்திகள் - ஹெலிகொப்டர்கள்! வவுனியாவுக்கு வருவதற்கு ஒரு ஹெலிகொப்டர்! அங்கிருந்து UC playgroundக்கு வருவதற்கு - 3 கிலோமீற்றர் தூரம் போவதற்கு - மக்களுடைய பணத்தில் பல இலட்சம் ரூபாயைச் செலவழித்து இங்கேயிருந்து bullet-proof car போகும்! இவ்வாறு மக்களுடைய பணத்தை வீண் விரயம் செய்த ஜனாதிபதிகளும் இருக்கிறார்கள். ஆனால், எங்களுடைய மாண்புமிகு ஜனாதிபதி அவர்கள் கணப்பொழுதாவது மக்களுடைய பணத்தை வீண் விரயம் செய்வதைப் பற்றி சிந்திப்பது கிடையாது. தன்னுடைய வரப்பிரசாதங்கள் அனைத்தையும் தூக்கி எறிந்துவிட்டு, மக்களுக்காகச் சேவை செய்கின்றார். அவ்வாறே எங்களுடைய அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் இருக்கின் றார்கள். நிச்சயமாக நாம் எதிர்காலத்தில் எங்களுடைய மக்களுக்காகப் பொருத்தமான நடவடிக்கைகளை எடுப்போம். அதேவேளை, தேவையற்ற, வீண் விரயத்தை ஏற்படுத்தக் கூடிய அனைத்தையும் நீக்கிவிட்டு, அதனூடாகக் கிடைக்கின்ற வருமானங்களை நிச்சயமாக மக்களின் தேவை களை நிறைவேற்றுவதற்காக, மக்கள் நலத் திட்டங்களுக்காகப் பயன்படுத்துவோம்.

அடுத்து நான் ஒன்றைக் கூற விரும்புகிறேன். எங்களுடைய அரசாங்கத்திலே இனவாதம் இல்லை. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் கடந்த இரண்டு நாட்களாக அக்கறையோடு வட பகுதிக்குச் சென்றிருக்கின்றார். அதேபோல அமைச்சர்களும் அக்கறையோடு சென்றிருக்கின்றார்கள். நாங்கள் அங்கு பல்வேறு செயற்றிட்டங்களை நடைமுறைப்படுத்துகின்றோம். நிச்சயமாக எங்களுடைய அரசாங்கக் காலத்திலே வட பகுதியிலே இருக்கின்ற பிரச்சினைகளைப் படிப்படியாகத் தீர்த்து வைப்போம். நாங்கள் இங்கே வெற்றுவேட்டு வைப்பது கிடையாது. *[இடையீடு]* வெறுமனே YouTube வருமானத்திற்காக வியாபாரம் செய்வதும் கிடையாது. உண்மையையே கதைக்கின்றோம்; உண்மையான செயல்களையே செய்வோம்; நிச்சயமாக அவற்றை நடத்திக் காட்டுவோம். அதன்மூலம் இந்த நாட்டிலே அனைத்து இன மக்களும் ஒற்றுமையாகவும் சந்தோசமாகவும் வாழக்கூடிய ஒரு சூழலை எங்களது ஆட்சிக் காலத்திலே உருவாக்குவோம் எனக்கூறி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.57]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත ඉවත් කිරීමට ගෙනෙන ලද පනත් කෙටුම්පත තමයි අද දවසේ සම්මත කිරීමට ඉදිරිපත් කර තිබෙන්නේ. ඇත්තටම මේ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරද්දී, 1986දී ගෙනා පනත ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා එතුමාට වරප්‍රසාද ලබා ගන්න, එතුමාගේ බිරිඳට වරප්‍රසාද ලබා ගන්න ගෙනා එකක් කියා ආණ්ඩුව පැත්තෙන් ඉතා පහළ මට්ටමේ ප්‍රකාශ සිදු කළ ආකාරය අපට ගොඩක් අවස්ථාවලදී ඇහුණා. අධිකරණ ඇමතිවරයාත් ඒ වාගේ කථාවක් කිව්වා. ඇත්තටම ජනාධිපතිවරයා ලෙස ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1986දී එම පනත ගෙනාවේ ඒ මොහොතට අදාළව, ඒ පරිසරයට ගැළපෙන ආකාරයට ඒ හරහා යම් යම් වරප්‍රසාද ප්‍රමාණයක් ජනාධිපතිවරයෙකුට ලැබිය යුතුයි කියන තැන ඉඳලායි. ජනාධිපති ජේ.ආර්. ගෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව හැම දාම මේ රටේ මිනිස්සුන්ට කථා කියලා, විරෝධතා පාලා අද ඔබතුමන්ලා තමන්ගේ ජනාධිපතිවරයෙක් හදා ගෙන තිබෙන්නේ. ඒ නිසා සැරින් සැරේ කැලි කියන්න දෙයක් නැහැ. දැන් ඔබතුමන්ලාට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙනවා නේ. ඒ නිසා අනුර කුමාර ජනාධිපතිතුමාට පුළුවන්, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. එහෙම අහෝසි කළාම කැලි කැලි අයින් වෙන්න දෙයක් නැහැ. එතකොට ආයෙත් පහසුකම් ඇත්තේත් නැහැ, මොකුත් නැහැ, ඉවරයි. අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න පුළුවන්. එහෙම කරන්නේ නැතුව මේ ව්‍යවස්ථාව නිර්මාණය කරපු මිනිස්සුන්ට සැරින් සැරේ අපහාස කරන්නයි, තමන්ගේ සමස්ත දේපළ රජයට පවරපු ජනාධිපතිවරයාට අපහාස කරන්නයි, ඒක දේශපාලනිකව යොදා ගනිමින් ඡන්දය දුන් මිනිස්සුන්ව සතුටු කරන්න කටයුතු කරන්නයි වුවමනාවක් නැහැ. තමන්ට පුළුවන්, තමන් කියපු ඉතුරු කාරණා ඉෂ්ට කරන්න. ඒක කළාම මේ වැඩේ ඉවරයි.

ඊළඟ කාරණාව මේකයි. ඇයි, හිටපු ජනාධිපතිවරයෙකුට මේ වාගේ පහසුකම් ලබා දිය යුත්තේ? ජනාධිපතිවරයා පත් වෙන්නේ ව්‍යාවස්ථාව තුළින්. ව්‍යවස්ථාවට පිටින් ලංකාවේ හිටපු ජනාධිපතිවරුන් කවුරුවත් පත් වෙලා නැහැ. ඒ ඒ ජනවරමට එකඟව පත් වුණු ජනාධිපතිවරුන් ඒ පහසුකම් ලබා ගත් අතරතුර, ඔබ තමුන්නාන්සේලා පත් කරපු ජනාධිපතිවරුන් 3දෙනෙකු තමයි මේ පහසුකම් වැඩියෙන්ම අවභාවිත කළේ කියලා ඔබ කියනවා. එ් සම්බන්ධ වගකීම ඔබේ අතේ තිබෙන්නේ. 1994, 2005, 2015 කාලවලදී සිදු කළ සියලු පත් කිරීම්වලට උදවු කරපු මිනිස්සු අන්තිමට අපට අනම්මනම් කියන ගමන්, ඒ ගැනම කථා කරන්න බලාගෙන ඉන්නවා. මම මේ ගැන කලින් දවසකත් කියා තිබෙනවා. සම්පූර්ණ පැකේජ් එක භාර ගැනීමේ වගකීම තිබෙන්න ඕනෑ. හැබැයි, ජනාධිපති තනතුරේ වරප්‍රසාද සහ ජනාධිපති තනතුරේ මුක්තිය ජනාධිපතිවරයාට පැවතිය යුතුයි, ඒකට කථා දෙකක් නැහැ. හේතුව, ඒ ඒ කාල සීමාවලදී ජනාධිපතිවරුන්ට පැවරෙන අභියෝගවලට මුහුණ දීමේදී, තමන්ට එන විවිධ ප්‍රශ්න විසඳීමේදී ගනු ලබන තීරණවලට ඒ නිදහස තිබිය යුතුයි. උදාහරණයක් හැටියට ගත්තොත්, වර්තමාන ජනාධිපතිවරයා මේ මොහොතේදී -ඔබේ අදහස්වලින් කියැවෙන විධියටම- පාතාලය මර්දනය කරන්න දායකත්වය සපයමින් ඉන්නවා, තමන්ගේ පාලන කාල සීමාව තුළ. ඊට අමතරව මත්ද්‍රව්‍ය නවත්වන්න තමන්ගේ පාලන කාල සීමාව තුළ උපරිම බර යොදනවා කියලා ජනාධිපතිවරයා කියනවා. හැබැයි, ලෝක දේශපාලනය තුළ ඕනෑ තරම් උදාහරණ තිබෙනවා, ජනාධිපතිවරු විශ්‍රාම ගියාට පසුව පවා මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රශ්නවලදී ඔවුන්ට ජීවිත අහිමි කරපු අවස්ථා සම්බන්ධව. ඒ නිසා ජනාධිපති තනතුර මෙහෙයවන්නේ අනුර කුමාරද, මහින්ද රාජපක්ෂද, මෛත්‍රීපාල සිරිසේනද කියන එක නොවෙයි ප්‍රශ්නය. එම තනතුරට අවශ්‍ය ආරක්ෂාව, ගෞරවය ලබා දෙන ගමන්, විශ්‍රාම ගියාට පසුවත් එම ආරක්ෂාව සහ ගෞරවය ලබා දිය යුතුයි. හේතුව ඒ, රටක් නියෝජනය කළ ජනාධිපතිවරයෙක්.

ඔය "ආරක්ෂාව" කියන වචනය පිළිබඳව කථා කළොත්, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පැවැති කාල සීමාවේ ජානක පෙරේරාගේ ආරක්ෂාව ඉවත් කිරීම හරහා සිදු වුණේ මොකක්ද? එල්ටීටීඊ සංවිධානය විසින් විශ්‍රාම ගියපු හමුදා නිලධාරියෙක් වුණු ඔහුව ඝාතනය කළ බව ඔබ කවුරුත් දන්නවා. ඒ නිසා හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව, ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහ ගෞරවය ආරක්ෂා වන පරිදි -ඒ තනතුර පවත්වා ගෙන යනවා නම්- කටයුතු කළ යුතුයි. ඉවත් කරනවා නම්, කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මෙවර ඔබට මේ ජනවරම හිමි වෙලා තිබෙන්නේ ඒවා ඉවත් කිරීමට එකඟව. ඒ නිසා ඔබ ඒවා අහෝසි කිරීම පිළිබඳව මට විවාදයක් නැහැ. හැබැයි, මම පෞද්ගලිකව විශ්වාස කරනවා, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විශ්‍රාම ගියාට පසුව එතුමාට මේකේ තිබෙන බරපතළකම වැටහේවි කියලා. සමහර විට මේ ගෙවෙන කාල සීමාව තුළ හෝ ඊළඟ අවස්ථාවකදී ඔබ මේ පිළිබඳව යළි යළිත් සාකච්ඡාවට ගනියි කියලා මම හිතනවා.

හේතුව ඔබේ පක්ෂයේත් නායකත්වය ඉවත් වුණාට පසුව- රෝහණ විජේවීර මැතිතුමාගේ පවුලට ඔබ සලකපු විධිය අපි දැක්කා. ඊට අමතරව, සෝමවංශ අමරසිංහ මැතිතුමා නායකත්වයෙන් ඉවත් වුණාට පසුව ඔබේ පක්ෂයෙන් සලකපු විධිය අපි දැක්කා. ඒ නිසා අනුර කුමාර දිසානායකටත් පසුව වෙන දේ අපට දකින්න පුළුවන්. ඒ කාලය වෙද්දී නායකයා වශයෙන් බිමල් රත්නායක හෝ වෙන කවුරුන් හෝ ඉඳියි. ජනාධිපති වෙලා ඉන්නා කාලයේ පහසුකම් දෙන්න ඕනෑ තරම් අය ඉන්නවා. පසුගිය දවස්වල ඒවා කියැවුණේ; ලස්සන කාන්තාවන්, තමන්ට අවශ්‍ය කරන ඉඩම් කඩම්, අවශ්‍ය කරන පහසුකම් ටික, අරහෙට ගියාම ඒ hotel එක, මෙහාට ගියාම මේක ආදී වශයෙන් දෙනවා. හැබැයි ඒ, ජනාධිපති තනතුරේ ඉන්නා කාලයේදී. ඒක බිමල්ට හම්බ වෙන්න පටන් ගත්තාට පසුව අනුර කුමාරට ඒවා හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා අනුර කුමාර දිසානායක විශ්‍රාම ගියාට පසුව රජයෙන් බලා ගන්නේත් නැහැ, JVP එකෙන් බලා ගන්නේත් නැහැ. අවසානයේදී මේ සියලු ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙන්නේ ජනාධිපති - *[බාධා කිරීම්]* මම මේ කථා කරන්නේ අපේ - *[බාධා කිරීම්]* කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]* විනය! විනය! විනය! *[බාධා කිරීම්]* විනය! විනය! විනය! කෝ, විනය? *[බාධා කිරීම්]* ආ! අපිට විනය උගන්වන්න ආවේ. *[බාධා කිරීම්]* අපි වල් පැළ. *[බාධා කිරීම්]*

ඔය මල් පැළ නේ. මොකද මේ වුණේ, මල් පැළවලට? ඔය මල් පැළ; අපි වල් පැළ. අපට ඕනෑ එකක් කිව හැකියි. මොකද, අපි විනයක් ගැන කිව්වේ නැහැ. සද්ද නැතිව ඉන්න. *[බාධා කිරීම්]* අම්මෝ! මේ මොකද වුණේ? මල් පැළ "ටක්" ගාලා වල් පැළ වුණා. ඔක තමයි ඊයේ නේපාලයේ වුණේ. *[බාධා කිරීම්]* මේ අහගන්න. අහගන්නකෝ. *[බාධා කිරීම්]* නිශ්ශබ්ද කරලා දෙන්නකෝ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

I rise to a point of Order.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මගේ වෙලාව ගන්න බැහැ. *[බාධා කිරීමක්]* හරි, හරි. ඒක අපි වෙනම කථා කරමුකෝ. *[බාධා කිරීමක්]* මට කථා කරන්න දෙන්නේ නැහැ නේ, ඉතින්. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමාගේ- *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු ජනාධිපතිතුමාගේ ගරුත්වයට බාධාවක් වෙන ආකාරයට මේ අවස්ථාවේදී ප්‍රකාශ නිකුත් කරනවා. පාර්ලිමේන්තුව තුළ මේ වනකොට බලය- *[බාධා කිරීම්]* ගරු ජනාධිපතිතුමාගේ ගරුත්වයට බාධා වෙන ආකාරයට එතුමාගේ personal conduct එක ගැන මෙතුමාට කථා කරන්න ඉඩ දෙන්න බැහැ. ඉතාම ලජ්ජා සහගත ප්‍රකාශයක් මේ සිද්ධ කරන්නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න. *[බාධා කිරීම්]*

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඉස්සෙල්ලාම කියන්න, එතුමිය mike එක ගත්තේ කොහොමද කියලා? එතුමිය පාර්ලිමේන්තුවේ ලොක්කාද? එතුමිය පාර්ලිමේන්තුවේ ලොක්කාද? ඔබතුමිය කොහොමද mike එක දුන්නේ? *[බාධා කිරීම්]* ඇයි, ඔබතුමා කවුද? මේක මගේ කථාවට අදාළ වෙලාව. *[බාධා කිරීම්]* කට පියාගෙන අහගෙන ඉන්නයි තිබෙන්නේ. හරිද? මේක මගේ වෙලාව. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නිහඬ වෙන්න. *[බාධා කිරීම්]*

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මේක මගේ වෙලාව. *[බාධා කිරීම්]* ඇයි, මොකක්ද අහන්නේ? තමන්ගේ ජනාධිපතිට අපහාස කරද්දී එතුමියට රිදෙනවා නම්, මේ රටේ කලින් හිටපු ජනාධිපතිවරුන්ට අපහාස කරද්දී ඇයි එතුමියට රිදුණේ නැත්තේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ කථාව කරගෙන යන්න. *[බාධා කිරීම්]*

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඒ මදිවාට මම කථා කරද්දී mike එක off කරනවා. ඉස්සෙල්ලාම තමුන්ගේ විනය රැකගන්න ඕනෑ; අපේ නොවෙයි. *[බාධා කිරීම්]* කට පියාගෙන අහගෙන ඉන්න. මේක. *[බාධා කිරීම්]* ඇයි, ඇයි, ඇයි? මගේ කථාවට අදාළ වෙලාව. *[බාධා කිරීම්]* මගේ කථාවට අදාළ වෙලාව. *[බාධා කිරීම්]* ඒක තමයි මමත් අහන්නේ? ඇයි මොකද? මට කථාව කරන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]* සද්ද නැතිව අහගන්න. සද්ද නැතිව අහගෙන ඉන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ කථාව කරගෙන යන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* නිහඬ වෙන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට කථා කරන්න දෙන්නේ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභාව නිහඬ වෙන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
දැන් මම අහන්නේ- *[බාධා කිරීම්]* මම වැරැදි කථාවක් කිව්වා. ඒ තමයි ඊළඟ ජනාධිපති බිමල් වෙයි කියපු එක. වැරැද්දක්. *[බාධා කිරීම්]* වැරැද්දක්. *[බාධා කිරීම්]* නැත්නම් ඔබතුමාද, ඔබතුමාද, වටගලද, ඊළඟ ජනාධිපති? ආසද? ආසද? *[බාධා කිරීම්]* හරි, හරි. අපි නිකම් අදහසක් ඒ කිව්වේ. කලබල වෙන්න එපා, ඉතින්. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාගේ පැත්තෙන් සජිත් මහත්මයා ඉදිරිපත් වෙන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]* කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]* ඉතින්, මට කථා කරන්න තවම ඉඩ දෙන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
කථා කරන්නේ කොහොමද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? කෑගහනවා නේ, එතුමන්ලා ඔක්කොම ටික එකතු වෙලා. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ආ, ඒ අස්සේ අර්ච්චුනා මන්ත්‍රීතුමාටත් අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, මෙතුමාගේ කථාවෙන් පස්සේ අවස්ථාව ගන්න. *[බාධා කිරීම්]* තත්පර 30යි. කියන්න තිබෙන දෙය කියන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, point of Order එකක් තත්පර 30යි කියලා කොහේවත් සඳහන් වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එහෙම නම්, ස්ථාවර නියෝගය කියලා ඉන්නකෝ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමියට ඕනෑ විධියට තත්පර 30යි, තත්පර 15යි කියලා වෙලාව දෙන්න point of Order එකක් නැහැ. මේකට දෙන්න ඕනෑ විනාඩියක්. *[බාධා කිරීමක්]* අහන්න. විනාඩියක් දෙන්න. අහන්න. අපි කථා කළාම,- *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථිකයාගේ කාලයෙන් වෙලාව අඩු වෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. Point of Order එකක් නේ. මට විනාඩියක් කථා කරන්න පුළුවන්. *[බාධා කිරීම්]* අහන්න. අපි ඉල්ලුවාම point of Order එකකට ඉඩ දෙන්නේ නැහැ. මෙතුමියට ඉඩ දුන්නේ කොහොමද? මෙතුමිය ඥාතිද? ඥාති නිසාද දුන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා ඉක්මනින් කියලා අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඒ ඥාති ද? Point of Order එකකට ඉඩ දෙන විධිය හැමෝටම සමාන වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මූලාසනයට ගරු කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමිය කොහොමද එහෙම අවස්ථාව දුන්නේ? *[බාධා කිරීම්]* අනේ මේ, බබාලා නිකම් අහගන්න එපා. වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කරුණාකර මූලාසනයට ගරු කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ඔබතුමා කෑ ගහන්න එපා. මම කථා කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභපතිතුමියට. එතුමිය උත්තර දෙන්න. Point of Order එකක් කියන්නේ නැතිව කොහොමද point of Order එකකට ඉඩ දුන්නේ? *[බාධා කිරීම්]* ඒක රීති ප්‍රශ්නයක්. *[බාධා කිරීම්]* කියවලා බලන්න. ඒක රීති ප්‍රශ්නයක්. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඇත්තටම කාරණය මේකයි. මම කල්පනා කළේ කරුණු දෙකයි. එකක්, බිමල් ඇමතිතුමාගේ නම කිව්වාම කලබල වීම. අනෙක් එක, වෙන කෙනෙකුට ලස්සනයි කිව්වාම තව කෙනෙක් කලබල වීම. ඔයාට වඩා එයා ලස්සනයි කොහොමත්. ඔයා නටන්න ඕනෑ නැහැ, ඒකට. ඔයාට වඩා ලස්සනයි. ඔයා නටන්න එපා බොරුවට, ඒකට. හරිද? ඒක තමයි කථාව. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාටත් ඒ වාගේ ලස්සන කෙනෙක් සොයා ගත්ත හැකියි, ජනාධිපති වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
විනාඩියක් ඇයි? මට කථාව කරන්න දුන්නේ නැහැ නේ, ඒගොල්ලෝ. *[බාධා කිරීම්]* වෙන වෙන ඒවා කියන්න වුණේ ඔබතුමන්ලා කෑගහපු නින්දා නේ.

මට කියන්න ඕනෑ වෙච්ච කාරණාව මෙන්න මේකයි. ජනාධිපතිවරයාගේ සහ ජනාධිපතිවරයාගේ පවුලේ අයට පහසුකම් සහ විශ්‍රාම ගියාට පසුව ආරක්ෂාව ඕනෑ වෙන්නේ ඇයි? ඊයේ නේපාලයේ ඇති වෙච්ච ප්‍රශ්නයත් ඒ වාගේ එකක්.

ඊයේ පෙරේදා වෙනකල් නේපාලය බොහොම සාමකාමීව තිබුණා. ආණ්ඩුවේ මැදිහත්වීමකින් තොරව, ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දුවක් දෙනවා. ජනප්‍රිය කොමියුනිස්ට් ආණ්ඩුවක් ඒ රටේ තිබුණේ. අවසානයේ දැකැත්ත ඇතුළු ඔක්කොම ටික වීසි කළා. ක්ෂණිකව වෙච්ච දෙයක්. ඒ නිසා ජනාධිපතිවරයාගේ විතරක් නොවෙයි විශ්‍රාම ගිය අයගේ ජීවිත පවා අහිමි කරනවා, මේ වාගේ හදිසි අරගලවලින්. මේ අරගළ නිර්මාණය කරන්නේ රාජ්‍යයට - රටට - විරුද්ධව.

රටක නායකයෙක් - ජනාධිපති - කියන්නේ, රට ඇතුළට විතරක් සීමා වුණු මිනිහෙක් නොවෙයි. මේ ප්‍රශ්නය විසඳාගන්න යනවා නම්, අපි ලෝකය ඇතුළේ ධනවත් රටක් වෙනවා නම්, අපට සිද්ධ වෙනවා ලෝකයේ අනෙක් රටවල් එක්ක තරග කරන්න. ඒ වාගේ වෙලාවට ලෝකයේ අනෙක් රටවල් අපේ වාගේ රටවලට විරුද්ධව කුමන්ත්‍රණ කරනවා. කුමන්ත්‍රණ කරන

කොට ඒ කුමන්ත්‍රණවලින් රාජ්‍යය ආරක්ෂා කරන්න අවසානයේදී සිද්ධ වෙන්නේ රාජ්‍යයටමයි. ඒ නිසා පාලනය මෙහෙයවන කාල සීමාව තුළ කෙටි කාලීනව ජනප්‍රියත්වය උදෙසා අනවශ්‍ය පරිදි මේ වාගේ තීරණ ගැනීම හරහා පිටතින් සිටින කණ්ඩායම්වලට මේ රාජ්‍යය අනාරක්ෂිත කරන්න, අරාජික කරන්න අවස්ථාවක් ලැබෙනවා. අවසානයේදී නේපාලයේ හිටපු අගමැතිවරයාගේ බිරිඳ මිය යනවා. එකම වරද ප්‍රජාතන්ත්‍රවාදීව බලයට පැමිණීම. ප්‍රජාතන්ත්‍රවාදීව බලයට ආවා කියලා ඒ වාගේ කුමන්ත්‍රණකාරි අරගළ නවත්වන්නේ නැහැ. ඒ නිසා ජනාධිපතිවරයෙකුගේ, අගමැතිවරයෙකුගේ විශ්‍රාම දිවියේ ආරක්ෂාව පවා රාජ්‍යයේ වගකීමක්. විශ්‍රාම වැටුපක් ලබා නොදෙන එක, රාජ්‍යය වෙනුවෙන් ජනාධිපතිවරයා මිය ගියොත් වැන්දඹුව කෙරෙහි ඉරිසියාව, වෛරය නිර්මාණය කරන එක සදාචාර සම්පන්න රටකට තරම් වන වගකීමක් නොවෙයි. ඒක තමයි මට කියාගන්න ඕනෑ වුණේ. රටේ නායකයා කියන්නේ, රට ගොඩ නැඟීම උදෙසා අමාරු තීරණ ගන්න කෙනාට. එතුමා විශ්‍රාම දිවියට ගියාට පසුවත් ඒ ප්‍රශ්නවලට මුහුණ දෙනවා. ඒ, අනුර කුමාර මහත්මයා වෙන්න පුළුවන්, වෙනත් කෙනෙක් වෙන්න පුළුවන්. හැබැයි අපි එතුමාගේ ජීවිතයට වගකියන්න ඕනෑ. ඇති වන ප්‍රශ්නවලදී මේ රට ගොඩ නැඟීම උදෙසා අමාරු තීරණ ගන්න එතුමාට නිදහස තිබෙන්න ඕනෑ. ඒක තමයි මට කියාගන්න ඕනෑ වුණේ.

ඊළඟ කාරණාව තමයි, රාජ්‍යය පවත්වාගෙන යන අතරතුර,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
කාලය අවසන්ද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වැඩිපුර විනාඩියකුත් දුන්නා.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
කථා කරන්න හම්බ වුණේ නැහැ නේ.

ඊළඟට කියන්න ඕනෑ කාරණය මේකයි. මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප ගැනත් සැරින් සැරේ කියනවා. 1977දී ඇන්.ඇම්. පෙරේරා ඇතුළු සමගි පෙරමුණු ආණ්ඩුවයි, ජේ.ආර්. ජයවර්ධන විපක්ෂ නායකවරයායි එකතු වෙලා තමයි මේ විශ්‍රාම වැටුප මන්ත්‍රීවරුන්ටත් හඳුන්වා දුන්නේ. ඊළඟට ඒකත් අයින් කරන්න නේ යන්නේ. ඒක ලබා දීමේ අරමුණ වුණේත් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමයි. කිසියම් මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු මැතිවරණයකින් පරාජයට පත් වුණා කියන්නේ, ඔහුගේ දේශපාලන දිවිය ඉවරයි කියන එක නොවෙයි. ඊළඟ අවුරුදු පහේ පත්වෙන ආණ්ඩුව හරියට කටයුතු නොකළොත් නැවත වතාවක් අර පැරදුණු මන්ත්‍රීවරයාට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ජනතාව විසින් ලබා දෙනවා. ඊළඟ අවුරුදු පහේත් විපක්ෂයේ කාර්යභාරය ජනතාව සමඟ කරන්න තමයි 1977දී ඔය විශ්‍රාම වැටුප හඳුන්වා දීලා තිබෙන්නේ. එහෙම නැතුව ඒකෙන් සැප විඳින්න නොවෙයි. විශ්‍රාමික ජනාධිපතිවරුන් වේවා, එතුමන්ලාගේ වැන්දඹු බිරින්දෑවරුන් වේවා ඒ අයට සීමාසහිත, පාලනය කළ පහසුකම් ලබා දීම හැර ඒක දේශපාලන අවියක් ලෙස භාවිත කරලා ජනප්‍රියවාදී වැඩවලට යොමු වෙන්න එපා. ඔබට ලැබිච්ච ජනවරමට අනුව මේ පනත් කෙටුම්පත එකඟයි. හැබැයි, මේක ඇතුළේ තිබෙන අභ්‍යන්තර මතවාදයට අපි විරුද්ධයි. මේක මේ රට අරාජික වෙන්න පවා හේතුවක් වෙනවා. හේතුව මේකයි. ජනාධිපතිවරුන් තමන්ගේ රට ගැන තීරණ ගත යුත්තේ එතැනින් ඉස්සරහට තමන්ට වන බලපෑම් ගැන නොසිතායි.

බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා. ඔබතුමාට පස් වරු 3.30 දක්වා කාලය තිබෙනවා.

[අ.භා. 3.10]

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මම විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා, මේ විවාදය අවසානයේදී මේ පනත් කෙටුම්පතට විපක්ෂයේ සියලුදෙනා සහය දෙයි කියලා. මොකද, මේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ පවතින දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම තමයි මෙහිදී අපගේ අරමුණ වුණේ. එහෙම නැතුව, මෙය කාගෙන්වත් පළිගැනීමක් නොවෙයි. මේ රටේ පැවැති දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා මේ රටේ මහජනයා සමඟ ඇති කරගත් සමාජ සම්මුතිය අනුව අපි පියවර රාශියක් ගත්තා, පසුගිය මාස 10 තුළ. එහි එක දිගුවක් හැටියට තමයි අපි අද මේ පනත් කෙටුම්පත හඳුන්වා දෙන්නේ.

රටේ පැවැති දේශපාලන සංස්කෘතිය තුළ තිබුණේ බලය ලබා ගන්නා දේශපාලකයා අධිවරප්‍රසාද සහිත පුද්ගලයෙකු බවට පත් වෙලා රටේ ජනයා දුක් විඳිද්දී ඔහු ඇති තරම් තමන්ගේ වරප්‍රසාද තර කරගෙන ජීවත් වෙන ස්වභාවයක්. මේ දේශපාලන සංස්කෘතිය තමයි අපි අවසන් කරමින් එන්නේ. එහි තවත් එක් දිගුවක් තමයි මේ පනත් කෙටුම්පත හරහා දියත් වෙන්නේ. ඔබතුමන්ලා දන්නවා, පැවැති දේශපාලන සංස්කෘතිය මොන වගේ එකක්ද කියලා.

සියලු දේ, බලයට පත් දේශපාලකයා අත්පත් කර ගත්තා. අපි ඒවා එකින් එක අවසන් කරමින් සිටිනවා. වාහන පර්මිට්, ඇමතිවරුන්ගේ නිල නිවාස, වැටුප් දෙකක් -ඇමති වැටුප සහ මන්ත්‍රී වැටුප- ලබා ගැනීම වැනි කාරණා අපි ඉවත් කරලා තිබෙනවා. ඒ වාගේම ඉන්ධන දීමනාව විශාල වශයෙන් අඩු කරලා තිබෙනවා. මේවාගේ අධිවරප්‍රසාද රාශියක් අවසන් කර තිබෙන තත්ත්වයක් තුළ තමයි විශ්‍රාමික ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත යටතේ තිබෙන වරප්‍රසාද ප්‍රමාණයක් අද අහිමි වෙන්නේ. මේක දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමට අදාළ කාරණයක් මිස කිසිවෙකුගෙන් පළිගැනීමේ චේතනාවෙන් සිද්ධ කරන කාරණයක් නොවෙයි.

මෙතැන කියැවුණා, විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධව. මේ පනතේ කිසිදු අදාළත්වයක් නැහැ, ආරක්ෂාවට. බොහෝ මන්ත්‍රීවරු අවබෝධයකින් තොරව තමයි මෙතැනදී ඒ ප්‍රකාශ කළේ. මේ පනතට කිසිදු අදාළත්වයක් නැහැ, විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධ කාරණය. ඒ අයට ආරක්ෂාව වෙනම සපයලා තිබෙනවා. ඒ සපයපු ආරක්ෂාව පිළිබඳ කරුණු අරගෙන සමහර අය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණය, රජයෙන් සපයලා තිබෙන ආරක්ෂාව පිළිබඳව

[ගරු ආනන්ද විජේපාල මහතා]

සෑහීමකට පත් වුණා. දැන් ඒ පිළිබඳව කිසිදු ගැටලුවක් නැහැ. යමෙකුට ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ආරක්ෂක තර්ජනයක් තිබෙනවා නම්, ආරක්ෂක අවදානමක් තිබෙනවා නම්, ආරක්ෂක අවදානම පිළිබඳව තිබෙන කමිටුවට ඒ කරුණු ඉදිරිපත් කරපුවාම ආරක්ෂාව ලබා ගන්න පුළුවන්. ඊට අමතරව පොලිසියෙනුත්, බුද්ධි සේවය හරහාත් සොයා ගන්නා තොරතුරු අනුව ආරක්ෂාව ලබා දුන් අවස්ථාත් තිබෙනවා. ඒ නිසා අද සම්මත කර ගන්න නියමිත මේ පනත් කෙටුම්පත, කිසිසේත්ම ඒ අයගේ ආරක්ෂාවට සම්බන්ධ පනත් කෙටුම්පතක් නොවෙයි. අපි මේ රටේ සියලුදෙනාගේම ආරක්ෂාව තහවුරු කරන්න, විශේෂයෙන්ම දේශපාලනයේ යෙදෙන විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ හිටපු ජනාධිපතිවරු ලබා ගත්ත වරප්‍රසාද පිළිබඳව කටයුතු කරන්නේ කොහොමද කියලා අපි දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කළා. එකක් තමයි, ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත හරහා මේ ලබා දෙන වරප්‍රසාද අහෝසි කිරීම. ඒ වාගේම අපේ සාකච්ඡාව තුළ අපි කථිකා කර ගත්තා, මේ දේවල් යම් සීමාවකට යටත්ව ලබා දීම කියන කාරණාව. හැබැයි, අපි බැලුවා, පසුගිය කාලය පුරා නැත්නම් පසුගිය දශක දෙක තුන ඇතුළත මේ අණපනත් හරහා වාගේම, විවිධ කැබිනට් තීන්දු හරහා වාගේම, විවිධ ක්‍රම ඔස්සේ ලබා ගත් මේ වරප්‍රසාදවල යම් සීමාවක් තිබුණාද කියලා. එහෙම කිසිදු සීමාවක් තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ආරක්ෂාවට අමතරව හිටපු ජනාධිපතිවරුන්ට විවිධ සේවා සඳහාත් සමහර කාර්ය මණ්ඩල සපයා තිබුණා. උදාහරණයක් කිව්වොත්, මහින්ද රාජපක්ෂ මහත්මයාට සපයා තිබුණා, වෛද්‍ය කටයුතු සඳහා නව දෙනෙක්, රියදුරන් අට දෙනෙක්, ලිපිකරුවන් දෙදෙනෙක්, යාන්ත්‍රික අංශය සඳහා පස් දෙනෙක්, නාවික සෙබළ සහායකයෙක්, විශේෂ යාත්‍රා පුහුණු හතළිස් හයක්, භෝජනවේදීන් දහසයක්, විදුලි කාර්මිකයන් විසිහයක්, සිවිල් ඉංජිනේරු කාර්මිකයන් හතරක්, ඉංජිනේරු කාර්මිකයන් හත් දෙනෙක්, ගබඩා පාලකයන් දෙදෙනෙක්, ශාරීරික සහායක උපදේශකයන් තිදෙනෙක්, වඩු කාර්මිකයෙක් සහ සුනඛ පාලකයෙක්. ඒ ආකාරයට එකසිය එකොළොස් දෙනෙකුගේ සේවය සපයා තිබුණා. මේවා ආරක්ෂාවට අදාළ කාරණා නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ කියන්න අදහස් කරන්නේ, මේ සමහර හිමිකම් සීමාවකින් තොරව අසීමාන්විතව භාවිත කරපු ආකාරයයි. මේ වාගේ පනත් කෙටුම්පතක් ගෙනෙන්නේ නැතිව, යම් සීමාවකට යටත්ව යම් දේවල් කරන්න හැකියාවක් තිබුණත්, අතීතය අධ්‍යයනය කර බැලුවාම මේවායේ කිසිදු සීමාවක් තිබුණේ නැහැ. මේ විධියට තමයි කටයුතු කරලා තිබුණේ. අනෙක් විශ්‍රාමික ජනාධිපතිවරු ගත්තත් මේ විධියට තමයි කටයුතු කරලා තිබුණේ. උදාහරණයක් විධියට ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට, වෛද්‍ය සහායකයන් තුන් දෙනෙක්, කාර්මික නඩත්තු අංශයේ එක්කෙනක්, රියදුරන් දහසයක්, ලිපිකරුවන් පහක්, අරක්කැමියන් අටක්, සහායක නිලධාරින් දහතුනක්, භෝජනවේදීන් අටක්, කාර්මික ශිල්පීන් තුන් දෙනෙක්, ශාරීරික අභ්‍යාස උපදේශකයෙක්, විශේෂ කාර්මික වෘත්තීන් හය දෙනෙක් සහ සුනඛ පාලකයෙක් ලබා දී තිබුණා.

අපි මේ වාගේ අධිවරප්‍රසාදිත දේවල් ඉවත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ හරහා අපි කියන්න උත්සාහ කරන්නේ මේකයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, මා කියමින් සිටියේ මේකයි. යම් වරප්‍රසාදයක් හෝ යම් හිමිකමක් ලබා ගත්තාට පස්සේ ඒ වරප්‍රසාද, හිමිකම් කිසිදු සීමාවකින් තොරව ඉතා විශාල වශයෙන් වර්ධනය කරගෙන ජීවත් වුණු ස්වභාවයක් තමයි අපට දකින්නට ලැබුණේ. ඒ විතරක් නොවෙයි. ජනාධිපතිවරුන්ගේ හිමිකම් පනත යටතේ ගැනෙන කාරණා කිහිපයක් තමයි මේ පනත් කෙටුම්පතින් අහෝසි වෙන්නේ. විශ්‍රාමික ජනාධිපති ආර්යාව, හේමා ප්‍රේමදාස මැතිනිය වෙනුවෙන් පසුගිය අවුරුද්ද තුළත් ජනාධිපතිවරුන්ගේ හිමිකම් පනත යටතේ ගැනෙන කාරණා සඳහා රජය වැය බරක් දරලා තිබෙනවා, රුපියල් 2,685,790ක. විශ්‍රාමික ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට රුපියල් 11,664,348ක්, විශ්‍රාමික ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාට රුපියල් 54,652,990ක්, විශ්‍රාමික ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට රුපියල් 15,772,045ක්, විශ්‍රාමික ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට රුපියල් 10,281,354ක් සහ විශ්‍රාමික ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාට රුපියල් 3,492,309ක් වශයෙන් රුපියල් 98,548,839ක මුදලක් වැය කරලා තිබෙනවා මේ ජනාධිපතිවරුන්ගේ හිමිකම් පනත යටතේ ගැනෙන කාරණා වෙනුවෙන්, 2024 වර්ෂයට පමණක්.

අපට සිද්ධ වුණා මේ වරප්‍රසාද සීමාවක් සහිතව පවත්වාගෙන යනවාට වඩා මේ වරප්‍රසාද අහෝසි කරන්න. මේ දේශපාලන සංස්කෘතිය අනුව ඒක අවශ්‍යයි. ඒ හින්දා විපක්ෂයේ ඔබතුමන්ලාත් විශේෂයෙන් මේක අනුමත කරයි කියලා අපි විශ්වාස කරනවා. මොකද, අපි මේ රටේ ජනතාවට දේශපාලන ආදර්ශයක් දිය යුතුයි, නායකත්වයෙන් ආදර්ශ ලබා දිය යුතුයි. එවැනි කර්තව්‍යයක් තමයි මෙහිදී සිදු වෙන්නේ. එහෙම නැතිව මේ සභාවේ කියැවුණා වාගේ කිසිදු පළිගැනීමක් නැහැ. සියලු විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව කියන කාරණය මෙතැනට කිසිසේත්ම ගැනෙන කාරණයක් නොවෙයි. මීට පරිබාහිරව තිබෙන කාරණයක් තමයි විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව කියන කාරණය.

මේ සභාවේදී විශේෂයෙන් කියැවුණා අනාගත ජනාධිපතිවරයෙක් ගැන. එතුමන්ලා පිළිගන්නවා අනාගත ජනාධිපතිවරයාත් එන්නේ ජාතික ජන බලවේගයෙන් කියලා. මොකද, සජබයෙන්ම කියනවා අනාගත ජනාධිපතිවරයා ජාතික ජන බලවේගයේ අපේ මන්ත්‍රීවරයෙක්, නැත්නම් අපේ සභානායකතුමා කියලා. අපි සන්තෝෂ වෙනවා. ඉතින් එතුමන්ලාම පිළිගන්නවා සජිත් ප්‍රේමදාසට බැහැ කියලා. අපි නොවෙයි ඒක කියන්නේ. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

අර්ච්චුනා මන්ත්‍රීතුමාත් කියනවා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඔව්, අර්ච්චුනා මන්ත්‍රීතුමාත් කියනවා. උතුරෙනුත් කියනවා, දකුණෙනුත් කියනවා අනාගත ජනාධිපති ජාතික ජන බලවේගයේ අපේ සභානායකතුමා කියලා. ඉතින් අපි සන්තෝෂයි. *[බාධා කිරීමක්]* අර්ච්චුනා මන්ත්‍රීතුමා ඒක තහවුරු කරනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කිව්වේ නාමල් කියලා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, දීර්ඝ කාලයක් මේ රටේ ජනතාව බලාපොරොත්තු වූ සිහිනයක් මේක. අපි මේ රටේ ජනතාවත් එක්ක ඇති කර ගත්ත සමාජ සම්මුතියක් තමයි මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරනවා කියන එක. ඒ කාරණය අපි මේ වෙනකොට අවසන් කරලා තිබෙනවා. තවම අවුරුද්දයි ගත වෙලා තිබෙන්නේ, අවුරුද්දයි ගෙවිලා තිබෙන්නේ. අපි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් මේ සම්බන්ධව කථා කරලා තිබෙනවා. ඒ හින්දා කවුරුවත් කලබල වෙන්න අවශ්‍ය නැහැ. කවුරුවත් කලබල විය යුතු නැහැ. ඒකට හේතුව, මේ සිද්ධ කරන්නේ මේ ඉෂ්ට කරන්නේ මේ රටේ ජනයාගේ ජන පැතුමයි. නැත්නම් ජන වරමයි.

අපේ අධිකරණ ඇමතිතුමා පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් මේ සභාවේදී ප්‍රකාශ කළා යම් කෙනෙකුට ජීවත්වීමේ අමාරුවක් හෝ නිල නිවාස පිළිබඳ ගැටලුවක් ආවොත් ජනාධිපතිතුමාට ඉල්ලීමක් කළාම, ඒ පිළිබඳව සලකා බැලීමක් කරන්න කිසිදු බාධාවක් නැහැ කියලා.

එහෙම කිසිදු බාධාවක් නැහැ. හැබැයි, ඇති තරම් ධනය තිබෙන, ඇති තරම් නිවාස තිබෙන මේ විශ්‍රාමික ජනාධිපතිවරුන්ට ජනයාගේ මුදල් මේ විධියට භාවිත කිරීම වරප්‍රසාදයක් හැටියට ලබා දීම එතරම් සුදුසුයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. අපි දන්නවා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාගේ නිවසේ කලින් වාසය කළේ කවුද කියලා. ඒ, හිටපු විදේශ කටයුතු ඇමති ලක්ෂ්මන් කදිර්ගාමර් මැතිතුමා. ඊට පස්සේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. රටේ ආර්ථික අර්බුදයක් තිබෙන වෙලාවක මේ නිවස නවීකරණය කිරීම සඳහා මුදල් වෙන් කර ගත්තා. කොවිඩ් අර්බුදය නිසා ආර්ථික වශයෙන් රට අසීරුම අඩියක වැටිලා තිබුණු වෙලාවක මේ නිල නිවස නවීකරණය කර ගැනීම සඳහා රුපියල් 472,529,000ක් වෙන් කර ගත්තා. ඒ, රටේ ආර්ථික අර්බුදයක් තිබෙන අවස්ථාවක. ජනතාව දුකට, පීඩාවට පත් වෙලා තිබෙන වෙලාවක තමයි මේ රුපියල් කෝටි 47 වෙන් කර ගෙන තිබෙන්නේ. මිනිස්සු පෝලිම්වල සිටියදී, මිනිස්සු පෝලිම්වල මියැදෙද්දී, කන්න නැතිව සිටිද්දී, බොන්න නැතිව සිටිද්දී, අධි ආර්ථික පීඩාකාරී තත්ත්වයක සිටියදී, කොවිඩ් තත්ත්වය හේතුවෙන් තවත් අසීරු තත්ත්වයක සිටි අවස්ථාවක රුපියල් කෝටි 47ක් වෙන් කර ගෙන තිබුණා, තමන්ගේ මන්දිර ටික ඉදි කර ගන්න. තමන්ම තමයි Cabinet Paper එක දාලා තිබුණේ. 2021දී රුපියල් 252,100,000ක් වෙන් කර ගෙන තිබෙනවා. ඒ වාගේම 2022දී රුපියල් 181,500,000ක් වෙන් කර ගෙන තිබෙනවා. සම්පූර්ණ එකතුව රුපියල් මිලියන 472.5යි. රටේ ජනතාව දුක් විඳිද්දී මේ විධියට රටේ ජනතාවගේ මුදල් පරිහරණය කිරීම දේශපාලකයන්ට තවදුරටත් කරන්න ඉඩ දිය යුතුද කියන ප්‍රශ්නය තමයි අපි මේ රටේ ජනතාවගෙන් අහන්නේ, එහෙම නැත්නම් මේ ගරු සභාවෙන් අහන්නේ. එහෙම ඉඩ දෙන්න කිසිදු හැකියාවක් නැහැ. අපි මේ රටේ ජනතාවගේ හැම රුපියලකම ආරක්ෂාව සහතික කරන්න තමයි ජාතික ජන බලවේගය හැටියට බලය ගත්තේ. අපි ඒක කරමින් ඉන්නවා. ඒ පිළිබඳ කිසිදු ගැටලුවක් නැහැ. එහෙම කරන්න අවශ්‍යයි. ඒ නිසා මේ ගෙනෙන යෝජනාව එක පැත්තකින් මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමක් වෙනවා. මේ රටේ ජනතාව දුක් විඳිමින් සිටිද්දී; සනීපාරක්ෂක පහසුකම් පවා නැති අර ඈත ගම් පළාත්වල පාසල් දරුවන් ඒ විධියට දුක් විඳිමින් සිටිද්දී, මේ වාගේ යම් පිරිසක් අධි වරප්‍රසාද ලැබීම දේශපාලනයේ හොඳ තත්ත්වයක් නොවෙයි. ආදර්ශවත් දේශපාලකයන්ට ඒක ගැළපෙන්නේ නැහැ. ඒ නිසා විපක්ෂයේ සියලු දෙනා එකතු වෙලා මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න දායක වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව පොලිස් සේවාව සම්බන්ධයෙන් කාරණා කිහිපයකුත් විශේෂයෙන් මේ ගරු සභාවේ මතු වුණා. පොලිස් සේවාවේ උසස්වීම් සම්බන්ධයෙන් ඊයේ පෙරේදා මේ ගරු සභාවේදී කාරණා කිහිපයක් මතු කළා. පොලිස් උසස්වීම් නවදහසක් දෙන්න අපි සූදානම් කර තිබෙනවා. කිසිවෙකුට අසාධාරණයක් වෙන්නේ නැහැ. මෙතැන මතු වෙච්ච සමහර කාරණා සාවද්‍ය කාරණා. ඒ උසස්වීම් පොලිසිය වාගේම විශේෂ කාර්ය බලකායටත් අදාළයි. ඒවා සාධාරණව ලබා දෙන ක්‍රමවේදය ආරම්භ වෙලා තිබෙනවා. දැන් උසස්වීම් ලබා දෙන කටයුත්ත ආරම්භ වුණා. පසුගිය 159 වැනි පොලිස් දිනය පාදක කරගෙන එය ආරම්භ කර තිබෙනවා. මේ මාස දෙක ඇතුළත එම උසස්වීම් දීලා අවසන් කරනවා. ඒ නිසා අපි මේ රටේ ජනතාවට කියන්න ඕනෑ, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! අද දින ප්‍රධාන කටයුතු අවසන් වනතෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, අපි මේ රටේ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරලා, සියලුදෙනාට සාධාරණ සමාජයක් සාදා දීමේ වුවමනාවෙනුයි කටයුතු කරන්නේ. ජාතික ජන බලවේගය ආණ්ඩු බලය අරගෙන පසුගිය අවුරුද්ද තුළ ඒ සඳහා අවශ්‍ය ශක්තිමත්ම පදනම දමා තිබෙනවා. පැවති දේශපාලන සංස්කෘතිය වෙනස් කළා වාගේම නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමේ කාර්යයත් මීට සමගාමීව සිද්ධ වෙමින් පවතිනවා. ඊට සමගාමීව ජාතීන් අතර සමඟිය ගොඩනැඟීම පිළිබඳවත් අපි අවධානය යොමු කරලා තිබෙනවා. අපේ විදේශ කටයුතු අමාත්‍යතුමා ජිනීවා සමුළුවේදීත් මේ පිළිබඳව රජයේ ස්ථාවරය ප්‍රකාශයට පත් කළා.

අපේ ගරු අගමැතිතුමියත් සභාවේ ඉන්නවා. අධ්‍යාපනයේ නව වෙනස්කමක්, නව පරිවර්තනයක් වෙනුවෙන් අපි දැන් පදනම

[ගරු ආනන්ද විජේපාල මහතා]

දමාගෙන යනවා. 2026 වර්ෂය ඒ සඳහා වෙන් කරගෙන තිබෙනවා. ඒ අනුව අපි ජාතික ජන බලවේගය හැටියට මේ රටේ ජනතාවට ලබා දුන් බොහෝ පොරොන්දු ඉටු කරමින්, ජනතාවත් එක්ක ඇති කර ගත් සමාජ සම්මුතියත් එක්ක වසරක් සාර්ථකව අවසන් කරලා තිබෙනවා.

මේ පනත් කෙටුම්පත සම්මත කරන අද දවස සුවිශේෂ දිනයක් හැටියට හඳුන්වා දෙන්න අවශ්‍යයි. මොකද, අපි මේ අසම්පූර්ණ දේශපාලන සංස්කෘතිය සම්පූර්ණ කරනවා. අපි මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා තිබෙනවා. ඒ වෙනස මේ සමාජයට දැනිලා තිබෙනවා. ඒ වාගේම අපි අත්හරින බොහෝ වරප්‍රසාද මේ රටේ දුක් විඳින ජනතාවගේ අභිවෘද්ධිය, සුබ විහරණය වෙනුවෙන් වෙන් කරන්න තීන්දු කරලා තිබෙනවා. මේ වෙනකොට මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව, ජන පැතුම ඉෂ්ට වෙමින් තිබෙනවා. ඒ හේතුවෙන් මේ රටේ ජනතාව මේ වෙනකොට සතුටෙන් ඉන්නවාය කියන එක පිළිබඳව අපට විවාදයක් නැහැ. විපක්ෂය මොනවා කිව්වත්, විපක්ෂය අවස්ථාවාදීව, නැත්නම් සමහර වෙලාවට ද්වේෂ සහගතව අදහස් ප්‍රකාශ කළත්, මේ රටේ ජනතාව ඇත්ත -යථාර්ථය- තේරුම් අරගෙන කටයුතු කරනවාය කියන කාරණය අවසාන වශයෙන් කියමින්, මා කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම සභාව එකඟද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, බෙදීමක් ඉල්ලා සිටිනවා.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින්නේ නම් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

මගේ වම් අත පැත්තේ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවකු නොමැති බවයි පෙනී යන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 151; විරුද්ධව 01; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 151; எதிராக 01; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 151; Noes 01; Abstain 0.

G 001. K.V. Samantha Viddyarathna	Yes
G 002. Sunil Handunnetti	Yes
G 003. K.D. Lal Kantha	Yes
G 005. Nalinda Jayathissa	Yes
G 006. Bimal Rathnayake	Yes
G 007. Harini Amarasuriya	Yes
G 010. Wasantha Samarasinghe	Yes
G 011. A.H.M.H. Abayarathna	Yes
G 013. Anil Jayantha	Yes
G 014. Harshana Nanayakkara	Yes
G 015. Dammika Patabendi	Yes
G 016. Saroja Savithri Paulraj	Yes
G 017. Ananda Wijepala	Yes
G 019. Sunil Kumara Gamage	Yes
G 020. Kumara Jayakody	Yes
G 021. Rizvie Salih	Yes
G 022. Anura Karunathilaka	Yes
G 023. Upali Pannilage	Yes
G 024. Nihal Galappaththi	Yes
G 025. Nihal Abeysinghe	Yes
G 027. Wasantha Piyathissa	Yes
G 028. Gamagedara Dissanayake	Yes
G 029. R.M. Jayawardhana	Yes
G 030. Sunil Watagala	Yes
G 031. Rathna Gamage	Yes
G 032. Mahinda Jayasinghe	Yes
G 034. Eranga Gunasekara	Yes
G 035. Upali Samarasingha	Yes
G 036. T.B. Sarath	Yes
G 037. Nalin Hewage	Yes
G 038. Prasanna Gunasena	Yes
G 039. Anton Jayakody	Yes

G 040. Sundaralingam Pradeep	Yes
G 041. Hemali Weerasekara	Yes
G 042. Ruwan Ranasinghe	Yes
G 043. Muneer Mulaffer	Yes
G 044. Susil Ranasinghe	Yes
G 045. Hansaka Wijemuni	Yes
G 046. Eranga Weeraratne	Yes
G 047. Namal Sudarshana	Yes
G 048. P. Ruwan Senarath	Yes
G 049. Madhura Senevirathna	Yes
G 050. Arun Hemachandra	Yes
G 051. Janitha Ruwan Kodithuwakku	Yes
G 052. Aruna Jayasekera	Yes
G 053. Sugath Thilakaratne	Yes
G 054. Ashoka Ranwala	Yes
G 055. Lakshman Nipuna Arachchi	Yes
G 056. R.M. Gamini Rathnayake	Yes
G 057. Manjula Suraweera Arachchi	Yes
G 058. K. Ilankumaran	Yes
G 059. Shantha Pathma Kumara Subasingha	Yes
G 060. Ajith Agalakada	Yes
G 061. Gayan Janaka	Yes
G 062. Najith Indika	Yes
G 063. Lakmali Hemachandra	Yes
G 064. Samanmali Gunasingha	Yes
G 065. Sagarika Athauda	Yes
G 066. Roshan Akmeemana	Yes
G 067. U. P. Abeywickrama	Yes
G 068. L.M. Abeywickrama	Yes
G 069. M.K.M. Aslam	Yes
G 070. Kaushalya Ariyarathne	Yes
G 071. Asitha Niroshana Egoda Vithana	Yes
G 072. Arkam Ilyas	Yes
G 073. Oshani Umanga	Yes
G 074. Krishnan Kalaichelvi	Yes
G 075. Upul Kithsiri	Yes
G 076. Wasantha Pushpa Kumara	Yes
G 077. Chaminda Lalith Kumara	Yes
G 078. Sarath Kumara	Yes
G 079. Nilanthi Kottahachchi	Yes
G 080. M.A.C.S. Chathuri Gangani	Yes
G 081. Lasith Bhashana Gamage	Yes
G 082. Thilanka U. Gamage	Yes
G 083. Nilusha Lakmali Gamage	Yes
G 084. Ajantha Gammeddage	Yes
G 085. Ajith Gihan	Yes
G 086. Jagath Gunawardana	Yes
G 087. Aboobucker Athambawa	Yes
G 088. Ruwanthilaka Jayakody	Yes
G 089. Thushari Jayasingha	Yes
G 090. T.K. Jayasundara	Yes
G 091. Mayilvaganam Jegatheeswaran	Yes
G 092. Rajeevan Jeyachandramoorthy	Yes
G 093. Sellaththamby Thilaganathan	Yes
G 094. Anushka Thilakarathne	Yes
G 095. Chandana Thennakoon	Yes
G 096. Thanura Dissanayake	Yes
G 097. Sugath Wasantha de Silva	Yes
G 098. Dharmapriya Dissanayake	Yes
G 099. Sujeewa Dissanayake	Yes
G 100. Susantha Dodawatta	Yes
G 101. Susantha Kumara Nawarathna	Yes
G 102. Sena Nanayakkara	Yes
G 103. Aruna Panagoda	Yes
G 104. Nimal Palihena	Yes
G 105. Nishantha Perera	Yes
G 106. Stepni Fernando	Yes
G 108. Lal Premanath	Yes
G 109 Nanda Bandara	Yes
G 110. Padmasiri Bandara	Yes
G 111. Ravindra Bandara	Yes
G 112. Sudath Balagalla	Yes
G 114. E. M. Basnayaka	Yes
G 115. Wijesiri Basnayake	Yes
G 116. S. Sandaruwan Madarasinghe	Yes
O 016. Ramanathan Archchuna	Yes
O 054. Chamara Sampath Dasanayake	No
O 065. Prageeth Madhuranga	Yes
O 066. Jagath Manuwarna	Yes
O 067. Ruwan Mapalagama	Yes
O 068. Nandana Millagala	Yes
O 069. Riyas Farook	Yes
O 070. Danushka Ranganath	Yes
O 071. Sanjeewa Ranasingha	Yes
O 072. Sunil Rathnasiri	Yes
O 081. Manjula Sugath Rathnayaka	Yes
O 082. A.M.M.M. Rathwaththe	Yes
O 083. Manoj Rajapaksha	Yes
O 084. Sunil Rajapaksha	Yes
O 085. Hasara Liyanage	Yes
O 086. Deepthi Wasalage	Yes
O 087. Kanchana Welipitiya	Yes
O 088. R. G. Wijerathna	Yes
O 089. Nishantha Samaraweera	Yes
O 090. Priyantha Wijerathna	Yes
O 091. Ruwan Wijeweera	Yes
O 092. Darmapriya Wijesinghe	Yes
O 093. Hiruni Wijesinghe	Yes
O 094. Athula Welandagoda	Yes
O 095. Fasmin Sharif	Yes
O 096. Dinindu Saman	Yes
O 097. Thilina Samarakoon	Yes
O 098. Ambika Samivel	Yes
O 099. Dewananda Suraweera	Yes
O 100. Chandana Sooriyaarachchi	Yes
O 101. G.D. Sooriyabandara	Yes
O 102. Aravinda Senarath	Yes
O 103. Kitnan Selvaraj	Yes
O 104. Janaka Senarathna	Yes
O 105.Chandima Hettiaratchi	Yes
O 106. Champika Hettiarachchi	Yes
O 107. Dinesh Hemantha	Yes
O 108. Geetha Herath	Yes
O 109. Bhagya Sri Herath	Yes

O 110. Muhammad Faizal	Yes
O 111. Ashoka Gunasena	Yes
O 112. Nandana Pathmakumara	Yes
O 113. Sunil Biyanwila	Yes
O 114. Samantha Ranasingha	Yes
O 115. Nishantha Jayaweera	Yes

Electronic Voting Results:

Participants:

Present	152

Votes:

Yes	151
No	01
Abstain	0

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 151යි; විරුද්ධව ඡන්ද 01යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

ඒ අනුව, න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම වැඩි ඡන්ද 150කින්, එනම් බහුතර ඡන්දයෙන් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරියයුතු ය." - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]

தீர்மானிக்கப்பட்டது:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 4 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rohana Bandara, you have seven minutes.

වී සඳහා සාධාරණ සහතික මිලක්
நெல்லுக்கான நியாயமான நிர்ணய விலை
A FAIR GUARANTEED PRICE FOR PADDY

[අ.භා. 3.42]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "වර්තමාන රජය සිය රාජ්‍ය බලය ලබා ගැනීමේදී ගොවි ජනතාව වෙත දහසකුත් බලාපොරොත්තු හා පොරොන්දු ලබා දෙන ලදී. එයින් ඉතා වැදගත් පොරොොන්දුවක් වූයේ සාධාරණ සහතික මිලක් යටතේ ගොවීන්ගේ වී මිලදී ගැනීමයි.
>
> රජය ප්‍රකාශ කළ ආකාරයට සාධාරණ මිලක් යටතේ ගොවීන්ගේ වී මිලදී ගැනීමක් සිදු නොවන අතර, රජය විසින් පනවන ලද සහතික මිල ප්‍රමාණවත් නොවන හෙයින් සිය අස්වැන්න ලබා දිය නොහැකි බවට ගොවීන් විසින් මැසිවිලි නඟයි.
>
> වර්තමානයේ ගොවීන්ට මුහුණ දීමට සිදුව ඇති ගැටලු අතර නිසි වෙලාවට ගොවීන්ට පොහොර සහනාධාරය නොලැබීම, පොහොර මිල ඉහළ යෑම, වගා හානිවලට නිසි වේලාවට වන්දි නොලැබීම දැක්විය හැකිය. මේ හේතු නිසා ගොවීන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් රජය නිසි සොයා බැලීමක් සිදු නොකරන බව ගොවීන්ගේ චෝදනාවයි.
>
> එබැවින්, රජය විසින් සිය ප්‍රකාශවලින් දක්වා ඇති පරිදි, ගොවීන්ට නිසි සාධාරණ සහතික මිලක් වී වෙනුවෙන් ලබා දී, ගොවි ජනතාව මුහුණ දෙන ගැටලුව නිරාකරණය කළ යුතු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අද ඊයේ සිට පවතින ප්‍රශ්නයක් නොවෙයි. කාලාන්තරයක් තිස්සේ අපේ රටේ ප්‍රධාන ආහාර වේල වුණු බත සපයන වී ගොවිතැන වෙනුවෙන් ඉතිහාසය පුරාවටම සෑම රජයක්ම ඇළ වේලි හදන තැන ඉඳලා, ජලාශ හදන තැන ඉඳලා විශාල වශයෙන් මුදල් වෙන් කරමින් කටයුතු කරලා තිබෙනවා. හැබැයි, මේ ඔක්කෝම කරලා, පහසුකම් ටික සපයලා, පොහොර සහනාධාරය පවා ලබා දීලා රජය පැත්තෙන් විවිධ දේවල් ලබා දීම සිද්ධ කළා. පොහොර නොමිලයේ ලබා දුන් කාලයක් තිබුණා. ඒ සියල්ල ලබා දුන්නත්, අනෙක් පැත්තෙන් ගොවීන් මුහුණ දෙන තවත් ප්‍රශ්න තිබුණා. සමහර කාල වකවානුවල ඔවුන්ට නියඟයට මුහුණ දෙන්න සිදු වුණා. ඒ වාගේම සමහර කාල වකවානුවල අධික වර්ෂාවට මුහුණ දීලා ඔවුන්ගේ වී ගොවිතැන විනාශ වුණා. එසේ විනාශයට පත් වුණාම ගොවිතැනේ නියැළෙන ගොවීන්ට ස්ථාවර ආදායම් මාර්ගයක් ඇති වෙන්නේ නැහැ. මේ සියල්ල නිසා මේ ක්ෂේත්‍රය තුළ නියැළෙන, අපේ රටේ ප්‍රධාන ආහාර වේල සපයා දෙන ගොවීන් විශාල අපහසුතාවකට පත් වෙනවා.

"අපි පොහොර සහනාධාරය ලබා දෙනවා. අපි කුඹුරට නිකම් වතුර ටික ලබා දෙනවා. අපි අනෙකුත් පහසුකම් සියල්ලත් ලබා දෙනවා" කියලා හැම රජයක්ම කියනවා. අනික් පැත්තෙන්, ගොවීන්ට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නේ සහල් පාරිභෝගිකයෝ. එම නිසා, පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම කියන කාරණයට මැදි වුණාම ගොවියාට සාධාරණ මිලක් ලැබෙන්නේ නැහැ. හැබැයි, අපි විපක්ෂයේ ඉන්නකොට ඔබතුමන්ලාත් මේ සඳහා රුපියල් 54ක මිලක් ඉල්ලපු අවස්ථාවකුත් තිබෙනවා අප දැක්කා. නමුත්, රාජ්‍යකරණයට ඇවිල්ලා මේ දෙක කළමනාකරණය කරන්න ගියාම, ඒ කියන්නේ පාරිභෝගිකයායි, ගොවියායි කියන දෙදෙනාම ගළපන්න ගියාම ලැබෙන මිල තුළින් ගොවියාට සාධාරණත්වයක් අත්වෙන්නේ නැහැ, අක්කරයක් වගා කරන්න යන වියදම, අක්කරයකින් ලැබෙන අස්වැන්නත් එක්ක අරගෙන බැලුවාම. යල සහ මහ කියන කන්න දෙකම වැඩ කළත්,- ගොවියාට කොහොමත් වගා කරන්න වෙන්නේ කන්න දෙකයි. ඔවුන් මාස 6ක් යැපෙන්න ඕනෑ, කුඹුරක් වගා කරලා එන ආදායමෙන්. ඒ සඳහා යට කරන මුදලවත් ගොවීන්ට ආදායමක් විධියට නොලැබෙනවා නම් ඒ අයගේ අනෙකුත් ආදායම් මාර්ග බවට පත් වෙන්නේ මොනවාද? එම නිසා විශාල කැප කිරීම් කරමින්, අවිනිශ්චිතතාවක් තුළ ඉඳගෙන ගොවීන් අපට අස්වැන්න ලබා දෙන්න කටයුතු කරනවා. රජය වුණත් මේක අත්හැර දමන්නේ නැහැ නේ. ඔබතුමන්ලාත් ගිය වතාවේ ඒ වෙනුවෙන් සාධාරණ මුදලක් වෙන් කළේ නැහැ නේ. හැබැයි, පසුගිය මහ කන්නයේ වර්ෂාව හේතුවෙන් අස්වැන්න අඩු වුණු නිසා ගොවීන්ට වෙළෙඳ පොළ තුළදී ඉහළ මිලක් ලැබුණා. නමුත් සාමාන්‍යයෙන් යල කන්නයේ වගා කරන්නේත් අඩුවෙන්. යල කන්නයේ වැඩියෙන් වගා කරන්නේ නාඩු වී. නමුත්, නාඩු වී සඳහා සාධාරණ මිලක් ලැබුණේ නැහැ. ඔබතුමන්ලා රුපියල් 120ක් කියලා සහතික මිලක් නියම කරලා තිබුණා වාගේම ගබඩා ඇරලා, නිලධාරින් වෙන් කරලා, මුදල් වෙන් කරලා, ඒ සියලු කටයුතු ඔබතුමන්ලාගේ පැත්තෙන් සිදු කරලා තිබෙනවා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. හැබැයි, ගොවියා තමන්ගේ අස්වැන්න එතැනට ගේන්නේ නැත්තේ ඇයි? ගොවියා තම අස්වැන්න ගෙනාවේ නැති වුණාම, රුපියල් 90, රුපියල් 95 ඉඳලා රුපියල් 100 දක්වා වූ මිලකුත්, ඊට පස්සේ වේළුණු වී සඳහා රුපියල් 110, රුපියල් 112 ඉඳලා රුපියල් 120 දක්වා වූ මිලකුත් ඔබතුමන්ලා දීලා තිබෙනවා. පසුගිය දෙසැම්බර් මාසයේ - ඔබතුමන්ලා පත් වුණු මුල් කාලයේ - පොහොර සහනාධාරය පිළිබඳ විවාද ඇති වන හැම අවස්ථාවකදීම මම මතක් කළේ, "පොහොර සහනාධාරය දෙන්න කලින් ඔබතුමන්ලා වී මිලදී ගැනීම දෙසට අවධානය යොමු කරන්න" කියන කාරණයයි. හැබැයි, මම එහෙම කියපු වෙලාවේදීත් ඒක සිද්ධ වුණේ නැහැ; අදටත් සිදුවෙලා නැහැ. ඒ වාගේම තව මාසයකින් අපි නැවත මහ කන්නය පටන් ගන්නවා. එම නිසා ලබන අවුරුද්දේවත් ගොවීන්ට සාධාරණ මිලක් ලැබෙන ක්‍රමයක්, සාධාරණ වැඩ පිළිවෙළක් යටතේ ඇති වෙන්න ඕනෑ. අපි විවාද කරමින්, බැණ ගත්තාට වැඩක් නැහැ. අපි මොකක් හෝ කිව්වාම ඔබතුමන්ලා ඒවා වැරදි විධියට දකිනවා. මොකක් කිව්වත් වැඩක් නැහැ, සාධාරණ වැඩ පිළිවෙළක්, ක්‍රමවේදයක් නොමැතිව ඔබතුමන්ලා නියම කරන මිලවත් ගොවියාට ලැබෙන්නේ නැහැ.

අද තිබෙන ප්‍රධාන ප්‍රශ්නවලින් එකක් තමයි, "බූතයා" කියන harvester එකෙන් - මැෂින් එකෙන් - වී ටික නෙළපුවාම වීවල තෙත බර වැඩි වන එක. තෙත වී ටික අරගෙන ඔබතුමන්ලාට ගබඩා කරන්න බැහැ. ඒක අපි ප්‍රායෝගිකව දන්නා දෙයක්. එතකොට ඉඩ මදි වෙනවා, වී ටික විනාශ වෙනවා. ඒ නිසා වී ටික වේළා ගන්න ඕනෑ. නමුත්, වී ටික වේළා ගන්න අවශ්‍ය පහසුකම් ගොවීන්ට නැහැ. සමහර කාපට් පාරවල් ගත්තාම, මේ කාල වකවානුවලදී සමහර කට්ටිය ට්‍රැක්ටර්වලින් වී අරගෙන ගිහිල්ලා ඒ පාරවල්වල වේළනවා. වී වේළාගෙන ගබඩාවට ගෙනාවාම ගබඩාවෙන් ඒවා භාර ගන්න නිසි වෙලාවට කට්ටිය ඉන්නවාද? අනෙක් පැත්තෙන්, එතැනට ආවාම නාට්ටාමිලා නැහැ. එතකොට නාට්ටාමිලා එක්කගෙන එන්නත් ඕනෑ. ගොවි මහත්වරුන්ට ඒ සඳහාත් විශාල පිරිවැයක් දරන්න සිද්ධවෙලා තිබෙනවා.

ඒ නිසා ගොවි මහත්වරු ඊට වඩා රුපියල් අටක්, දහයක් මිල අඩුවට විකුණන්න යොමු වෙලා තිබෙනවා. රජය මැදිහත් වෙන්නේ නැහැ කියා අපි කියන්නේ නැහැ. රජයේ මැදිහත් වීමක් තිබෙනවා. හැබැයි, රජයේ මැදිහත්වීම සාධාරණ නැහැ; ප්‍රායෝගික නැහැ. ඒ නිසා ඔබතුමන්ලා ගොවියාට සාධාරණ මිලක් ලබා දෙන්න. මීට එහා ගිය මේ කියන ප්‍රායෝගික ගැටලු ටිකත් අපි හඳුනාගෙන කටයුතු කරන්න ඕනෑ. ගරු ඇමතිතුමන්ලා

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

දෙපළම සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කාලයේ මේ පිළිබඳව විශාල උනන්දුවකින් කථා කළා. ඔබතුමන්ලා අද රාජ්‍යකරණයේ ඉන්නවා. ඒ නිසා වී සඳහා සාධාරණ මිලක් ලබා දෙන්න. එක්කෝ, මිල වැඩි කර දෙන්න. අපි දැක්කා, යහ පාලන රජය 2015දී බලයට ඇවිල්ලා වී සඳහා හොඳ මිලක් ලැබුණාම ඒවා ගබඩා කර ගන්න ගබඩාවල ඉඩ මදි වුණා. ඒ තරමට ගොවීන් වී ලබා දුන්නා. ගොවීන්ට තමන්ගේ මහන්සියට සාධාරණ මිලක් ලැබෙනවා නම්, ඒ ස්ථානවලට ගෙන යන්න යන පිරිවැයටත් එක්ක සාධාරණ මිලක් ලැබෙනවා නම් ගොවීන් ඒ ස්ථානවලට වී ගෙන යන්න උනන්දු වෙනවා. නමුත් අද තිබෙන මිලත් එක්ක ගොවීන් ඒ තැන්වලට වී ගෙන යන්න උනන්දු වෙන්නේ නැහැ. ඊට වැඩිය රුපියල් කිහිපයක් අඩුවෙන් එළියෙදි විකුණන්න පෙලඹෙනවා. අපි කියන්නේ රජයක් විධියට ඒ සියල්ලම ආරක්ෂා කළ යුතුයි කියන එකයි. අපි සහළින් ස්වයංපෝෂිත රටක්. අපි සහළින් ස්වයංපෝෂිත කළ හැකි රටක්. අපි විවිධ කාලගුණ, දේශගුණික කාරණාවලට ලක් නොවුණොත් අපට අපේ ප්‍රධාන ආහාර වේල සපයා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා වගා කිරීම සඳහා ගොවීන් උනන්දු කරවීමට රටක් විධියට අපි කටයුතු කළ යුතුව තිබෙනවා. විපක්ෂයට, ආණ්ඩු පක්ෂයට මේ ප්‍රශ්නය දේශපාලනය කර ගන්න ඕනෑ නැහැ.

ඔබතුමන්ලා වී මිලදී ගන්න මුදල් වෙන් කරනවා. ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒ වෙනුවෙන් ගබඩා සංකීර්ණ තිබෙනවා. හැම දෙයක්ම තිබෙනවා. ඒ නිසා නියම කරන මිල, එක්කෝ ගොවියාට ඒ ස්ථානවලට ගෙනෙන්න පුළුවන් විධියේ සාධාරණ මිලක් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් රාජ්‍ය ආයතන මීට වඩා පහළට ඇවිල්ලා කුඹුරේදීම වී මිලදී ගන්නා තැනට යොමු කරන තැනට ගෙනෙන්න ඕනෑ. ඒක සාකච්ඡා කරලා විසඳන්න ඕනෑ. රජයට අරගෙන ගිහිල්ලා තෙත වී ගබඩා කරන්න බැහැ. අපේ ගොවීන් හුඟාක් අයට "බූතයා" මැෂින් එකේ කුලිය ගෙවා ගන්නත් අතේ සල්ලි නැහැ. ඒ නිසා නියත වශයෙන්ම තෙළපු ගමන් වී ටිකක් විකුණා ගන්න වෙනවා. එහෙම නම් ඒකට අත්තිකාරමක් ගෙවන්න පුළුවන්. මේ සඳහා නිසි සැලැස්මක් එක්ක මොකක් හරි ක්‍රමවේදයක් සහිතව අවංකවම මැදිහත් වෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
වැඩෙන් බේරෙන්න කියලා කටයුතු කරනවා වෙනුවට, නිසි ක්‍රමවේදයක් එක්ක ඒ කටයුතු සඳහා අවධානය යොමු කළොත් අපට ඒ ඉලක්කය සපුරා ගන්න පුළුවන්. ගොවියාට සාධාරණයක් ඉෂ්ට කරනවා වාගේම පාරිභෝගිකයාටත් සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. මිල ඉහළ යන කාලවකවානු තිබෙනවා. ලබන මාසයේ ඉඳලා අපේ රටේ හාල් මිල ඉහළ යනවා. එහෙමත් නොවී පාරිභෝගිකයා ආරක්ෂා කරන තැනට අපට යන්න පුළුවන්. උද්ධච්චකමට "අපි තමයි වැඩ්ඩෝ" කියලා හිතන්නේ නැතුව ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු හඳුනා ගෙන රටක් විධියට අපි කටයුතු කරමු කියන කාරණය යෝජනා කරමින්, ගොවියාට වී සඳහා සාධාරණ මිලක් ලබා දීමට අපි සියලු දෙනා කැප වෙමු කියන කාරණය යෝජනා කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Leader of the Opposition to second the Adjournment Motion. You have an allocation of seven minutes.

[අ.භා. 3.51]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහණ බණ්ඩාර මැතිතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරපු යෝජනාව මා ස්ථිර කරනවා. විශේෂයෙන්ම කෘෂි කර්මාන්තයේ වී වගාව කේන්ද්‍රීයව අද මේ විවාදය පවත්වන මොහොතේ මම කැමැතියි, ඒ ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු පිළිබඳව කථා කරන්න මේ අවස්ථාව උපයෝගී කර ගන්න. ඒ ගැටලුවලට අදාළ විසඳුම සෙවීම සියලුදෙනාගේම යුතුකමක්. අපි පුළුවන් තරම් උත්සාහ දරනවා ඒ විසඳුමත් ප්‍රකාශයට පත් කර, ඒ විසඳුම් ලබා දීමේ ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යභාරය ඉෂ්ට කරන පවතින රජයට ඒ විසඳුම් ලබා දෙන්න උනන්දු කරවන්න; පොලඹවන්න.

ඇත්ත වශයෙන්ම මේ මොහොත වනවිට අපි හිතන්නට ඕනෑ වී වගාවේ ඵලදායීත්වය අඩු වෙන්නට හේතුව මොකක්ද කියලා. පසුගිය කාලයේ අපේ රටේ වී නිෂ්පාදනය, ඒ වාගේම කෘෂි කර්මාන්තය ඉහළ මට්ටමක තිබෙන කොට පොහොර තහනමක් ආවා. රසායනික යෙදවුම්වල තහනමක් ආවා. වී නිෂ්පාදනය ගත්තොත්, සියයට 34ක පහළ වැටීමක් සිදු වුණා. පොහොර භාවිතය සියයට 35ක නිර්දේශ වූ ප්‍රමාණයට වැඩිය අඩුවෙන් තමයි අදටත් පවතින්නේ. ඒක නිසා විශේෂයෙන්ම රජයට වගකීමක් තිබෙනවා, ඊළඟ කන්න කිහිපයේදී ඒ නිර්දේශිත ප්‍රමාණය වගාවට යෙදවීමට වී ගොවියා උනන්දු කරවන්නට; එවැනි තත්ත්වයක් බිහි කරන්නට. සරල වචනයෙන් කියනවා නම්, ඒකට අවශ්‍ය මූල්‍ය ශක්තිය ලබා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම ඒ ව්‍යාප්ති සේවාවන් හරහා ඒක හරියාකාරව සිදු වනවාද නැද්ද කියන එක සොයා බලන්නට ඕනෑ.

ඒ වාගේම සහතික මිල ප්‍රශ්නය. අපට ඇහුණා, වී කිලෝවක් සඳහා රුපියල් 120ක සහතික මිලක් ලබා දෙනවාය කියලා. අපි සත්‍ය කථා කළොත්, මෙය සහතික මිල ලබා දීමක් නොවෙයි, සහතික මිල පාලනය කිරීමක් ඒ සිද්ධ වෙන්නේ. මොකද, කවදාවත් කිසිම ආණ්ඩුවක් සම්පූර්ණ අස්වැන්න මිලදී ගන්නේ නැහැ. අස්වැන්න මිලදී ගන්නේ යම්කිසි ප්‍රතිශතාත්මක ප්‍රමාණයක්, මිලක් පාලනය කරන්න, ගොවියාට ස්ථාවර මිලක් ලබා දෙන්න. අපි අහලා තිබෙනවා, මේ ස්ථාවර මිල රුපියල් 120 නොවෙයි, රුපියල් 140, 150 විය යුතුයි කියලා රජය නියෝජනය කරන මැති-ඇමතිවරු කුඹුරටම ගිහිල්ලා ඒ ප්‍රකාශ කළා. මම අහලා තිබෙනවා, ගොයම් කකාත් ඒ ප්‍රකාශ කළා කියලා. එතකොට කෝ ඒ සහතික මිල? පාර්ලිමේන්තු අණ පනත් හරහා මේ සහතික මිල රටේ නීතිය බවට පත් කරනවා කිව්වා. නමුත්, ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

හැම දාම කියන දේ තමයි, යන පිරිවැය -වියදම- සුළු ප්‍රමාණයක්, රුපියල් 120ට දුන්නාම ප්‍රමාණවත් ලාභයක් ගොවියාට ලැබෙනවාලු. ඒක වැරදියි. බීජ, යෙදවුම්, පොහොර, තෙල් පෙ◌ාහොර, උපකරණ මිල සහ ඒ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ ක්‍රියාකාරකම්වලදී ඇත්ත වශයෙන්ම අද ගොවියාට

සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ. ඒ නිසා කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන් ශක්තිමත් කරන්නට යම් කිසි පැහැදිලි වැඩ පිළිවෙළක් අවශ්‍යයි, ඒකාධිකාරය බිඳ වට්ටන්නට. ඒ දේ සිදු කරන්නට ඕනෑ. අද කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන් බොහොම අමාරුවක වැටිලා ඉන්නවා. ඔවුන් බරපතළ මූල්‍ය අර්බුදයක සිටින්නේ. එම නිසා ඒ අයට ඒ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා මූල්‍ය ශක්තිය ලබා දෙන්නට රජය විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ වාගේම වී, සහල් අගය දාමයේ - value chain එකේ - ප්‍රධාන ක්‍රියාකරුවන් නිසි කළමනාකරණයට ලක් කරන්නට ඕනෑ. ඒ වාගේම වේළීමේ වැඩ පිළිවෙළක් - dryer system එකක් - ක්‍රියාත්මක කරන්නට පැහැදිලි වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

ඒ වාගේම වී වගාව සඳහා අවශ්‍ය බීජ වීවල ලොකු හිඟයක් තිබෙනවා. සහතික බීජ වීවල. අපි දන්නවා, රාජ්‍ය සහ පෞද්ගලික අංශය සපයන්නේ සියයට 16යි කියලා. අපි මේ ගණන සියයට 25 දක්වා ඉහළ නංවන ඉලක්කයකට යන්නට ඕනෑ. ඒ වාගේම හොඳ ප්‍රභේද බිහි කිරීමේ වැඩසටහනකට අපි යොමු වෙන්න ඕනෑ. අපේ මන්දගාමීත්වයක් තිබෙනවා, නවීන තාක්ෂණය යොදා ගෙන කෘෂි කර්මාන්තය ඉහළ නංවන්න. ඩ්‍රෝන තාක්ෂණය ඇතුළු නවීන තාක්ෂණ ක්‍රම උපයෝගී කරගෙන කෘෂි කර්මාන්තය ඉහළ නංවලා, විශේෂයෙන්ම නෙදර්ලන්තය වාගේ අපනයන ක්ෂේත්‍රයේ ඉහළම තලයකට එන්නට පුළුවන් ඉලක්කයකට යන්න ජාතික වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. පොහොර සහනාධාරය ප්‍රමාණවත් ද, කලට වේලාවට ලැබෙනවාද? යූරියා, MOP, TSP සියල්ලටම වාගේම කෘෂි රසායනවලට අවශ්‍ය මූල්‍ය ශක්තිය ගොවි ජනතාවට ලැබෙනවාද? අපි ඇත්ත කථා කළොත්, ඇත්ත වශයෙන්ම ලබා දෙන මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් වන්නේ නැහැ.

ඊළඟ කාරණය තමයි දූර්වල ගබඩාකරණය. මෙට්‍රික්ටොන් 350,000ක ගබඩා පහසුකම් තිබුණත් අපි උත්සාහ දරන්නට ඕනෑ, මහා පරිමාණයේ මෝල් හිමියන් යොමු වුණු ආකාරයටම රාජ්‍ය ක්ෂේත්‍රය තුළත් silo ක්‍රමයක් නිර්මාණය කරන්නට කටයුතු කරන්න.

ඒ වාගේම, අපේ රටේ කෘෂි කර්මාන්තයේ -වී වගාව ඇතුළු භෝග වගාවේ- නියැළෙන බොහෝ දෙනා මුහුණ දෙන වන අලි-මිනිස් ගැටලුවට අදටත් තිරසර විසඳුමක් නැහැ. අද මිනිස් සම්පතත් විනාශ වෙනවා, වන සම්පතත් විනාශ වෙනවා. පැහැදිලි වගා ආරක්ෂණ වැඩ පිළිවෙළක් නැහැ. අද ජීවිත හානි සිදු වුණාම ප්‍රමාණවත් වන්දි ලබා දෙන වැඩසටහනක් නැහැ; දේපළ හානිවලට වන්දි ලබා දෙන ක්‍රමවත් වැඩ පිළිවෙළක් නැහැ. මෙවන් තත්ත්වයක් තුළ ගොවියා ඇත්ත වශයෙන්ම දුකට පත් වෙලා සිටිනවා.

අවසාන වශයෙන් මම යෝජනා කරනවා, වී ගොවිතැන ඇතුළු සමස්ත කෘෂි කර්මාන්තය තුළ, කෘෂි කර්මාන්ත චක්‍රය තුළ, එනම් විවිධ අවස්ථාවලදී බීජ ලබා දීමේ සිට, යෙදවුම්වල සිට, නිෂ්පාදනයේ සිට අළෙවිය දක්වා වන චක්‍රය තුළ වඩාත් සැලසුම් සහගත වැඩ පිළිවෙළක්, ජාතික වගා සැලැස්මක් -ජාතික කෘෂිකාර්මික සැලැස්මක්- ක්‍රියාත්මක කළ යුතුය කියා. එය සිදු කිරීම ඉතාම වැදගත්. වී වගාව ගැන විතරක් නොවෙයි මම මේ කියන්නේ; සමස්ත වගාව ගැනයි කියන්නේ. අපේ රටේ සහල් නිෂ්පාදනය මෙට්‍රික්ටොන් මිලියන 2.8 යි. වාර්ෂික සහල් අවශ්‍යතාව මෙට්‍රික්ටොන් මිලියන 2.4 යි. අතිරික්තයක් ද තිබෙනවා. අතිරික්තයක් තිබෙන රටක අපි අදටත් සහල් ආනයනය කරනවා.

මේක ජාතික ඛේදවාචකයක්. ඒ නිසා විශේෂයෙන්ම රජයේ ප්‍රතිපත්ති මාලාව තුළ ඔබතුමන්ලා නිර්මාණය කරනවා කියපු ඒ ජාතික කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වචනයට පමණක්, කොළ කැබැල්ලකට පමණක්, කථාවට පමණක්, නිවේදනවලට පමණක් සීමා කරන්නේ නැතිව, ඒ කියපු දේ මහ පොළොවේ සත්‍යයක්, යථාර්ථයක් බවට පත් කිරීමට ඔබතුමන්ලා කටයුතු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sajith Premadasa, your allotted time has been exhausted.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

I will wind up, Sir.

එසේ කරන තෙක් මේ රටේ දසලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාව වෙනුවෙන්, ඒ අයගේ අයිතිය සුරක්ෂා කරන්න අප පෙනී සිටිනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. K.D. Lal Kantha. You have 15 minutes.

[අ.භා. 4.01]

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීම නිසා මේ මොහොතේ කෘෂි කර්මාන්තයේ නිරත ගොවි ජනතාවගේ පොහොර ගැටලුව, නිෂ්පාදන වියදම සහ ගොවීන්ට අදාළ අනෙකුත් කාරණා ප්‍රමාණයක් පිළිබඳව සත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම පළමුවෙන්ම සතුටු වෙනවා. ඒ වාගේම, කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල සිටින අපේ මහජන මන්ත්‍රීවරුන් විශාල පිරිසක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන නිසා බොහෝ දෙනෙක් බලාපොරොත්තුවෙන් ඉන්නවා පොඩි වෙලාවක් හෝ මේ කාරණය සම්බන්ධයෙන් කථා කරන්න. ඒ නිසා මම මේ ගැන වැඩි වෙලාවක් කරුණු කියන්න යන්නේ නැහැ. ඒ, වැඩි දෙනෙකුට අවස්ථාව ලබා දෙන්න අපට අවශ්‍ය නිසා.

ජාතික වශයෙන් මුළු කෘෂි කර්මාන්තයම දියුණු කිරීමේ කථාව පැත්තකින් තබා යෝජනාවේ අන්තර්ගත නිශ්චිත කරුණුවලට මා එන්නම්. මොකද, ඒ සමස්ත කථාව යනු වෙනම විවාදයක් කළ යුතු ලොකු කථාවක්. රජය වී මිල දී ගැනීමට සම්බන්ධ වෙනවා, ක්‍රම දෙකකට. වී අළෙවි මණ්ඩලය මඟින් එයට සම්බන්ධ වීම, එකක්. වී අලෙවි මණ්ඩලය තවමත් ඒ කටයුත්තට අවශ්‍ය ප්‍රමාණයට සම්බන්ධ වෙන්නේ නැහැ කියන එකත් අපි පිළිගන්නවා. වී අලෙවි මණ්ඩලය තවමත් ඒ තැනට ගිහින් නැහැ. ඒක ඇත්ත.

2024-2025 මාස් කන්නය ගත්තොත්, වී අලෙවි මණ්ඩලය ඒ කටයුත්ත ක්‍රියාත්මක කිරීම ආරම්භ කළා. නමුත්, වී අලෙවි මණ්ඩලයට දැවැන්ත කාර්යයක් කරන්න අවස්ථාවක් හම්බ වුණේ නැහැ. හැබැයි, 2025 යල කන්නය දැන් අවසන් වෙමින්

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

තිබෙනවා. වී අලෙවි මණ්ඩලය 2024-2025 මාස් කන්නයට වඩා මේ යල කන්නයේදී සාර්ථක මැදිහත්වීමක් කරමින් තිබෙනවා. වෙනදාට වඩා වී මිල දී ගැනීමකුත් සිදු කරනවා. එක පැත්තකින්, ඒ විධියට මැදිහත්වීමක් තිබෙනවා. අනෙක් පැත්තෙන්, වී මිල දී ගෙන ගබඩා කරන අය සහ වී මෝල් හිමියන්ට බැංකු හරහා ණය ලබා දීමෙන් රජය මැදිහත්වීමක් කරනවා. ඔඩපණ ණය ක්‍රමය ගැන කවුරුත් දන්නවා. ඒ ණය ක්‍රමය පිළිබඳ පැහැදිලි කරන්න අවශ්‍ය නැහැ. මා හිතන විධියට, ඒ ගැන කවුරුත් දන්නවා. ඒ ක්‍රමයට මැදිහත්වීමක් තිබෙනවා. ඔය ක්‍රම දෙකෙන් තමයි රජය දැනට වී මිල දී ගැනීමට සහ වී මිල තීරණය කිරීමට දායක වන්නේ. විශේෂයෙන් වී මිල තීරණය කිරීමට රජය දායක වන ක්‍රමයක් තිබෙනවා. දැන් වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 150ට, 160ට, 170ට මිල දී ගන්න කියලා කියපු අය ඉන්නවා. ඒක ඇත්ත. ඒක සහතික මිලක්වත්, ස්ථිර මිලක්වත් නොවෙයි. එක එක අවධියේදී වී කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කරන්න යන පිරිවැයට අනුව තමයි වී කිලෝග්‍රෑම් එකක මිල තීරණය කරලා කියන්නේ. අපි විපක්ෂයේ හිටපු ඒ කාලයේ වී කිලෝග්‍රෑම් එකක මිල මෙච්චරයි කියලා කිව්වා නම්, වී කිලෝග්‍රෑම් එකකට දෙන්න ඕනෑ මිල රුපියල් 150යි කියලා කිව්වා නම්, එහෙම කිව්වේ එදා පැවැති පිරිවැයට අනුවයි. එහෙම නැතිව වෙන මොකක් හරි නිසා නොවෙයි. ඒ මිල හැමදාම තිබෙන්න ඕනෑ වාගේ තමයි විපක්ෂය කථා කරන්නේ. එහෙම එකක් නැහැ. පිරිවැයත් එක්කයි මිල ගණනය කරන්නේ.

ඇත්තටම අපේ මූලික අවධානය යොමු වෙලා තිබෙන්නේ හෙක්ටෙයාරයකින් නිෂ්පාදනය කර ගන්නා වී ප්‍රමාණය වැඩි කර ගන්නයි. ප්‍රමාණය වැඩි කරගන්න, වැඩි කරගන්න අප දැනට වී කිලෝග්‍රෑම් එකකට නිර්දේශ කරන මිලටත් වඩා මිල අඩු වෙන්නත් පුළුවන්. මොකද, පිරිවැය සහ නිෂ්පාදනය කියන එක සම්බන්ධයෙන් ගණනය කරලා නේ වී මිල කියන්නේ. දැනට වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 120යි කියලා තිබුණාට එය ස්ථිර මිලක් නොවෙයි. ගිය මාස් කන්නයේදීත් වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 120යි. උදාහරණයකට අපි නාඩු වී ගනිමු. අපි නාඩු වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 120ට ගත්තේ. ගිය මාස් කන්නයට වඩා මේ පාර පිරිවැයත් වැඩි වෙලා නැති නිසා -සමහර ප්‍රදේශවල පිරිවැය ටිකක් අඩු වෙලාත් තිබෙනවා- තමයි මේ පාර වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 120යි කියලා තිබෙන්නේ. එහෙම නැතිව වෙන මොකවත් හින්දා නොවෙයි. යල කන්නයේදී වී කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කරන්න යන පිරිවැය වැඩි වුණා නම් වී කිලෝග්‍රෑම් එක රුපියල් 120 නොවෙයි, රුපියල් 130ක් වෙන්න තිබුණා; එහෙම නැත්නම්, රුපියල් 140ක් වෙන්න තිබුණා. වී කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 120යි කියලා කියන්නේම පිරිවැය අනුවයි. ඒ නිසා වී කිලෝග්‍රෑම් එකකට රුපියල් 120 කියන මිල ගොවීන්ට ඉතාම සාධාරණ මිලක්. ඔබතුමන්ලා විරුද්ධ නම් ඒකත් කියන්න. අපි ඒ ගැන අලුතින් කථා කරලා බලමු. ඒකට ප්‍රශ්නයක් නැහැ. නමුත්, දැනට හදාගත්ත සූත්‍රයක් තිබෙනවා. ඒ සූත්‍රය තමයි, වී කිලෝග්‍රෑම් එකක් හදන්න යන නිෂ්පාදන පිරිවැය බලා මිල තීරණය කිරීම. අපි හිතමු, වී කිලෝග්‍රෑම් එකක් හදන්න රුපියල් 100ක නිෂ්පාදන පිරිවැයක් ගියා කියලා. වී මිල තීරණය කිරීමේදී ඒකට රුපියල් 30ක් තව එකතු කරනවා. නමුත්, මේ කන්නයේදී වී කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රුපියල් 100ක් වෙලා නැහැ. ඒ නිසා තමයි, වී කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 120හිම තිබෙන්නේ. ඒ ලාභ පංගුව මදි නම්, ඒක වෙනම සාකච්ඡාවක්. සියයට 30ක මුදලක් ලාභය විධියට එකතු කරන එක වැරැදියි කියලා කවුරු හරි කියනවා නම්, ඒක සියයට 40ක් වෙන්න ඕනෑ; සියයට 50ක් වෙන්න ඕනෑ කියලා කියනවා නම් -ඒ සූත්‍රය වැරැදියි කියනවා නම්- ඒක වෙනම කථාවක්. තිබෙන මොකක් හරි ක්‍රමවේදයකට අනුව තමයි වී කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 120යි කියලා ප්‍රකාශ කරලා තිබෙන්නේ. ගිය මාස් කන්නය ගත්තොත්, ගොවියාට ප්‍රශ්නයක් වුණේ නැහැ. ඒක කවුරුත් දන්නවා. ඒක කවුරුවත් වහන්න යන්න එපා. එතකොට තමන් කියන එක පවයක් වෙනවා නේ, පාර්ලිමේන්තුව ඇතුළේ. ඕනෑ නම් ඒක පිටදී කියාගන්න. ඒකට කමක් නැහැ. හැබැයි, මේක ඇතුළේ තමයි එවැනි කථා වැඩිපුර කියන්නේ; එළියේ නොවෙයි. ගිය මාස් කන්නයේ ගොවි ජනතාවට ප්‍රශ්නයක් වුණේ නැහැ. නමුත්, මෙවර යල කන්නයේ ගොවීන්ට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒක ඇත්ත. අපි ඒක පිළිගන්නවා.

රුපියල් 120යි කියලා වී අලෙවි මණ්ඩලය වී මිලදී ගත්තත්, වී අලෙවි මණ්ඩලය ආසන්නයේ නැති ඈත ප්‍රදේශවල අයට තවම වී අලෙවි මණ්ඩලයටම වී ගෙනැල්ලා දෙන්න බැරි නිසාත්, වී අලෙවි මණ්ඩලයට නියමිත ප්‍රමිතිය තිබෙන වී මිලදී ගැනීම සඳහා වන අවශ්‍ය පහසුකම් තවම සම්පූර්ණ කරලා නැති නිසාත්,- ඇත්තම කියනවා නම් dryers නැහැ වී අලෙවි මණ්ඩලයට. ඒ නිසා ප්‍රමිතිගත වී විතරයි ගන්නේ. ඇත්ත, හුතයාගෙන් කපලා ගත්තාට පස්සේ තෙත වී තමයි තිබෙන්නේ. එතකොට පෞද්ගලික අංශයයෙන් ගිහිල්ලා මේ පාර වී ගත්තොත් රුපියල් 120ට වඩා අඩුවෙන් තමයි ගන්නේ. ඒක අපි පිළිගන්නවා. ගියපාර වැඩි ගානට ගත්තා. ඒ නිසා ගියපාර ගොවියාට ප්‍රශ්නයක් වුණේ නැහැ. මේ පාර මිලේ යම් පහත වැටීමක් තිබෙනවා. නමුත්, අපට තිබෙන සංඛ්‍යාලේඛන, දත්ත මත තමයි අපි කථා කරන්නේ. පිරිවැයට අනුව යන මිල බැලුවාම ගොවියාට බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා කියනවා. බරපතළ ප්‍රශ්නයක් වෙලා නම් මේ වෙනකොට ගොවියෝ ඉන්නේ පාරේ. එහෙම නම් ගොවියෝ දැනුත් ඉන්නේ පාරේ. එහෙම නම් මේ වෙනකොට වී ගොවියෝ ඉන්න ඕනෑ මහ පාරේ අරගළවල, උද්ඝෝෂණවල. එහෙම එකක් රටේ නැහැ. එහෙම එකක් නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, මේ පාර්ලිමේන්තුවේ ගොවි නායකයෝ ගොඩක් ඉන්නවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔය ඉන්නේ.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගොවි නායකයෝ ගොඩක් ඉන්නවා, පාර්ලිමේන්තුවේ. *[බාධා කිරීමක්]* ඒගොල්ලෝ කරුණු කියයි. වී අලෙවි මණ්ඩලයත් විනාශ කරලා,-

මෙතැන මගේ වයසේ අය ඉන්නවා ඇති. අපි පොඩි කාලයේ පාරට බැස්සාම වී.අ.ම. කියලා ගහපු ලොරි කොච්චර ගියාද පාරේ? වී.අ.ම කියන අකුරු තුන ගහපු ලොරි පාරේ කොච්චර ගියා ද? අද එක ලොරියක් තවම නැහැ නේ. දැන් එක ලොරියයි තිබෙන්නේ. ඒක වෙනම දෙයක්. ඒ නිසා අපි පිළිගන්නවා, ඒක දියුණු කරන්න ඕනෑ කියලා. අපි ඒක දියුණු කරන වැඩ සටහනක තමයි ඉන්නේ. රජය ප්‍රමාණවත් වී තොගයක් රැස් කරගන්න ඕනෑ කියන ස්ථාවරයේ ඉන්නවා.

ගොවියා තවම දුප්පත්. ඒ දුප්පත්කමින් ගොවියා ගොඩ ගැනීම අරමුණු කරගෙන ඒකට ඕනෑ කරන සැලැස්මක තමයි අපි වැඩ කරමින් යන්නේ. ඒ නිසා අපි ගොවියාගේ ප්‍රශ්න ඉක්මනින් විසඳන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළක යනවා. දැනටත් ගොවියාට ප්‍රශ්න තිබෙනවා.

ඊළඟට, මේ යෝජනාවේ තිබෙනවා, පොහොර සහනාධාරය වෙලාවට හම්බ වෙන්නේ නැහැ කියලා. ඇත්තටම පොහොර

සහනාධාරය අති බහුතරයකට වෙලාවට හම්බ වෙනවා. මුදල් දෙන නිසා ඒගොල්ලන්ට මේක කළමනාකරණය කර ගන්නත් පුළුවන්. පොහොර දෙනවා නම් එහෙම කළමනාකරණය කර ගන්න බැහැ. ඒ ගහට පොහොර දෙන්න ඕනෑ වෙලාවේ නියමිත ප්‍රමාණය දෙන්නම වෙනවා නේ. පොහොර තිබෙන්නේ විවෘත වෙළඳ පොළේ. ඒගොල්ලන්ගේ මොකක් හරි ගිණුමක තිබෙන ප්‍රශ්නයක් නිසා, ඉලක්කමක් එහේ මෙහේ වෙච්ච නිසා වෙලාවට දීගන්න බැරි වුණත් මුදල ලැබෙන නිසා එයාට පුළුවන් ඒක යම් කළමනාකරණයක් කර ගන්න, වෙළඳ පොළෙන් පොහොර ගන්න නිසා. නමුත්, ගොවියාගේ ප්‍රශ්න තවම විසඳිලා නැහැ. අපි ඒවා විසඳීමට අවශ්‍ය වැඩ සටහනක යනවා.

මම මීට වඩා කාලය ගන්නේ නැහැ. මොකද, එහෙම ගන්න එක වැරැදි නිසා. කොහොමත් අපට ගොවි ජනතාව වෙනුවෙන් විශාල උනන්දුවක් තිබෙනවා. අපි ඒ වෙනුවෙන් කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය වන මැදිහත් වීම් අපි අනිවාර්යයෙන්ම කරනවා. සමස්ත කෘෂි කර්මාන්තය ගත්තොත්, ඒ තුළ ලොකු විප්ලවයක් කරන්න තිබෙනවා. ඒක වෙනම මාතෘකාවක්. ඒ මාතෘකාව ගැනත් වෙලාවක කථා කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි කියලා කියමින් මගේ වචන කීපය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Gnanamuththu Srineshan. You have five minutes.

[பி.ப. 4.12]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகள் தொடர்பான இன்றைய தின ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்து கொண்டு, வட, கிழக்கு மாகாணங்கள் சார்ந்து குறிப்பாக மட்டக்களப்பு மாவட்டம் சார்ந்து எனது கருத்துகளை முன்வைக்கலாமென நினைக்கின்றேன்.

உண்மையிலேயே விவசாயிகள் உற்பத்தியில் ஈடுபட்டு நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துகின்றார்கள். அவர்கள் பிரதான உணவுப் பொருளான நெல்லை உற்பத்தி செய்வதுடன், வேறு தானியங்களையும் உற்பத்தி செய்கின்றார்கள். விவசாயிகளால் உற்பத்தி செய்யப்படுகின்ற நெல் அல்லது விளைபொருட்கள் உரிய காலத்தில் கொள்வனவு செய்யப்படாமல் இருப்பது பாரியதொரு பிரச்சினையாக மாறி இருக்கின்றது. விளைபொருட்கள் உற்பத்தி செய்யப்பட்டவுடன், அவற்றுக்கு விலை நிர்ணயம் செய்யப்பட்டு, அவற்றைக் கொள்வனவு செய்ய வேண்டிய தேவை இருக்கின்றது. குறித்த காலத்தில் விலை நிர்ணயம் செய்யப்பட்டு, கொள்வனவு இடம்பெறாவிட்டால், தனியார் துறையினர் அவற்றைக் குறைந்த விலையில் பெற்றுக் கொள்கின்றார்கள். இதனால் விவசாயிகள் பாதிக்கப் படுகின்றார்கள். விலை நிர்ணயம் செய்யப்படும்போது விவசாயிகளும் நுவர்வோரும் பாதிக்கப்படாத விதத்தில் சமநிலைத் தன்மையைப் பேணவேண்டிய தேவையும் இருக்கின்றது.

இதைவிட, போதியளவு களஞ்சியப்படுத்தும் வசதிகள் இன்மையானது முக்கிய பிரச்சினையாக இருக்கின்றது. ஏனெனில், நெல்லைச் சேகரித்து வைப்பதற்கான தேவை இருக்கின்றது. மட்டக்களப்பு போன்ற இடங்களில் நெல்லைக் களஞ்சியப்படுத்துவதில் பாரிய இடர்பாடுகள் காணப்படு கின்றன. நெல்லை உற்பத்தி செய்தவுடன் விற்பனை செய்துவிட்டால், அவற்றைக் களஞ்சியப்படுத்துவதிலுள்ள பிரச்சினையைத் தீர்க்கலாமென விவசாயிகள் நினைக்கின் றார்கள். எனினும், நெல்லை விற்கும்போது, அதற்கு நியாயமான விலை கிடைப்பதில்லை.

மட்டக்களப்பில் தேவபுரம் என்ற இடத்தில் ஒரு களஞ்சியசாலை இருக்கின்றது. அது Paddy Marketing Boardஇனால் - நெல் சந்தைப்படுத்தும் சபையால் - முன்னர் பயன்படுத்தப்பட்டது. அங்கு களஞ்சியசாலைக்குரிய அடித்தளங்கள், சட்டகங்கள் எல்லாம் காணப்படுகின்றன. அந்தக் களஞ்சியசாலையைத் திருத்தி அமைப்பதன் மூலம் அங்கு நெல்லைச் சேமித்து வைப்பதற்கான வாய்ப்பு ஏற்படும்.

அடுத்து, ஈரலிப்பாகவுள்ள நெல்லை உலர்த்துவதற்குப் பேதியளவு இடங்கள் இல்லாமையால், இப்பொழுது விவசாயிகள் 'கொங்றீட்' வீதிகளிலும் தார் வீதிகளிலும் அவற்றைப் போட்டு உலர்த்த முனைகின்றார்கள். இதன்போது ஏற்படுகின்ற பிரச்சினை என்னவென்றால், வாகனங்கள் நெல்மீது ஏறிச் செல்லக்கூடிய நிலைமை வரும்போது நெல் பாதிக்கப்படுவதால் அந்த நெல்லை விதை நெல்லாகப் பயன்படுத்த முடியாத நிலைமை ஏற்படுவதுதான். அதுமாத்திர மன்றி, எச்சில் போன்ற பல்வேறுபட்ட கழிவுகள் காரணமாக வீதிகள் அசுத்தமாக இருப்பதனால் உண்ணுவதற்காகப் பயன்படுத்துகின்ற அரிசி மாசுபடுகின்ற நிலைமையும் காணப்படுகின்றது.

மட்டக்களப்பு மாவட்டத்திலாக இருக்கலாம், அம்பாறை மாவட்டத்திலாக இருக்கலாம், திருகோணமலை மாவட்டத்திலாக இருக்கலாம், வடக்கு மாகாணத்திலாக இருக்கலாம், ஏன் நாட்டின் ஏனைய பாகங்களிலாக இருக்கலாம்! அங்கு நெல்லைக் களஞ்சியப்படுத்தக்கூடிய களஞ்சியசாலைகள் போதியளவு அமைக்கப்படாமல் இருப்பது பாரிய பிரச்சினையாக இருக்கின்றது. உரம், உரமானியம் என்பன உரிய காலத்தில் கிடைக்காமல் இருப்பதும் விவசாயி களுக்குப் பிரச்சினையாக இருக்கின்றது. ஏனென்றால், பருவம் தப்பி உரத்தைப் பயன்படுத்தும்போது விளைச்சல் மந்தமாக இருப்பதற்கு வாய்ப்பு இருக்கின்றது. எனவே, அதனையும் உரிய காலத்தில் வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், விவசாய உற்பத்தியில் ஈடுபடும்போது பல்வேறுபட்ட இழப்புகள் ஏற்படுகின்றன. அந்த இழப்புகளுக்குரிய நஷ்டஈடுகள் விவசாயிகளுக்கு அரிதாகவே கிடைக்கின்றன. அவர்கள் பலவிதமான போராட்டங்களைச் செய்தாலும்கூட, இழப்பீடுகள் உரிய காலத்தில் கிடைப்பதில்லை. கடந்த காலத்தில் மட்டக்களப்பு, அம்பாறை, திருகோணமலை போன்ற மாவட்டங்களில் பாரிய வெள்ளப்பெருக்கு ஏற்பட்டபோது, நெற்பயிர்கள் அதிகமாகப் பாதிக்கப்பட்டன. ஆனாலும், அதற்கான இழப்பீடு வழங்கும் விடயம் மந்தகதியிலேயே இடம்பெறுகின்றது.

அடுத்து, காட்டு யானைகளின் அட்டகாசம் பற்றி கூற வேண்டும். எதிர்க்கட்சித் தலைவர் அவர்களும் இந்த விடயத்தைச் சுட்டிக்காட்டி இருந்தார். மட்டக்களப்பு மாவட்டத்தில் வெல்லாவெளி, கிரான், வவுணதீவு, செங்கலடி,

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

வாகரை போன்ற பிரதேசங்களிலும், அம்பாறை, திருகோணமலை மாவட்டங்களிலும் காட்டு யானைகளின் அட்டகாசம் அதிகமாக இருக்கின்றது. அதிலிருந்து விவசாய நிலங்களைப் பாதுகாப்பதற்கான வழிமுறைகள் மிகக் குறைவாகவே இருக்கின்றன. மட்டக்களப்பு மாவட்டத்தில் வனசீவராசிகள் திணைக்களத்தின் 10 உப அலுவலகங்கள் அமைக்கப்பட வேண்டியிருந்தும், அங்கு 3 உப அலுவலகங்கள் மட்டுமே காணப்படுகின்றன. அதுமாத்திரமல்ல, காட்டு யானைகளை விரட்டுகின்ற உத்தியோகத்தர்களின் எண்ணிக்கையும் குறைவாகவே இருக்கின்றது. யானை வேலியால் மாத்திரம் விவசாயிகளைப் பாதுகாக்க முடியாமல் உள்ளது.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Okay, Sir.

நான் இங்கு குறிப்பிட்ட விடயங்களைக் கருத்திற்கொண்டு, விவசாயத்துறை அமைச்சர் அவர்கள் உரிய நடவடிக்கைகளை எடுத்து, விவசாயிகளையும் நுகர்வோரையும் பாதுகாக்குமாறு கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.17]

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මෙම විවාදයේදී කාරණා තුනක් මතු කරනවා. එකක් තමයි, වී මිලදී ගැනීම පිළිබඳ ප්‍රශ්නය. අනෙක, පොහොර ප්‍රශ්නය. ඊළඟට වන්දි ප්‍රශ්නය. වී මිලදී ගැනීමට අදාළව ගත්තොත්, අපි මේ වගකීම් භාර ගන්නකොට වී කිලෝවක නිෂ්පාදන වියදම තිබුණේ රුපියල් 99.75යි. වී කිලෝවකට රජය සහතික මිලක් නියම කරලා තිබුණා, රුපියල් 105ක.

හැබැයි, රජය වී මිලදී ගත්තේ නැහැ. ගබඩා වහලා තිබුණේ. ගොවියාගේ වී ඉතාම අඩු ගණන්වලට, කුණු කොල්ලයට විකුණන්න සිද්ධ වුණා. අපි මේ රජය භාරගන්නකොට වී කිලෝවේ නිෂ්පාදන වියදම ඊට වඩා ගොඩක් අඩු වුණා. උදාහරණයක් විධියට ගත්තොත්, රතු නාඩු වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 76යි. සුදු නාඩු වී කිලෝවක නිෂ්පාදන වියදම ඊට වඩා ටිකක් වැඩියි. නිෂ්පාදන වියදමට සියයට 30ක් එකතු කරලා වී කිලෝවක මිල නියම කරන්න කියලා අපේ ලාල් කාන්ත ඇමතිතුමා කියපු පරිදි අපේ සටන් පාඨයක් තිබුණා. අපි වී කිලෝවකට සියයට 30කටත් එහා වටිනාකමක් එකතු කරලා සහතික මිලක් නියම නොකර, අවම මිලක් නියම කළා. ඒ අනුව තමයි රුපියල් 120, රුපියල් 125, රුපියල් 132 විධියට නාඩු, සම්බා, කීරි සම්බා වීවලට මිලක් නිර්මාණය වෙන්නේ. ඒ මිල නියම කරලා අපි නිකම් හිටියේ නැහැ. වහපු ගබඩා ප්‍රතිසංස්කරණය කරලා ගබඩා ටික ඇරියා. ඒ අනුව පසුගිය මහ කන්නයේ වී මෙට්‍රික්ටොන් 59 ½ක් තමයි රජයේ ගබඩාවලට ගොවීන් ගෙනැවිත් දුන්නේ. හැබැයි මේ වෙනකොට - ඊයේ දවස වෙනකොට - මෙට්‍රික්ටොන් 43,891ක වී ප්‍රමාණයක් ගබඩාවලට ගෙනැවිත් දී තිබෙනවා. ඒක තමයි වී සම්බන්ධ කාරණය.

අද මේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමා කිව්වා, සමහර අවස්ථාවල රුපියල් 157ටත් වී කිලෝවක් ඉල්ලුවා කියලා. අපි කිව්වේ වී කිලෝවක් රුපියල් 157ට ඉල්ලුවා කියලා නොවෙයි. රුපියල් 150කට වැඩි නිෂ්පාදන වියදමක් වීවලට එදා ගියා. ඒකට අදාළ තර්කය විපක්ෂ නායකතුමාගෙන්ම මතු වුණා. විපක්ෂ නායකතුමා යම් ප්‍රකාශයක් කළා. ඒක පැහැදිලියි, සත්‍යයි. වී නිෂ්පාදනය සියයට 34ක් දක්වා පහත වැටුණා කියලා එතුමා කිව්වා; රසායනික පොහොර තහනම් කිරීමත් එක්ක වී නිෂ්පාදනය සියයට 34 දක්වා පහත වැටුණාය කියලා එතුමා ප්‍රකාශ කළා. ඒක සත්‍යයි. පොහොර මිටිය රුපියල් 40,000ක් දක්වා වැඩි වුණා. එහෙම නම් වී නිෂ්පාදනය සියයට 34ක් දක්වා අවම වෙනකොට, අනෙකුත් යෙදවුම් පොහොර පට්ට ගණන් වෙනකොට එදාට සාපේක්ෂව වී කිලෝවකට රුපියල් 150කට වැඩි නිෂ්පාදන පිරිවැයක් යන එක අහන්න දෙයක් නොවෙයි. ඔන්න ඔය කාරණය තමයි එදා අපි මතු කළේ.

ඊළඟ කාරණය මෙයයි. පොහොර සම්බන්ධයෙන් ගත්තාම, ඇත්තටම මේ පොහොර සහනාධාරය දෙන්නේ පොහොර සඳහාම කියලා නොවෙයි. මේක වගාවට අදාළව ඕනෑම කටයුත්තකට යොදා ගැනීමේ නිදහස ගොවියාට තිබෙනවා. මේ සහනාධාර දෙන්නේත් අදියර දෙකකින්. එසේ අදියර දෙකකින් දෙන්නේත් ඒ වුවමනාවත් එක්ක. ඒ අනුව අපි මේ වගකීම් භාරගන්නකොට හෙක්ටෙයාර 2ක් සඳහා ගොවියාට පොහොර සහනාධාරය වශයෙන් ලැබුණේ රුපියල් 30,000යි. අද වෙනකොට ඒ වෙනුවෙන් රුපියල් 50,000ක් ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. කන්න රැස්වීමේ තීන්දුවක් අනුව වී වගා කරන ඉඩම්වල අතුරු භෝග වගා කරන සෑම ගොවියෙකුටම හෙක්ටෙයාර දෙකක් සඳහා රුපියල් 30,000ක ආධාරයක් දෙනවා. පසුගිය යල කන්නයේ ඒක දුන්නා. මේ මහ කන්නයේත් ඒක දෙනවා. එහෙම නම්, ඒ සහනාධාර වැඩ පිළිවෙළ ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි වීවල නිෂ්පාදන වියදම -පිරිවැය- ගණන් බලනකොට ඔය පොහොර සහනාධාරය; වගා සහනාධාරය කියන එක ගණන් ගත්තේ නැහැ. ඒක අත හැරියා. ඒකත් එකතු කළා නම් නිෂ්පාදන වියදම මීටත් වඩා අඩු වෙනවා. එහෙම නම් ගොවියාට තවත් අවාසියක් සිද්ධ වෙනවා. ඒ සියල්ල නොසලකා හැරියා.

මේ යෝජනාවේ කාරණා 3ක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අනෙක් කාරණය තමයි වන්දි ගෙවීම. මේ පිළිබඳව ගත්තොත්, අපි මේ වගකීම් බාර ගන්නකොට ඊට කලින් යල කන්නයේ ගොවීන්ට වගා වන්දි ගෙවලා තිබුණේ නැහැ. ඊට පස්සේ අපි බලයට ඇවිල්ලා පළමුවැනි මාසය තුළම ඒ හිඟ වන්දි මුදල් ගොවියාට ගෙව්වා. පසුගිය මහ කන්නයට අදාළව ගත්තොත්, අවස්ථා දෙකකදී වගා හානි වුණා. ඒ වගා හානි වෙච්ච ගොවීන් ප්‍රමාණය 70,548ක්. වගා හානි වෙච්ච අක්කර ප්‍රමාණය ගත්තොත්, අක්කර 83,255ක්. ඒ අදාළ සුදුසුකම් තිබෙන සියලු ගොවීන්ට මේ වන්දි මුදල් ගෙවලා මේ වෙනකොටත් සෑහෙන කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ සියලු වන්දි ගෙවලා අවසානයි. පළමුවැනි වතාවට කන්න පහුවෙන්න කලින් ඒ ගොවීන්ට වන්දි මුදල් ගෙව්වා. දැන් ඒ වන්දි ගෙවලා ඉවරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ අය ගොවීන්ට වන්දි ගෙවීම් ගැන කථා කරනවා. ගොවීන්ට වන්දි නොවෙයි, ගොවීන්ගේ නිෂ්පාදනවලට සල්ලි නොගෙවපු කට්ටිය තමයි මෙහෙම කථා කරන්නේ. උදාහරණයක් විධියට ගත්තොත්, දඹුල්ලේ ලොකු ලූනු ගොවියාගේ බීජවලට රුපියල් 9,000 ගණනේ ගෙවනවාය කියලා ගොවියාගෙන් බීජ ගත්තා. ගොවියාට සත පහක් ගෙව්වේ නැහැ. ඒකට අදාළව අපි දඹුල්ල පුරා පෙළපාළි ගියා. එවකට හිටපු පී. හැරිසන් ඇමතිතුමාව ගිහින් හමු වුණා, අනුරාධපුරයේදී. ඒ විතරක් නොවෙයි. හිටපු අලුවිහාරේ ඇමතිතුමාව දඹුල්ලට ගෙන්වූවා. හිටපු රාජ්‍ය ඇමතිවරයෙක් වන විදුර වික්‍රමනායක මහතාව දඹුල්ලට ගෙන්වූවා. ගොවියොත් සම්බන්ධ කරගෙන කථා කළා. ගොවියාගේ ලූනු බීජ ටික ගත්තා. නමුත්, සත පහක් ගෙව්වේ නැහැ. ඒ විතරක් නොවෙයි. මීට කලින් වැලිමඩ, ඌව පරණගම, බොරලන්ද, බොරගස්වැව ඇතුළු ස්ථාන හයකදී ආණ්ඩුව ගොවියාගේ අර්තාපල් ගත්තා. ගොවියාට කිලෝවකට රුපියල් 95 ගණනේ ගෙවනවා කියලා අර්තාපල් කිලෝ 2,044,000ක් ගත්තා. හැබැයි, ගෙව්වේ නැහැ. අපට සිද්ධ වුණා අමාත්‍යාංශය වටලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මෙතුමන්ලාගේ ආණ්ඩුව. මේ අවස්ථාවේ මෙතැන නැති වුණාට, ඊට අදාළ ඇමතිවරයා මේ ඉස්සරහා පෙළේ ඉන්නවා. එතුමා දැනටත් පාර්ලිමේන්තුවේ ඉන්නවා. අපි වැටලුවා, උද්ඝෝෂණය කළා. අරගළ කරලා කොටසක් ගත්තා. හැබැයි, තවමත් සල්ලි නොලැබුණු ගොවියෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. ගොවීන්ට කෝටි ගණනක් ගෙවන්න තිබෙනවා, ගෙව්වේ නැහැ. එහෙම අත්දැකීම් තමයි තිබෙන්නේ. ඒ වාගේම තමයි අම්පාරේ ගොවීන්ටත්. අපේ ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. ගොවීන්ගේ වන්දි මුදල වන රුපියල් කෝටි 32ක් ගෙව්වේ නැහැ. මොනරාගල ගොවීන්ට ගෙව්වෙත් නැහැ. එහෙම ඇත්දැකීම් තිබෙන්නේ. ඒ අත්දැකීම් එකතු කරපු කට්ටිය තමයි මැරිලා ඉපදිලා වාගේ අද කථා කරන්නේ. ඒකයි තත්ත්වය.

දැන් තමුන්නාන්සේලා උපදෙස් ගොඩක් දුන්නා. හොඳයි, ඒ උපදෙස් අපි පිළිගන්නම්. දැන් ආණ්ඩුවට කියනවා, කමතටම ගිහින් වී ගන්න කියලා. දෙන පොහොර සහනාධාරය මදි කියනවා. මීට වඩා මැදිහත් වෙන්න ඕනෑ බව කියනවා. ඔව්, ඒ ඔක්කෝම හරි. හැබැයි, තමුන්නාන්සේලා ආණ්ඩු කරපු කාලයේ ඔය දේවල් ටික කළා නම් මේ ප්‍රශ්න මොකක්වත් නැහැ නේ. ඔය කියපු මොනවත් නොකරපු නිසා නේ අද මේවා කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඔය කියපු කාරණා ඔක්කෝම කළා නම් ප්‍රශ්නයක් නැහැ නේ. රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා, විපක්ෂ නායකතුමා ඇතුළු ඒ ආණ්ඩුවේ පාලන කාලය තුළ ඔය කියපු දේවල් කළා නම් අද අපට උපදෙස් දෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ නේ. දැන් අපට උපදෙස් ගොඩක් දුන්නා නේ. ඒ දේවල් ටික ඒ කාලයේ කළා නම් අද උපදෙස් දෙන්න අවශ්‍ය වෙන්නෙත් නැහැ.

අපි වී අලෙවි මණ්ඩලය ගනිමුකෝ. වී අලෙවි මණ්ඩලය වසා දමා තිබුණේ. ඒක වවුලන්ට ඉන්න අත ඇරලා තිබුණේ; පරවියන්ට ඉන්න අත ඇරලා තිබුණේ; වඳුරන්ට ඉන්න අත ඇරලා තිබුණේ. ඒක තමයි අපි ප්‍රතිසංස්කරණය කරන්න පටන් ගත්තේ. තවමත් ප්‍රතිසංස්කරණ අවසන් නැහැ. වී අලෙවි මණ්ඩලයේ බරපතළ විධියට සේවක පුරප්පාඩු තිබෙනවා. ඒවා පුරවලා නැහැ. ඒවා ඔක්කෝම අපි අංගසම්පූර්ණ කරනවා. එන මහ කන්නය වනකොට මීට වඩා පියවරක් අපි ඉස්සරහට තබනවා. විශේෂයෙන්ම අපේ රටේ කෘෂි කර්මාන්තයට අදාළව ගත්තොත්, පැවැති ඔන්න ඔය තත්ත්වය තුළ මේ වනකොට අපි සාධනීය ප්‍රවේශයකට ඇවිල්ලා තිබෙනවා. මේ වනකොට පස පරීක්ෂා කිරීමේ කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා. අපි ඉදිරියේ දී ඒ සඳහා ස්වේච්ඡා බලකායක් පුහුණු කරනවා; නිර්මාණය කරනවා. තවත් දවස් කිහිපයකින් ඒ කටයුත්ත ආරම්භ කරනවා. පස පරීක්ෂා කරලා පසට ගැළපෙන විධියට, බෝගවලට ගැළපෙන විධියට අවශ්‍ය යෙදවුම් ටික සැපයීමට අදාළ ඒ තාක්ෂණික ක්‍රමවේද අපි මේ වනකොට ආරම්භ කරලා තිබෙනවා. අපි වැඩිදියුණු කරපු බීජ නිෂ්පාදනය කරමින්, තවත් අත්හදා බලමින්, පර්යේෂණ කරමින් සිටිනවා. අපේ රටේ පරිසරයට ගැළපෙන බීජ සකස් කර ගැනීමට අදාළ සැලැස්මකට, වැඩ පිළිවෙළකට අපි මේ වනකොට අවතීර්ණ වෙලා තිබෙනවා. අඩු භූමියකින් වැඩි ඵලදාවක් ලබා ගැනීමට අදාළ තාක්ෂණික ක්‍රමවේද එක්ක අපේ රටේ කෘෂි කර්මාන්තය ඉදිරියට අරගෙන යන්න අපි මේ වනකොට සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම වැඩ ආරම්භ කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. අස්වැන්න වැඩි කර ගැනීමට අදාළව අනෙකුත් අනුගමනය කළ යුතු පියවර සියල්ල මේ වනකොට අපි අනුගමනය කරමින් තිබෙනවා.

පශු සම්පත් ක්ෂේත්‍රය නංවන්නත් අපේ ලොකු සැලැස්මක් තිබෙනවා. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම මේ වනකොට අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ තත්ත්වය එක්ක සමස්තයක් විධියට ගත්තොත්, කෘෂි කර්මාන්තයට අදාළව අපේ රටේ ආහාර අවශ්‍යතාව සම්පූර්ණ කිරීමටත්, ඒ තුළින් ගොවියාගේ වෙළෙඳපොළ ප්‍රශ්නය විසඳීමටත් කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම නිෂ්පාදනවලට අගය එකතු කරන්නත් ඕනෑ. ගොවියා කොච්චර වගා කළත් වැඩක් නැහැ, ගොවියාගේ වෙළෙඳ පොළ ප්‍රශ්නය විසඳෙන්නේ නැත්නම්. අන්න ඒක ක්‍රමානුකූලව විසඳන්නත් අපි මේ වනකොට අත ගහලා තිබෙනවා. වෙළෙඳපොළ ප්‍රශ්නය බේරා ගන්න, එයට යම් විසඳුමක් දෙන්න අපට තව කෙටි කාලයක් යනවා. අඩු ගණනේ යම් විසඳුමක් ලැබෙන තත්ත්වයකට එන්න තවත් කන්න දෙක තුනක්වත් ගත වෙනවා.

ඔන්න ඔය තත්ත්වය තුළ ගොවියාගේ අස්වැන්න වැඩි කරලා නිෂ්පාදන වියදම අඩු කරලා ගොවියාට සාධාරණ මිලක් ලබා දීම, ඒ වාගේම පාරිභෝගිකයාට සාධාරණ මිලකට තමන්ගේ ආහාර අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට අදාළ පරිසරය හැදීම, අපි කන බොන දේවල් වෙනුවෙන් පිටට යවන අතිවිශාල ඩොලර් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අවම කර ගැනීම කියන කාරණාවලට අදාළව සහ පිට රටවලින් අපේ රටට ඩොලර් ගෙන ඒම කියන කාරණාවට අදාළවත් අපේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරමින් මේ වෙනකොට අපි ඒ කටයුතු ඉදිරියට ගෙන යමින් තිබෙනවා. අපේ ලාල් කාන්ත ඇමතිතුමා, ඒ වාගේම අපේ සුසිල් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්වරුන්, ලේකම්වරියන් සහ අනෙක් සියලුම නිලධාරින් එක්ව අපි එක කණ්ඩායමක් විධියට අපේ රට කෘෂිකාර්මිකව ඉදිරියට ඔසවා තැබීම සඳහා ඉතාම විධිමත්, විද්‍යාත්මක වැඩ පිළිවෙළක් දියත් කිරීමට අවශ්‍ය වැඩකටයුතු මේ වනකොට ආරම්භ කර තිබෙනවා කියන කාරණයත් මේ වෙලාවේ මා සඳහන් කළ යුතුයි.

විශේෂයෙන්ම මේ යල කන්නයට වඩා එන මහ කන්නය තුළ ගොවියාගේ පැත්තෙන් අපි සාධනීය පියවරක් ඉදිරියට තබන්න සැලසුම් කර තිබෙනවා. ඒත් එක්කම ඔබ සියලුදෙනාටම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න තමුන්නාන්සේලා ඉදිරිපත් කරන සාධනීය යෝජනා හැම එකක්ම අපි පිළිගන්නා බව, භාරගන්නා බව. විනාශ කරපු කෘෂි කර්මාන්තයක් නැවත පණ ගන්වමින් ඉස්සරහට ගෙන යන්න තමයි අපට සිදු වෙලා තිබෙන්නේ. අපි ඒ ගමන අනිවාර්යයෙන්ම ඉදිරියටම යනවා කියන කාරණය මේ වෙලාවේ මතක් කරමින්, මා නිහඬ වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. R.M. Ranjith Madduma Bandara. You have five minutes.

[අ.භා. 4.31]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වී මිල සහ කෘෂි කර්මාන්තය ගැන කථා කරද්දී මට කියන්න සිද්ධ වෙනවා, ගොවීන් කියන්නේ මේ රටේ සිටින අන්තිම අසරණ, දුප්පත්ම කොටස බව. පවතින ආර්ථිකය තුළ අමාරුවෙන්ම ජීවත් වෙන්නේ ගොවියා. අපිට මතකයි, 1994 වර්ෂය වෙනකොට මේ රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් ගොවියාගේ පංගුව, ගොවියාගේ දායකත්වය සියයට 20ක් බව. අද වෙනකොට ඒක සියයට 8ක් වෙනකම් අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ සාපේක්ෂව ගොවියා දුප්පත් වෙලා තිබෙනවා. ගොවියාගේ ආදායමට වඩා වියදම වැඩියි. ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා ඒ ගැන කථා කරාවි. තමුන්නාන්සේලාගෙන් අපි අහනවා, ගොවියා වෙනුවෙන් මොනවාද කළේ කියා. තමුන්නාන්සේලා පොහොර සහනාධාර මුදල් නිසි වෙලාවට බැංකුවලට තැන්පත් කරන්නේ නැහැ. පොහොර දාන කාලය පසු වුණාට පසුව තමයි සමහර වෙලාවට ඒ මුදල් තැන්පත් කරන්නේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. සමහර ගොවීන්ට ඒ මුදල් වෙලාවට හම්බ වෙන්නේත් නැහැ. තවම ඒ මුදල් හම්බ වුණේ නැති ගොවීන් ඉන්නවා. කරුණාකරලා මේ සහනාධාර මුදල ලබා දෙන්න. ගොවියාට දෙන එකම සහනාධාරය පොහොර සහනාධාරය නේ.

ඒ විතරක් නොවෙයි. අලුත් තාක්ෂණය කෘෂි කර්මාන්තයට හඳුන්වා දීමට ඔබතුමන්ලා කටයුතු කරලා නැහැ. අපි ඉල්ලා සිටිනවා, එම කටයුතු සිදු කරන්න කියලා. මොකද, අවුරුදු ගණනාවක් තිස්සේ ගත් අස්වැන්නම තමයි තවමත් අරගන්නේ. මහවැලි ඉඩම්වලින් ගන්න අස්වැන්නත් අඩු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගොවි ණය ගැන තමුන්නාන්සේලා එදා කථා කළා. නමුත් ගොවි ණය කපා හරින කථාව දැන් කියන්නේ නැහැ.

මෙහිදී වී ගොවිතැනට අමතරව මොනරාගල දිස්ත්‍රික්කයේ සිටින හේන් ගොවීන් ගැන කථා කරන්නත් මම බලාපොරොත්තු වනවා. ඒගොල්ලන් පාරම්පරිකව හේන් ගොවිතැනේ නියැළෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ මහ වාරිමාර්ගයෙන් වැඩ කරන්නේ අක්කර 30,000ක් විතරයි. අනෙක් අය ඔක්කෝම හේන් ගොවිතැන් කරන්නේ. ඒක පාරම්පරිකව කරන දෙයක්. මේ රටට වාර්ෂිකව බඩඉරිඟු ටොන් ලක්ෂ 6ක් ඕනෑ. නමුත් රට තුළ නිෂ්පාදනය කරන්නේ ලක්ෂ 3යි. අපි ලක්ෂ 6ක් දක්වා නිෂ්පාදනය වැඩි කරගන්නවාද, නැත්නම් පරිභෝජනය අඩු කර ගන්නවාද? මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවීන් වැඩ කරපු ඉඩම්වල වගා කිරීම අද වන විට ඔවුන්ට තහනම් කර තිබෙනවා. ඒ, ඒ මිනිසුන් පාරම්පරිකව වැඩ කරපු ඉඩම්. ලාල් කාන්ත මැතිතුමා කෘෂිකර්ම ඇමතිතුමා වාගේම ඉඩම් ඇමති. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, එම ගොවීන්ට ඒ අවස්ථාව ලබා දෙන්න කියලා. ඒ ගොවීන් බඩඉරිඟු ටික වවනවා, වට්ටක්කා ටික වවනවා, පැණි කොමඩු ටික වවනවා. අද වන විට අපි අවුරුද්දකට බිලියන 40ක් බඩඉරිඟු ගෙන්වන්න වියදම් කරනවා. එම ප්‍රමාණය ඊටත් වැඩි වෙන්න පුළුවන්. මම ඉල්ලන්නේ කරුණාකර ඒ ඉඩම්වල අයිතිය ඔවුන්ට ලබා දෙන්න කියලායි. කොටියාගල, ඇතිමලේ, මහකලුගොල්ල, කහම්බාන, තෙනගල්ලන්ද, වෙහෙරගල ආදී පැතිවල ගොවීන් වාගේම බුත්තල ප්‍රදේශයේ ගොවි ජනතාවත් අද අන්තිමට අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ජනාධිපතිවරයා ඊයේ පෙරේදා එම ගම්වලට ගිහින් තිබුණා. එතුමා එම ගොවීන්ට ඉඩම් ලබා දෙනවා වෙනුවට සූර්ය බල විදුලි ව්‍යාපෘතියකට ඉඩම් අක්කර 1,000ක් අරගෙන තිබෙනවා. එතුමා ගිහිල්ලා පොරොන්දු වෙලා තිබුණා, ගොවීන්ට ඒ පාරම්පරික ඉඩම් ලබා දෙනවා කියලා. අපි කියන්නේ නැහැ, කැලයෙන් ඉඩම් දෙන්න කියලා. එතැන ගොවීන් වැඩ කරපු අක්කර ගණනක ඉඩම් තිබෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අද ගොවිතැන වෙනුවට එම ඉඩම්වලට හරක් ලක්ෂ ගණනක් ගෙනිහින් දමා තිබෙනවා. ඒකෙනුත් වෙන්නේ ලොකු විනාශයක්. මේකට ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් අවශ්‍යයි. රටට කිරි නිෂ්පාදනයත් අවශ්‍යයි, ඒ සඳහා හරකුන් ඉන්නත් ඕනෑ.

නමුත් මෙතැන වෙලා තිබෙන්නේ, ගොවියා වැඩ කරපු ඉඩම් ටිකට දැන් වෙන ප්‍රදේශවල හරක් ගෙනැත් දාලා තිබෙන එකයි. මම හිතනවා, මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ නියෝජ්‍ය ඇමතිතුමා මේ සම්බන්ධව මා එක්ක එකඟ වෙයි කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකරලා මේ ප්‍රශ්නය විසඳන්න. එක පැත්තකින් අපි විදේශ විනිමය ආරක්ෂා කර ගන්නත් ඕනෑ.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ඔව් ගරු ඇමතිතුමා, පැහැදිලි කරන්න.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඔබතුමායි, DCC එකේ සභාපතිතුමායි ඉන්නවා. මේ පිළිබඳව මොනරාගල DCC එකෙන් තීරණයක් අරගෙන අපට එවන්න. අපි අපේ අනුමැතිය දෙන්නම්.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

අපට ඕනෑ අපේ ගොවියාව ආරක්ෂා කරගන්නයි. ඔබතුමාගේ තීන්දුව හොඳයි. *[බාධා කිරීමක්]*

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් තිබෙනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

අපේ නියෝජ්‍ය ඇමතිතුමා කියන්නේ දෙන්නේ නැහැ කියන එක නේද? දෙන්න බැහැ කියන එක තමයි මොනරාගල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය නායකයා කියන්නේ. ඉතින් මම දන්නේ නැහැ, මොනරාගල දිස්ත්‍රික්කයේ ඡන්දයෙන් ඇවිල්ලා, -

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ඉඩම්වලට අදාළව පරිසර සංවිධානයකින් නඩුවක් දාලා තිබෙනවා. ඊට අමතරව 2012දී

ගැසට් එකක් ගහලා ඒ ගැසට් එකෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කරගෙන තිබෙනවා. ඊට අමතරව මෙතුමන්ලා ඉන්න කාලයේ සම්බන්ධීකරණ කමිටුවේදී තීන්දුවක් අරගෙන තිබෙනවා, ඒ කැලේට ඇතුළු වෙන්න දෙන්න බැහැ කියලා. ඔය කාරණා තුනම තිබෙනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

අපි අපේ කාලයේ - යහ පාලන කාලයේවත්, එක්සත් ජාතික පක්ෂ කාලයේවත් - කවදාවත් එහෙම තීන්දුවක් අරගෙන නැහැ. අපි දන්නේ නැහැ, පසුගිය කාලයේ කිව්වාට මොන කාලයද කියලා. *[බාධා කිරීමක්]* නැහැ. යහ පාලන කාලයේදී අපි පැහැදිලිවම ඉඩම් ටික ගොවීන්ට දුන්නා. ඒ කාලයේ ගොවීන් බොහොම ශක්තිමත්ව සිටියා. ඔවුන් ට්‍රැක්ටර් ගත්තා, වෙන යන්ත්‍ර ගත්තා. අද මම හිතන විධියට ඔවුන්ට ණය ගෙවා ගන්නවත් විධියක් නැහැ. ඔබතුමා ඒ ප්‍රදේශයට ගිහිල්ලා මේ පිළිබඳව තව ටිකක් සොයා බැලුවා නම් හොඳයි කියලායි මම හිතන්නේ, නියෝජ්‍ය ඇමතිතුමනි. *[බාධා කිරීමක්]* නඩු තිබෙනවා. නඩු නැත්තේ නැහැ. ගොවීන්ට නඩු තිබුණා කියලා ගොවීන්ගේ ගොවිතැන නවත්වන්න බැහැ. පාරම්පරික අයිතිය නවත්වන්න බැහැ. මේ ප්‍රදේශයේ බොහොම දුප්පත් ගොවීන් කොටසක් ඉන්නේ.

මම ඔබතුමන්ලාට පෙන්නුවා, පසුගිය අවුරුදු ගණන ඇතුළත ගොවීන්ගේ ආර්ථිකය කොහොමද කඩා වැටිලා තිබෙන්නේ කියලා. අපි ඔක්කෝම එකතු වෙලා මේ ගොවීන්ගේ ආර්ථිකය නැවත හදන්න ඕනෑ. අපට අවශ්‍ය බඩඉරිඟු ටොන් ලක්ෂ 6න් ලක්ෂ 3යි නිෂ්පාදනය කරන්නේ. මේක තවත් අඩු කරනවාද? දැනුත් මේ නිෂ්පාදනය අඩු වෙලා තිබෙන්නේ. මේ නිසා අද පවුල් දහස් ගණන් අතරමං වෙලා තිබෙනවා. අපි සියලුදෙනා එකතු වෙලා මේ ගැන කථා කරමු. මම දන්නවා, සත්තු ආරක්ෂා කරන්නත් ඕනෑ කියලා. ඒ සඳහාත් ඉඩම් දෙන්න ඕනෑ. පාරිසරික ආයතනවල කටයුතුත් කරන්න ඕනෑ. අපි මේ ගැන වාද විවාද කරනවා නොවෙයි. අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මොනරාගල දිස්ත්‍රික්කයේ සිටින පාරම්පරික ගොවීන්ගේ ඉඩම් අයිතිය ලබා දෙන්න කියලායි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Nalin Bandara Jayamaha. You have seven minutes.

Order, please! Will an Hon. Member propose the Hon. Kitnan Selvaraj to the Chair?

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතු ය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.

[අ.භා. 4.38]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ අපේ රෝහණ බණ්ඩාර මැතිතුමා ඉදිරිපත් කළ ඉතාම වැදගත් කාලීන යෝජනාව ගැන කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ කන්නයේ වී මිලදී ගැනීම දැන් සෑහෙන දුරට අවසන් වෙලා තිබෙනවා. හැබැයි, ගොවියාට වී සඳහා සාධාරණ මිලක් ලබා දෙන්න රජයට මැදිහත් වෙන්න බැරිව ගියා. රජය පාලන මිලක් දැම්මත්, ඒ පාලන මිල බෝඩ් ලෑල්ලකට විතරක් සීමා වුණා. මොකද, වී මිලදී ගැනීම සඳහා වූ රජයේ යන්ත්‍රණය සාර්ථක වුණේ නැහැ. ගරු ඇමතිතුමනි, රජයේ වී මිලදී ගැනීමේ යන්ත්‍රණය සාර්ථක වුණා නම් වී මෙට්‍රික් ටොන් ලක්ෂ ගණනක් රජයේ ගබඩාවලට එන්න ඕනෑ. අපට මතකයි, ඔබතුමන්ලා ආණ්ඩුව හදපු ගමන් වී ගබඩා සුද්ධ කරලා, එළි පෙහෙළි කරලා වී ගබඩා ලැහැස්ති කරපු බව. අපි වී ගබඩා කරලා, ඊට පස්සේ වී කොටලා අඩු මිලට පාරිභෝගිකයාට හාල් දෙනවා කියලා ඔබතුමන්ලා ලොකු චිත්‍රයක් මැව්වා. ඔබතුමන්ලාගේ මැතිවරණ ව්‍යාපාරය රට පුරා ගෙන යද්දී 'විසඳුම' කියලා බෝඩ් පවා ගහගෙන ගියා. ඒ කාලයේ නාමල් කරුණාරත්න මහත්මයා ගොවියාට විසඳුමක් ගැන කිව්වා, පාරිභෝගිකයාට විසඳුමක් ගැන කිව්වා.

හැබැයි, අද ඒ විසඳුම ලැබිලා තිබෙනවාද? වී මිලදී ගැනීම සාර්ථක වුණා නම් මේ වාගේ අඩු වී ප්‍රමාණයක් ගබඩාවලට එන්න විධියක් නැහැ නේ. මම හිතන විධියට, රටේ අවශ්‍ය වී ප්‍රමාණයෙන් දවස් දෙකකටවත් අවශ්‍ය වී ගබඩා සතුව නැහැ. මෙතැන බරපතළම ප්‍රශ්නය මේකයි. පසුගිය කන්නයේ සම්බා වගා කරලා තිබෙන ප්‍රමාණය ඉතාම අඩුයි. ඔබතුමන්ලා විසඳුම් හොයනවා නම්, අද කොච්චර නාඩු වගා කරන්න ඕනෑද, කොච්චර සම්බා වගා කරන්න ඕනෑද, කොච්චර කීරි සම්බා වගා කරන්න ඕනෑද කියලා යම්කිසි තක්සේරුවක්, ඇස්තමේන්තුවක් තිබෙන්න ඕනෑ. වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමාට ලෑස්ති වෙන්න වෙනවා, වහාම සම්බා ගේන්න. මොකද, සම්බා නැහැ. හෙට - අනිද්දා වෙනකොට සම්බා කිලෝවක මිල රුපියල් 300ට වඩා වැඩි වෙනවා. කීරි සම්බා කිලෝවක මිල දැනට රුපියල් 340යි. අවශ්‍ය සම්බා ප්‍රමාණය රටේ නිෂ්පාදනය වෙලා නැහැ. ඔබතුමන්ලා ඒ පිළිබඳව නිසි කළමනාකරණයක් කරලා නැහැ; නිසි අධ්‍යයනයක් කරලා නැහැ. ඔබතුමන්ලා රිළවු ගණන් කළාට රටට අවශ්‍ය සම්බා හාල් ප්‍රමාණය කොච්චරද, කීරි සම්බා හාල් ප්‍රමාණය කොච්චරද, නාඩු කොච්චරද, රතු කැකුළු කොච්චරද කියලා හොයා බලා නැහැ. ඒ නිසා හෙට අනිද්දා වෙනකොට සම්බා සහ කීරි සම්බා හිඟයක් රටේ ඇති වෙනවා.

ඔබතුමන්ලා ගබඩා සුද්ද කරද්දී, ගබඩාවලට වී ගබඩා කරනවා කියද්දී කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් ශක්තිමත් කරනවාය කිව්වා. ගබඩාවල වී ටික කොටන්න ඒ අයට දෙනවාය කිව්වා. ඒ අය හරහා ඒ වී ටික කොටවනවා කිව්වා. මම අහන්න කැමතියි, පසුගිය කාලයේ ඔබතුමන්ලා ගබඩා කරපු වීවලින් එක ටොන් එකක්, කිලෝවක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට දීලා කෙටෙව්වාද කියලා. ආනමඩුව පැත්තේ,

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

අපේ ගල්ගමුව, කුරුණෑගල පැත්තේ, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව ඇතුළු අනෙක් දිස්ත්‍රික්කවලත් වී මෝල් හිමියන් ඔබතුමන්ලා වෙනුවෙන් කාර්යාල දමාගෙන හිටියා; වී කොටන්න බලාගෙන හිටියා. අන්තිමට කවුද වී ටික කෙටුවේ? බී.ආර්.ගේ හිතවතෙකුට දීලා තමයි වී ටික කෙටෙව්වේ. බී.ආර්. කියන්නේ, බිමල් රත්නායක මහත්තයා නොවෙයි. අර, හිටපු බී.ආර්. එතුමාගේ හිතවතෙක් වන මධුසංඛ ජයවික්‍රම තමයි වී ටික කෙටුවේ. ඒ, මහා පරිමාණ ව්‍යාපාරිකයෙක්. *[බාධා කිරීමක්]* ඒ වී ටික කොටපු විධිය අපි දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඔහුට තමයි වී ටික කොටන්න දුන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට මිස ඔහුට නොවෙයි වී ටික කොටන්න දෙන්න ඕනෑ, වසන්ත ඇමතිතුමනි. ඔබතුමන්ලා වී ටික කොටන්න දෙනවා කිව්වේ ඔහුට නොවෙයි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට. මහා පරිමාණයේ කෙනෙකුට දීලා වී ටික කොටවනවා කිව්වේ නැහැ. ඔබතුමන්ලා "ජාතික සතොස" කියලා බෝඩ් එකක් ගහගෙන වී කොටලා දැම්මා. ප්‍රශ්නය ඒක නොවෙයි, වී කොටන්න දුන්නු පුද්ගලයායි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් බලාගෙන හිටියා, ගබඩාවලින් වී ටික අරගෙන තමන්ගේ මෝල්වල තිබෙන වී හිඟයත් එක්ක වී ටික කොටලා හාල් බවට පරිවර්තනය කරන්න. හැබැයි, ඔබතුමන්ලා ඒක දුන්නේ බැසිල් රාජපක්ෂගේ මිත්‍රයාට. ඒ නිසා රටේ ජනතාව බලාපොරොත්තු වුණු විසඳුම ලැබිලා නැහැ. ගොවියා බලාපොරොත්තු වුණු විසඳුම ලැබුණේ නැහැ.

ඊයේ පෙරේදා මම සෙවනගලට ගියා. සෙවනගල සීනි කර්මාන්තශාලාවට අයත් උක් වගා කරන ලද අක්කර ගණනාවක් -මෙට්‍රික් ටොන් 13,000ක් විතර තිබෙන කොටසක්- ගිනි අරගෙන.

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
ගිනි අරගෙන නොවෙයි, ගිනි තියලා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගිනි තියලා වෙන්න පුළුවන්, ගිනි අරගෙන වෙන්නත් පුළුවන්. හැබැයි, ගොවීන් ගිනි තියන්නේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
සජබ අපේක්ෂකයෝ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මෙන්න මේ කාරණය හිතා බලන්න. 2018 ඉඳන් මේ අවුරුද්ද දක්වා -හැම අවුරුද්දේම- මෙහෙම ගිනි අරගෙන තිබෙනවා. *[බාධා කිරීමක්]* හරි, ගිනි තැබුවා කියමුකෝ. එතකොට 2018 ඉඳන් සමගි ජන බලවේගයේ අපේක්ෂකයෝද ගිනි තැබුවේ? සජබ අපේක්ෂකයෝ 2025දී ගිනි තැබුවා නම්, 2018 ඉඳන් 2024 වෙනකම් ගිනි තියලා තිබෙන්නේ ඔබතුමන්ලා. එහෙම නේ වෙන්න ඕනෑ. මෙවර අපි ගිනි තැබුවා නම්, ඊට කලින් ගිනි තියලා තිබෙන්නේ ඔබතුමන්ලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2022දී මෙට්‍රික් ටොන් 33,000ක් ගිනි තියලා තිබෙනවා; ගිනි ඇවිළිලා තිබෙනවා. හැබැයි, ඒවා මිලදී ගත්තා ගබඩා. කොටින්ම කියනවා නම්, අපි කැමති හෝ අකැමති දයා ගමගේ ව්‍යාපාරිකයෙක් විධියට කාලයක් ඔය සීනි කර්මාන්තශාලාව කළා. එතුමා ව්‍යාපාරිකයෙක් විධියට ඔය ගිනි ගත්ත හෝ ගිනි තියපු උක් ගස් ටික මිලදී ගත්තා. ඒවා කර්මාන්තශාලාවට දමන්නේ නැතුව බැහැර කළා. මොකද, එහෙම කළේ ගොවියා රකින්න ඕනෑ හින්දායි. ව්‍යවසායකයනුත් ගොවියා රැක්කා නම්, මීට කලින් හිටපු ආණ්ඩු 2018 ඉඳන් ගිනි ගත්ත උක් ගස් ටික අරගෙන ගොවියාව රැක්කා නම්, මේ පුනරුද ආණ්ඩුව ඇයි ඒ ගොවියාව රකින්නේ නැත්තේ? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගිනි තිබ්බා, ගිනි තිබ්බා කියලා ඔබතුමා ගිනි තියමින් ඉඳලා හරියන්නේ නැහැ. ගොවියාව රකින්න. ඒ උක් ගස් ටික කපලා ඒ ගොවි බිම් ටික සකස් කළේ නැත්නම් ගොවියාගේ අනාගතය ඉවරයි. ගොවියා ඊළඟ කන්නයට සූදානම් වෙන්නේ නැහැ. සජබ අපේක්ෂකයෝ විසින් ගිනි තිබ්බා, ගිනි තිබ්බා කියලා හරියන්නේ නැහැ. 2018 ඉඳන් හැම අවුරුද්දේම මෙට්‍රික් ටොන් දසදහස් ගණනක් ගිනි අරගෙන තිබෙනවා. එහෙම නම් ඒවා ගැනත් හොයා බලන්න. එක එක්කෙනාට ඇඟිල්ල දිගු කරන එක නොවෙයි වෙන්න ඕනෑ. ඒ ගිනි ගත්ත උක් ගස් ටිකේ තවම සීනි තිබෙනවා. මම ඒ උක් ගස් කාලා බැලුවා. ඒවා කර්මාන්තශාලාවලට දමන්න පුළුවන්. ඒ ගොවීන්ගේ ගිනි ගත්ත උක් ගස් ටික කපන්න, පටවන්න අමතර වියදමක් ඔවුන්ට යනවා. ඔවුන්ගේ වියදම හරි cover කරගන්න, තමන්ගේ දරු පවුල් රැක ගන්න, ඒ කර්මාන්තය රැක ගන්න, ඒ උක් ගොවියා ඊළඟ කන්නයටත් සූදානම් කරන්න, උක් ගොවීන් ආරක්ෂා කරන්න ඒ ගිනි ගත්ත උක් ගස් ටික ගන්න ඕනෑ.

එහාට මෙහාට ඇඟිල්ල දිගු කරන එක නොවෙයි කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔය ගිනි තියපු කතන්දරය ඔබතුමාට සෙවනගලට ගිහිල්ලා කියන්න පුළුවන්ද? ඔබතුමාට අත් දෙක බැඳගෙන මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳන් ඔය කථාව කියන්න පුළුවන්. හැබැයි, ඔබතුමාට සෙවනගලට ගිහිල්ලා ඔය කථාව කියන්න බැහැ. එතැනට ගිහිල්ලා කියන්න බැහැ, ඔබතුමාට ඒ කථාව. ඔබතුමාට එතැනට යන්නත් බැහැ. ඔබතුමන්ලා එනකම් ගොවියෝ බලාගෙන ඉන්නවා. අපි බිංගිරියේ ඉඳලා සෙවනගලට ගිහිල්ලා ඒ ගොවියෝ ගැන හොයා බැලුවා. ජනාධිපතිතුමාත් ඇවිල්ලා ගියා. ඒ නිසා කරුණාකරලා ඔබතුමා ඒ කටයුත්ත වෙනුවෙන් මැදිහත් වෙන්න. ඔබතුමන්ලා ඒ උක් ගස් ටික මිලදී ගන්නවාද?

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
උක් ගස් ටික ගන්න විධිය හදලා තිබෙන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
උක් ගස් ටික ගන්න විධිය හදලා තිබෙනවාය කිව්වාට වැඩක් නැහැ. ඒවා තවම ට්‍රැක්ටර් උඩ පටවලා තිබෙනවා. එම නිසා ඒ උක් ගස් ටික වහාම මිලදී ගන්න. සජබ අය ගිනි තබලා තිබෙනවා නම් ඒ අයට දඬුවම් දෙන්න. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපේ නොවෙයි නේ ආණ්ඩුව. එම නිසා ඒ අයට දඬුවම් දෙන්න. හැබැයි, උක් ගොවියාට සාධාරණයක් කරන්න. ඒ වාගේම 2018දී ගිනි තබපු ඒවා ගැනත්, 1988-89 කාලයේ ගිනි තබපු ඒවා ගැනත් සොයා බලන්න.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.45]

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை ஒரு விவசாய நாடு. இந்த நாட்டிலே வாழுகின்ற பெரும்பான்மையான மக்கள் விவசாயிகள். அதிலும் வடக்கு-கிழக்குப் பகுதிகளில் வாழுகின்ற மக்கள் பெரும்பான்மை யானவர்கள் விவசாயிகள். இலங்கையில் ஏறக்குறைய 2,000,000 ஏக்கர் நிலத்தில் நெற்பயிர்ச் செய்கை மேற்கொள்ளப்படுகின்றது. அதிலே, வன்னிப் பிரதேசத்தில் 200,000 ஏக்கரில் நெல் பயிரிடப்படுகின்றது. வன்னியில் நெற்பயிர்ச் செய்கைக்கு, அதாவது பெரும்போகத்தில் பயிர்செய்யப்பட்ட இரண்டு இலட்சம் ஏக்கருக்கான உர மானியத்துக்காக இரண்டாயிரம் மில்லியன் ரூபாய் நிதி எமது அரசாங்கத்தால் வழங்கப்பட்டது. அதேபோன்று, கடந்த சிறுபோகத்தில் 67,000 ஏக்கர் வயல் நிலங்களில் நெற்பயிர் செய்கை பண்ணப்பட்டது. அவ்வாறு விதைக்கப்பட்ட வயல்களுக்கும் பசளை மானியம் வழங்கப்பட்டது.

முல்லைத்தீவு மாவட்டத்தைப் பொறுத்தவரையில், கழிவுநீர்மூலம் விளைவிக்கப்படுகின்ற நெற்பயிர்ச் செய்கைக்கு கடந்த காலத்தில் பசளை மானியம் வழங்கப்படவில்லை. ஆனால், எமது அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பின்னர் கழிவுநீர்மூலம் விளைவிக்கப்படுகின்ற நெற்பயிர்ச் செய்கைக் கான பசளை மானியம் அண்ணளவாக 1,200 ஏக்கர் வயல் நிலங்களுக்கு வழங்கப்பட்டது. இந்த வருடம் முல்லைத்தீவு மாவட்டத்திற்கு 4,000 மில்லியன் ரூபாய் நிதியானது நீர்ப்பாசனத் திணைக்களத்திற்கு ஒதுக்கப்பட்டு, குளங்கள் மற்றும் ஏனைய நீர்ப்பாசனக் கட்டுமானப் பணிகளுக்காகப் பயன்படுத்தப்படுகின்றது.

கடந்த காலத்தைப்போல் அல்லாமல் எமது ஆட்சிக் காலத்திலே விவசாயிகள் பெருமளவு நன்மைகளைப் பெற்றுக் கொள்கின்றார்கள். கடந்த ஆட்சிக் காலத்திலே ஒரு ஹெக்டயருக்கு 15,000 ரூபாய் உர மானியம் வழங்கப்பட்டது. ஆனால், எமது அரசாங்கத்தினால் ஒரு ஹெக்டயருக்கு 25,000 ரூபாய் உர மானியம் வழங்கப்படுகின்றது. நெற்பயிர் செய்கைக்கு மாத்திரமன்றி, சிறுபோகக் காலத்தில் வயல் நிலத்திலேயே பயிர் செய்யப்படுகின்ற உப உணவுப் பயிர்களுக்கு ஏக்கர் ஒன்றுக்கு 6,000 ரூபாய் உர மானியம் வழங்கப்படுகின்றது. உண்மையிலேயே சொல்லப்போனால், எமது அரசாங்கமானது ஆட்சியைக் கைப்பற்றியதன் பின்னர் விவசாயிகளுக்கு ஒரு பொற்காலம் உருவாகியுள்ளது எனக் குறிப்பிடலாம்.

எதிர்க்கட்சியில் இருக்கின்ற உறுப்பினர் ஒருவர் எமது ஆட்சிக் காலத்தில் விவசாயிகள் tractorஐக் கொள்வனவு செய்வதற்கு வழியில்லாமல் இருக்கின்றார்கள் என்று தெரிவித்திருந்தார். உண்மையிலேயே கடந்த காலத்தில் leasing மூலம்தான் tractors கொள்வனவு செய்யப்பட்டன. ஆனால், எமது ஆட்சிக் காலத்தில் ready cash - முழுப் பணத்தினையும் செலுத்தி tractorஐக் கொள்வனவு செய்யக்கூடிய வாய்ப்பு விவசாயப் பெருமக்களுக்குக் கிடைக்கப் பெற்றுள்ளது என்பதை நான் இந்தத் தருணத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்தில் மாத்திரமல்லாமல் மன்னார், வவுனியா போன்ற மாவட்டங்களிலும் நெற்பயிர்ச் செய்கை யானது சிறந்த முறையில் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. வன்னித் தேர்தல் மாவட்டங்கள் மூன்றுக்கும் எமது அரசாங்கம் பெருமளவு நிதியை ஒதுக்கீடு செய்து விவசாயத் துறையை மேம்படுத்திக் கொண்டிருக்கின்றது. அதேபோல், கடந்த யுத்த காலத்தில் கைவிடப்பட்டிருந்த நிலங்களையும் குளங்களையும் மீண்டும் பயிர்ச்செய்கையில் ஈடுபடுத்துவதற்கான நடவடிக்கைகளை எடுத்து வருகின்றது. அங்குள்ள நித்தகைக் குளத்தின்கீழ் 1,800 ஏக்கர் நெற்பயிர்ச் செய்கை செய்யக்கூடிய வயல்கள் இருக்கின்றன. கடந்த காலத்தில் அந்த நிலங்களில் நெற்பயிர்ச் செய்கை செய்யப் படாமல் இருந்தது. எமது அரசாங்கம் குறித்த குளத்தைப் புனரமைப்பதற்கும் அதன்கீழ் உள்ள நிலங்களை, அதாவது வன பாதுகாப்புத் திணைக்களத்தினுடைய கட்டுப்பாட்டில் உள்ள நிலங்களை விடுவித்து, அந்த நிலங்களில் மீண்டும் நெற்பயிர் செய்கையை மேற்கொள்வதற்கும் உரிய நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது.

அதுபோல், முல்லைத்தீவு மாவட்டத்தில் 6 பெரிய நீர்ப்பாசனக் குளங்கள் காணப்படுகின்றன. இந்தக் குளங்கள் அனைத்துக்கும் தேவையான உட்கட்டமைப்பு வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதற்கு எமது அரசாங்கம் தயாராக உள்ளது. அங்குள்ள முத்தையன்கட்டுக் குளம் 2015ஆம் ஆண்டு 4,850 கோடி ரூபாய் செலவு செய்யப்பட்டு புனர்நிர்மாணம் செய்யப்பட்டிருந்தது. ஆனால், அதனுடைய வாய்க்கால்கள் புனருத்தாரணம் செய்யப்படவில்லை. கடந்த வாரம் மாண்புமிகு ஜனாதிபதி அவர்கள், முல்லைத்தீவு மாவட்டத்துக்கு விஜயம் செய்த வேளையில், குறித்த வாய்க்கால்களைப் புனருத்தாரணம் செய்வது தொடர்பில், அவருடன் கலந்துரையாடி அதற்குரிய நிதியைக் கோரியிருந்தேன். எதிர்வரும் வருடத்தில் அதற்குரிய நிதியைத் தந்துதவுவதாக அவர் உறுதியளித்திருக்கிறார்.

வடக்கிலே வாழுகின்ற மக்கள் அதிகமாக விவசாயம் மற்றும் கால்நடை வளர்ப்பை மேற்கொள்கின்றார்கள். கடந்த மாதம், அதாவது எட்டாம் மாதம் முதலாந் திகதியிலிருந்து பசுப்பாலின் கொள்வனவு விலையானது பத்து ரூபாயினாலும், எருமைப் பாலின் விலையானது இருபது ரூபாயினாலும் அதிகரிக்கப்பட்டுள்ளது. இதன்மூலம் கால்நடை வளர்ப்பில் ஈடுபட்டுக்கொண்டிருக்கும் விவசாயிகளுக்குப் பாரிய நன்மை ஏற்பட்டிருக்கின்றது. இலங்கையில், எமக்குத் தேவையான பாலில் 40% மாத்திரமே உள்நாட்டில் உற்பத்தி செய்யப் படுகின்றது. மிகுதி வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யப்படுகின்றது. எதிர்வரும் காலங்களில் உள்நாட்டில் பாலின் உற்பத்தியை அதிகரிப்பதன்மூலம், வெளிநாடுகளில் இருந்து இறக்குமதி செய்யும் பாற் பொருட்களின் அளவைக் குறைத்து, கால்நடைத் துறையின் ஊடாக எமது நாட்டிலிருந்து வெளிநாடுகளுக்குச் செல்கின்ற அந்நியச் செலாவணியைக் குறைத்து, நாட்டினுடைய பொருளாதாரத்தை ஸ்திரப் படுத்துவதற்கு அரசாங்கம் முயற்சிக்கின்றது.

கிழக்கு மாகாணத்தில் நெல் கொள்வனவின்மூலம் அம்பாறை, சம்மாந்துறை போன்ற பிரதேசங்களில் இருக்கின்ற நெற்களஞ்சியசாலைகள் பூரணமாக நெல்லினால் நிரம்பிய நிலையில் காணப்படுகின்றது. ஆனால், எதிர்க்கட்சி உறுப்பினர் ஒருவர் கூறியிருந்தார், அங்கேயுள்ள நெற் களஞ்சியசாலைகள் வெறுமனே காணப்படுவதாக. அதேவேளை, வடக்கு மாகாணத்தில் காணப்படுகின்ற நெற் களஞ்சியசாலைகள் கடந்த காலத்திலே ஏற்பட்ட அனர்த்தம் காரணமாகப் பல்வேறு பாதிப்புகளைச் சந்தித்திருந்தன. அந்த நெற் களஞ்சியசாலைகளில் தற்போது திருத்த நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுக் கொண்டிருக்கின்றது. எதிர்வரும் காலத்தில் எமது பிரதேசத்தில் உற்பத்தி செய்யப்படுகின்ற நெல்லைக் கொள்வனவு செய்து, அவற்றில் களஞ்சியப்படுத்தி, மக்களுடைய தேவைகளைப் பூர்த்தி செய்வதற்கு நாங்கள்

[ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

முயற்சித்துக் கொண்டிருக்கின்றோம் என்பதையும் இந்த உயரிய சபையில் தெரிவித்து, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.53]

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාවට අදහස් දක්වන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා. රජය මෙවර යල කන්නයේ වී මිලදී ගැනීම සඳහා සහතික මිල ගණන් දෙකක් ලබා දී තිබෙනවා. තෙත වීවලට රුපියල් 102ක් සහ වේළපු වීවලට රුපියල් 120කුත් වශයෙන් මිල ගණන් ලබා දී තිබෙනවා. අපි ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, වී අලෙවි මණ්ඩලයේ තිබෙන ගබඩාවලට ගොවීන් ප්‍රමාණවත් ලෙස වී ගෙනැවිත් දුන්නාද, රජය ඒ ගැන සෑහීමකට පත් වෙනවාද කියලා. මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, මෙට්‍රික්ටොන් 3,667ක් පමණයි මුළු දිස්ත්‍රික්කයේම තිබෙන ගබඩාවලට වී ලැබිලා තිබෙන්නේ. එක පැත්තකින් ගොවියා ගබඩාවලට වී ගෙනාවේ නැහැ. තවත් පැත්තකින් රජය තෙත වීවලට මිලක් ලබා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ පැවති කිසිම රජයක් තෙත වීවලට මිලක් ලබා දුන්නේ නැහැ. ඒ නිසා මේ තෙත වීවලට ලබා දුන් රුපියල් 102ක මිලත් එක්ක,- එක පැත්තකින් ගොවියාට වී ටික වේළා ගන්න විධියක් නැහැ- ප්‍රබල මෝල් මුදලාලිලා ටික කුණු කොල්ලයට මේ කන්නයේ වී ටික මිලදී ගත්තා.

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා මගේ මිත්‍රයෙක්. ඔබතුමායි මමයි එකට උද්ඝෝෂණ කරලා තිබෙනවා. ඔබතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අරලගංවිල ප්‍රදේශයේ උද්ඝෝෂණයක් කරලා කිව්වා, රුපියල් 154ට වී මිලදී ගන්නවා කියලා. එදා ගොවියාට වී කිලෝවක් නිෂ්පාදනය කරන්න තිබුණු මිලත් එක්ක තමයි ඒ මිල කිව්වේ කියලා ඔබතුමා කිව්වා. මම අහන්න කැමැතියි, එදා තිබුණු මිලයි, අද තිබෙන මිලයි,-

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මට තිබෙන කාලය ගන්න එපා. මට මගේ කාලය අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම සඳහන් කරමින් අසත්‍ය ප්‍රකාශයක් කළා. ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 150ට වැඩි නිෂ්පාදන වියදමක් වීවලට යනවා කියලා අපි කිව්වා. එහෙම කිව්වේ, විපක්ෂ නායකතුමා කිව්වා නේ අස්වැන්න සියයට 34ක් දක්වා අඩු වුණා කියලා. අන්න ඒ කාලයේ වී කිලෝවක නිෂ්පාදන වියදම තමයි අපි ඒ කිව්වේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ඒක තමයි මම මේ කියන්න හැදුවේ. මට ඒක පැහැදිලි කරන්න දෙන්නකෝ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. එදා තිබුණු මිලට සාපේක්ෂව ගත්තොත්, අද යූරියා මිටියේ මිල රුපියල් 50,000 සිට රුපියල් 10,000 දක්වා අඩුවෙලා තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. හැබැයි එදා අක්කරයක් හාන්න වැය වුණේ රුපියල් 15,000යි. අද, රුපියල් 25,000යි. ගොයම් කැපුවේ රුපියල් 12,000ට. අද රුපියල් 18,000යි. එතකොට ඉන්ධන මිල අඩුවෙලා තිබෙනවාද? මහ කන්නයට සාපේක්ෂව මේ යල කන්නයේදී හෙක්ටෙයාරයකින් ගොවියා රුපියල් 75,000ක පාඩුවක් විඳලා තිබෙනවා. ඒකයි මේ කියන්න යන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. එදා දුන්නු රුපියල් 154ක මිල, මේ යල කන්නයේදී හරි නම් රුපියල් 170ක් විතර වෙන්න ඕනෑ. එහෙම මිලක් දෙන්න බැහැ කියන එක අපි පිළිගන්නවා. හැබැයි, වියදම අඩුවෙලා නැහැ. මම දැක්කා, ඔබතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 68ක් යනවා කියලා. ඒ රුපියල් 68 හැදුවේ කවුද? මම විශ්වාස කරන විධියට, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නම් වී කිලෝවක් නිෂ්පාදනය කරන්න අවම වශයෙන් රුපියල් 112ක්, 113ක් වියදම් වෙනවා.

රජය රුපියල් 120ක සහතික මිලක් දීලා තිබෙන එක ඇත්ත. ගරු ඇමතිතුමනි, රජය සහතික මිලක් දීලා තිබුණාට, තෙත වීවලට 102ක මිලක් දුන්නාට තෙත වී ගත්තාද? තෙත වී ගත්තේ නැහැ.

කඩිනම් මහවැලි ව්‍යාපාරය යටතේ අපි එදා හෙක්ටෙයාර එකකින් වී කිලෝ 6,000ක්, 7,000ක් නිෂ්පාදනය කළා. එහෙම නම් අද නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. ඒ නිෂ්පාදනය වැඩි කර ගන්න ගොවියා ධෛර්යවත් කරන්න වෙනවා. එක පැත්තකින් ගොවියා ධෛර්යවත් කරනවා වාගේම රජයේ බැංකුවක් මැදිහත් වෙන්න ඕනෑ ගරු ඇමතිතුමනි. දැන් ගොවියා හැම කන්නයකදීම ගමේ ඉන්න මුදලාලිට, නැත්නම් ගමේ පොලියට දෙන මුදලාලිට තමයි යටත් වෙන්නේ. ඒ නිසා කුඩා හා මධ්‍යම ව්‍යාපාරිකයන්ට, වී ගබඩා කර ගන්නා මුදලාලිලාට ණය පහසුකමක් දෙනවා වාගේම කරුණාකරලා මේ මහ කන්නයේදීවත් රජයේ බැංකුවක් මැදිහත් කරලා ගොවියාට විශේෂ ණය පහසුකමක් ලබා දීලා, ගොවියා ධෛර්යවත් කරන්න. එහෙම කරලා වේලාවට පොහොර සහනාධාරය, වේලාවට වතුර ටික ලබා දුන්නොත් ඔබලා දෙන මිල සාධාරණයි.

දැන් ගොවියා හැම පැත්තකින්ම තැළෙනවානේ. අලි-මිනිස් ගැටුමෙනුත් ගොවියා තමයි තැළෙන්නේ. ඔබතුමන්ලා කියන විධියට යල කන්නයේ ගොවියා පාරට බැස්සේ නැහැ. ගොවියාට පාරට බහින්නවත් විධියක් නැහැ, එච්චර අමාරුයි ගොවියාට. අපි ඔබතුමන්ලා වාගේ ගොවියා ළඟට ගිහිල්ලා පෙළ ගස්සලා, "යමු, පාරට බහිමු" කිව්වේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමන්ලා පොළොන්නරුවේ හිඟුරක්ගොඩට ඇවිල්ලා වෙච්ච දේ දන්නවා නේ. ඔබතුමන්ලා අනවශ්‍ය විධියට අපව එතැනට ගෙන්වා ගන්න එපා. ඒවා කියා ගන්න හදන්නත් එපා. හිඟුරක්ගොඩ වෙච්ච

සිද්ධිය ගැන කථා කරන්න ඕනෑ නැහැ නේ. පොළොන්නරු දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩට ආව වෙලාවේ ගොවීන් හැසිරුණු විධිය අපි දන්නවා නේ. ගොවියා සතුටු නම් එහෙම හැසිරෙයිද? එතැනට අපි කවුරුත් සම්බන්ධ වුණේ නැහැ නේ, අපේ ගොවීන් එතැනට ඇවිල්ලා කෑ ගැහුවේ නැහැ නේ. දේශපාලන පක්ෂ, පාට භේදවලින් තොරව ගොවීන් එතැනට ගිහිල්ලා තමන්ගේ දුක කිව්වා. ගොවියාත් එක්ක කථා කරන්න ජංගම සේවා දැම්මා නම්, රට පුරා ගියා නම්, ගොවි ජනපදවලට ගියා නම් ගොවියා කියාවි. ගොවියා එළියට බැහැලා කෑ ගහලා කිව්වේ නැහැ "අපට අමාරුයි" කියලා. ගොවියා ඇත්තටම අමාරුවෙන් ඉන්නේ. ගොවියාට වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 113ක්, 114ක් යනකොට ගොවියාගේ වී ටික ගන්නේ රුපියල් 80ට, 95ට නම් ගොවියා මඩට බහීද? මඩ සෝදා ගත් කල ගොවියා රජකමට සුදුසුයි කියලා කිව්වේ නිකම් නොවෙයි නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේ ගොවි ජනපදයක්. මට මතකයි, ඒ කාලයේ ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා පොහොර කප්පාදු කළ වෙලාවේ ඔබතුමන්ලා පාරට බැහැලා ගොවියා වෙනුවෙන් පෙනී සිටියා. හැබැයි අද ඔබතුමන්ලා ඉන්නේ ආණ්ඩුවේ. ඔබතුමන්ලා ආණ්ඩුවේ ඉඳගෙන විපක්ෂයේ විධියට හැසිරෙන්න එපා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මේක පැහැදිලි කරලා පෙන්වා දෙන්න හදනකොට ඔබතුමන්ලා ඉස්සරහා පැත්තෙනුත් කෑ ගහනවා, පිටිපස්ස පැත්තෙනුත් කෑ ගහනවා, අපට දෙයක් කියා ගන්න දෙන්නෙත් නැහැ. එහෙම කරන්න එපා. අපි ජනතාවගේ හඬ මේ අවදි කරන්නේ. පොළොන්නරු දිස්ත්‍රික්කය නියෝජනය කරන විපක්ෂයේ එකම මන්ත්‍රීවරයා මම. අපි මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ උඩින් පහත් වෙලා නොවෙයි. ඔබතුමන්ලා කියන විධියට උඩුගං බලා පීනපු කෙනෙක් මම. ඔබතුමන්ලා ශ්‍රමදානයක් දාලා මේවා ශුද්ධ කරනකොට දෙවෙනි වතාවටත් පොළොන්නරුවේ මිනිස්සු මාව පාර්ලිමේන්තුවට එව්වා නේ. එතකොට මොකක්ද මගෙන් පොළොන්නරුවේ ජනතාවට වෙන්න ඕනෑ සාධාරණය? මේ සභාවේදී තමයි කථා කරන්න තිබෙන්නේ. වෙන කථා කරන්න තැනක් නැහැ. මේ සභාවේදීත් කථා කරන්න දෙන්නේ නැත්නම්, මේ සභාවේදීවත් මේවා අවබෝධ කරලා දෙන්න ඉඩ දෙන්නේ නැත්නම්, කොතැනද අපි කියන්නේ? *[බාධා කිරීමක්]* ඒක තමයි ගරු ඇමතිතුමා අපි කියන්නේ, ගොවියාට සාධාරණයක් කරලා දෙන්න. විශේෂයෙන් මේ අවස්ථාව ඒ සඳහා ලබා දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ගොවියාට යන වියදමට සාපේක්ෂව මහ කන්නයේදී ඔවුන්ගේ අස්වැන්නට සාධාරණ මිලක් ලබා දේවි කියලා මම විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි **10ක** කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.01]

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා ගොවීන් පාරට බස්සන්න ගොවීන්ට කථා කළේ නැහැ කියලා කිව්වා. නැහැ, කථා කළා. නමුත් ගොවීන් පාරට බැස්සේ නැහැ. ඒක තමයි වුණේ. මෙහෙමයි. අපි වීවලට රුපියල් 120ක අවම මිලක් නියම කළා. ඒ වාගේම වී අලෙවි මණ්ඩලය වී මාර්කට් එකට වී මිලදී ගැනීම සඳහා සූදානම්, ඒ ක්‍රියාවලිය ආරම්භ කළා. රුපියල් 15,000ට තිබුණු පොහොර සහනාධාරය රුපියල් 25,000 දක්වා වැඩි කළා. අපේ එක අරමුණක් වුණේ වී මිල ස්ථාවර කරන එක. දෙවෙනි එක, පාරිභෝගිකයාට සහල් මිල ස්ථාවර කරන එක. දැන් ගරු මන්ත්‍රීතුමා ඇහුවා වී අලෙවි මණ්ඩලය කොච්චර වී ප්‍රමාණයක් අරගෙන තිබෙනවාද, සැබෑමකට පත් වෙනවාද කියලා. වී අලෙවි මණ්ඩලය වී මිලදී ගැනීමට කටයුතු කළ එක අරමුණක් තමයි වී වෙළෙඳ පොළේ වී මිල ස්ථාවර කිරීම. දෙවෙනි එක, සහල් වෙළෙඳ පොළේ සහල් මිල උච්චාවචනය වෙනකොට වී තොගයක් සහල් කරලා සහල් මිල ස්ථාවර කර ගැනීම.

වී අලෙවි මණ්ඩලයට දැනුත් වී යම් ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. ඒ ප්‍රමාණය සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තිබෙනවා. ඔව්, සමහර තැන්වල ගොවීන්ට වී කිලෝවක් රුපියල් 120ටම දෙන්න බැරි වුණා. මොකද, තෙත වී කිලෝවක් ගත්තේ ටිකක් අඩු මිලට. අපි ඒක පිළිගන්නවා. වී අලෙවි මණ්ඩලය වට්ටලා තිබුණු තැන ගත්තාම, නැති භංගස්ථාන කරලා තිබුණු විධිය ගත්තාම මේ විධියෙන් හරි බේරුණා ඇති. අප මේ වැඩේට බැහැලා වී අළෙවි මණ්ඩලයේ වී ගබඩා පිළිසකර කරලා වී මිල දී ගැනීමට කටයුතු කළේ නැත්නම් අද වී මිල කීයක් වෙයිද? අප අවම මිල රුපියල් 120යි කියලා හරි වෙලාවට ගැසට් කරලා ප්‍රකාශයට පත් කළේ නැත්නම් වී මිල කීයක් වෙයිද? අප රුපියල් 15,000ට තිබුණු පොහොර සහනාධාරය රුපියල් 25,000ට වැඩි කළේ නැත්නම් වීවල නිෂ්පාදන පිරිවැය කීයක් වෙයිද? ඒ නිසා තමයි ගොවියා අද පාරට බහින්නේ නැත්තේ. අප මේ ක්‍රියාමාර්ගය ගත්තේ නැත්නම්, මේ වැඩ ටික කළේ නැත්නම් පාරේ වී ටික ගිනි තියන්නයි ගොවියාට අද සිදු වෙන්නේ. අප ආණ්ඩුව භාර ගන්න කොට වී අලෙවි මණ්ඩලය අවුරුදු 4කින් වී ඇටයක්වත් කිරලා තිබුණේ නැහැ. එහි එක ගබඩාවකවත් වී ගබඩා කරන්න බැහැ; එක ලොරියයි තිබෙන්නේ. රුපියල් මිලියන 28,000ක් -බිලියන 28ක්- ණයයි, වී අලෙවි මණ්ඩලය. සේවකයෝ නැහැ. ඒක තමයි තිබුණු තත්ත්වය. අවුරුදු 4කින් ගිණුම් පියවලා නැහැ. අපි ඇවිල්ලා මුදල් වෙන් කරලා වී මිල දී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය කඩිනමින් සූදානම් කළා. සමහර තැන්වල ගබඩා repair කිරීම සඳහා වෙච්ච ඇස්තමේන්තු හදන එකට සාමාන්‍ය ක්‍රමවේදය ඔස්සේ ගියා නම් පරක්කු වෙන නිසා, අපි හමුදාවට කථා කරලා හමුදාවේ අය අරගෙන තමයි ඒ ගබඩා repair කළේ. අපි ගබඩා 123ක් සූදානම් කළා. දැන් අපි ලැහැස්ති වෙලා ඉන්නවා තවත් ගබඩා 80ක් හදන්න, එළඹෙන අවුරුද්දේ. එතකොට වී ගබඩා 200ක් සම්පූර්ණ වෙනවා. අපේ ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, "ආණ්ඩුව වී මිල දී ගැනීම සඳහා ක්‍රමවේදයක් හදලා තිබෙන බව අපි දන්නවා. නමුත්, එය සාධාරණ නැහැ" කියලා. මේ තිබෙන තත්ත්වය ඇතුළේ අපි උපරිම සාධාරණයක් ඉෂ්ට කර තිබෙනවා. සමහර තැන්වල වී අලෙවි මණ්ඩලයේ ගබඩා පිරුණා. අප කළේ ගොවි සංවිධානවල තිබෙන ගබඩාවල වී ගබඩා කරන්න ගත්තු එකයි. වාහල්කඩ එහෙම කළා. රාජාංගනය ගත්තාම, වී අලෙවි මණ්ඩලයේ ගබඩාව පිළිසකර කරන්න බැහැ. ඒක ඒ තරම් අබලන්. අප කළේ මොකක්ද? රාජාංගනයෙන් වී අරගෙන transport කළා තලාවේ ගබඩාවට. නිලධාරීන් නැහැ. අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් අනුයුක්ත කරන නිලධාරීන් වී අලෙවි මණ්ඩලයට ලබා දුන්නා; ගොවි සංවිධානවලින් නියෝජිතයකු ගණනේ වී අලෙවි මණ්ඩලයට ලබා දුන්නා. ඔවැනි තත්ත්වය තමයි එය තිබුණේ. වී අලෙවි මණ්ඩලය වී ගබඩා කළාට වනඅලි තර්ජන ආවා. අපි ඒකට ක්‍රියාමාර්ගයක් ගත්තා ආරක්ෂක අමාත්‍යාංශය සමහත් කථා කරලා. ඒ තමයි, වී අලෙවි මණ්ඩලයට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආරක්ෂාව ලබා ගැනීම. එහෙම නම්, අපගේ ක්‍රමවේදය සාධාරණ නැහැ කියන්නේ කොහොමද? අනුරාධපුරයේ හොරොව්පතාන වාගේ ඇත

[ගරු (වෛද්‍ය) සුසිල් සුසිල් රණසිංහ මහතා]

තැන්වලත් වී අලෙවි මණ්ඩලයේ ගබඩා විවෘත කරලා අද වී යම් ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. අපි ඒ ගොවීන්ටත් සාධාරණයක් කරලා තිබෙනවා.

අප මේ ක්‍රියාමාර්ගය ගත්තේ නැත්නම් අද වී මිල ගොවියාට කිසිදු ලාභයක් එන්නේ නැති මට්ටමට එනවා. මේ ක්‍රියාමාර්ගවලින් තමයි වී මිල රැකිලා තිබෙන්නේ; ගොවියාට සහනයක් ලැබිලා තිබෙන්නේ. ගිය මාස් කන්නයේ ගොවියාට හොඳම මිලක් ආවා. ඒ නිසා මේ යල කන්නයේ කළේ මොකක්ද? ගොවියා උපරිම ප්‍රමාණයක් වී වගා කරලා තිබෙනවා. මේ සැරේ බොහෝ තැන්වල අස්වැන්නත් හොඳයි. මඩකලපුව දිස්ත්‍රික්කයේත් එහෙමයි. මා මඩකලපුව දිස්ත්‍රික්කයට ගිය වෙලාවේ එහි හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම නියෝජනය වන පරිදි ගොවියෝ ඇවිල්ලා අපත් එක්ක සාකච්ඡා කළා.

ඒ හැමෝම කිව්වා, මේ සැරේ වී අස්වැන්න හොඳයි, වී අලෙවි මණ්ඩලය සාධාරණ මැදිහත් වීමක් කළ නිසා වී සඳහාත් හොඳ මිලක් ලැබුණා කියලා. පොහොර සහනාධාරය සම්බන්ධයෙන් ද කථා කළා. සමහර තැන්වල එය වෙලාවට ලැබුණේ නැහැ තමයි. ඒවාට බලපෑ නොයෙක් හේතු තිබෙනවා; නොයෙක් ප්‍රශ්න තිබෙනවා. අපි දන්නවා, සමහර වෙලාවට නිලධාරින් ඒවා අවභාවිත කළා කියලා. ඒ සම්බන්ධයෙන් අපි නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. සමහර තැන්වල මේ ක්‍රියාවලිය විසින් ද අතපසුවීම් වෙලා තිබුණා. අපි ඒවාත් නිවැරැදි කළා. හැම තැනම පොදුවේ වෙච්ච දෙයක් නොවෙයි ඔබතුමන්ලා කියන්නේ. ඒ නිසා සමහර තැන්වල වෙච්ච ඒවාට පොදු අර්ථකථනයක් දෙන එක වැරැදියි. කෙසේ වෙතත්, අපි එහිදී සාධාරණ මැදිහත් වීමක් කර තිබෙනවා.

ලබන අවුරුද්දේ වී අලෙවි මණ්ඩලය තවත් දියුණු කරන්න ඕනෑ; වී අලෙවි මණ්ඩලයේ තවත් ගබඩා පිළිසකර කරන්න ඕනෑ. තවත් ගබඩා 80ක් පිළිසකර කිරීම සඳහා වන වැඩ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම dryers සවි කිරීම සම්බන්ධයෙනුත් අපේ වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි ඒක නියමු ව්‍යාපෘතියක් විධියට ලබන අවුරුද්දේ පටන් ගන්න තීරණය කර තිබෙනවා. ඒ වාගේම වී අස්වැන්න හොඳින් ගබඩා කරන්න පුළුවන් තාක්ෂණයෙන් ඉහළ ගබඩා හදන්නත් අපි අත තියලා තිබෙනවා. තිබුණු තත්ත්වයත් එක්ක බැලුවාම වට්ටලා, නැති කරලා, නැති භංගස්ථාන කරලා තිබුණු වී අලෙවි මණ්ඩලය ගොඩ ගෙන, වී මිල ස්ථාවර කිරීම සඳහා කඩිනමින් මැදිහත් වෙලා උපරිම සාධාරණයක් අපි කර තිබෙනවා. ගොවියෝ ඒක දන්නවා.

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාට වඩා අපි යනවා ගොවීන් හමු වෙන්න. අපි ගොවීන් එක්ක සාකච්ඡා කරනවා; ගම්වල රැස්වීම් පවත්වනවා. අපට ඔය කියන ආකාරයේ විරෝධයක් එන්නේ නැහැ නේ. එතුමන්ලාගේ රැස්වීම්වලට 10ක්, 15ක් ආවාට, අපේ රැස්වීම්වලට 100ක්, 150ක් එනවා. රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා ඉන්න දිස්ත්‍රික්කයේම තමයි මමත් ඉන්නේ. ඒ ආසනයේම තමයි මමත් ඉන්නේ; මහවැලි areasවල තමයි අපිත් ඉන්නේ. ඔය කියන විධියේ විරෝධයක් එන්නේ නැහැ. නමුත් අපි දන්නවා, ප්‍රශ්න තිබෙනවා කියලාත්. වී අස්වැන්න අඩු වීම සම්බන්ධයෙන් ද කථා කළා. ඔව්, වී අස්වැන්නේ අඩු වීමක් තිබෙනවා. ඒකට හේතු ගොඩක් තිබෙනවා. විශේෂයෙන්ම රසායනික පොහොර තහනම් කරලා කාබනික පොහොරවලට බලෙන් ඇද දැමීමෙන් වී අස්වැන්න අඩු වෙලා තිබෙනවා. ගොවීන් වී සඳහා පොහොර යොදන ක්‍රමවේදවල ගැටලු තිබෙනවා. ඒවා නිවැරැදි කිරීම සඳහාත් අපි වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කරලා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යෝජනා කරන තාක්ෂණ පැකේජය, වී වගා කිරීමේ අලුත් ක්‍රම ගොවියාට හඳුන්වා දීම සඳහා අපි වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම මහවැලි ප්‍රදේශවල සහ මහා වාරි ව්‍යාපාර ආශ්‍රිත ගොවි සංවිධානත් එක්ක කථා කරලා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ AI මහත්වරුන් එක්කත් කථා කරලා, වාරිමාර්ග කළමනාකරණ අංශයේ RPM මහත්වරුත් කැඳවලා, අලුත් ගොවි බිම් යායවල් විධියට හඳුනාගෙන, "යාය 2" කියන ආදර්ශ තාක්ෂණික පැකේජය භාවිත කිරීම සඳහා ගොවීන් දැනුවත් කිරීමේ ආදර්ශ ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙනවා. ඒකේ තිබෙන කරුණු අරගෙන අපි ගොවීන් එක්ක ඒ වැඩේ පටන් අරගෙන තිබෙනවා. අපි අලුත් විධියට වගා කරමු, වී වගාවේ වගා ක්‍රම වෙනස් කරමු, ඒකෙන් අස්වැන්න වැඩි වෙනවා කියන එක සහතික කරලා, අනෙකුත් ගොවීන් ඒ සඳහා පොලඹවන්නත්, ඔවුන් අතර ඒ ක්‍රමවේද ප්‍රචලිත කරන්නත් අපි දැන් වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා; ඒ සඳහා වන වැඩසටහන් හදලා තිබෙනවා.

ඊළඟ කාරණය, ලංකාවට පොහොර ගෙන ඒම, ලංකාවේ පොහොරවල ගුණාත්මකභාවය, ඒ වාගේම මිල සහ වෙළෙඳ පොළේ කිසිදු හිඟයකින් තොරව පොහොර පැවතීම කියන කාරණා සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙලා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් හොඳම පියවරකට, හොඳම වැඩසටහනකට යමින් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
අපි බලාපොරොත්තු වෙනවා, Government-to-Government සාකච්ඡා හරහා චීන රජයත් එක්ක සාකච්ඡා කරලා පොහොර ආනයනය කරලා, පොහොර සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයටත් උත්තරයක් හොයන්න; ඒ වාගේම, කෘෂි රසායන පිළිබඳ ප්‍රශ්නයටත් උත්තරයක් හොයන්න. අපි ඒ සඳහා කටයුතු කරමින් ඉන්නවා. අද මේ මාතෘකාව සාකච්ඡාවට ගත්තු එක හොඳයි, අපේ ගරු ඇමතිතුමාත් කිව්වා වාගේ. මෙහිදී යෝජනාවකුත් කළා. අපට මෙහිදී කියා ගන්න පුළුවන් වුණා, අප කළ මැදිහත්වීම් මොනවාද, අපේ සැලසුම් මොනවාද කියලා. මේ ලැබුණු කෙටි කාලය ඇතුළත වී මිල ස්ථාවර කිරීම සම්බන්ධයෙන් සාධාරණ මැදිහත් වීමක් කරලා තිබෙනවා කියලා අපි හිතනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.11]

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வட, கிழக்கு மாகாணங்களில் 1990ஆம் ஆண்டு யுத்தம் மற்றும் பயங்கரவாத நடவடிக்கைகள் காரணமாக பாதுகாப்புக் கருதி

இடம்பெயர்ந்த மக்களது காணிகள் 2006ஆம் ஆண்டு வனசீவராசிகள் திணைக்களத்தால் அரச நிலங்களாக வர்த்தமானி அறிவித்தல்மூலம் பிரகடனப்படுத்தப்பட்டது. அவற்றில் விடுவிக்கப்பட வேண்டிய காணிகளின் அளவுகள் மாவட்டந்தோறும் கூட்டங்கள் நடாத்தப்பட்டு தீர்மானிக்கப் பட்டது. அந்த அடிப்படையில், நான் சார்ந்திருக்கின்ற அம்பாறை மாவட்ட மக்கள் சுமார் 35 ஆண்டுகளாக முகங்கொடுக்கின்ற நிலப் பிரச்சினையை இந்த உயர் சபையின் கவனத்துக்குக் கொண்டு வருவதற்காக இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்துகின்றேன்.

முன்னைய ஆட்சிக் காலத்தில் மக்களால் தொடர்ந்து விடுக்கப்பட்ட கோரிக்கைகளுக்கு இணங்க, வனத்துறை மற்றும் வனவிலங்கு பாதுகாப்புத்துறை ஆகிய இரு துறைகளும் மக்களின் நீண்ட காலக் குறைகளை உணர்ந்து, சில நிலப் பகுதிகளை விடுவிக்கத் தீர்மானித்தன. இத்தீர்மானங்கள் பல ஆலோசனைகளுக்குப் பிறகே எடுக்கப் பட்டன. காரணம், இப்பகுதிகளில் காணப்படும் நிலங்கள் உண்மையிலேயே காடுகள் அல்ல. அவை பரம்பரை பரம்பரையாக மக்கள் வாழ்ந்துவந்த, விவசாயம் செய்துவந்த நிலங்களாகும். இதன் அடிப்படையில், அம்பாறை, உகண, தெஹியத்தகண்டிய, லாஹுகல, பானம, அட்டாளைச்சேனை, சம்மாந்துறை, திருக்கோவில் மற்றும் பொத்துவில் போன்ற பகுதிகளில் நிலங்கள் அடையாளம் காணப்பட்டன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறிப்பாக பொத்துவில் பிரதேச செயலாளர் பிரிவுக்குள் பின்வரும் நிலப்பகுதிகளை விடுவிப்பதற்காக அரசாங்க அதிபரால் அடையாளம் காணப்பட்டுள்ளன. கச்சக்கோடியில் 23.25 ஹெக்டெயாரும், ஆமாவட்டுவானில் 26.6 ஹெக்டெயாரும், ஆமாவட்டுவான் பாய்ச்சல் ஆறில் 69.30 ஹெக்டெயாரும், தங்கப்பிள்ளை கணத்தையில் 0.3 ஹெக்டெயாரும், தங்கப்பிள்ளை கணத்தை வடக்கில் 4.38 ஹெக்டெயாரும், பள்ளடியன் 'றோட்'இல் 14.50 ஹெக்டெ யாரும், பள்ளடியன் 'றோட்' வடக்கில் 8.99 ஹெக்டெயாரும், தாரம்பலவில் 275 ஹெக்டெயாரும், ரொட்டைக் குளத்தில் 327 ஹெக்டெயாரும், செல்வவெளியில் 7.68 ஹெக்டெயாரும், செம்மணி குளத்தில் 8.49 ஹெக்டெயாரும், செல்வவெளியில் 22.2 ஹெக்டெயாரும், துக்குவெல்லவில் 32 ஹெக்டெயாரும், கும்மாவெளியில் 3.36 ஹெக்டெயாரும் அடையாளம் காணப்பட்டுள்ளன.

லாஹுகல பிரதேச செயலாளர் பிரிவின் பள்ளியடிவட்டை யிலுள்ள 117 ஏக்கர் நெல் வயல்கள் தவறுதலாக வனத் துறைக்குள் கொண்டுவரப்பட்டுள்ளன. இவை பயிரிடத்தக்க வளமான வயல்கள் என்பதால், அங்குள்ள விவசாயிகளின் தேவைகளைக் கருத்திற்கொண்டு, அவற்றின் நிலைமையை மறுபரிசீலனை செய்து, அவற்றை விடுவிப்பதற்கான நடவடிக்கைகளையும் மேற்கொள்ள வேண்டும். மேலும், கரான்காவட்டை, வட்டமடு போன்ற பிரதேசங்களிலுள்ள காணிகள் தொடர்பான பிரச்சினைகளும் தீர்க்கப்படவேண்டி இருக்கின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2023 பெப்ருவரி 23ஆம் திகதி நாடாளுமன்ற வளாகத்தில் அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் மற்றும் அரச அதிகாரிகள் பங்கேற்ற கூட்டத்தில் லாஹுகல மற்றும் பொத்துவில் பிரதேச செயலக அதிகாரிகளும் பங்கு பற்றினார்கள். அந்தக் கூட்டத்தில், நீண்ட காலமாக சர்ச்சைக்குரியதாக இருந்து வருகின்ற கிராங்கோவைப் பகுதிலுள்ள 502 ஏக்கர் நிலத்தை லாஹுகல மற்றும் பொத்துவில் மக்களுக்குப் பிரித்துக் கொடுக்க வேண்டும் என்ற தீர்மானம் எடுக்கப்பட்டது. ஆனால், அது இன்றுவரை நடைமுறைப்படுத்தப்படவில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் பிரதேசத்திலுள்ள விவசாய மற்றும் குடிநீர்ப் பிரச்சினையைத் தீர்ப்பதற்காக ஹெட ஓயா திட்டத்தை நடைமுறைப்படுத்த வேண்டுமென கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் பல தீர்மானங்களை எடுத்தன. அந்த அடிப்படையில், 2018ஆம் ஆண்டில் 150 மில்லியன் ரூபாயும், 2019ஆம் ஆண்டில் 25 மில்லியன் ரூபாயும், 2020ஆம் ஆண்டில் 50 மில்லியன் ரூபாயும் என 3 தடவைகளில் இந்த ஹெட ஓயா திட்டத்தை ஆரம்பிப்பதற்காக நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டபோதிலும், ஆரம்பக் கட்டத்திலேயே அத்திட்டம் கைவிடப்பட்டு இருக்கின்றது.

மொனராகலை, அம்பாறை மாவட்டங்களை அடிப் படையாகக் கொண்டு இந்த ஹெட ஓயா திட்டம் ஆரம்பிக்கப் படவேண்டி இருக்கின்ற காரணத்தால், இரண்டு அரசாங்க அதிபர்களையும் இணைத்ததாக ஒரு குழுவை எங்களுடைய அம்பாறை மாவட்டத்தின் அபிவிருத்திக் குழுவின் தலைவராக இருக்கின்ற பிரதி அமைச்சர் கௌரவ வசந்த பியதிஸ்ஸ அவர்கள் நியமித்து இருக்கின்றார். இந்தக் குழுவின் அறிக்கையைப் பெற்று, விரைவாக ஹெட ஓயா திட்டத்தை ஆரம்பிப்பதன்மூலம் பொத்துவிலில் சுமார் 14,000 ஏக்கர் காணிகளில் இரண்டு போகங்களும் விவசாயம் செய்ய முடியுமெனவும் பொத்துவில், பானம, லாஹுகல, கோமாரி ஆகிய பிரதேசங்களிலுள்ள 10,000க்கும் அதிகமான குடும்பங்கள் குடிநீரைப் பெற்றுக்கொள்ள முடியுமெனவும் நாங்கள் நம்புகின்றோம். எனவே, ஹெட ஓயா திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு இந்தச் சபை விரைவாக நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සෞඛ්‍ය අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාට මම මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. හේතුව තමයි, අපේ මූලික රෝහලට එතුමා ambulance එකක් ලබා දුන්නා. අපේ ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් මම මේ අවස්ථාවේ එතුමාට ස්තුතිවන්ත වෙනවා. තවද, අපේ කර්මාන්ත ඇමති ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා ගිය සතියේ අපේ පොතුවිල් ප්‍රදේශයේ කර්මාන්ත වැඩපොළක් සකස් කරලා, අරුගම්බේ ප්‍රදේශයේ කඩ කුටි ගහලා සංචාරකයන් ගොඩක් සතුටු කළා. ඒ ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියට මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම අපේ මහා දිසාපති චින්තක අබේවික්‍රම මැතිතුමාට, Additional GAට, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් නසීල් මහතාට, සහකාර ප්‍රාදේශීය ලේකම් එම්. රාමකුට්ටි මහතාට, ගණකාධිකාරි එස්.එම්. හාරූන් මහතාට සහ පරිපාලන නිලධාරි සුහායිර් මහතාට මේ වැඩසටහන හරියාකාරව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මම මේ සභාව තුළදී ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.17]

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා අද ගෙනැවිත් තිබෙන සභාව කල් තැබීමේ යෝජනාව තුළින් තහවුරු කරන්න උත්සාහ කරමින් ඉන්නවා, මේ යල කන්නයේදීත් වී මිලදී ගැනීම සඳහා ආණ්ඩුවක් විධියට අපි අනුගමනය කරපු ක්‍රමය, මැදිහත් වීම ප්‍රමාණවත් නැහැ, සාධාරණ නැහැ කියලා. ඔව්, අපි විශ්වාස කරන විධියට සාධාරණ නැහැ. ඇයි ඒ? මීට වඩා සාධාරණයක් කරන්න අපට ඉලක්කයක් තිබෙනවා. ගොවි ජනතාවට මීට වඩා සාධාරණයක් කරන්න අපට අරමුණක් තිබෙනවා. හැබැයි, මීට වඩා සාධාරණයක් කරන්න පුළුවන් මට්ටමේ භාණ්ඩාගාරයක්, රටක් නොවෙයි අපට භාර දුන්නේ. ගොවි ජනතාවට මීට වඩා පහසුකම් සපයන්න අපට ඉලක්කයක් තිබෙනවා, අරමුණක් තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවක් විධියට, කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට ගොවි ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්නේ කොහොමද, ගොවි ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන්නේ කොහොමද කියලා අපට ඉලක්කයක් තිබෙනවා, දැක්මක් තිබෙනවා. නමුත් මෙතුමන්ලා මේ යල කන්නයට අදාළව තහවුරු කරන්න උත්සාහ කරමින් ඉන්නවා, සමාජයේ මතයක් හදන්න උත්සාහ කරමින් ඉන්නවා, ආණ්ඩුව වී මිලදී ගන්නේ නැහැ කියලා. වී අලෙවි මණ්ඩලයට තිබෙන හැකියාව අනුව මේ වෙනකොට වී මෙට්‍රික්ටොන් 45,000කට වඩා වැඩි ප්‍රමාණයක් මිලදී අරගෙන තිබෙනවා. මොකක්ද තිබෙන හැකියාව? ගබඩා තිබෙනවා 216කට ආසන්න ප්‍රමාණයක්. හැබැයි, ඒ 216න් 146යි වී මිලදී ගන්න පුළුවන් මට්ටමේ තිබෙන්නේ. ඉතිරි ඔක්කෝම විනාශ වෙලා තිබෙන්නේ. ඉතිහාසයේදී ඒවා විනාශ වෙන්න ඉඩ හැරලා තිබෙනවා.

ඒ වාගේම වී අලෙවි මණ්ඩලයේ cadre එකට අනුව සේවකයන් 229කට ආසන්න ප්‍රමාණයක් ඉන්න ඕනෑ. හැබැයි, 159දෙනායි ඉන්නේ, මේ වෙනකොට. සමහර ගබඩාවල සිටින ඒ නිලධාරි මහත්වරුන්ට සතියට දවස් දෙකක් එක ගබඩාවක ඉන්න සිදුවෙලා තිබෙනවා, ඉතිරි දවස් තුන තව ගබඩාවක ඉන්න සිදුවෙලා තිබෙනවා. ඇයි ඒ? 2019 ඉඳලා රාජ්‍ය සේවකයන් බඳවා ගත්තේ නැහැ. මේ වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කරනවා වෙනුවට කඩා වැට්ටුවා. එම නිසා ආණ්ඩුවක් විධියට, කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපි තහවුරු කරලා කියනවා, ඔව්, අපි මේ වෙලාවේ මේ මොහොතට ගැළපෙන විධියට අපේ රටේ ගොවි ජනතාවට සාධාරණයක් කරලා තිබෙනවා කියලා.

කිංස් නෙල්සන් මැතිතුමා කිව්වා, ගොවි ජනතාව පාරට බස්සනවා ලු. අපි කියනවා, පුළුවන් නම් බස්සන්න කියලා.

ගොවි ජනතාව පාරට බස්සලා පෙන්වන්නකෝ. ඇයි ඒ? අපි ගොවි ජනතාවගේ ප්‍රශ්න එකින් එක, එකින් එක විසඳමින් තිබෙනවා. මේ ගෙවෙන අවුරුද්දකට ආසන්න කාලය ඇතුළේ අපි ක්‍රමානුකූලව අපේ රටේ ආර්ථිකය ස්ථාවර කරමින් තිබෙනවා. ස්ථාවරව, පරිස්සමින් මේ ගෙවුණු අවුරුද්ද ඇතුළේ අපි ඉස්සරහට යමින් සිටිනවා. අපේ රටේ ගොවි ජනතාවගේ ප්‍රශ්න ක්‍රමානුකූලව විසඳමින් තිබෙනවා. වාරි කර්මාන්තයට රුපියල් මිලියන 78,000ක් වෙන් කරලා වාරි කර්මාන්තයේ අලුත් ආරම්භයක් අපි දීලා තිබෙනවා. ඇළ වේලි පද්ධති, වැව් ටික ප්‍රතිසංස්කරණය කරන්න අපි නැවත මැදිහත් වෙමින් තිබෙනවා. ඒක නිසා වී ප්‍රශ්නය විතරක් නොවෙයි, ගොවියා මුහුණ දෙන අනෙක් ප්‍රශ්න ටිකත් අපි විසඳමින් සිටිනවා. ඇත්ත, අපේ රටේ ගොවි ජනතාවට අද වී ටික වේළා ගන්න විධියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂය පැත්තෙන් මතු කරන විධියට, ඉතිහාසය පුරාවට ආණ්ඩු කළේ අපිද කියන එකයි මම කල්පනා කළේ. අපි ආණ්ඩුව අරගෙන අවුරුද්දයි. අවුරුද්දක් යන කොට අපෙන් මේ ප්‍රශ්න කරන විධියට, යෝජනා කරන විධියට ඉතිහාසයේ ආණ්ඩු කරලා තිබෙන්නේ අපිද? විපක්ෂයේ අද යෝජනා ඉදිරිපත් කරන, ප්‍රශ්න කරන කට්ටිය තමයි බලන කොට එදා විපක්ෂයේ ඉඳලා තිබෙන්නේ. අද ඒ තත්ත්වයටයි පත් වෙලා තිබෙන්නේ. පසුගිය අවුරුද්දේ - ගෙවුණු කාල සීමාව ඇතුළේ - පදවියේ ජීවිත නැති වුණා, තාර පාරේ වී වේළන්න ගිහිල්ලා. දැන් ඇවිල්ලා කියනවා, dryers හයි කරන්න කියලා. ඉතිහාසයේ ආණ්ඩු කෙරුවේ ඒගොල්ලන්. ඒ අය ආණ්ඩු කළාට, එක ගොවි සංවිධානයකට, සමුපකාරයකට dryer එකක් දෙන්න බැරි වෙලා තිබෙනවා. හැබැයි, මේ අවුරුද්දේ පුළුවන් මට්ටමින් dryers දෙන්න අපි යෝජනා කරලා තිබෙනවා.

විමධ්‍යගත මුදල්වලින් අපි පදවිය සමුපකාරයට dryers දෙන්න යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙනුත් dryers දෙන්න යෝජනා කරලා තිබෙනවා. තාක්ෂණය අපි අත්පත් කරලා දෙන්න සූදානම් කියන එක අපි මේ මොහොතේදී කියනවා.

විපක්ෂ නායකතුමා පසුගිය කථාවේදී - ඉස්සෙල්ලා කථාවේදී - මතු කළා, අපේ රටේ වනඅලි ප්‍රශ්නය ගැන. ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ වනකොට වනඅලි ප්‍රශ්නය ගැන දෙවතාවක් සාකච්ඡා කරලා ඒ ප්‍රශ්නයේ බරපතළකම හඳුනාගෙන තිබෙනවා. ඒ මැදිහත්වීම කරමින් තිබෙනවා. වනඅලි ප්‍රශ්නය විසඳීමට අදාළව අපි ආණ්ඩුව විධියට ගතයුතු ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. වනඅලි ප්‍රශ්නයේදී ප්‍රධාන වශයෙන් මුහුණ දෙන ගැටලුව මොකක්ද? ඒ ඒ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්තුමා, දේශපාලන අධිකාරිය ඒ සියලු නිලධාරීන් මැදිහත් වෙලා අන්න කමිටු නිර්මාණය කරලා අපි පියවරෙන් පියවර, පියවරෙන් පියවර ඒ ප්‍රශ්නය නිරාකරණය කරන්න ඕනෑ මැදිහත් වීම කරමින් සිටිනවා.

අනෙක් පැත්තෙන් ගත්තාම නිෂ්පාදන පිරිවැය අඩු කිරීම වෙනුවෙනුත් අපි කටයුතු කරනවා. අපේ රටේ ගොවි ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් තමයි නිෂ්පාදන පිරිවැය. ක්‍රමානුකූලව අපේ රටේ භූමිය සැලසුම්සහගත කරලා අපේ රටේ ගොවියා දරන නිෂ්පාදන පිරිවැය, ශ්‍රමය අඩු කරලා ගොවියාට වැඩි ලාභයක් අත්පත් කර දෙන්නේ කොහොමද කියන ඒ සැලසුම අපි ඉදිරිපත් කරමින් තිබෙනවා. අපේ රටේ කෘෂි කර්මාන්තයට තාක්ෂණය එකතු කරලා අලුත් ආරම්භයක්, නව්‍යකරණයක් ඇතුළේ ගොවියාගේ ඒ බලාපොරොත්තු අපි ඉෂ්ට කරමින් තිබෙනවා.

මේ රටේ ජනතාව අවුරුද්දකට කලින් අපට දුන් mandate එකක් තිබෙනවා; ජන වරමක් තිබෙනවා. ඒ ජන වරමට ගරු කරමින් ස්ථාවරව යන මේ ගමන ඇතුළේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට හැම දාමත් මේ වාගේ යෝජනා, මේ වාගේ ප්‍රශ්න පාර්ලිමේන්තුවට දාලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ සාකච්ඡා කරලා යන්න පමණයි ඉතුරු වෙන්නේ කියලා අපි දන්නවා. ගොවි ජනතාව ආයෙත් පාරට බස්සන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, අපි දවසින් දවස ප්‍රශ්න විසඳමින් ඉන්නවා. අද මේ සාකච්ඡාව අපි තවත් සාධනීය ලෙස දකිනවා. අපි මේ තිබෙන ප්‍රශ්න ටික

විසඳමින් කටයුතු කරනවා. මාස් කන්නය එනවා. මාස් කන්නය ඇතුළේ ගොවි ජනතාවට අවශ්‍ය පොහොර සහනාධාරය ලබා දීමට අදාළ ඒ මැදිහත් වීම් සූදානම් කිරීම මේ වනවිටත් කරමින් තිබෙනවා. අපි වේලාසනින් අවදි වෙමින් තිබෙනවා. පොහොර සහනාධාරය ලබා දීමේ ගැටලු තවදුරටත් නිරාකරණය කරගන්නේ කොහොමද කියලා කථාබහ කරමින් ඉන්නවා. රුපියල් මිලියන 20,000කට ආසන්න ප්‍රමාණයක් මේ මාස් කන්නයට අදාළව වෙන් කරලා තිබෙනවා, පොහොර සහනාධාරය දෙන්න. පොඩි මුදලක් නොවෙයි. ගොවි ජනතාවට ඒ මුදල් ප්‍රමාණය දෙන්න ඕනෑ කරන මැදිහත් වීම් අපි කරනවා. එතැනින් එහාට ගිහිල්ලා අපි පොහොර සඳහා හැම දාමත් මුදල් ලබා දෙනවා වෙනුවට, ගොවි ජනතාවට අවශ්‍ය වෙලාවට ප්‍රමිතියෙන් යුක්ත පොහොර ටික ලබා දීමට අවශ්‍ය මැදිහත් වීම කරමින් අපේ රටේ කෘෂිකර්මාන්තය අලුත් දිශාවකට, දිශානතියකට මෙහෙයවන්න සූදානම් කියන පණිවුඩය ලබා දෙමින්, මම නවතිනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.24]

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අපේ මන්ත්‍රීවරයා කියපු විධියට දැන් ආණ්ඩුවේ ඉන්නේ ඔබතුමන්ලා කියලා අමතක වෙලාද කියලාත් හිතෙනවා. ඔබතුමන්ලා බලය අරගෙන අවුරුද්දක් තමයි ගතවෙලා තිබෙන්නේ. අවුරුද්දක් ගෙවිලා ගිහිල්ලා තිබෙද්දී නැවත වතාවක් විපක්ෂයට කෙඳිරි ගාන එක නොවෙයි ඔබතුමන්ලාට කරන්න තිබෙන්නේ. ඔබතුමන්ලාගේ කාර්යභාරය ඉෂ්ට කරන එකයි කරන්න තිබෙන්නේ. විශේෂයෙන් මේ කාරණය මතක් කරන්න ඕනෑ. ඔබතුමන්ලා වේදිකාවලදී කිව්වා, මේ රට ගොඩ දාන්න මාස හයක් ඇති කියලා.

මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරන්න කලින් ඒවාත් පොඩ්ඩක් මතක තබා ගන්න. ඒ වාගේම ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්, සංතෘප්ත ගොවි දිවියක්" කියලා. සංතෘප්ත ගොවි දිවියක් ලැබිලා තිබෙනවාද කියන කාරණය ගැන අද ඔබතුමන්ලාට සතුටු වෙන්න පුළුවන්ද මම දන්නේ නැහැ. ඔබතුමන්ලා ගොවි බිම්වලට ගිහිල්ලා, ගොවි ජනතාව මුණ ගැහිලා කථා කරනවා නම්, ගොවීන්ගේ සංතෘප්ත දිවිය මොකක්ද කියලා ඔබතුමන්ලාට බලාගන්න පුළුවන්. අපේ ගොවීන්ට නම් සංතෘප්ත දිවියක් ලැබිලා නැහැ කියන කාරණය විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ. හැබැයි පාකිස්තානය, ඉන්දියාව ඇතුළු වෙන රටවල ගොවීන්ට නම් සංතෘප්ත දිවියක් ලැබිලා තිබෙනවා. අපි බඩඉරිඟු අස්වැන්න නෙළන කාලයට මේ රටට බඩඉරිඟු ටික ගෙනෙනවා, අර්තාපල් අස්වැන්න නෙළන කාලයට අර්තාපල් ටික ගෙනෙනවා, බී ලූනු අස්වැන්න නෙළන කාලයට බී ලූනු ටික ගෙනෙනවා. ඒ නිසා වෙනත් රටවල ගොවීන්ට නම් සංතෘප්ත ගොවි දිවියක් ලැබිලා තිබෙනවා කියලා අපට කියන්න පුළුවන්.

විශේෂයෙන්ම කෘෂිකර්ම ඇමතිවරයා සමහර ප්‍රකාශ කරනවා. එතුමා මධ්‍යස්ථව, විවෘතව කථා කරන නායකයෙක්. හැබැයි, එතුමාගේ ප්‍රකාශ මේ රටේ කෘෂි කර්මාන්තයේ නියැළෙන ගොවි ජනතාවට කොච්චර දුරට බලපානවාද කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. එතුමා එක වෙලාවක කියනවා, "අපි වවලයි අපි කන්නේ" කියන ප්‍රතිපත්තියක් අපට නැහැ කියලා. ඒ තුළින් සිදු වන්නේ ගොවි ජනතාවට ගොවිතැන් කරන්න තිබෙන වුවමනාව, ධෛර්යය නැති කරන එකයි. එක වෙලාවක කියනවා, අස්වැන්න ලැබෙන්නේ නැති ඒවා වගා කරන්න එපා කියලා. අපි ඒකයි කියන්නේ, ලංකාවේ ගොවීන්ට නොවෙයි ඉන්දියාවේ, පාකිස්තානයේ ගොවීන්ට නම් ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ සංතෘප්ත දිවියක් ලැබී තිබෙනවා කියලා.

ඒ වාගේම මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. ඔබතුමන්ලා ප්‍රකාශ කළා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්නට යන මුදල කීයද කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිවරයා කිව්වා, රතු නාඩු වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 78යි යන්නේ කියලා. ඒ නිසාම අපට ඒ අසත්‍ය කාරණාව ගැන කථා කරන්න සිද්ධ වෙනවා. එතුමා අවුරුද්දකට කලින් කිව්වා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 154ක් යනවා කියලා. අවුරුද්දකට පස්සේ එතුමා කියනවා, රුපියල් 78යි යන්නේ කියලා.

ජාතික ගොවිජන එකමුතුව විසින් හදලා තිබෙනවා, වී කිලෝවක අස්වැන්න ලබා ගන්න යන නිෂ්පාදන වියදම. ඒ අනුව, රුපියල් 105ත්, 115ත් අතර මුදලක් යනවා. නැඟෙනහිර පළාතේ වී කිලෝවක් සඳහා නිෂ්පාදන වියදම රුපියල් 118ක්, පොළොන්නරුව "බී" කලාපයේ වී කිලෝවක් සඳහා නිෂ්පාදන වියදම රුපියල් 104ක්, කලාවැව රාජාංගනයේ වී කිලෝවක් සඳහා නිෂ්පාදන වියදම රුපියල් 118ක් සහ වලව කලාපයේ වී කිලෝවක් සඳහා නිෂ්පාදන වියදම රුපියල් 110ක් වශයෙන් එහි සඳහන් කර තිබෙනවා. ඒ විස්තර ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේ මම **සභාගත*** කරනවා.

ඔබතුමන්ලාගේ නාමල් කරුණාරත්න මැතිතුමා හරි, කවුරු හරි මේ වියදම් පිළිගන්නේ නැත්නම්, මේක වැරදියි කියලා ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කරන්න. ඕනෑ නම් විවාදයකටත් එන්න. අපි ඔප්පු කරලා පෙන්වන්නම්, මේ ගණන යනවා කියන එක. මේ තමයි වී කිලෝවක් සඳහා වන නිෂ්පාදන මුදල.

2024 යල කන්නයේදී වී අස්වැන්න මෙට්‍රික් ටොන් ලක්ෂ 24යි කියලා කිව්වා. මෙට්‍රික් ටොන් ලක්ෂ 24ක වී අස්වැන්නක් බලාපොරොත්තුවෙන් හිටපු රටක, වී අලෙවි මණ්ඩලය අද වන විට වී අරගෙන තිබෙන්නේ මෙට්‍රික් ටොන් 46,000ක් විතරයි. ඒක ප්‍රමාණවත් නැහැ.

මේ ගොවීන්ගේ වී අස්වැන්න මිලදී ගැනීමට තරම් පහසුකම් ප්‍රමාණයක් නැහැ කියලා අපි කියනවා. පසුගිය කාලයේ වී අලෙවි මණ්ඩලය dryers හයි කළාද, නැද්ද කියන එක අදාළ නැහැ. පසුගිය ආණ්ඩු ඒවා කරපු නැති නිසා තමයි ඔබතුමන්ලාට දැන් බලය දීලා තිබෙන්නේ. දැන් ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුද්දක් වෙනවා. දැන් ආයෙත් ජනතාවට කෙඳිරි ගාන්න එපා, පසුගිය කාලයේ අරක කරලා නැහැ, මේක කරලා නැහැ කියලා. දැන් ඔබතුමන්ලාට තමයි බලය තිබෙන්නේ. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. ඔබතුමන්ලා බලන්න, දැන් කන්න දෙකක් අවසන් වෙලා තිබෙනවා. ගොවි ජනතාවගේ වී අස්වැන්න මිලදී ගන්න ඔබතුමන්ලාගේ ක්‍රමවේදය මොකක්ද? අපි දන්නවා, වී අලෙවි මණ්ඩලයට ඔක්කොම වී මිලදී ගන්න බැහැ කියලා.

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුරංග රත්නායක මහතා]

අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වා, මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට ණය දීලා තිබෙනවා කියලා. මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ගෙන් සියයට 90ක් blacklist කරලා තිබෙනවා. ණය ගන්න බැහැ, බැංකුවෙන් blacklist කරලා තිබෙන්නේ. ඔබතුමා කියනවා, රුපියල් මිලියන 5,000ක් නිකුත් කර තිබෙනවා කියලා. නමුත් ණය ගන්න බැහැ. අපි කියන්නේ ගොවි ජනතාවගේ අස්වනු මිලදී ගැනීම සඳහා ඊට වඩා විධිමත් ක්‍රමවේදයක් හදන්න කියලායි. මොකද, ඒ සඳහා වී අලෙවි මණ්ඩලය ප්‍රමාණවත් නැහැ. යල කන්නයේ වී අස්වැන්න මෙට්‍රික් ටොන් ලක්ෂ 24ක් වනවා. එම නිසා වී ගොවීන්ගේ වී අස්වැන්න මිලදී ගන්න ඔබතුමන්ලා මීට වඩා වෙනස් වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න. දැන් ඔබතුමන්ලාට තමයි බලය තිබෙන්නේ. ඔබතුමන්ලාට ඒවා කරන්න පුළුවන් කියලා වේදිකාවේ කියලා තමයි බලයට ආවේ. සැලසුම් තිබෙනවා කිව්වා. ඔබතුමන්ලාට අවශ්‍ය සියලු දේ කරන්න පුළුවන් කිව්වා. ඒ නිසා තවදුරටත් විපක්ෂයට කෙඳිරි ගගා ඉන්නේ නැතිව ඔබතුමන්ලාගේ කාර්යභාරය කරන්න. ඔබතුමන්ලා ඒ කාර්යභාරය නොකළොත් මොකද වෙන්නේ? කලින් කථා කළ මන්ත්‍රීතුමා ඇහුවා, ගොවි ජනතාව පාරට බස්සන්න පුළුවන්ද කියලා. ගොවි ජනතාව පාරට බස්සන විධිය අපි දන්නවා. ගොවි ජනතාව පාරට බස්සන්න බැරිව නොවෙයි අපි ඉන්නේ. ගොවි ජනතාවට ඒ අවශ්‍ය කාරණා ඉටු වෙනවාද කියලා අපි තවදුරටත් බලාගෙන ඉන්නවා. අපි ආණ්ඩුව එක පාරටම අමාරුවේ දමන්නේ නැහැ. හැබැයි, ආණ්ඩුව තවදුරටත් තමන්ගේ වගකීම් නොසලකා හරිනවා නම් අපි ගොවි ජනතාව පාරට බස්සලා ඔබතුමන්ලා ගෙදර යවනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.30]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් කල්පනා කළා, මේ විවාදයේ පිළිතුරු කථාව පටන් ගන්න, මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමා කෝ කියලා. බලන් හිටියා, හිටියා, එතුමා එයි කියලා. නමුත්, ආවේ නැහැ. අපේ සුරංග රත්නායක මන්ත්‍රීතුමා විතරක් සභාවේ ඉන්නවා. මොනවා වුණත් විපක්ෂයේ තනියට ඉන්නේ අනුරාධපුරේ මිනිහෙක් නේ. ඒ නිසා ඔබතුමාට ස්තුති කරන්න ඕනෑ, කථාව කරන්න හරි හිටපු එක ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව පාර්ලිමේන්තුවේ Parliamentary Business Committee එකේ සාකච්ඡා කරපු වෙලාවේ විපක්ෂය වෙනුවෙන් විපක්ෂ නායකතුමා, ඒ වාගේම රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා පොර බැදුවා, "වෙලාව මදි අපේ විපක්ෂයට, ගොවියා සම්බන්ධයෙන් අද බරපතළ ප්‍රශ්නයක් තිබෙන්නේ" කියලා. නමුත්, මෙම යෝජනාව ස්ථිර කරපු විපක්ෂ නායකත් vanished. හැබැයි, ඒ වුණාට ගොවියා ගැන තමයි කථාව. සුරංග රත්නායක මන්ත්‍රීතුමා නැත්නම් විපක්ෂයේ කවුරුවත් සභාවේ නැතිව යනවා. ලජ්ජාවේ බැහැ. ඒ වුණාට කථා කරන්නේ ගොවියා ගැන. මාර ප්‍රශ්නයක් ගොවියාට තිබෙනවා කියනවා. මේ යෝජනාව ඇතුළේම ඔබතුමන්ලා ප්‍රමාදයි සහ පරාදයි කියන දෙකම තිබෙනවා. ඒ මොකද? මේ යෝජනාව ඉදිරිපත් කරපු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාවත් මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා කොහේ හරි ඉඳලා මේ කථාව අහගෙන ඉන්නවා නම්, මෙතැනට එන්න කියන්නයි මම මේ කියන්නේ. එතුමා සභාව ඇතුළට ආවා නම් තමයි හොඳ. ඒත් එන්නේ නැහැ නේ. යෝජනාව ඉදිරිපත් කළා, ඊට පස්සේ ගිහිල්ලා. මේ කරන්නේ බොරු වැඩ. ගොවියා වෙනුවෙන් පෙනී ඉන්නවා කියලා බොරුවට පෙන්වන්න හදනවා. අඩුම ගානේ තමන් ගෙනාපු යෝජනාව ඉවර වෙනතුරු ආණ්ඩුව මොකක්ද කියන්නේ කියලා අහගන්නවත් පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නේ නැහැ. දැන් එතුමාට rewind කරලා බලන්න වෙනවා, අපි කියන ඒවා අහගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරනකොට වී මිල ගැන කිව්වා. එය ගොවියාට මදි කිව්වා. අනික් කාරණය විධියට කිව්වා, වී මිලදී ගන්නේ නැහැ කියලා. තව එකක් කිව්වා, පොහොර වෙලාවට දෙන්නේ නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, මේ යල කන්නයේ තවම ගොයම් කපලා තිබෙන්නේ සියයට 54යි. ඒක මතක තියාගන්න. සියයට 100ක් ගොයම් කපලා ඉවර නැහැ. දැන් ටිකකට කලින් නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කියලා ගියේ මොකක්ද? ඔක්කෝම ගිහිල්ලා නේ. බොරු කියලා යනවා. මේ අය ෆේස්බුක් එකේ මොනවා හරි දමාගන්න පාර්ලිමේන්තුවේදී බොරුවක් කියලා මාරු වෙනවා.

ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා සභාවේ ඉන්න නිසා මම ඔබතුමා කියපු තැනින් උත්තර දෙන්න පටන් ගන්නම්. මොකද ඔබතුමා කිව්වා නේ, පොහොර සහනාධාරය පිළිබඳව, වී පිළිබඳව, ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට සල්ලි දීම පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ යල සහ මහ කියන කන්න දෙකේම වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.6ක්, 4.7ක් විතර වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ යල කන්නයේ ගිය අවුරුද්දට වඩා වැඩියෙන් හෙක්ටෙයාර 80,000ක වී වගා කරලා තිබෙනවා; හෙක්ටෙයාර 80,000ක්. එම නිසා පසුගිය යල කන්නයට වඩා මේ යල කන්නයේ වී අස්වැන්න මෙට්‍රික් ටොන් ලක්ෂ 23ක් වැඩිපුර බලාපොරොත්තු වෙනවා. සාමාන්‍යයෙන් අපේක්ෂා කළේ මෙට්‍රික් ටොන් ලක්ෂ 21යි. ඒක තව ලක්ෂ දෙකකින් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා පොහොර ලබා දීම සම්බන්ධයෙන් විපක්ෂය කිව්වේ පට්ටපල් බොරු. අඩුම ගානේ දීලා තිබෙන ගණනවත් දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්නේ යල කන්නය ගැන. අවුරුද්දකට රුපියල් බිලියන 40යි, 50යි අතර මුදලක් දෙනවා, යල, මහ කියන කන්න දෙකටම. ඔඩපණ ණය කොටසක් දෙනවා. ඊට අමතරව, මෝල් හිමියන් මහා පරිමාණ ලෙසත් ණය ගන්නවා. ඒගොල්ලන්ට අඛණ්ඩව roll over කරන්න ලබා දෙන ණයත් තිබෙනවා. ඒ ණය ඔවුන් ගන්නවා. එහෙම රුපියල් බිලියන 3, 4, 5, 7, 8 ගන්න අය ඉන්නවා. මේ යල කන්නයේ මේ වෙනකොට රුපියල් බිලියන 21ක් disburse කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ දීලා තිබෙනවා. ඔබතුමා කිව්වා, සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට ණය දීලා නැහැ කියලා. නමුත්

244දෙනෙකුගේ ණය අනුමත කරලා තිබෙනවා. ඒ ප්‍රමාණය රුපියල් මිලියන 6,528ක්. රුපියල් මිලියන 6,528ක් මෝල් හිමියන් 244දෙනෙකුට අනුමත කරලා තිබෙනවා. ඉන් අරගෙන තිබෙන්නේ රුපියල් මිලියන 3,759යි; සියයට 58යි. මොකද, ගොයම් කැපිලා තිබෙන්නේ සියයට 54යි කියලා මම කිව්වා. ඒ නිසා ගොයම් කැපෙන ප්‍රමාණයට තමන් ගත් ණය මුදල ඒගොල්ලන් disburse කර ගන්නවා. ඒගොල්ලන් බැංකුවෙන් ඒ ණය ගන්නවා. සමහර මෝල් හිමියන්ගේ ගබඩාවල වී තිබෙනවා. සමහර ඒවායේ එම වී කොටලා වෙළෙඳ පොළට හාල් නිකුත් කරනවා. මොකද ඒ අය roll over කරනවා, මේ ව්‍යාපාරය කරගෙන යන්න.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා හරි. ඉතිහාසයේ වී අලෙවි මණ්ඩලය වී මිලදී ගත්තා. සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට කියලා තමන්ගේ යාළුවන්ට එම වී ටික දුන්නා. අවසානයේ ඒ මිනිස්සුත් බංකොලොත් වෙලා ණය ගෙවා ගන්නත් බැරි වෙලා නන්නත්තාර වුණා. අපේ රටේ වී මෝල් 1,759ක් තිබෙනවා. නමුත් මෝල් 650ක් විතර තමයි වැඩ කරන්නේ. ඒ මෝල් 650නුත් සමහර අයට වැඩ කර ගන්න බැහැ, ප්‍රාග්ධනය නැහැ. ඒ විතරක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, තව සමහර අය ඉන්නවා, මුදල් නැති නිසා මේ ක්‍රියාවලියට එකතු වෙන්නේ නැති. අපි පසුගිය කාලයේ කිව්වා, තමන්ගේ හිඟ ණය මුදල reschedule කරගෙන ඉවර වෙලා මේ ක්‍රියාවලියට එන්න කියලා. එහෙමත් සමහරු ආවා. ඒ විතරක් නොවෙයි. ඔබතුමාත් දන්නවා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව සහ රාජාංගනය කියන ප්‍රදේශවල වී මෝල් 4ක් තිබෙන බව. මම ගිය සතියේ පොලිසියටත් කථා කරලා තමයි එම මෝල් හිමියන්ට ණය ගෙවීමට යම් කාලයක් අරගෙන දුන්නේ. මොකද, ඔවුන්ට නඩු දාලා තිබෙන්නේ. අවුරුදු 2ක් තිස්සේ නඩු දාලා තිබෙනවා. මේ වන විට ඒ නඩු කටයුතු ප්‍රමාද වෙලා තිබෙන්නේ. අපි තමයි ඒ මෝල් 4ටත් වී අරන් දුන්නේ. ඒ නිසා අසත්‍ය කියන්න එපා කියලා මම විපක්ෂයට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව කරන වැඩ ටික ගැන මම දැන් කියන්න ඕනෑ. මොකද විපක්ෂය උත්සාහ කරනවා, අසත්‍ය දේවල් කියන්න. අපේ කෘෂිකර්ම ඇමතිතුමා කිව්වා වාගේ මේ යෝජනාව ගෙනාපු එක හොඳයි. අඩුම ගානේ අපි කියන නිසා මේ වෙලාවේ මේ ටිකවත් දැනගනීවි. හැමදාම ඒගොල්ලන් හිතාගෙන ඉන්නවා, අපිත් ඒගොල්ලන් වාගේ කියලා. නැහැ, ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා මම මේ තොරතුරු ඇතුළත් ලේඛන සභාගත කරන්නම්. මොකද, මේ වෙලාවේ සභාවේ නැති අය හෙටවත් ඇවිල්ලා මේ තොරතුරු බලාගනීවි.

වී අලෙවි මණ්ඩලය පසුගිය කාලයේ වී මිලදී ගත් ආකාරය පිළිබඳවත් දැන් කථාවක් කිව්වා. ඒ විස්තරත් මම කියන්නම්.

2020දී වී මෙට්‍රික් ටොන් 29,685යි; 2021දී වී මෙට්‍රික් ටොන් 52,852යි; 2022දී වී මෙට්‍රික් ටොන් 78,361යි; 2023දී වී මෙට්‍රික් ටොන් 2,154යි; 2024දී වී මෙට්‍රික් ටොන් 2,758යි. අපි 2025 මහ කන්නයේ අස්වැන්න මිලදී ගන්න පටන් ගත්තා, ගරු මන්ත්‍රීතුමා. 2025 මහ කන්නයේ වී කිලෝවක මිල රුපියල් 120ක් කළා. ගොවියාගේ අතට හොඳ මිලක් ආවා. නමුත් ගොවියා වී අලෙවි මණ්ඩලයට වී ගෙනාවේ නැහැ. මොකද, ගොවියා තෙත වී කිලෝවක් රුපියල් 110ට, 115ට වික්කා. මේ කන්නයේ වේළපු වී කිලෝවක් එළියේ මිලදී ගන්නේ රුපියල් 110ට. ගිය කන්නයේ ගොවියා තෙත වී කිලෝවක් රුපියල් 110ට වික්කා. *[බාධා කිරීමක්]* මම මේක කියලා ඉන්නම්. අපරාදේ අපේ වෙලාව. ඔබතුමාට මම පසුව හමුවෙලා මේ ගැන කියලා දෙන්නම්, අඩුම ගණනේ ඔබතුමා සභාව තුළ හිටපු ගෞරවයට.

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
තෙත වී සඳහා මිලක් නියම කර තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
තෙත වී සඳහා මිලක් නියම කිරීම ඇතුළේත් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ අපි අපේක්ෂා කළේ මොකක්ද? එළියේ ගොවියාගේ වී කිලෝවක් රුපියල් 95ට, රුපියල් 85ට ගන්නවා. ඒ විධියට එක් එක් ගණන්වලට වී ගන්න නිසා තමයි තෙත වීවලටත් මිලක් නියම කළේ. ගොවියාට පෙන්නුවා, තෙත වී කිලෝ එක රුපියල් 102යි, වේළපු වී කිලෝ එක රුපියල් 120යි, ඒ නිසා ඔබට අඩුම ගණනේ රුපියල් 102ට තෙත වී කිලෝවක් විකුණාගන්න බැරි නම් වී වේළලා ගෙනෙන්න, රජය රුපියල් 120ට වී කිලෝවක් මිලදී ගන්නවා කියලා. මේ වනකොට සියයට 54ක් ගොයම් කපා අවසන් කර තිබෙනවා. මන්ත්‍රීතුමනි, සමහර දිස්ත්‍රික්ක තිබෙනවා, සියයට 90ක් ගොයම් කපා අවසන් කරපු. රටම නොවෙයි. සමහර දිස්ත්‍රික්ක තිබෙනවා, තවම ගොයම් කපා තිබෙන්නේ සියයට 45යි, 50යි, සමහර ඒවා සියයට 80යි. ඒ අනුව සමස්තයෙන් සියයට 54ක් ගොයම් කපා අවසන්. ඔබතුමාට දැනගැනීම සඳහාත්, මේ සභාවේ අවබෝධයටත්, දැනගැනීමටත් මම මේ වාර්තා සභාගත කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි. මේ වෙනකොට යල කන්නයේ ගොයම් කපා තිබෙන ප්‍රමාණය ගත්තොත්, මෙට්‍රික් ටොන් 1,522,000ක්. ඒ තොරතුරු ටිකත් මම සභාගත කරන්නම් ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා.

වී අලෙවි මණ්ඩලයට මේ වෙනකොට ආණ්ඩුව රුපියල් බිලියන 8ක් දීලා තිබෙනවා. නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ වී අලෙවි මණ්ඩලය රුපියල් බිලියන 28.5ක් බැංකුවලට ණයයි. ඒ, ඔයගොල්ලන් පසුගිය කාලයේ කරපු වැඩ. වී අලෙවි මණ්ඩලය මහජන බැංකුවට රුපියල් මිලියන 750ක් ණයයි. ඔක්කෝම ගත්තාම වී අලෙවි මණ්ඩලය රුපියල් මිලියන 29,250ක් ණයයි. වී අලෙවි මණ්ඩලය මෙච්චර ණය කරලා තිබෙන්නේ ඇයි? වී අරගෙන, අඩුවට දෙන්න කිව්වා යාළුවන්ට. අර හැරිසන් දැන් සොයාගන්නත් නැහැ. සත්ව ආහාරවලට වී විකිණුවේ. මතකද? ගත්ත වී ටික අඩු ගණනට යාළුවන්ට දුන්නා, සත්ව ආහාරවලට කියලා. අන්න එහෙමයි මේගොල්ලන්ගේ පාලකයෝ වැඩ කළේ. සජිත් ප්‍රේමදාස හිටපු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සමහර කාලවලදී වී අලෙවි මණ්ඩලයේ වී ටික වික්කේ එහෙමයි. මේ විධියට තමයි වී අලෙවි මණ්ඩලයට එදා පාඩු කළේ.

හැබැයි, අද අපි වී අලෙවි මණ්ඩලය හොඳ තැනකට ගෙනැත් තිබෙනවා. යල කන්නයේ අපට ගන්න පුළුවන් වුණේ අස්වැන්නෙන් සියයට 59.5යි. අද වෙනකොට වී අලෙවි මණ්ඩලය විතරක් වී මෙට්‍රික් ටොන් 45,990ක් අරගෙන තිබෙනවා. සතොසට දුන්නා, රුපියල් මිලියන 5,000ක්. ලංකා බැංකුව හරහා සතොසට රුපියල් මිලියන 5,000ක් දුන්නා, වී මිලදී ගන්න. CWE එක වහලා තිබුණේ. අවුරුදු 4ක ගිණුම් තිබුණේ නැහැ. අපි ගිණුම් හදලා සතොස ස්ථාපිත කරලා පසුගිය යල කන්නයේ වී මෙට්‍රික් ටොන් 3,980ක් ගත්තා. අද සිට සතොස මේ කන්නයේ වී මිලදී ගන්න පටන්ගත්තා. මොකද, සතොසට සල්ලි එන්න ඕනෑ වී ටික ගන්න. ඒ නිසා මේ කටයුත්තත් දැන් අපි කරමින් තිබෙනවා. ආණ්ඩුව ගත්ත වී ටික කොටලා වෙළෙඳ පොළට හාල් නිකුත් කරන්නයි මේ හදන්නේ. මේ කථාව කියද්දි නලින් බණ්ඩාරත් මොනවාදෝ කියලා පැනලා ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේ විවාදවලට යෝජනා ඉදිරිපත් කරන අය, කථා කරන අය අඩුම ගණනේ තමන් කරපු කථාවට උත්තරය ලැබෙනවාද කියා බලාගන්නවත් සභාවේ ඉන්න ඕනෑ කියලායි. මේ අය පට්ටපල් බොරු කියනවා.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට බැංකුවලින් ණය පහසුකම් ලබා දෙනවා. දැනට ඒ අයට රුපියල් මිලියන 6,500ක් ණය දීලා තිබෙනවා. මහා පරිමාණ මෝල් හිමියන්ට මේ කන්නයට පමණක් රුපියල් මිලියන 16,000ක් දීලා තිබෙනවා. එතකොට, රුපියල් මිලියන 21,000ක් දීලා තිබෙනවා. ඒ නිසා මහ කන්නයේදී රුපියල් මිලියන 25,000කට ආසන්න මුදලක වී මිලදී ගන්නවා, මේ දෙගොල්ලන්. රුපියල් මිලියන 50,000කට ආසන්න - රුපියල් මිලියන 40,000ත්, 50,000ත් අතර - වටිනාකමකට වී ගන්න රජය ණය දෙනවා, බැංකු පද්ධතිය හරහා. ඊට අමතරව මේ කන්නයේ මහා භාණ්ඩාගාරය හරහා වී අලෙවි මණ්ඩලයට රුපියල් මිලියන 8,000ක් දීලා තිබෙනවා. අපි සතොසට ගත්ත වී ටික හාල් බවට පත් කරලා වෙළෙඳ පොළට දමන්න ඕනෑ. ඒ, ඇයි? මේගොල්ලන් කොහොමත් කැමැතියි, ආණ්ඩුව මේ වෙළෙඳ පොළෙන් අයින් වෙනවා නම්. සුරංග මන්ත්‍රීතුමා, අර පොළොන්නරුවේ හෙලිකොප්ටර් එකක් තබාගෙන ඉන්නේ, ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුර ගන්න ආවේ, අර ආපහු ඇවිල්ලා සජිත් ප්‍රේමදාස මහත්තයාගෙන් සල්ලි ඉල්ලුවේ, ඒ අය තමයි ඉතින්. මේගොල්ලන් හිතාගෙන ඉන්නවා, ඒ අය දියුණු කරගත්තා නම් හරි කියලා. නැහැ. අපි ගිය කන්නයේ රුපියල් 230ක් ලෙස නාඩු හාල් මිල තීරණය කළා. මදි වුණු හාල් ප්‍රමාණය පිට රටින් ගෙනැත් දුන්නා. රුපියල් 120ට වී මිලදී ගන්නවා වාගේම රුපියල් 230ට හාල් දෙන්න තමයි අපි අපේ වෙළෙඳ පොළ හැදුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාව මම කියන්නේ නිකම් නොවෙයි. මේ වෙනකොට අපි ගත්ත වී ටික කොටලා වෙළෙඳ පොළට දානවා. ජාතික සතොස හරහා කිලෝග්‍රෑම් 5 බැගින් වූ කැකුළු සහල් සහ නාඩු සහල් බෑග් අපි රට පුරා බෙදා හරිනවා. අපි මේ වෙනකොට සහල් විකිණීම ආරම්භ කර තිබෙනවා. වී අලෙවි මණ්ඩලය ගත්ත වී ටිකත් අරගෙන කොටලා අපි බෙදා හරිනවා. ඒවා බෙදා හරින්නේ කොහොමද? අපි යහළුවන්ට දුන්නේ නැහැ; හිතවතුන්ට දුන්නේ නැහැ; අත යට ගාණක් තියාගෙන දුන්නේ නැහැ; අපි සත්ව ආහාරවලට කියලා හිතවතුන්ට දීලා ඒවායෙන් ගේම් ගැහුවේ නැහැ. අපි කොහොමද කළේ? අපි සතොසේ වී ටික ටෙන්ඩර් දැම්මා. ගරු මන්ත්‍රීතුමනි, අපි පත්තරේ දාලා තිබෙන දැන්වීම බලන්න. අපි 2025.05.25වන දින "සිළුමිණ" පත්තරය ඇතුළු පත්තර තුනක දැන්වීම් දැම්මා. අපි සතු වී තොග කොටලා අපේ design එක තිබෙන බෑග් එකේ දාලා අපේ ගබඩාවලට ගෙනැත් දෙන මිල තීරණය කළා. ඒ මිල තීරණය කරන්න ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් දැම්මා. Pre-bid meeting එකක් පැවැත්වූවා. ඒකට ඇවිල්ලා අපි සාකච්ඡා කළා. සහල් කොටලා දෙන්න පුළුවන් ලංකාවේ ලොකු මෝල්වලට තමයි මේ වැඩේ කරන්න පුළුවන්. පොඩි මෝල්වලට බැහැ. මොකද, quality එකක් සහිතව මේ සහල් පරිභෝජනය කරන්න අපේ රටේ පාරිභෝගිකයා දැන් පුරුදු වෙලා තිබෙනවා. ඒක මහා පරිමාණ මෝල් හිමියන් මාර්කට් එක ඇතුළේ කරපු development එකක්. ඒක හොඳයි, quality එකක් තිබෙන සහල් දෙන්න ඕනෑ. කුඩා පරිමාණ මෝල්වලටත් දැන් ඒ තාක්ෂණය ඇවිත් තිබෙනවා. සහල්වල කළු ඇට ඉවත් කරන මැෂින් දැන් කුඩා පරිමාණ මෝල්වලටත් එනවා. ඒ අයත් boilers හදනවා. ඒ අයත් silos හදන්න පටන් ගන්නවා. ඒක හොඳයි. අපේ සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා ඊයේත් ඒ ගැන කථා කළා. අනුරාධපුරයෙනුත් අපේ මෝල් හිමියෙක් ආවා, ලොකු මෝලක් දාන්න. වී කිලෝග්‍රෑම් කෝටියක් ගබඩා කරන්න පුළුවන් මෝලක් දාන්න ඉඩමකුත් බලලා තිබෙනවාය කියලා ඔහු කිව්වා. ඒක හොඳයි. ඔහු silos 4ක් ගහනවාය කිව්වා. ඒ වාගේ තාක්ෂණයයි, දැනුමයි මේ කර්මාන්තයට එකතු කරන එක හොඳයි. හැබැයි, පසුගිය කාලයේ ආණ්ඩු කරපු අය මොකද කළේ? වී අලෙවි මණ්ඩලය බංකොලොත් කළා; සතොස වහලා දැම්මා; ගබඩා ටික යහළුවන්ට දුන්නා. දැන් අපි ආපු ගමන් අපෙන් අහනවා, "කෝ, වී ගත්තාද?" කියලා. ඔව්, මේ වෙනකොටත් අපි මේ කන්න දෙකේ මෙට්‍රික් ටොන් 50,000ක් අරගෙන තිබෙන්නේ. අපේ අපේක්ෂාව, මේ යල කන්නය අවසන් වෙනකොට මෙට්‍රික් ටොන් 80,000ක් වී ගන්නයි. අවුරුද්දකට මෙට්‍රික් ටොන් ලක්ෂ 2කට ආසන්නව වී මිලදී ගන්න එක තමයි රජයේ අපේක්ෂාව. ඒ අපේක්ෂාව අනුව වී ටික කොටලා සහල් කරලා මාර්කට් එකට දානවා. ඒක කරලා තිබෙන්නේ ටෙන්ඩර් දාලා, තරගකාරී මිල ගණන් කැඳවලා. අපට වැඩිම ලාභ තිබෙන, සතොසට වැඩිම ලාභ තිබෙන ටෙන්ඩර්කරුවාට දීලා තමයි අපි මේ කටයුත්ත කරන්නේ. අපි මේක යහළුවන්ට දීලා නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු බොරු කියලා මාරු වෙන එක වෙනුවට අඩු ගාණේ මේ සභාවේ හිටියා නම් හොඳයි මේවා දැනගන්න.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අය මේ කථාව කියාගෙන යනකොට, පොහොර සහනාධාරය පිළිබඳව, වී පිළිබඳව වාගේම යල කන්නයේ කුඹුරු ඉඩම්වල වගා කිරීම පිළිබඳවත් කිව්වා. ඒ නිසා විපක්ෂ නායකතුමාට දැනගන්නත් එක්ක මම මේ කාරණය කියන්න ඕනෑ. මොකද, මෙතැනට ඇවිල්ලා එතුමාට හිතෙන හිතෙන ඒවා කිව්වාම ඒ දේවල් අපේ රටේ මිනිස්සු පිළිගන්නවා කියලා එතුමා හිතාගෙන ඉන්නවා. එහෙම නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කය වගා කරලා තිබෙන වී වර්ගත්, අස්වැන්නේ ප්‍රමාණයත් සඳහන් සියලු ලේඛන මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට හෙට ඇවිල්ලා මේ දේවල් බලා ගන්න කියන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ දේවල් කියන්නේ නිකම් නොවෙයි. මොකද, මේ කන්නයේත් සම්බා වීවල නිෂ්පාදනයේ අඩුවක් තිබෙන බව අපි දන්නවා. කීරි සම්බාවලත් නිෂ්පාදනයේ යම් අඩුවක් තිබෙනවා. ඇයි ඒ? පසුගිය කන්නයේ නාඩු වී අස්වැන්නත් අඩු වුණා. ඒ නිසා මේ කන්නයේ මිනිස්සු වැව්වා. මේ කන්නය වෙනකොට අපේ තිබෙන ඇස්තමේන්තු අනුව නාඩු සියයට 65ක් තිබෙනවා. රතු සහල් තිබෙනවා, සියයට 22ක්. ඒ දෙකේ එකතුව සියයට 87යි. කීරි සම්බා සහ සම්බා තිබෙන්නේ සියයට 13යි. මේ රට ඇතුළේ පරිභෝජනය ගත්තාම සියයට 65ක් කැකුළු සහ නාඩු පරිභෝජනය කරනවා. සියයට 22ක් රතු සහල් පරිභෝජනය කරනවා. ඉතුරු සියයට 13ක පරිභෝජනය සඳහා සම්බා සහ කීරි සම්බා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. විපක්ෂ නායකතුමා කිව්වා, සහල් අතිරික්තයක් තිබෙන රටේ, පිට රටින් සහල් ගේනවා කියලා. එතුමා දන්නේ නැහැ, දැන් වෙනත් කර්මාන්ත ඇවිල්ලා තිබෙනවාය කියලා. ඒක එතුමාට මතක නැහැ. මොකද, එතුමාට එහෙම සිහියක් ආවේ නැහැ. අපේ රටේ මිනිස්සු මාසයකදී කුකුළු මස් කිලෝග්‍රෑම් මිලියන 21ක් ආහාරයට ගන්නවා. අපේ රටේ මිනිස්සු දවසකට බිත්තර මිලියන 10ක් ආහාරයට ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කර්මාන්තවලට අදාළව සහල් පිටි කර්මාන්තය තිබෙනවා. ඊළඟට, බියර්වලට විතරක් සහල් මෙට්‍රික් ටොන් 20,000කට ආසන්න ප්‍රමාණයක් ගන්නවා. දැන් ව්‍යාපාරිකයෙක් සකේ හදන කර්මාන්තශාලාවක් හදනවා. ඔහු කියනවා, ඔහුටත් අවුරුද්දකට සහල් මෙට්‍රික් ටොන් 12,000ක් ඕනෑ කියලා. ඒ වාගේම සහල් පිටි කර්මාන්තයක් තිබෙනවා. එමෙන්ම, ලංකාව තවත් සහල් මෙට්‍රික් ටොන් හයහත්දහසක් පිට රටත් යවනවා. ඒ සියල්ල එක්ක ගත්තාම අපේ රටේ සහල් නිෂ්පාදනයයි, මේ කර්මාන්තයයි අතර තිබෙන හඳුනා ගැනීම අපි ආණ්ඩුවක් හැටියට කරලා තිබෙනවා. කෘෂිකර්ම ඇමතිතුමා ඇතුළු කණ්ඩායම මේ වෙනකොට මේ දේවල් සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් ඉන්නවා. මේ කන්නයේ හෙක්ටෙයාර 527,000ක් වගා කර තිබෙනවා. පොහොර සහනාධාරයත් එක්ක ඔක්කෝම හෙක්ටෙයාර 544,000ක් තිබෙනවා. මේ කන්නයේ වගා කරපු හෙක්ටෙයාර 544,000ට වඩා ලබන යල කන්නයේදී හෙක්ටෙයාර 825,000ක් දක්වා වැඩියෙන් වගා කරන්න ඕනෑ. අන්න එතකොට අපේ වගා භූමි ප්‍රමාණය වැඩි වෙනවා. ඒ විතරක් නොවෙයි. අක්කරයකට බුසල් 80ක්, 90ක් ලැබිච්ච වී අස්වැන්න අඩුම තරමින් බුසල් 120ට, 150ට අපි ගේන්න ඕනෑ. අපට හොඳ බීජ ඕනෑ. ඒ වාගේම, නිෂ්පාදන ඵලදායීතාව වැඩි වෙන්න ඕනෑ. ඉන්දියාවේ සහල් කිලෝවක් ලංකාවට එනකොට රුපියල් 120ක, 125ක අතර මිලක් තිබෙන්නේ. හැබැයි, අපේ වී කිලෝවක්ම රුපියල් 120යි.

නමුත්, දැන් වී කිලෝවකට රුපියල් 150ක් ඉල්ලනවා. එතකොට පාරිභෝගිකයා කොහොමද ගන්නේ? ඒ නිසා අපි මේ රටේ ගොවියා රකින්න වීවලට රුපියල් 120ක මිලක් දුන්නා. පාරිභෝගිකයා රකින්න සහල්වලට රුපියල් 230ක මිලක් දැම්මා. වී අලෙවි මණ්ඩලයත්, සතොසත් එකට එකතු වෙලා ඒ දෙකම කළමනාකරණය කරන්න වැඩ කරලා තිබෙනවා, පාරිභෝගිකයාට අඩුවක් නැතුව සහල් ටික වෙළෙඳ පොළට දෙන්න.

අපි පොහොර සහනාධාරය වෙලාවට දුන්නා. පසුගිය අවුරුද්දේ පොහොර සහනාධාරය පිළිබඳ ප්‍රශ්නය ආවේ ඇයි? Budget එකෙන් සල්ලි වෙන් කරලා තිබුණේ මහ කන්නයට - දෙසැම්බර්වලට - කලින්. මහ කන්නය දැන් පටන් ගන්නවා. දෙසැම්බර්වලට කලින් සල්ලි වෙන් වුණාම අවසාන කාලයේ කොටසට පොහොර සහනාධාරය දෙන්න සල්ලි කලින් වෙන් කර ගන්න ඕනෑ. කෘෂිකර්ම ඇමති ලාල් කාන්ත මැතිතුමා කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, ලබන අවුරුද්දට දෙන්න තිබෙන කන්නයේ සල්ලිවලින් රුපියල් බිලියන 5ක් මේ කන්නයට දෙන්න කියලා, ප්‍රමාදයක් නැතුව පොහොර සහනාධාරය දෙන්න. අපි යල කන්නයේදී කිසිදු තැනක ප්‍රමාදයක් නැතුව රුපියල් මිලියන 14,000කට ආසන්න මුදලක් පොහොර සහනාධාරය වශයෙන් දුන්නා. නමුත් දැන් මෙතුමන්ලා බොරු කියන්න හදනවා. බොරුව කියලා ඉන්න බැහැ නේ සභාවේ, යන්න එපා යැ. ඒ නිසා යෝජනාව ඉදිරිපත් කළා, බොරුව කිව්වා, පාර්ලිමේන්තුවෙන් ගියා. අඩුම තරමින් යෝජනාව ඉදිරිපත් කරපු, යෝජනාව ස්ථිර කරපු අය මේ සභාවේ ඉඳලා ආණ්ඩුව මොනවාද කරලා තිබෙන්නේ කියලාවත් දැනගන්නවා නම් හොඳයි කියලා මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංවාදය සඳහා එකතු වෙන්න අවස්ථාව ලැබීම ගැනත් මම සතුටු වෙනවා. මොකද, අපේ රජය මේ වෙනකොට අරගෙන තිබෙන ක්‍රියාමාර්ග තුළින්, බංකොලොත් කරලා තිබුණු වී අලෙවි මණ්ඩලය, වහලා දාලා තිබිච්ච සතොස සක්‍රිය කරලා, ඒවා මේ රටේ තොග වෙළෙඳාමට එකතු වෙමින් තිබෙනවා. ඒ හරහා, සහල් වෙළෙඳ පොළ තුළ මාෆියාව හදාගෙන ඉන්න අයට අපි උත්තරයක් ලබා දෙමින් තිබෙනවා. රජය ගත්ත වී ටික කොටලා හාල් කරලා මාර්කට් එකට අපි දමමින් තිබෙනවා. එහෙම කරලා, අපි සහල් වෙළෙඳ පොළේ මිල සියයට 10ත්, සියයට 15ත්, සියයට 20ත් අතර ප්‍රමාණයකින් පාලනය කිරීම සඳහා වූ වැඩ පිළිවෙළක් සහිතව ඉස්සරහට ගමන් කරමින් සිටිනවා. ඒ වෙනුවෙන් අපි ගෙන යන ක්‍රියාමාර්ග තුළ මේ රටේ ගොවියාගේ වීවලට සාධාරණ මිලකුත්, පාරිභෝගිකයාගේ සහල්වලට සාධාරණ මිලකුත් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් වී අලෙවි මණ්ඩලය සතු ගබඩාත්, සතොස සතු ගබඩාත්, මහජනතාවගේ බදු මුදලුත්, ඒ හරහා බැංකුවලින් ලබා දෙන ණයත්, ඔඩපන ණයත්, වී අලෙවි මණ්ඩලයෙන් ලබා දෙන ණයත් සියල්ල පාවිච්චි කරමින් වී ගොවියාත්, පාරිභෝගිකයාත් ආරක්ෂා කරනවා වාගේම පොහොර සහනාධාරයත් වෙලාවට ලබා දීලා, වට්ටපු රට ගොඩනඟන කටයුත්ත මාලිමාව ආණ්ඩුව ගොවියාත් එකතු කරගෙන කරනවාය කියන කාරණය මතක් කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.47ට, 2025 සැප්තැම්බර් 11වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 5.47க்கு, பாராளுமன்றம் 2025 செப்ரெம்பர் 11, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 5.47 p.m. until 9.30 a.m. on Thursday, 11th September, 2025.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.